

# බුදුදහම පිළිබඳ බටහිර මතය

## ඕස්ට්‍රේලියානු භික්ෂුවක බුදුදහම දකින හැටි


සම්පාදක :

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තක :

මන්ජරී පීරිස්

# බුදුදහම පිළිබඳ බටහිර මතය

## ඕස්ට්‍රේලියානු භික්ෂුවක බුදුදහම දකින හැටි


**සම්පාදක:**

**ශ්‍රාවස්ති ධම්මික හිමි**

පරිවර්තක:

මන්ජරී පීරිස්

# ප්‍රස්තාවනාව

18 වැනි වියෙහි පටන් බෞද්ධයකු වන මම වසර 42ක් පුරා බෞද්ධ භික්ෂුවක සේ කල් ගෙවමි. මේ කාලය තුළ බුද්ධ ධර්මය පිළිබඳව යමක් නොකියවූ, අධ්‍යයනය නොකළ එකම දිනයක් හෝ ගතකර නොමැති තරම්ය. බුද්ධ ධර්මයේ දර්ශනය, මනෝවිද්‍යාව, එහි සම්ප්‍රදායයන් සහ ඉතිහාසය සැම විටම මා වශී කර ඇත. එසේම ඒවා නිරන්තරයෙන්ම සිදු වෙමින් පවතී. මා ධර්මය ගවේෂණය කරන විට, කලාතුරකින් මතුකර දක්වන හෝ සාමාන්‍ය බෞද්ධයන් සම්පූර්ණයෙන්ම නොදන්නා කරුණු මට හමුවී ඇති අතර, එවැනි තොරතුරු පිළිබඳව විශේෂයෙන්ම, සිතීමෙන් මා හට පිබිදීමක් ඇති කරයි. එවැනි තොරතුරු පිළිබඳව ලිවීමෙන් මම විශේෂයෙන්ම සතුටට පත් වෙමි. බුද්ධ ධර්මයේ "අඩුවෙන් සැරිසැරු මාවතේ" ගමන් කිරීමට මම කැමැත්තෙමි. මෙහි ඇතුළත් කර ඇති රචනා අතුරින් බොහෝ ඒවා පසු ගිය වසර 15 තුළ මා ලියා ඇති අතර, ඒවා "ද අයිලන්ඩ්", "සන්ඩේ ටයිම්ස්", "ඩේලි මිරර්", "ද නේෂන්" යන පුවත්පත්වල ද, ජර්නල් සඟරාවෙහි ද, 2008-2017 දක්වා මගේ බ්ලොග් අඩවියේ ද පළ වී ඇත.

මෙම ග්‍රන්ථය අවධානයෙන් සහ කැපවීමෙන් සිංහල බසට පරිවර්තනය කළ මන්ජරී පීරිස් මෙණෙවියට සහ මෙම කාර්යයේදී ඇයට උපකාර කළ සුජීව දිලංගන පීරිස් මහතාට ස්තුති කරන්නට කැමැත්තෙමි. මෙහි මුල් ඉංග්‍රීසි පිටපත කියවමින් බොහෝ ප්‍රයෝජනවත් යෝජනා සිදු කළ, පූජ්‍ය ආනන්දජෝති ස්වාමීන්වහන්සේට සහ මෙහි සඳහන් බොහෝ රචනා පුවත්පත්වල පළකර ගැනීමට උපකාර කළ තිස්ස දේවේන්ද්‍ර මහතාට ද ස්තුතිවන්ත වෙමි. ඒ සියලු දෙනාම සැබෑ කල්‍යාණ මිත්‍රයෝ වෙති.

# පරිවර්තකගේ සටහන

මෙම වටිනා ග්‍රන්ථයේ කර්තෘ, පූජ්‍ය ශ්‍රාවස්ථි ධම්මික ස්වාමීන්වහන්සේ සඳහන් කර ඇති අන්දමට, බුදුදහමට අදාළ, එහෙත් ඒවාට ලැබිය යුතු අවධානය අඩුවෙන් යොමු කළ විෂයයන් සහ කරුණු පෙළක්ම මෙම ග්‍රන්ථය තුළින් පරීක්ෂාවට ලක් කර ඇත. එම නිසා මෙම ග්‍රන්ථය, සිංහල බසින් ධර්ම ග්‍රන්ථ පරිහරණය කරන පින්වතුන්ට ප්‍රයෝජනවත් වේ යැයි මම විශ්වාස කරමි.

පළමුව මා කෙරෙහි විශ්වාසය තබා මෙම ග්‍රන්ථය සිංහලට පරිවර්තනය කිරීමට මට අවසර දුන් උන්වහන්සේට මම මගේ ප්‍රණාමය පුද කරමි.

දෙවනුව, මෙම ග්‍රන්ථය ප්‍රකාශ කිරීමට  අනුග්‍රහය දැක්වූ මහරගම සිරි වජිරඤාණ ශ්‍රී ධර්මායතනවාසී ත්‍රිපිටකාචාර්ය පානදුරේ පසන්න ස්වාමීන්වහන්සේට සහ සම්බන්ධීකරණය කටයුතු කරදුන් පූජ්‍ය ගබ්බෙල වජිරඤාන ස්වාමීන්වහන්සේටත් මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරමි,

තෙවනුව, මෙම ග්‍රන්ථයේ අවසාන සෝදුපත් සම්පූර්ණයෙන්ම කරදුන් පූජ්‍ය කඹුරුපිටියේ අනෝම ස්වාමීන්වහන්සේට මගේ ගෞරවනීය ප්‍රණාමය මෙයින් පුද කරමි.

එසේම, මෙම ග්‍රන්ථය  සකස් කර ගැනීමට සහාය ලබා දුන් මහාචාර්ය කාලෝ ෆොන්සේකා,  ඩබ්ලිව්. ආරියසිංහ ප්‍රේමසිරි, මෙම පොත මුද්‍රණයට යන තුරු ඉතා කැප වීමෙන් සිංහල බස් වහර නිවැරදි කර දීම සම්බන්ධයෙන් ඉන්ද්‍රාණී පද්මා ද සේරම්, නිරෝෂන් ප්‍රේමතිලක, ලිලාමනී අමරසිංහ සහ ජීවක මෛත්‍රී යන මහත්ම මහත්මීන්ට ද මා කෘතඥ වන අතර, මෙම කුසල කර්මයට කොටස්කරුවන් වීමේ  පුණ්‍යකර්මය ඔවුන් සියලු දෙනාගේ මෙලොව සහ පරලොව සුවයට ද, සංසාර විමුක්තියට ද හේතුවක්ම වේවා!

මෙම ග්‍රන්ථය පරිවර්තනය කිරීමේ මගේ අභිලාෂය වන්නේ, බුදුදහම සිංහල බසින් පරිහරණය කරන පින්වතුන් අතරට යාමෙන් ඔවුන්ගේ දහම් දැනුම පෝෂණය කිරීමත්, මගේ දෙමව්පියන්ගේ සහ පවුලේ සියලු දෙනාගේත් සංසාර විමුක්තියට මංපෙත් විවෘත කිරීමත් පමණි. මගේ මේ වෑයම හුදෙක් ධර්ම දානයයි, වෙනත් කිසිදු ලාභයක් මම මෙයින් බලාපොරොත්තු නොවෙමි.

තෙරුවන් සරණයි!

මන්ජරී පීරිස්

86. දහම් මාවත

මහරගම

# පටුන


1.වෙසක් (පාලියෙන් වෙසාඛ) උත්සවයේ ඉතිහාසය

2.බුදුපියාණන් වහන්සේගේ දැහැටි කූර පිළිබඳව විමසීම

3.බුද්ධ ධර්මය, ගස් සහ වනාන්තර

4.ඔබ කවරදාවත් නොදත් බුදුපියාණන් වහන්සේ

5.බුදුපියාණන් වහන්සේ කෙබඳු පුද්ගලයෙක් ද?

6.ධර්මය, කර්මය සහ ස්වාභාවික විපත්

7.බුදුපියාණන් වහන්සේ ගුරුවරයකු වශයෙන්

8.බුද්ධාගමේ සහ ක්‍රිස්තියානි ආගමේ ප්‍රාතිහාර්යයන්

9.බුදුපියාණන් වහන්සේගේ චාරිකා පිළිබඳ අධ්‍යයනයක්

10.බුදුපියාණන් වහන්සේ වදාළ සනීපාරක්ෂාව- වච්චකුටි

11.අශිෂ්ට ජාතකය

12.බුදුපියාණන් වහන්සේ, රෝග සුවකිරීම සහ ඖෂධ

13.බැටළු හම පොරවාගත් වෘකයන්ගෙන් ප්‍රවේසම් වෙන්න!

14.ජලය, ජලය, සෑම තැනම

15.විවාහ උත්සව සහ විවාහය පිළිබඳව බුදුපියාණන් වහන්සේ පැවසුවේ මොනවා ද?

16.බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳ ජනප්‍රවාද

17.බුදුපියාණන් වහන්සේ සැබැවින්ම හින්දු භක්තිකයෙක් ද?

18.දුම් ඉරීම සහ පස්වන ශික්ෂා පදය

19.බුදුපියාණන් වහන්සේගේ සමකාලීනයන් උන්වහන්සේ දුටු අයුරු

20.නිර්වාණය අවබෝධයට ආහාර

21.ත්‍රිපිටකය පළමුව ලීවේ කවදා ද? කොහේදී ද?

22.මරණ දඬුවම හා ප්‍රබුද්ධ පුද්ගලයා

23.සංකස්සයේ ප්‍රාතිහාර්යය : යථාවක් හෝ ප්‍රබන්ධයක්ද?

24.පාලි ත්‍රිපිටකයේ ශෘංගාරය

25.ජේසුතුමා සහ බුදුපියාණන් වහන්සේ ගතී ස්වභාවයෙන් එක හා සමාන ද? නැතහොත් සම්පූර්ණයෙන්ම  වෙනස් ද ?

26.බුදුපියාණන් වහන්සේ කාන්තාවන් සම්බන්ධයෙන් කුමක් වදාළේ ද?

27.මිතුරන් සහ මිතුරුදම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ අදහස්

28.බුදුපියාණන් වහන්සේ සහ ආහාර පිළිබද දර්ශනය

# 01.වෙසක් (පාලියෙන් වෙසාඛ) උත්සවයේ ඉතිහාසය

සියලු බෞද්ධ උත්සව සහ නිවාඩු දිනයන් අතරින් ගෝලීය වශයෙන් උත්සවාකාරයෙන් පවත්වනු ලබන උත්සවය වන්නේ වෙසක් උත්සවයයි. බුදුපියාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය සහ පරිනිර්වාණය එකම දිනක සිදුවූ බවට සාම්ප්‍රදායික වශයෙන් විශ්වාසයක් ඇත. ඒ වර්තමානයේ අප්‍රේල් - මැයි කාලයට සමරූපීවන, දෙවන මාසයේ, පුර පොහොය හෙවත් පැරණි ඉන්දියානුවන් හඳුන්වන වෙසක් දිනය වේ. අවම වශයෙන් පසුගිය වර්ෂ 60ක කාලය තුළ සිංහලයෙන් හඳුන්වන ආකාරයට, වෙසාඛ (Vesakha ) ඉතා බහුල වශයෙන් වෙසක් යනුවෙන් උච්චාරණය කරනු ලබයි. තායි භාෂාවෙන් (වයිස්ටඛ), ටිබෙට් භාෂාවෙන් (සා ගා දාව) හෝ වියට්නාම් භාෂාවෙන් (එට් දාන්) යනුවෙන් සකස් නොවූයේ ඇයි? එයට හේතුව, 1950 දී බෞද්ධයන්ගේ ජගත් සහභාගිත්වයෙන් පැවති සමාරම්භක රැස්වීම පැවැත්වූයේ, ශ්‍රී ලංකාවේ මුදල් ආධාර සහ පරිපාලනය යටතේ වන බැවින් එය ඔවුන් පවසන ආකාරයෙන් වර්තමානයේ භාවිත කෙරේ.

වෙසාඛ සියලු රටවල්වලම ප්‍රධාන උත්සවය ලෙස සමරන්නක් නොවේ. අවුරුදු 50 ක් වනතුරුම මාසා පූජා සහ වන් අසන්හා බූචාවල මෙන්ම තායිලන්තයේද එය මතුවී නොපෙනුණු, පැවිදි පිරිසට පමණක් සීමාවූ උත්සවයක් විය. විශාල නිවාඩු සහ උත්සව  බ්‍රාහ්මණ වංශිකයන්ගේ සැමරීම් විය; සොන්ග්ක්‍රාන්, ලොයි ක්‍රතොන්ග් යනාදිය සහ රටේ උතුරු ප්‍රදේශයේ ඉන්තාකින්වල ජලය විසිකිරීමේ උත්සවය සහ තවත් බොහෝ උත්සව තිබුණි. එක්දහස් අටසිය අසූ ගණන්වල මුල් කාලයේ සිට, ශ්‍රී  ලංකාවේ වෙසක් දිනය රජයේ නිවාඩු දිනයක් කිරීම සඳහා අඛණ්ඩව දියත් කළ සංවිධානාත්මක ව්‍යාපාරය, කර්නල් ඔල්කොට්තුමා ලන්ඩනයට ගොස් බ්‍රිතාන්‍ය බලධාරීන්ගෙන් ඉල්ලා සිටින තුරුම අසාර්ථක වූ අතර, අවසානයේ 1885 දී සාර්ථක විය. උද්‍යෝගිමත් ඇමරිකානු ජාතික, පූජ්‍ය සුමංගල ස්වාමීන්වහන්සේ එය ජනයා අතර ප්‍රචලිත කරන තුරුම, මැලේසියානු බෞද්ධයන් වෙසක් උත්සවය සැමරුවේ කලාතුරකිනි. උන්වහන්සේ එක්දහස් නවසිය පනස් ගණන්වලදී  බ්‍රිතාන්‍ය රජයට වෙසක් දිනය රජයේ නිවාඩු දිනයක් කරන ලෙස අභියාචනා කිරීම ආරම්භ කළහ. සිංගප්පූරු ජාතිකයන් බහුතරයක් තමන් බෞද්ධයන් බව සැමවිටම හඳුනාගත්තත්, 1947 වනතුරුම වෙසක් උත්සවය රජයේ නිවාඩු දිනයක් බවට පත්කර ගැනීමට කිසිදු පුද්ගලයෙකු ක්‍රියාත්මක වූයේ නැත. ඉල්ලීම් කිහිපයක් සිදු කිරීමෙන් අනතුරුව, 1950දී රජය වෙසක් දිනය රජයේ නිවාඩු දිනයක් කිරීම සඳහා කොමිටියක් පත්කරන ලදී. නමුත් ඒ

සඳහා මහජන සහයෝගය ලැබුණේ ස්වල්ප වශයෙනි. එය රජයේ නිවාඩු දිනයක් බවට පත් වූයේ 1955 දීය.

අවධානයට ගතයුතු කරුණ නම්, බුදුපියාණන් වහන්සේගේ උපත, බුද්ධත්වයට පත්වීම සහ පරිනිර්වාණය බොහෝ බෞද්ධ පැරණි කාලයේ කෙසේ, කවර ආකාරයකින්, කවර නිශ්චිත කාලයක උත්සවාකාරයෙන් සැමරුවේද යන්න පිළිබඳව ඇත්තේ ඉතා ස්වල්ප තොරතුරු ප්‍රමාණයක් වීමයි. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව හැර අනික් රටවල ඒ පිළිබඳව වාර්තා කිසිවක් සඳහන් නොවේ. සුඇන්සැං (Xuanzang) නමැති චීන ජාතික වන්දනාකරු මෙම උත්සව බෞද්ධයන් සැමරුවේ කෙසේද යන්න සහ කවදා ද යන්න සම්බන්ධයෙන් සටහනක් තබා ඇත. "බෝධිසත්වයන් වහන්සේ වෙසාඛ මාසයේ දෙවන භාගයේ 8 වැනි දින උපත ලබා ඇත. නමුත් ස්ථවිර ගුරුකුලය දරන මතය වන්නේ එය සිදුවී ඇත්තේ වෙසාඛ මාසයේ දෙවැනි භාගයේ 15 වැනි දිනයේ බවයි. පැරණි වාර්තාවල සඳහන් වන්නේ බුදුපියාණන් වහන්සේ වෙසාඛ මාසයේ දෙවැනි භාගයේ 15 වැනි දිනයේ පරිනිර්වාණයට පත්වූ බවය. එහෙත් සරවස්ථිවාදී ගුරුකුලයට අනුව කාර්තික මාසයේ දෙවැනි භාගයේ 8 වැනි දින උන්වහන්සේ පිරිනිවන් පා වදාළහ. ඉන්දියානු දින දර්ශනයට අනුව තථාගතයන් වහන්සේ වෙසාඛ මාසයේ දෙවැනි භාගයේ 8 වැනි දිනයේ දී නිර්වාණ අවබෝධය ලැබූහ. නමුත් ස්ථවිර ගුරුකුලයට අනුව එය සිදුවී ඇත්තේ වෙසාඛ මාසයේ දෙවැනි භාගයේ 15 වැනි දිනයි.

ඒ නිසා මහායාන සහ ස්ථවිරවාදීන් (ථේරවාදයේ ඉන්දියානු සංස්කරණය) අතර, මෙම සිදුවීම්වල මාස නොව, දින වකවානු පිළිබඳව එකඟතාවක් නොවූ බව පෙනේ. සුඇන්සැං (Xuanzang) මෙම උත්සව සැමරීම සිදුකළ ආකාරය පිළිබඳව නිශ්චිත තොරතුරක් ලබා දී නැත. කෙසේ නමුත්, බුද්ධ ගයාවේදී සිදු කළ වෙසක් සැමරීම පිළිබඳව, ඔහු යම් දෙයක් කියා ඇත. "සෑම වර්ෂයකම එම දිනයේදී විවිධ රටවල අධිරාජයන්, ප්‍රදේශවල භික්ෂූන් සහ ගිහි පිරිස, සිය දහස් ගණනින් මේ ස්ථානයේ රැස්වී, සංගීතයට ගැළපෙන ආකාරයට සුවඳ ගැල්වූ ජලය සහ කිරිවලින් බෝධිය නාවමින්, නිරන්තරව මල් සහ පහන් දල්වමින් එකිනෙක ඉස්මතුවීමට තරම් බෝධියට පූජා කරති."

පස්වන ශතවර්ෂය ආරම්භයේ මුල් යුගයේදී පැට්නා නගරයේ වෙසාඛ සැමරූ ආකාරය පාහියන් නමැති චීන ජාතික වන්දනාකරුවෙක් තහවුරු කළේය. "දෙවන මාසයේ (වෙසාඛ) 8 වන දිනයේදී පින්තූර රැගත් පෙරහැරක්

පැවැත්වෙයි. ඔවුහු රෝද හතරකින් යුත් වාහනයක් නිර්මාණය කර, ඒ මත ලණුවලින් උණබම්බු ගැටගසා, පස් මහල් කුලුනක් ගොඩනගති. මැද පිහිටි කණුවකින් එයට ආධාර සැපයේ. එය ස්තූපයක් ලෙස දර්ශනය වේ. අනතුරුව ඔවුහු එය තුනී ලිනන් රෙදිවලින් ආවරණය කර, පසුව වර්ණවත් පාට ආලේප කරති. දෙවිවරුන්ගේ රූප නිර්මාණය කර, ඒවා රනින් සහ රිදියෙන් සරසා අනතුරුව එම්බ්‍රොයිඩර් කරන ලද සිල්ක් රෙදිවලින් සැරසූ උඩුවියන් යට මෙම රූප තබති; ඊටත් අනතුරුව වාහනයේ සිවු කොනෙහි බුදුකුටි තනති; වාඩිගත් ඉරියව්වෙන් සිටින බුදු පිළිම, දෙපසෙහි බෝසත් පිළිම ද සහිතව ඒවා තුළ තබති. එවැනි රථ 20ක් පමණ තරමක් වෙනස් ආකාරයට සරසා තිබේ. පෙරහැර පවත්වන දින භික්ෂූන් සහ ගිහි පිරිස විශාල සංඛ්‍යාවක් පිරිත් සජ්ඣායනය කරමින්, සංගීතය සහ මල් පූජා පවත්වමින් සහභාගි වෙති. බ්‍රහ්මචාරීන්ගේ (එම දිනයට දශ ශීලය ආරක්ෂා කරන ගිහි පිරිස) ආරාධනය මත, මෙම වාහන නගරයට පැමිණ ඊට පසු නතර වෙයි. රාත්‍රිය පුරාම විවිධ ප්‍රදේශවලින් පැමිණෙන පිරිස පිරිත් සහ සංගීතය සජ්ඣායනය කරති. මෙය ඉතාම සිත් ඇදගන්නා සුලු දෙයකි, එය තවමත් නේපාලයේ සහ ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල පැවැත්වෙන අශ්වකරත්ත උත්සව පිළිබඳ පැරණිතම සඳහනකි.

ශ්‍රී ලංකාවේ වෙසක් සැමරීම සම්බන්ධයෙන් මුල්ම යොමුව ක්‍රිස්තු පූර්ව පළමුවෙනි ශතවර්ෂය තෙක් දිවයයි. එය ඉතාමත් විශාල, සමහර විට විශාලතම ආගමික උත්සවය විය හැකිය. මහාවංශයේ රජවරුන් සැමරූ වෙසක් උත්සව සංඛ්‍යාව අනුව ඇතැම් රජවරුන්ගේ පාලනය තක්සේරු කෙරෙයි. නමුත් වංශ කථාවල එම සැමරුම් කිනම් ස්වරූපයකින් සිදුවූයේද යන්න පිළිබඳව නිශ්චිතව තොරතුරු නැත. II වැනි සේන රජුගේ කාලයේ "වෙසක් උත්සවය දුප්පතුන්ට ආහාර, බීම සහ ඇඳුම් ඔවුන් කැමති ආකාරයට" ලබාදෙමින් සැමරූ බව මහාවංශයේ සඳහන් වේ. 5 වන ශතවර්ෂය ආරම්භයේදී පාහියන් නමැති චීන ජාතික වන්දනාකරු ශ්‍රී ලංකාවේ වසර දෙකක් ගතකළ බව සඳහන් වේ. ඔහු දළදා උත්සවයක් ඇසින් දැක ඇත. මෙම උත්සවයේදී සම්පූර්ණයෙන්ම ජීවමාන ආකාරයට පෙනෙන", විශාල සහ දීප්තිමත් වර්ණවලින් නිමැවූ සියලු ජාතක කථා දර්ශන, නගරයේ පාර දෙපස පිහිටුවා තිබී ඇත. නැවතත්, වර්තමානයේ ශ්‍රී ලංකාවේ වෙසක් උත්සවය සමරන ආකාරය පිළිබඳව මෙය හොඳ සටහනක් නිසා ඉතා වැදගත් වේ. බොහෝ නගර සහ පුරවරවල, ප්‍රධාන මංසන්ධිවල, විශාල තුනීලෑලි මත ජාතක කථා හෝ බුදුපියාණන් වහන්සේගේ ජීවිත කථාවේ සිද්ධීන් චිත්‍රවලට

නගා ස්ථාපිත කර ඇත. අද කාලයේ හඳුන්වන තොරන් මෙන් විදුලි බුබුළු දහස් ගණනින් දල්වා තිබුණි. සමහර රූප එහා මෙහා යන අතර, ශබ්දවිකාශන යන්ත්‍රයකින් සෑම කථාවක්ම පැහැදිලි කරන ලදී. පාහියන්ගේ කාලයේදී පොල්තෙල් පහන් දල්වන්නට ඇතැයි සිතිය හැකිය.

මෑත දශකවලදී ප්‍රචලිත සහ ජනප්‍රියවූ පුරුද්දක් නම්, සිද්ධාර්ථ කුමාරයාගේ කුඩා කල පිළිමයක් තබා ගෙන එයට ජලය ඇල කිරීමයි. සිද්ධාර්ථ කුමාරයා උපත ලැබූ විට උන්වහන්සේ සේදීම සඳහා ජලය අහසින් වැටීම යන ජනකථාව ප්‍රතිනිර්මාණය කිරීමක් ලෙස මෙය සිදුවේ. මෙය බුදුපියාණන් වහන්සේට ගෞරව කිරීමට ඉතා හොඳ ක්‍රමයකි. එසේම දරුවන්ට සහභාගි විය හැකි අවස්ථාවකි. නමුත් ශ්‍රී ලාංකේය ඉතිහාසයට එහි පූර්වාදර්ශයක් නැත. ජපානයෙන් ඇරඹුණු එය දශක ගණනාවකට පෙර හඳුන්වා දෙනු ලැබුණි.

# 02.බුදුපියාණන් වහන්සේගේ දැහැටි කූර පිළිබඳව විමසීම

"බුදුන් වහන්සේගේ ධර්මය ගැඹුරු වූ ද, වටහා ගැනීමට අසීරු වූ ද, බුද්ධිමතුන්ට පමණක් ළං විය හැකි වූ ද, හොඳ විචාර බුද්ධියක් ඇතිව උඩුගං බලා පිහිනීමක් බඳු (පටිසෝතගාමී) එකකැයි" ද සාමාන්‍යයෙන් සිතන්නට අපි පුරුදු වී සිටිමු. බුදුපියාණන් වහන්සේම උන්වහන්සේගේ ධර්මය එවැන්නක් ලෙස පැහැදිලි කර තිබේ. තවදුරටත් අපි දහම පරීක්ෂා කරන විට, ඕනෑම නූතන දාර්ශනිකයකු හෝ නූතන මනෝ විද්‍යාඥයකු මෙන් පරිපූර්ණ ලෙස අපගේ ජීවිතය සහ දෛවය සම්බන්ධයෙන් ඉතා වැදගත් ප්‍රශ්න වටහා ගැනීමට බුද්ධ ධර්මය කටයුතු කරයි. එහෙත්, මෙය සත්‍යයක් වන අතරවාරයේ බුදුන් වහන්සේ එපමණ උසස් නොවූව ද තව දුරටත් වැදගත් වූ ප්‍රශ්න; සාමාන්‍ය ජනයාට අදාළ වූ ප්‍රශ්න, පිළිබඳව සාකච්ඡා කළහ ... ඒ ජනයා ප්‍රඥාව ලැබූවන් වුව ද, නොවූව ද, මහාචාර්යවරුන්, තැපැල්කරුවන්, ගැමියන් වුව ද එය ඒ හා සමානව ම වැදගත් විය. ඉහළින් අඩු, එහෙත්, ධර්මයෙන් වැදගත් කරුණක් පිළිබඳව උදාහරණයක් ලෙස, දන්ත සෞඛ්‍යය පිළිබඳව බුදුපියාණන් වහන්සේ දේශනා කළ බව දැක්විය හැකිය. "දන්ත සෞඛ්‍යය!" යමෙකු අසන්නට පුළුවනි. ධර්මය පුහුණු කිරීමේදී දන්ත සෞඛ්‍යයට ඇති ක්‍රියාව කුමක්ද? හොඳයි, ඔබ ඒ ගැන සිතන විට බොහෝ දේ ඇත. මහත් කම්පනයකින් යුතු දත් කැක්කුමක් තිබෙන විට ඔබට ධර්ම දේශනාවකට සිත යොමු කිරීම සිතින් මවා ගත හැකිද? රහතන් වහන්සේ නමක් ඔබට බෙදා දෙන්නට උත්සාහ කරන සියල්ල ... උන්වහන්සේගේ මුවෙන් අප්‍රසන්න ප්‍රශ්වාසයක් පමණක් ඔබ සිත තුළට එන්නේ නම් ඔබට ඒ දේශනාව ලබාගත හැකිද?

ඕනෑම පුද්ගලයෙකුට, ඕනෑම වේලාවක, ඕනෑම ස්ථානයකදී ධර්මය පුහුණු කළ හැකි බව බුදුපියාණන් වහන්සේ වදාළහ. නමුත්, ධර්මය උපරිමයෙන් උකහා ගැනීමේ හැකියාව ඇතිවීමට, පුහුණු වීමට සහ සාර්ථකව අරමුණට පත්වීමේ අවස්ථා ලබා ගැනීමට කොන්දේසි පහක් තිබෙන බවද උන්වහන්සේ පැහැදිලි කළහ. මෙම කොන්දේසි නම් ... යමෙකු තරුණ නම්, යමෙකුට යහපත් සෞඛ්‍යයක් තිබේ නම්, යමෙකුට ප්‍රමාණවත් ආහාර තිබේ නම්, රට සාමයෙන් පවතී නම් සහ අවසානයේ සංඝයා එක්සත් නම් යනාදියයි. රෝගී පුද්ගලයෙකුටද ධර්මය පුහුණු කළ හැකිය, බුදුපියාණන් වහන්සේ සඳහන් කළ ආකාරයට "ඔබ ධර්මය පුරුදු කළ යුත්තේ මෙසේ සිතමින්ය. මගේ ශරීරය රෝගී වුවත්, මගේ මනස රෝගී නොවේ." මෙය සිතේ තබා ගත් විට, නිතර පවතින රෝගවලින්, කම්කටොලුවලින් සහ අසහනයෙන් නිදහස් වූ විට කිසිම සැකයකින් තොරව ඕනෑම දෙයක් ලබා ගැනීමට ඔබට

පහසු වේ. බුදුපියාණන් වහන්සේ භික්ෂු භික්ෂුණීන්ට සවස් වරුවේ ආහාර නොගැනීමට උපදෙස් දුන්නේ, එයින් සෞඛ්‍යයට ඇති ප්‍රයෝජනය නිසාය. උන්වහන්සේ මෙසේ වදාළහ: "මම හවසට ආහාර නොගනිමි. ඒ නිසා මම රෝගවලින් සහ පීඩාවලින් නිදහස් වෙමි. සෞඛ්‍යය, ශක්තිය සහ පහසුව විඳිමි." පැහැදිලිවම, බුදුපියාණන් වහන්සේ යහපත් සෞඛ්‍යයේ ප්‍රයෝජනය අගය කළහ.

අංගුත්තර නිකායේ, ස්වල්ප වශයෙන් අවධානයට යොමු වූ සූත්‍රයක, අඛණ්ඩව අපගේ දත් පිරිසිදු කිරීමට බුදුපියාණන් වහන්සේ අවවාද කළ අතර, එසේ කිරීමෙන් ලැබෙන ප්‍රයෝජනද සඳහන් කළහ. එම  සූත්‍රයේ මෙසේ සඳහන් වී ඇත: "දත් බුරුසුවක් භාවිත කිරීමේ ප්‍රයෝජන පහක් තිබේ. ඒ පහ මොනවාද? එය ඇස්වලට හොඳයි, දුගඳක් පිට නොවේ. අංකුර බද්ධ පිරිසිදු වේ, පිත සහ සෙම ආහාර හා මුසු නොවේ, ආහාර වඩා හොඳින් රස දැනේ. දත් බුරුසුවක් භාවිත කිරීමේ ප්‍රයෝජන පහ මේවායි." (A.111.250) පැරණි ඊජිප්තුවේ සහ බැබිලෝනියාවේ මූලාශ්‍ර  දත් පිරිසිදු කිරීම පිළිබඳව සඳහන් කර ඇත. නමුත්, දන්ත සෞඛ්‍යය පිළිබඳව මුල්ම දැන ගැනීමට ලැබුණු සඳහන් කිරීම මෙයයි.

බුදුපියාණන් වහන්සේට මෙහිදී සඳහන් කිරීමට ඇති දේ විමසීම වැදගත්ය. ඇස් සහ මුඛය අතර සම්බන්ධයක් තිබේද? සැබැවින්ම තිබේ. මුඛයේ ඇතිවන ආසාදනයක් හක්ක හරහා අස්ථි සහ පටකවලින්   සෑදුණු නාස් කුහරයට පැතිරීමෙන් හිස් කබලේ ඉදිමුමක් ඇති විය හැකි අතර, එයින් හිසරදය, ඇස් පිටුපස වේදනාව සහ පීඩනයක් ඇති කළ හැකිය.

යහපත් දන්ත සෞඛ්‍යක් තුළින් ඇතිවන දෙවන ප්‍රයෝජනය නම්, අංකුර බද්ධ, වාග්මය පිටිකාවන් හෝ පාලියෙන් හඳුන්වන රසහරණීය පිරිසිදු වීමයි. අංකුර බද්ධයන් 7000ක් තිබෙන බව කුස ජාතකයේ (531) සඳහන් වේ. ඒවා සාමාන්‍ය මිනිස් දිවක තිබෙන බවට නූතන ගණනයට, එනම්, 2000 සහ 8000 සම්පූර්ණයෙන්ම සමාන වේ. දත් පිරිසිදු කළ විට දිව මත නිතරම සකස් වන සුදු වර්ණ පටලයන් සහ කට ගඳ ගහන හෙවත් දුගඳ නැති වේ. එසේම, සැබැවින්ම නැවුම් සහ පිරිසිදු මුඛයක් ආහාරයේ රසය සම්පූර්ණයෙන්ම අත්විඳීමට සහ ඇගයීමට අවස්ථාව සලසයි.

සුශෘතසංහිතා, නමැති ආයුර්වේදයේ ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයේ කොටස් බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ස්වල්පයකට පසුව, දන්තශෝධන චූර්න නමැති දෙයක් පිළිබඳව සඳහන් කර ඇති අතර, එය

දන්තාලේපයක් විය යුතුය. බුදුපියාණන් වහන්සේ ඒ පිළිබඳව සඳහනක් නොකළ නමුත්. සමහරවිට උන්වහන්සේගේ කාලයේත් මෙය භාවිතයේ තිබෙන්නට ඉඩ ඇත. සුශෘතසංහිතාවෙහි ද දිව පිරිසිදු කිරීම (ජීවනිර්ලේඛන) ගැනද පැහැදිලි කරයි. දිව මත සමහර විට මතුවන සුදු වර්ණ පටල ඉවත් කිරීම සඳහා තුනී වානේ පතුරක් ඉහළට පහළට ගෙන යාමේ පුරුද්දක්ද තිබුණි. බුදුපියාණන් වහන්සේ මෙයද සඳහන් කර නැත.

මුඛ සෞඛ්‍යය රැකීම සඳහා බුදුපියාණන් වහන්සේ සඳහන් කර ඇති එකම උපකරණය දැහැටි කූරයි. එහි පදගතය, දත් කූර (දන්තකට්ඨ) යි. මෙය යම් ගසක කෝටු කැබැල්ලක්, දත් කූරක් හෝ යම් ආකාරයකින් දත් පිරිසිදු කිරීමට භාවිත කරන්නට යොදා ගත්තා විය යුතුයි. නමුත්, එවැනි කෝටු කැබලි හෝ කෝටු කුමන ගසින් ලබා ගත්තේද? මිනිසුන් ආහාරයට පසු නාග වැල් කෝටු  නාග ලතා  සැපීම සිදු කළ බව ජාතක කථාවේ සඳහන් වෙයි. මෙය බොහෝ දුරට බුලත් වැල් (පයිපර් බීට්ල්) වලට සමාන විය හැකි අතර, එහි කහට සහ මුදු ලෙස උත්තේජක යුෂයක් ඇත. එවැනි කෝටු මුඛ උත්තේජකයක් ලෙස භාවිත කරන්නට ඉඩ ඇති නමුත්, ඉතා මුදු සහ පටලයකින් වැසුණු නිසා බුරුසුවක් ලෙස භාවිතය සීමාසහිත විය හැකිය. දත් බුරුසුවක් ගස් වර්ග හතරකින් නිපදවිය හැකි බව සුශෘතසංහිතාවෙහි සඳහන් කර ඇත. ඒ නිම්බ, ඛදිර මණ්ඩූක හෝ කරන්ජ යි. මේ ගස් හතර, කොහොඹ ගස (අසදිරච්ට ඉන්ඩිකා), දෙවැන්න, සුදු කහ මැලියම් සහිත ගස - අකාසියා කටේචු, ඊළඟට මීපැණි ගසත් (බාසියා ලතාෆොලියා), අවසානයට ඉන්ඩියන් බීච් (පොන්ගාමියාගල්බ්‍රා) ගසත්ය. මේ අතරින් බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළ දත්කූර කුමක්ද?

7වන ශතවර්ෂයේදී චීන ජාතික සුඅැංසැං (Xuanzang) නමැති භික්ෂුව ඉන්දියාවේ සිටින විට ඔහු එක් ආශ්‍රමයකට වැඩම කළ අවස්ථාවේදී, එහි තිබූ ගසක් දැක, එය බුදුපියාණන් වහන්සේ දත් පිරිසිදු කිරීමට කෝටු ලබගත් ගස් වර්ගය බව හැඳිනගෙන ඇත. මේ භික්ෂුව සඳහන් කරන ආකාරයට එම ගස විලෝ ගසයි. එහි ඉන්දියානු නම ඔහු දැන සිටියේ නැත. ඔහු සහ ඔහුගේ චීන පාඨකයන් හුදෙක් හුරුව සිටියේ එය වෙනත් නමකින් ආමන්ත්‍රණය කිරීමටයි.

වර්තමානයේ ඉන්දියාවේ වඩා බහුල ලෙස දත් පිරිසිදු කිරීම සිදු කරනු ලබන්නේ කොහොඹ කෝටු සැපීමෙන්ය. නමුත් එම පුරුද්ද ඉතා ශීඝ්‍රයෙන් නව පන්නයේ ප්ලාස්ටික් පරිවර්තනයකට ආදේශ වෙමින් පවතී. විශාල නගරවල පවා, අලුයම කොහොඹ කෝටු  ක්‍රමානුකූලව ගොඩ ගසා, අලෙවි

කිරීම සඳහා තිබීම සාමාන්‍ය දර්ශනයකි. ඒ අතර මිනිසුන් ඒ අවට ක්‍රියාශීලීව ඒවා සපමින් සිටගෙන සිටීමද සුලබ දර්ශනයකි. මේවා භාවිත කරන සාමාන්‍ය ක්‍රමය නම් කෝටුවේ එක් පැත්තක් ගෙවී යනතුරුම සපා, ඊට පසු දත් සහ විදුරුමස් මත උඩට සහ පහළට ඇතිල්ලීමයි. ගම්බද ප්‍රදේශවල තිබෙන එකම දැහැටි කුරු වර්ගය කොහොඹ කෝටු පමණි. අනුමාන වශයෙන් බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළ දත්කූරු කොහොඹ කූරු පමණි. එසේ නම් එය ඉතා හොඳ තෝරා ගැනීමකි. අතීශයින් තිත්ත රසයෙන් යුතු කොහොඹ යුෂවල ඉතා දැඩි දිලීර සහ බැක්ටීරියා නාශක ගුණාංග අඩංගු වේ. උඩට සහ පහළට කූරෙන් ඇතිල්ලීම වැදගත් වනවා පමණක් නොව, එයින් දත් මත සහ දත් අතර ඇතිවන මැලියම් ඉවත් කරයි. එසේම එයින් විදුරුමස් උත්තේජනය ඇතිකරයි. ඒ නිසා බුදුපියාණන් වහන්සේගේ දැහැටි කූර කොහොඹ ගසින් නිමවූවක් විය යුතුය.

# 03.බුද්ධ ධර්මය, ගස් සහ වනාන්තර

මාර්තු 21 දින ජාත්‍යන්තර වනාන්තර දිනයයි. මෙම දිනයේ සහ ඒ හා සමාන "ජාත්‍යන්තර දිනවල" ඒවා සංවිධානය කරන කමිටු, විවිධ මට්ටමේ සාර්ථකත්වයන් සහ අඩු වැඩිවන මට්ටමේ උද්යෝගයක් සමඟ හැකි තරම් සමාජයේ කොට්ඨාස ඒ සඳහා සහභාගී කර ගැනීමට උත්සාහ දරති. ආගමික නායකයෝ සහ ආයතනද සාමාන්‍යයෙන් උපකාර ලබා ගැනීමට යොදවා ගනිති. පෙර කී ලෙස, සමාජයේ ආගමට තිබෙන බලපෑම මෙයින් තේරුම් ගත හැකිය. අදාළ කරුණු පිළිබඳව සමහර ආගම්වල අර්ථවත් දේ පවසන්නට තිබේ. තමන්ට කළ හැකි හොඳම දේ නොකරන අය, අඩුම තරමින් කෙතරම් ඒත්තු ගැන්වීමට නොහැකි වුවත් හෝ බලපෑම් කළත්, ඒවා සැලකිල්ලට නොගෙන අදාළ යමක් කියති. ජාත්‍යන්තර වනාන්තර දිනය සම්බන්ධයෙන් සුළු ආගම් ප්‍රමාණයකට බුද්ධ ධර්මයට වඩා වනාන්තර සහ ගස් පිළිබඳව කියන්නට අර්ථවත් දේ තිබිය හැකිය. විද්‍යමාන ධර්මයට අමතරව, සැබෑ ධර්මය වූ ත්‍රිපිටකය, බෞද්ධ ග්‍රන්ථ, සාමාන්‍යයෙන් පැළෑටි පිළිබඳව බොහෝ දේ පවසයි. විශේෂයෙන්, වනාන්තර සහ ගස් පිළිබඳව, වෙනත් කිසිම විෂයකට වඩා තොරතුරු දක්වයි.

ඇත්ත වශයෙන්ම, සිතට නැගෙන පළමු දේ, බුදුපියාණන් වහන්සේගේ ගස් සමඟ තිබූ සමීප සම්බන්ධයයි. උන්වහන්සේ ගසක් යට උපත ලැබීම, ඉවුජීනියා ජම්බෝලලා ගසක් යට මුල්කාලීන ආධ්‍යාතමික අත්දැකීමක් ලැබීම, ෆිකස් රෙලිජියෝසා ගසක් යට බුද්ධත්වයට පත්වීම, සහ ශොරේයා රොබුස්ටා ගස් දෙකක් යට පරිනිර්වාණයට පත්වීම ආදියයි. නමුත්, බුදුපියාණන් වහන්සේ හෝ බුද්ධ ධර්මය හා ගස් අතර තිබූ ඉතාම වැදගත් සම්බන්ධය මෙය යයි සිතීම වැරදීමකි. ක්‍රිස්තු පූර්ව 320ට ආසන්නව ග්‍රීක ජාතික විද්‍යාඥයකවූ තියොෆරස්ටස් පැළෑටියේ ඉතිහාසය නමැති ග්‍රන්ථය, උද්භිද විද්‍යාව විද්‍යාවක් වශයෙන් හැඳින්වීමේ ආරම්භය ලෙස සාමාන්‍යයෙන් උපකල්පනය කරනු ලැබේ. එය හොඳ හේතුවකි. කෙසේ නමුත්, උද්භිද විද්‍යාවට අදාළ විමසීම් සහ පැළෑටි පිළිබඳව සිතීමට උත්සාහ කිරීම් ආරම්භ වූයේ, බුදුපියාණන් වහන්සේට පෙර, අඩුම වශයෙන් ශතවර්ෂ දෙකකට පෙර බව ත්‍රිපිටකය පෙන්වා දෙයි. එසේම, මුල් කාලීන බෞද්ධයන්, ග්‍රීක ජාතිකයන් තරමටම ක්‍රමවත් නොවන බව සත්‍යයකි. කෙසේ නමුත් ඔවුන් විචාරශීලීයි.

බුදුපියාණන් වහන්සේ පැළෑටි, ඖෂධීය ශාක, තණ හෝ කැලෑ ගස් (ඕසධී, තිණ සහ වනස්පතී) වශයෙන් වර්ගීකරණය කළහ. අනෙක් අවස්ථාවල උන්වහන්සේ ඒවා බෝවීම අනුව වර්ගීකරණය කළහ: ඒවා අලවලින් (මූල), කඳින් (ඛන්ධ), පුරුක් (ඵුල්ලා), රිකිලි (අග්ග) හෝ ඇට (බීජ) යනුවෙන් පැළෑටි

එක් ප්‍රාණ ඉන්ද්‍රියක් (ඒකින්ද්‍රිය) ලෙස උන්වහන්සේ සැලකූ සේක. ඒවාට අදාළ වන්නේ කිනම් ඉන්ද්‍රියක්ද කියා උන්වහන්සේ සඳහන් නොකළත්, උන්වහන්සේ පාරිසරික උත්තේජනයට අනුව පැළෑටිවල සංචලනය සහ ජීව ආවර්තනය අඟවන්නට ඇත. උදාහරණ වශයෙන්, සමහර මල් රාත්‍රියට වැසෙන ආකාරය සහ දහවල් කාලයේ විවෘත වන ආකාරය සහ අනෙක් මල් ඉරු එළියට මුහුණ දීමට එහා මෙහා වන්නේ කෙසේද කියාය.

ජාතක කථාවල අපට ගස් පිළිබඳව නිර්වචනය කිරීමට මුල්කාලීන ප්‍රයත්නයක් ඇත: "එයට අතු තිබෙන නිසා, එය ගසක් යනුවෙන් හඳුන්වනු ලබයි. අතු නොමැතිව, එය හුදෙක් ඉන්නකි. එකිනෙකට ආසන්න දුර ප්‍රමාණයක වැඩෙන ගස් රාශියක්" වනාන්තරයක් ලෙස පරමත්ථජෝතිකාවෙහි නිර්වචනය කර තිබේ. බුදුපියාණන් වහන්සේ හඳුන්වන ආකාරයට ගස්වල සමහර ව්‍යුහමය කොටස් සහ අනෙක් කොටස්වලට මුල් (මූල), කඳ (දණ්ඩ හෝ ඛන්ධ) ශාඛ යුෂ හෝ පිට පොත්ත (පපටිකා), නම්‍ය කෙඳි සහිත පටක හෝ ඇතුළත පොත්ත (තච), නොමේරූ ලීය (ඵෙග්ගු) ඇතුළත ලීය (සාර), අතු (සාඛ), කුඩා රිකිලි (පසාඛ), කොළ (පණ්ණා) හෝ (පත්ත) සහ මුඳුන (අග්ග) යනුවෙන් ඇතුළත් වේ. එසේම පහළට වටවූ ඇට (තුලා) කොපුවකින් ආවරණය වී ඇති සමහර ඇට සහිත කරල් (සිපටිකා) පිළිබඳවද සඳහනක් ඇත. මුල්, ගස්වල එම කොටස් සහ ඒවාට ආධාර දෙන සහ ජලය සහ පෝෂණය උරාගෙන ප්‍රවාහනය කරන වෙනත් පැළෑටි හඳුනාගෙන විස්තර කර ඇත. සඳහන් කළ සමහර විවිධ මුල් පද්ධතිවලට, දිගු හෝ කෙටි (දීඝමූල සහ රස්සමූල), අග සිහින්වූ මුල් සහ ආංශික මුල් (මූලානි අභොගමානියානි තිරියංගමානි), පෝෂණය ලබා දෙන මුල් (නාලි), ව්‍යාප්තවන මුල් (මූලසන්තනක), සහ පැල්ම ඇති මුල් (මත්තනි) යනාදි වන ගහන මුල් ඇතුළත් වේ. නුග ගස්වල තිබෙන උස්ව පිහිටි මුල් "ට්‍රන්ක්-ස්ප්‍රන්ග්" (ඛන්ධජ ) නමින් සුත්තනිපාතයේ හඳුන්වා ඇත. ගහේ මුල් තෙතමනය සහ පෝෂණය පසෙන් උරා ගෙන ශාක යුෂ (ඕජා) කඳ හරහා අතුවලට සහ කොළවලට උරා ගන්නා බව අවබෝධ කරගෙන ඇත. විශුද්ධිමග්ගයේ මෙසේ සඳහන් වේ: "විශාල ගසක් හියුමස්වල සාරයෙන් පෝෂණය වෙමින් පොළොව මත වැවෙන විට, නිසි තත්ත්වයට පැමිණෙන විට, එහි මුල් සහ කඳ, අතු සහ රිකිලි, පත්‍ර, මල් සහ පලතුරු වැඩෙන අතර, ගසේ වර්ගය කල්පයක අවසානය දක්වා නොනැවතී අහස පුරවමින් වැඩෙයි. හියුමස්වල සාරය මුල්වල පමණක් තිබේ යැයි කෙනෙකුට කිව නොහැක, නමුත්, කඳේ හෝ පලතුරේ තිබිය නොහැක. නමුත් කඳේ නැත. ඒ ඇයි? එයට හේතුව, මුල්වලට උඩින් මුළු ගස පුරාම පැතිර යන නිසාය."

මල්, මල් හට ගන්නා පැළෑටිවල ප්‍රජනන ව්‍යුහය විස්තරාත්මකව පරීක්ෂා කරන ලදී. සෑම කොටසක්ම, නම් කර විස්තර කරන ලදී. ඒ අනුව, කඳ (දණ්ඩ හෝ වන්ත, අන්කුරය (කෝරක), පෙති (පට්ට හෝ දළ), පොහොට්ටුව (ගබ්භා), කේසරය (කන්ජක්ඛා), පලතුරක ඇටයෙන් පිට මදය (කන්නිකා) සහ රොන් (රේණු) යනුවෙන් ත්‍රිපිටකයේ සඳහන් වේ. එවැනි සැලකිල්ලෙන් සිදු කළ නිරීක්ෂණ තිබියදීත් බෞද්ධයන් හෝ අනෙක් පැරණි ඉන්දියානුවන් මෙම කොටස්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව තේරුම් ගත්තේ නැත. ජාතකවලට අනුව, මල් වර්ග දෙකකට බෙදේ. ඒ පොළොවේ සහ ජලයේ වැවෙන වශයෙනි. නමුත් ඇතැම් විට තවත් වර්ග දෙකක් එකතු වේ, ඒ වැල් මත වැවෙන සහ ගස්වල කඳෙහි හෝ අතුවල වැවෙන වශයෙනි.

සැමවිටම ඉතා ප්‍රවේසමින් නිරීක්ෂණය කරන්නකු වශයෙන්, බුදුපියාණන් වහන්සේ, "කපා දමන ලද ගසක් එහි මුලට හානියක් වී නොමැති නම්, සම්පූර්ණව තිබේ නම්, නැවත වැවෙන බව දැන ගත්හ. (Dhp. 338) කෙසේ නමුත්, සමහර පැළෑටි, විශේෂයෙන්ම පාම් ගස් "මුලෙන්ම කපා දැම්මත්" නැවත වැවෙන්නට පුළුවන් බවත් උන්වහන්සේ නිරීක්ෂණය කළ සේක.

යැදීම්වලට පිළිතුරු ලබා දිය හැකි දෙවිවරුන් ගස්වලට අරක් ගෙන සිටින බව පැරණි ඉන්දියානුවන් මෙන්ම, ඔවුන්ගෙන් පැවත එන්නෝද පුළුල් ලෙස විශ්වාස කළහ. ග්‍රීක ජාතිකයන්ටත් එවැනිම විශ්වාස තිබූ අතර, ඔවුහු ගස් අරක් ගත් දෙවිවරුන් රුක් දෙවියන් ලෙස හැඳින්වූහ. පාලියෙන් ඔවුන් ඇමතුවේ රුක්ඛදේවතා, වනදේවතා හෝ ආරාමදේවතා යනුවෙනි. බුදුපියාණන් වහන්සේ ඉඳහිට දෙවියන් වැඳීම සම්බන්ධයෙන් පැහැදිලි කළ ආකාරයටම, ත්‍රිපිටකයේද කිසිම තැනක රුක්ෂ වන්දනා අනුමත කර නැත. ධම්මපදයේ 188.9 පැදිවලින් උන්වහන්සේ මෙසේ සඳහන් කළ සේකඃ "බියෙන් ඇලලී ගිය මිනිස්සු පූජනීය කඳු, කැලෑ, වදුලු, ගස් සහ සිද්ධස්ථානවලට යති. නමුත් මේවා ආරක්ෂිත සරණක් නොවේ; හොඳම සරණත් නොවේ. එවැනි තැන්වලට ගොස් යමෙක් සියලු කරදරවලින් නිදහස් නොවේ." විනය පිටකයේද උන්වහන්සේ මෙසේ පවසතිඃ "ගහක ජීවිතයක් (භූතයන් හෝ දෙවිවරුන්) ඇතැයි මිනිස්සු සාමාන්‍යයෙන් සිතති", මෙය පුළුල් ලෙස පැතිරුණු මතයක් බවත්, තමන් එය පිළිනොගන්නා බව උන්වහන්සේ ඇඟවූහ. ගස් වැඳීම, බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම නිසා පැහැදිලිවම ඇතිවූ බලපෑම, බොහෝ ජාතක කථාවන්හි ගස් වැඳීම උසුළු විසුළුවලට ලක් කරන ලදී.

බුදුපියාණන් වහන්සේ ගස් සහ වෙනත් පැළෑටි පිළිබඳව පරීක්ෂාවෙන් විමසිලිමත් වූවෙකු පමණක් නොව, ඒවා පිළිබඳව උන්වහන්සේට ගෞරවයක් සහ ළබැඳියාවක් තිබූ බව පෙනේ. යහපත් සහ නොමසුරු පුද්ගලයකු ගසකට සසඳමින් උන්වහන්සේ මෙසේ පැහැදිලි කළ සේක: කරුණාවෙන් සහ ආගන්තුක සත්කාරයෙන් හෙබි මෙම පුද්ගලයා "පාර දෙපැත්තේ වැඩෙමින්, විඩාවට පත් ගමන් කරන්නන් පිළිගනිමින් තමාගේ සිසිල් සෙවණින් ඔවුන්ගේ වෙහෙස සංසිඳවන යෝධ නුග ගසක් වගේ යි" පැවසූ සේක. එවැනිම සැසඳීමක් අවුරුදු 400කට පමණ පසු මිලින්ද පඤ්හ ග්‍රන්ථයේ සඳහන් වේ. "ගසක් එයින් ලබා දෙන සෙවණේ ප්‍රභේදයක් නොමැතිව මෙන්ම, භාවනා යෝගියකු කිසිම සත්ත්වයකු අතර ප්‍රභේදයක් ඇති නොකළ යුතුයි. ඒ වෙනුවට සොරුන්ට, මිනීමරුවන්ට, සතුරන්ට සහ තමන්ටත් එකසේ ආදරය වැඩිය යුතුයි." මුල් කාලීන බෞද්ධ ආකල්ප එසේ පවතින්නට ඇත. ගස්වලට නොවඳින්න, ගස් මෙන් ජීවත් වෙන්න!"

එසේම බුදුපියාණන් වහන්සේ ගස්වලට ගෞරව කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කථාන්තරයක් කියාදී ඇත. බොහෝ අතීතයේදී ජනප්‍රවාදයේ එන කෝරව්‍යා නමැති රජ කෙනෙකුට, ඔහුගේ රාජධානියේ අසාමාන්‍ය පැණි රසකින් යුතු පලතුරු හට ගන්නා නුග ගසක් තිබූ බව සඳහන් වේ. එම රාජධානියේ සිටි සැම දෙනාටම එම පලතුරු නොමිලේ රස විඳීමට හැකිවූ නිසා එම ගස ආරක්ෂා කිරීමට හේතුවක් ද නොතිබුණි. නමුත් එක් දිනක එක් මිනිසකු බඩ පිරෙන තුරු එම පලතුරු අනුභව කර, ගසේ අත්තක්ද කඩා යන්නට ගියේය. මෙම අකෘතඥතාව පිළිබඳව ගසට අරක්ගත් භූතයා ප්‍රකෝපව, තව දුරටත් ගසට එලදාව නැති වන්නට කටයුතු කළේය. ගස්වලට ගෞරව කිරීමේ ආකල්ප ජේතවත්ථුවේ මෙම අමතක නොවන වචනවලින් ප්‍රකාශ කර ඇත. "ගසක සෙවණේ වාඩිවන හෝ වැතිරෙන අයකු එහි අත්තක් වත් නොකැඩිය යුතුය, ඔහු එසේ කරන්නේ නම්, ඔහු මිතුරකු පාවාදෙන්නෙක් වේ, නපුරක් කරන්නෙක් වේ. ගසක සෙවණේ වාඩිවන හෝ වැතිරෙන අයකු එහි කොළයකට හෝ හානි නොකළ යුතුය. ඔහු එසේ කරන්නේ නම් මිත්‍රයකු පාවා දෙන්නෙක් වේ, නපුරක් කරන්නෙක් වේ." (Pv. 21.3-5) මෙවැනි වචන රටේ සැම කැලෑ ආරක්ෂක සහ ජාතික වන උද්‍යාන ඉදිරිපිට දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කළ යුතු නොවේද?

පසුකාලීනව, බෞද්ධ සාහිත්‍යය පුරාම ගස් පිළිබඳව සිත් පිනවන උද්ධෘතයන් පළ විය. පහත සඳහන් වන්නේ එයින් ස්වල්පයකි.

අශ්වඝෝෂගේ බුද්ධචරිත කාව්‍යයෙහි ආධ්‍යාත්මික පුරුදු කිරීම ගසකට සසඳා ඇත. "ගසක කෙඳි ඉවසීමට, මල් ගුණවත් බවට, අතු අවබෝධයට සහ ප්‍රඥාවට, අධිෂ්ඨානයෙන් මුල් බැසගෙන ධර්මය නමැති පලතුර එලදැරීම" මහාවස්තුවේ මෙසේ සඳහන් වේ; "යහපත් පුද්ගලයා නුග ගසක් සේ වැඩෙන අතර, යහපත් බවින් අල්ප පුද්ගලයා මහමග පැළ කරන ලද ගසක් මෙන් වැඩීමෙන් බාල වේ." වැදගත් සංස්කෘතික කවියකුවන ශාන්තිදේව, ඔහුගේ බෝධිචර්යාවතාර තුළින් වනාන්තර ජීවිතයේ සැනසීම කෙරෙහි ඔහුගේ ඇති ආශාව මෙසේ ලීවේයඃ "ගස් රළු වචන කථා නොකරයි. ප්‍රයෝගයෙන් සතුටු වන්නටද උත්සාහ නොකරයි. ගස් සමඟ සතුටින් ජීවත් වන්නට මට කවදා අවස්ථාව ලැබේවිද?" ගස් පිළිබඳව එතරම් කල් සිට පැවත එන උනන්දුව සහ සැලකිල්ල සමඟින් ජාත්‍යන්තර වනාන්තර දිනය සම්බන්ධයෙන් වගකීමක් ගැනීම සහ රටේ ගස්වලට අදාළ උරුමය රැකීම බෞද්ධයකු කළ යුතු එකම නිවැරදි දෙයය.

# 04.ඔබ කවරදාවත් නොදත් බුදුපියාණන් වහන්සේ

බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වී මාස කිහිපයකට පසු, අර්හත් ස්වාමීන් වහන්සේලා 500 නමක් රජගහ නුවරදී හමුවූ බවත්, පළමුවෙනි සංගායනාව (පඨම සංගීති) පැවැත්වූ බවත් ඉතාම පැරණි මූලාශ්‍රවලට අනුව සඳහන් වේ. මෙම සංගායනාව පැවැත්වීමේ හේතුව වූයේ, පෙර වර්ෂ 45 පුරා බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ ධර්මය අමතක නොකර ආරක්ෂා කර ගැනීමය. රහතන් වහන්සේලා සහ සමහර විට වෙනත් බොහෝ අයත්, පටලවා ගැනීමට හෝ අමතක කිරීමට නොහැකි තරම් වූ බුද්ධ ධර්මය, ඉතා වටිනා සහ ඉතා වැදගත් බව විශ්වාස කළහ. ධර්මය රහතන් වහන්සේලාට බොහෝ දේ ලබා දී ඇත, ඒ රහත් ඵලය ලබා ගැනීමට අවශ්‍ය මාර්ගයට යොමු කිරීමය. ඒ නිසා එකල සිටි අනෙක් අයටද ඊට පසු සදහටම අනෙක් අයටද එයින් ප්‍රයෝජනය ලබා ගැනීම හෙවත්, රහත් ඵලය ලබා ගෙන නිර්වාණයේ නිදහස සහ සැනසුම ලබා ගැනීමට උපකාර කිරීම සඳහා අවශ්‍ය ධර්මය ආරක්ෂා කිරීමට රහතන් වහන්සේලාට අවශ්‍ය විය. රහතන් වහන්සේලා බුදුපියාණන් වහන්සේ දේශනා කළ සියලු දේ ආරක්ෂා නොකරන්නට ඇත. එයට හේතුව බුදුපියාණන් වහන්සේ එකම දේ බොහෝ වාරයක් දේශනා කර තිබීමය. නමුත් අත්‍යවශ්‍ය ලෙස විනිශ්චය කරනු ලැබූ ධර්මය උන්වහන්සේලා ආරක්ෂා කළහ. ඒ පිළිබඳව විශේෂ සටහනක් නොමැති වුවත්, ඇතැම් තොරතුරු පසුකාලීනව ත්‍රිපිටකයට එකතු කර ඇති බව පැහැදිලිය. උදාහරණ වශයෙන්, මධුර සූත්‍රයේ මහා කච්ඡායන තෙරුන් වහන්සේගේ දේශනයක් සිදුකර ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුව බව විශේෂයෙන් සඳහන් වී තිබේ. ථේර ගාථා සහ ථේරී ගාථාවල අඩංගු සමහර කවි අඩුම තරමින් බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පරම්පරා දෙකකට හෝ තුනකට පසුව භික්ෂු භික්ෂුණීන් රචනා කළ ඒවා වන අතර, එයින් එකක් අසෝකගේ පුත්‍රයා විසින් කියන ලද්දකි. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 100 කට පසු පැවැත්වූ දෙවන සංගායනාවේ තොරතුරු විනය පිටකයේ ඇතුළත් වේ. නමුත්, ඊටත් වඩා, සමහර පොත්වල අඩංගු භාෂාව, ශෛලිය සහ අන්තර්ගතය වැදගත් බවින් අඩු සේ සලකන ඛුද්දක නිකායේ සඳහන් වී තිබෙන්නේ, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු සිය ගණනකට පසුව බිහිවූ ඒවා බවයි. ඒවා බුදුපියාණන් වහන්සේට හෝ උන්වහන්සේගේ සෘජු ශ්‍රාවකයන්ට ආරෝපණය කර නොමැති වුවත්, මේ ග්‍රන්ථ විශ්වාසය තැබිය හැකි සේ සලකනු ලබයි. කෙසේ නමුත්, දීඝ, මජ්ඣිම, සංයුක්ත සහ අංගුත්තර නිකායේ හරය ඇතුළත් ද්‍රව්‍ය සහ සුත්ත නිපාත, ධම්මපද, උදාන, ඉත්තිවුත්තක ආදියේ බුදුපියාණන් වහන්සේ දේශනා කළ

ධර්මය නිවැරදිව පිළිබිඹු වන බව, ඉතා ඉහළ මට්ටමක විශ්වාසයෙන් අපට කිව හැකිය. බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ ධර්මය සම්බන්ධයෙන් අපට ඇති පැරණිතම සහ ඉතා විශ්වසනීය සටහන එයයි. පළමුවෙනි ධර්ම සංගායනාවට සහභාගිවූ රහතන් වහන්සේලා බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ අත්‍යවශ්‍යම ධර්මය ලෙස තීරණය කළ දේ ආරක්ෂා කළහ.

එම නිසා ත්‍රිපිටකය එහි අන්තර්ගතය සම්බන්ධයෙන් වැදගත් වේ. නමුත්, එහි අඩංගු නැති දේ සම්බන්ධයෙන් ද එය වැදගත් වේ. එසේම, ත්‍රිපිටකයේ නැති දේ සම්බන්ධයෙන් සමහර විට බොහෝ බෞද්ධයන් පුදුමයට පත්විය හැකිය. සැබැවින්ම, එය ඔවුන්ට තිගැස්මක් ඇති කළ හැකිය. මෙම පරිච්ඡේදයෙන් ත්‍රිපිටකයෙන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව සඳහන් කරන දේ නොව, සඳහන් නොකරන දේ මම සාකච්ඡා කරමි.

බොහෝ බෞද්ධයන්ට ධර්මය පිළිබඳව ඇත්තේ අසම්පූර්ණ දැනුමකි. නමුත් සමහර විට, ඔවුන් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳව ප්‍රධාන කරුණු දන්නවා ඇත. අබෞද්ධ බොහෝ අයද දන්නවා ඇත. එය ග්‍රන්ථවල, විශ්වකෝෂවල කෙටියෙන් දක්වා ඇත. එය ගීතවල සහ චිත්‍රපටවල ප්‍රසිද්ධියට පත්කර ඇත. එය දහම් පාසැල් දහස් ගණනක උගන්වා ඇත. පන්සල් බිත්තිවල සහ වෙසක් පත්වල නිරූපණය කර ඇත. නමුත්, බුදුපියාණන් වහන්සේගේ ජීවන චරිතයට ඇතුළත් හොඳින් දන්නා සහ ආදරණීය සිද්ධීන් කිසිවක් ත්‍රිපිටකයේ සඳහන් වී නැති බව දන්නේ සුළු පිරිසක් වන අතර, එය ඔවුන් පුදුමයට පත් කරනු ඇත. පහත සඳහන් වන්නේ එවැනි උදාහරණ කිහිපයකි.

<u>**උන්වහන්සේගේ පියා**</u> - බුදුපියාණන් වහන්සේගේ පියා ශුද්ධෝදන, එහි අර්ථය, "පිරිසිදු සහල්" යන්නයි. ඔහු පිළිබඳව සෑම විටම සඳහන් වන්නේ, "ශාක්‍යයන්ගේ රජ"ලෙසත්, සෑම විටම, රාජකීය වස්ත්‍රයෙන් සැරසී, සමහර විට, සිංහාසනයක් මත අසුන් ගෙන, ඔටුන්නක් පැලඳගෙන හෝ මාළිගයක ජීවත්වෙන ලීලාවෙන්ම ඔහු නිරූපණය වන පුද්ගලයෙකු ලෙස ය. එසේ තිබියදීත්, උන්වහන්සේ කුමාරයෙකු (රාජ කුමාර) ලෙස හැඳින්වූ බවත්, පියා මාළිගයක ජීවත්වූ බවත් ත්‍රිපිටකයේ කිසි තැනක සඳහන් වී නැත. මුළු ත්‍රිපිටකයේම එකම තැනක උන්වහන්සේගේ පියා පිළිබඳව රාජ, සාමාන්‍යයෙන් රජ යන පරිවර්තනය ලබාදෙන වචනය සඳහන් වී ඇත. සැබැවින්ම, ක්‍රිස්තු පූර්ව 5 වන ශතවර්ෂයේ නිශ්චිතවම රාජ යන වචනයේ සම්පූර්ණ අර්ථය අද කාලයේ අදහස් කරන රජ යන අදහස නොවීය. නමුත්, පාලකයෙකු හෝ ප්‍රධානියා ලෙස අපට කිව හැකිය. බොහෝ ස්ථානවලදී පුද්ගලයකු උන්වහන්සේ තමන් වහන්සේගේ පියා, රජ ලෙස හැඳින්වීම

බලාපොරොත්තු වූවත්, උන්වහන්සේ එසේ නොකළහ. උදාහරණ වශයෙන්, බිම්බිසාර රජු උන්වහන්සේගේ පවුල සහ උත්පත්තිය පිළිබඳව විමසූ විට, උන්වහන්සේ හුදෙක් පැවසුවේ තමා ශාක්‍ය පවුලෙන් පැවත එන බව පමණි. (Sn. 322-4)

ශාක්‍යයන්ට "රාජ-තනන්නන්" (රාජ කත්තාරෝ) වශයෙන් මිනිසුන් කණ්ඩායමක් තිබූ බවට සඳහන් වේ. මෙම කණ්ඩායම වැඩිහිටි ශාක්‍යයන්ගෙන් සමන්විත වූ බවට සම්පූර්ණයෙන්ම නිශ්චිත වූ අතර, එයින් එක් පුද්ගලයෙකු නිශ්චිත කාලයකට හෝ ඔහු පිළිබඳව කණ්ඩායමට විශ්වාසය රැඳෙන තුරු හෝ තෝරා පත් කර ගත්හ. එම නිසා, සුද්ධෝදන, රජ කෙනෙකුට වඩා ප්‍රධානියකු ලෙස හැඳින්වීම වඩාත් නිවැරදි වේ. බුදුපියාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම සහ නිසැකවම වංශාධිපති හෝ පාලන තන්ත්‍ර පවුලකින් පැවත ආ නමුත් රාජකීය නොවන බව සඳහන් කළ හැකිය. සුද්ධෝදන පිළිබඳව මුළු ත්‍රිපිටකයේම සඳහන් වන්නේ දෙවතාවක් බවත්, ඒ දීඝ නිකායේ සහ විනය පිටකයේ බවත් දැන ගැනීම ප්‍රයෝජනවත් වේ.

<u>**මහා මායාවගේ සිහිනය**</u> - බුදුපියාණන් වහන්සේගේ පියා රජ කෙනෙකු සහ උන්වහන්සේ කුමාරයකු බව සැම දෙනාම විශ්වාස කරන්නාසේම, උන්වහන්සේ පිළිසිඳ ගන්නා විට උන්වහන්සේගේ මව සුදු ඇතකු සිහිනෙන් දුටු බවද ඔවුහු විශ්වාස කරති. මෙය මෙසේ සිදුවන්නට ඉඩ ඇත. නමුත්, එසේ සිදු වූවා නම්, එය ත්‍රිපිටකයේ කිසි තැනක සඳහන් වී නොමැති නිසා, පළමුවෙනි ධර්ම සංගායනාවේදී රහතන් වහන්සේලා එය සඳහන් නොකළහ.

<u>**නම**</u> - මුළු ත්‍රිපිටකය පුරාම බුදුපියාණන් වහන්සේට ගෝතම, යහපත් ගෝතම හෝ ශ්‍රමණ ගෝතම, තථාගත, ඉඳහිට, හිරුට ඥාතියා (ආදිච්චබන්ධු), ශාක්‍යයන්ගේ සූර්ය පෙළපත සහ ශාක්‍යයන්ගේ ඉෂිවරයා (ශාක්‍යමුණි) යනුවෙන් හඳුන්වා ඇත. ගෝතම යනු වංශ නාමයකි. එහි අදහස "උතුම් ගවයා" යන්නයි. මෙයින් අදහස් වන්නේ, අතීතයේ ඉන්දියාවේ ගවයන්ගෙන් පිළිබිඹු වන්නේ වස්තුව මැනීම සහ නම්බුව මූලාශ්‍ර කර ගැනීම බවයි. මෙහි වැදගත් වන්නේ බුදුපියාණන් වහන්සේ කිසිම අවස්ථාවක ගෝතම යනුවෙන් තමන් වහන්සේ නොහැඳින්වීමයි. ත්‍රිපිටකයට පසුව එකතුවූ අපදානයේ හැර ත්‍රිපිටකයේ කිසිම තැනක සිද්ධාර්ථ යන නාමය සඳහන්වී නැත. අපදානය ත්‍රිපිටකයේ ඛුද්දක නිකායේ එක් පොතකි. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 400-500කට පසු ත්‍රිපිටකයට එක් කළ දෙයකි. එය ථේර සහ ථේරී ගාථා පිළිබඳ අටුවාවකි. එය බුදුපියාණන් වහන්සේට ලැබුණු නාමය විය හැකිය. නමුත් පැරණිතම සටහන්වල එය සඳහන්වී නොමැත.

**අසිතගේ අනාවැකිය** - සුත්ත නිපාතයට අනුව, කපිලවස්තු පුරයේ විශේෂ දරුවකු උපත ලබා ඇති බව දෙවියන් අසිත තාපසයන්ට කියා සිටි විට දරුවා දැකීම සඳහා ඔහු එහි ගියේය. ශුද්ධෝදන ඔහු පිළිගෙන දරුවා වඩා ගැනීමට දුන් විට, "සලකුණු සහ මනත්‍ර" කලාවේ නිපුණයෙකු වූ ඔහු දරුවා පරීක්ෂා කර මොහු බුද්ධත්වයට පත්වන බව ප්‍රකාශ කර සිටියේය.

මේ දරුවා " අත්‍යන්ත සුපිරිසිදු දර්ශනය" අවබෝධ කර, බුද්ධත්වයට පැමිණ, "බොහෝ දෙනාට අනුකම්පාවෙන්" (බහුජන හිතානුකම්පා) සත්‍යය අනාවරණය කරනු ඇත යනුවෙන් දරුවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව අසිත පැවසුවේය. එවිට ඔහුගේ ඇස්වලට කඳුළු ගැලුවේය. මෙය දැක බියට පත්වූ ශුද්ධෝදන දරුවාගේ අනාගතය සම්බන්ධයෙන් යම් අභාග්‍යයක් දුටුවේද කියා ඇසුවේය. තාපසතුමා පිළිතුරු දෙමින්, තමා දුකට පත් වූයේ මේ සියල්ල සිදුවීමට පෙර තමා මිය යන බවත්, තමාට ඒ නිසා කිසිවක් දකින්නට නොලැබෙන බවත් නිසා යැයිද කීවේය.

අසිතගේ මෙම කථාවේ පසුකාලීන වැඩිදුර විස්තර බොහෝ තිබේ. පෙර ඒවාට වඩා දීර්ඝය. දරුවා විශ්වයටම අධිපති (චක්කවත්ති) හෝ පූර්ණ ප්‍රඥාව ලැබූ මුනිවරයකු (බුද්ධ) වනු ඇතැයි අසිත අනාවැකි පළ කළ බව බොහෝ විට සඳහන් වී ඇත. මේ දෙකින් එක් අනාවැකියක් හෝ ත්‍රිපිටකයේ සඳහන් නොවේ.

**තාරුණ්‍යය සහ විවාහය** - තරුණ ගෝතම පුරුෂ ශක්තියෙන් හෙබි කඩවසම් තරුණ පුරුෂයෙකු බවට වැඩුණු බව අපි අසා ඇත්තෙමු. ආවාහයක් කර ගැනීමට කාලය එළඹි විට, පිරිමියෙකුට ඔබින ශිල්ප පිළිබඳ තරගයකට සහභාගි වී එයින් ඔහු ජය ගත්තේය. ඒ අනුව රමණීය යශෝධරාව සමඟ ආවාහ වීමට අවස්ථාව උදා විය. ඔවුහු විවාහවූහ. සැබැවින්ම මෙම කථාවේ විශ්වාස කළ නොහැකි දෙයක් නොවීය. එය එම කාලයේ තරුණයකුට සාමාන්‍යයෙන් හරියටම සිදුවිය යුතු දෙයකි. නමුත් එය ත්‍රිපිටකයේ සඳහන් වී නැත. ගෝතම විවාහවූ බව අප දන්නේ රාහුල ඔහුගේ පුතණුවන් බවට බොහෝ සෙයින් සඳහන් වී තිබීම නිසාය. නමුත් යශෝධරා යන නාමය ත්‍රිපිටකයේ එක් වරක් හෝ සඳහන් වී නොමැත. ගෝතමගේ බිරිඳ ඇයගේ නම කුමක් වුවත්, සඳහන් වී ඇත්තේ "රාහුලගේ මව" (රාහුල මාතා) යනුවෙන් පමණි.

**තරුණ ගෝතම සහ පාත්තයා** - ස්ථිරවම, තරුණ ගෝතම පිළිබඳව කියැවුණු ඉතාම රසබර කථාව, සැබැවින්ම ඕනෑම ආගමික සම්ප්‍රදායක තිබූ රසබරම කථාව වන්නේ ගෝතම, දේවදත්ත සහ පාත්තයා පිළිබඳව කථාවය. එක් අවස්ථාවක වත්තක ඇවිදිමින් සිටින විට, තරුණ ගෝතම තටුවක හීයක්

ඇනී පාත්තයකු අහසින් වැටෙනු දැක්කේය. ඔහු මෘදුව පාත්තයා තම උකුළේ තබාගෙන තුරුලු කර හීය ඉවත් කර, තෙල් සහ මීපැණි යොදා, තුවාලයට බෙහෙත් ගැල්වීය. ඊට පසු ඔහුගේ ඥාති සහෝදර දේවදත්ත වහ වහා ඔහු වෙත පණිවුඩයක් එවමින්, පාත්තයාට විද්දේ තමා නිසා තමා වෙත පාත්තයා එවන මෙන් ඉල්ලා සිටියේය. ගෝතම පිළිතුරක් දෙමින්, "පාත්තයා මිය ගියා නම්, මම වහාම එවමි. නමුත් පාත්තයා තවමත් ජීවතුන් අතර සිටින නිසා ඔබට අයිතියක් නැත" යි කීවේය. දේවදත්ත නැවතත් පණිවුඩයක් එවමින්, "පාත්තයා එසේ පහළට හෙළනු ලැබුවේ තමාගේ හැකියාව නිසා බවත්, ඒ නිසා ඌ තමාට හිමි බවත් කියමින් වාද කළේය. නැවතත් ගෝතම පාත්තයා ලබාදීම ප්‍රතික්ෂේප කර, මතභේදය සමනය කිරීම සඳහා බුද්ධිමතුන්ගේ සභාවක් කැඳවන මෙන් ඉල්ලා සිටියේය. ප්‍රශ්නය යම් වේලාවකට සාකච්ඡා කර, බුද්ධිමතුන්ගෙන් වැඩිම ජ්‍යෙෂ්ඨ පුද්ගලයා තමාගේ අදහස ප්‍රකාශ කළේය. "ජීවත්වන අය, ඒ අය රැකබලා ගෙන ජීවිත ආරක්ෂා කරන අයට හිමිවිය යුතුයි. ජීවිත විනාශ කරන්නට උත්සාහ කරන අයට හිමි නොවිය යුතුයි." සභාව මෙම තීරණයට එකඟවී පාත්තයා තබා ගැනීමට ගෝතමට අවසර දුන්නේය.

මෙය ඉතා වැදගත් කථාවකි. නමුත් එය එන්නේ කොතැනකින් ද? එය ත්‍රිපිටකයේ නැත. එය අටුවාවල නැත. එය ටීකාවලත් නැත. සැබැවින්ම එය කිසිම පාලි ග්‍රන්ථයක නැත. එය සඳහන් වන්නේ ක්‍රිස්තු වර්ෂ දෙවන හෝ තුන්වන ශතවර්ෂයේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වර්ෂ 600 කට 800 කට පසුව, අභිනිෂ්ක්‍රමණ සූත්‍ර නමින් රචිත මහායාන ග්‍රන්ථයේය. මෙය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර 1876 දී ප්‍රකාශයට පත්විය. ඉංග්‍රීසි උගත් සමහර සිංහල බෞද්ධයන් මෙම කථාව කියවා තිබෙන්නට ඇත. එයින් සතුටු වන්නට ඇත. ඉන් අනතුරුව ක්‍රමයෙන් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳව ජනප්‍රිය අවබෝධය තුළට එය අන්තර්ගත කරන්නට ඇත. නූතන කාලයේදී පවා ජනප්‍රවාද වැඩෙමින්, පවතින සම්ප්‍රදායන්ට උකහා ගන්නා ආකාරය දැක්වීමට මෙය හොඳ උදාහරණයකි.

**ජම්බු ගස යට** - තම තරුණ වියේදී, එක්තරා මොහොතක, ගෝතම ජම්බු ගසක (ශ්‍රී ලංකාවේ ජම්බු නොව, ඉන්දියාවේ ගස (සිසිජියම් කුමිනි) සෙවණේ වාඩිවී සිටිනා විට, භාවනා ස්වභාවයේ පළමුවන ධ්‍යානයට නිරායාසයෙන්ම පත්වූ බව පැවසුවේය. වර්ෂ ගණනාවකට පසු, අත්ථකිලමථානු යෝගය පුහුණු කිරීම අත් හැරීමෙන් පසු බෝගස යට වාඩිවූ විට, ඔහුට මෙම සිද්ධිය මතක් විය. ඔහු නැවතත් ධ්‍යාන වැඩීම දියුණු කළේය. මෙය ඔහුට බුද්ධත්වය ලබාගැනීමට උපකාර විය. දහම් පාසැල් යන ඕනෑම දරුවකුගෙන් ඔබ ඇසුවොත්, තරුණ ගෝතම ජම්බු ගස යට සිට බලාගෙන

සිටියේ කුමක්ද කියා, ඒ අය ඔබට කියාවි ශ්‍රී ලංකාවේ "වප් මඟුල" ලෙස හඳුන්වන, වර්ෂයේ උත්සවාකාර සීසෑමේ උත්සවයේදී ඔහුගේ පියා වැඩෙහි නිරත වන අයුරු බලා සිටි බව. නමුත් බුදුපියාණන් වහන්සේ මෙය කිසිසේත් විස්තර කර නැත. උන්වහන්සේ හුදෙක් මෙසේ වදාළ සේක. "ශාක්‍ය වංශික මගේ පියා වැඩෙහි යෙදෙන අයුරු" මම බලා සිටියෙමි. ඔහුගේ පියා කුඹුරේ වල් නෙළීම, අස්වැන්න නිරීක්ෂණය, ගස් කපමින් සිටීම, හෝ වෙනත් වැඩ පළක යෙදී සිටියා විය හැකිය. එසේ නම් සාමාන්‍ය සහ විශේෂ නොවන "කාර්යය" "චාරිත්‍රානුකූල සීසෑමකට" පරිවර්තනය වූයේ කෙසේද? එයට හේතුව ඊට පසු පරම්පරාව ගෝතමගේ පියා රජ කෙනෙකු ලෙස විශ්වාස කිරීමත්, රජවරුන් එළදෙනුන්ගෙන් කිරි දෙවීම හෝ ගොවිතැන් වැඩ නිරීක්ෂණය නොකරන නිසාත්ය. ඔවුහු රාජකීය සහ වර්ෂයේ පළමු චාරිත්‍රානුකූල සීසෑමේ වැඩ වැනි වැදගත් කටයුතුවල පමණක් යෙදෙන අයයි. මෙය මනබඳන උදාහරණයකි. එක් ජනප්‍රවාදයක (ශුද්ධෝදන රජ කෙනෙකි.) තවත් ජනප්‍රවාදයක් උපදවීමට (ඔහු චාරිත්‍රානුකූල සීසෑම සිදුකරමින් සිටීම) අවශ්‍ය වී තිබේ.

**<u>සතර පෙර නිමිති</u>** - සමහර විට බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳව කියැවුණු වඩාත් ප්‍රතිමාමක කථාව මෙය විය හැකිය. මෙම ඊනියා සතර පෙර නිමිති (චතු නිමිත්ත) කියන පරිදි ගෝතම කපිලවස්තු මාර්ගයේ තමාගේ සුවච අශ්වාරෝහක ඡන්න සමඟ යන විට, ඔහුට අහම්බෙන් වයසින් ජරාවට පත්වූ මිනිසෙක්, රෝගී මිනිසෙක්, ආදාහනය සඳහා ගෙනයන මළමිනියක් සහ අවසානයේ තැනින් තැන යන තාපස භික්ෂුවක් හමුවූහ. ජීවිතය හා සම්බන්ධ අප්‍රසන්න සත්‍යයන්ගෙන් ආවරණය කරන ලද සහ මීට ප්‍රථමයෙන් කිසි දිනක නොදුටු මෙම දර්ශන පිළිබඳව ඔහු දැඩි සේ කම්පනයට පත් විය. තමාගේ වරප්‍රසාදවලින් පිරිපුන් ජීවිතය අත්හැර වියපත් වීම, රෝගීවීම සහ මරණයෙන් ඔබ්බට තත්ත්වයක් සෙවීමට තීරණය කිරීම, ගෝතමගේ ක්‍රියාත්මක වීම මෙම කථාවෙන් පැහැදිලි වෙයි. මෙම සතර පෙර නිමිති ප්‍රබෝධවත්, බලවත් සහ අනුවේදනීය කථාවකි. එය බොහෝ සෙයින් ජනප්‍රියයි. එය කලාව තුළ මනහර ලෙස දර්ශනය කිරීමට උපකාරී වී ඇත. නමුත් කනගාටුවට කරුණ නම්, එය ත්‍රිපිටකයේ නොමැති වීමයි. ත්‍රිපිටකයේ බුදුපියාණන් වහන්සේ හුදෙක්ම ප්‍රකාශ කර ඇත්තේ තමා වයසට පත්වීම, රෝගී වීම සහ අවසානයේ මරණයට පැමිණීමට යටත් බව අරමුණු කරගෙන උන්වහන්සේ ලෝකය අත් හැරීමට පෙලඹුණු බවයි.

**<u>රාත්‍රියේදී රහසින් පිටවීම</u>** - ගෝතමගේ පියා ඔහු කවරදා හෝ ලෝකය අත්හැර යෑම වැළැක්වීම සඳහා සිතාගත නොහැකි තරම් සැප සහිත සුඛෝපභෝගී මාළිගාවකට සීමා කළ බව සඳහන් වේ. නමුත් ගෝතම

නිශ්චිතවම තීරණය කර, මහ රාත්‍රියේ කිසිවකුට නොදැනෙන සේ තම බිරිඳ සහ අලුත උපන් පුත්‍රයා දෙස එකවරක් බලා රහසේම මාළිගාවෙන් පිටවී ගියේය. නැවතත්, මේ පිළිබඳව කිසිවක් ත්‍රිපිටකයේ නැත. සැබැවින්ම, "මගේ දෙමව්පියන්ගේ හැඬීම සහ විලාප මැද" ඔහු තම නිවසින් බැහැරව ගිය බව බුදුපියාණන් වහන්සේ පැහැදිලිව කියා ඇත. මෙයින් හඟවන්නේ යම් ආකාරයක තමාගේ දෙමව්පියන් සමඟ වාදයක් තිබූ බවත්, නිසැකවම ඔහුගේ පිටවීම ඔවුන්ගේ සම්පූර්ණ දැනුම ඇතිව සහ සමහරවිට දවල් කාලය තුළ නික්මීම සිදුවූ බවත්ය.

<u>**නිදාසිටි නාට්‍යාංගනාවන් අහම්බෙන් හමුවීම**</u> - බුදුපියාණන් වහන්සේ ලෝකය අභිනිෂ්ක්‍රමණය කළ රාත්‍රියේදී මාළිගාවේ සිටි නාට්‍යාංගනාවන්ට අදාළව උන්වහන්සේට අත්විඳින්නට සිදුවූ තවත් සිදුවීමක් පිළිබඳව සඳහන් වේ. උන්වහන්සේ ඒ නිශ්ශබ්ද රාත්‍රියේ ඇවිදගෙන යන විට, අසැබි ආකාරයට නාටිකාවන් ගෙනා සහ සංගීතවේදීන් නිදා සිටි අයුරු, ඔවුන්ගේ අවුල්වූ කෙස්, අශෝභන වස්ත්‍ර, ශරීරයේ හැඩවැඩ කිරීම් අප්‍රසන්න තත්ත්වයට පත්වී තිබීම සහ මුඛයෙන් කෙළ වැගිරෙමින් තිබීම ආදියයි. ඔවුන් තමාට පෙනෙන්නට දවස පුරා රූප ශෝභාව තබාගෙන සිටි අයුරුත්, නිදන විට සිටි අයුරුත් යන දෙක අතර තිබූ අසමානතාව ගෝතමට පෙනුම සහ ජීවිතයේ යථාර්ථය අතර වෙනස පිළිබඳව පිළිකුලක් ඇති කළේය. නැවත මෙය බලවත් කථාවක් වන අතර, එය ත්‍රිපිටකයේ සඳහන් වේ. නමුත් අපූර්වත්වය නම් එය සිදුවී ඇත්තේ ගෝතමට නොවේ. යස නමැති පොහොසත් තරුණයෙකුටයි. එක් පුද්ගලයෙකුගේ අත්විඳීමක් බුදුපියාණන් වහන්සේගේ ජීවිත කථාවට බද්ධ කර ඇත.

<u>බෝගස</u> - ත්‍රිපිටකයේ වැදගත් සඳහනක් ඇතැයි සිතන අවසාන වශයෙන් එක් විස්තරයක් පිළිබඳව අපි බලමු. නමුත් මෙය ඇත්තටම ත්‍රිපිටකයේ සඳහන් වී නැත. විශේෂයෙන්ම බෞද්ධ ලෝකය පුරා බෝගස් පූජණීයත්වයෙන් සලකනු ලබයි. කුමක් හෙයින් ද යත්, ඉන් එක් ගසක් එකල උරුවේලාව නමින් ප්‍රකට වූ බුද්ධගයාවෙහි වැඩුණු අතර, එහි විහිදුණු අතු සේවණේදී බුද්ධත්වය ලැබූ දින රැයෙහි, බුදුන් වහන්සේට සෙවණ ලබා දුන් බැවිනි. බෝගස පිළිබඳව බොහෝ කථාන්දර තිබේ. එහි ශාඛාවක් සංඝමිත්තා තෙරණින් වහන්සේ විසින් ශ්‍රී ලංකාවට වැඩම කර එදා සිටම ගෞරවය ලබාදෙමින් පවතී. මෙම ගසට ලබාදෙන අවධානය සැලකිල්ලට ගත් විට එයට ත්‍රිපිටකයේ විශේෂ ස්ථානයක් කෙනෙකු බලාපොරොත්තු විය යුතුය. නමුත් පුදුමයට කරුණ නම් බෝගස පිළිබඳව ත්‍රිපිටකයේ කෙටි සඳහන් දෙකක්, දීඝ නිකායේ එක් ස්ථානයක සහ උදානයේ (විනය පිටකයේ නැවත සඳහනක්) පමණක් තිබීමයි. සතියක් පුරා ඇසිපිය නොහෙළා බුදුපියාණන් වහන්සේ

බෝගස දෙස බලා සිටි බවට සඳහන් ජනප්‍රිය කථාවද සඳහන්ව ඇත්තේ අටුවාවල පමණි.

මෙම උදාහරණවලට තවත් සුළු ප්‍රමාණයක් එකතුකළ හැකිය. බුදුපියාණන් වහන්සේගේ චරිතාපදානයේ සාමාන්‍ය බෞද්ධයා හොඳින් දන්නා ජනකාන්ත ප්‍රතිමාමක දේ බොහොමයක් ඉවත්කළ හැකිය. මෙම සිද්ධීන් කිසි දිනක සිදුවූයේ නැතැයි හෝ සත්‍යය නොවේයැයි මෙයින් අදහස් නොකෙරේ. නමුත් ඒවා සිදුවූයේ නම් සහ සත්‍යය වූයේ නම් පැහැදිලිවම පළමුවන ධර්ම සංගායනාවට සහභාගිවූ රහතන් වහන්සේලා, මතක තබා ගැනීමට සහ පූජනීය ධර්ම ග්‍රන්ථවලට ඇතුළත් කිරීමට තරම් වැදගත් යයි සලකා නැති වීමයි. නමුත් ඒ ඇයි? එතරම් අර්ථවත් සහ මතක තබාගත යුතු සහ තේරුම් ගැනීමට අවශ්‍ය මාර්ග සක්‍රීය සහ අවධානයට ගත යුතු, පැහැදිලි කිරීමට අවශ්‍ය ධර්ම කරුණු ඉවතලන්නේ ඇයි? එක් විය හැකි පැහැදිලි කිරීමක් නම් මෙම විස්තර දැන සිටිය නමුත්, නොසලකා හැරීමක්, ඊටත් වඩා විය හැකි පැහැදිලි කිරීමක් නම්, ඒවා බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසුව සහ පළමුවන සහ දෙවන ධර්ම සංගායනාවෙන් පසුව ඇතිවූ ජනප්‍රවාද නිසයි. නිර්වාණය අත්පත් කරගන්නේ කෙසේද යන්න පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ දේශනා සම්බන්ධයෙන් රහතන් වහන්සේලා සහ අනෙක් භික්ෂු භික්ෂුණීන් වහන්සේලා දැඩි සේ සැලකිලිමත් වූ බවත්, නමුත් භික්ෂුවක වීමට පෙර ජීවිතය පිළිබඳව උන්වහන්සේගේ උනන්දුව ස්වල්පයක් හෝ තිබුණේ නැත.

බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳව මෙකී සහ වෙනත් විස්මයජනක කථාන්දර "හුදෙක් ජනප්‍රවාද" ලෙස සැලකීම සහ බැහැර කිරීම මෙයින් අදහස් නොකෙරේ. ඒවා මිලියන ගණන් ධර්ම දේශනාවලට වර්ණය සහ ප්‍රබෝධය ලබාදී ඇත. ඒවා පැරණි බෞද්ධයන්ගේ නිර්මාණාත්මක පරිකල්පනයට සාක්ෂි සපයයි. ඉතිහාසයේ ඉතාම වැදගත් පුද්ගලයෙකු පිළිබඳව ඇති භක්තිය නිසාම තවත් විස්තර දැනගැනීම පිණිසම, ඔවුන් සැබැවින්ම සහ සම්පූර්ණයෙන්ම එසේ කරන්නට ඇත. නමුත්, බුද්ධාගම නවීකරණයට සහ බුද්ධාගම නැති කිරීමට උත්සාහ කරන විකල්ප ආගම් සමග සටන් කරන්නට සිදුවෙන නිසා බෞද්ධයන් තමන්ගේ ආගම හොඳින් දැනගැනීම වැදගත් වේ. යථාව කුමක්ද? ඇදහිලි කුමක්ද? ජනප්‍රවාද කුමක්ද සහ විශේෂයෙන් ත්‍රිපිටකය කියන්නේ කුමක්ද යනාදිය බෞද්ධයකු සැබවින්ම දැනගත යුතුය.

# 05.බුදුපියාණන් වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද?

බුදුපියාණන් වහන්සේ බෙහෙවින් සුවිශේෂ පුද්ගලයෙකි. නිශ්චිතවම කරුණාවන්ත සහ බුද්ධිමත් උන්වහන්සේගේ හමුවීමත් ඉතාම ප්‍රායෝගිකයි. එපමණටම ඒ හමුවීම මිනිසුන්ගේ ජීවිත වෙනස් කරයි. උන්වහන්සේ ජීවත්ව සිටියදීත් උන්වහන්සේ පිළිබඳව ජනප්‍රවාද පැතිර තිබුණි. උන්වහන්සේගේ පරිනිර්වාණයට ශතවර්ෂ ගණනාවකට පසුවත් සමහර විට ජනප්‍රවාද සහ මිථ්‍යාවන් ඒ සැබෑ මිනිසා අපැහැදිලි කරන්නට අවස්ථාව සැලැස්වීය. ඒ නිසා බුදුපියාණන් වහන්සේ දෙවියකු ලෙස සලකනු ලැබූහ. සැබැවින්ම බුදුපියාණන් වහන්සේ මිනිසෙකි. සමහර විට හඳුන්වන "හුදෙක් දෙවියකු" නොව, නමුත් සම්පූර්ණ හෝ උතුම් පුද්ගලයෙකු ලෙස හැඳින්වෙන (මහාපුරිස) විශේෂ පන්තියේ මිනිසෙකි. එවැනි සම්පූර්ණ පුද්ගලයෝ අනෙක් අයගෙන් වෙනස්ව උපත නොලබති. සැබැවින්ම කායිකව ඔවුන් සැමවිටම සම්පූර්ණයෙන්ම සාමාන්‍ය නමුත් ඔවුහු ඔවුන්ගේම උත්සාහයෙන් සැම මිනිස් හැකියාවක්ම සම්පූර්ණ කරන අතර, ඔවුන්ගේ මානසික පාරිශුද්ධිය සහ අවබෝධය සාමාන්‍ය මිනිසුන් ඉක්මවන මට්ටමකට දියුණු කරති. බුදුන්වහන්සේ සම්පූර්ණ පුද්ගලයෙකු වන අතර, දෙවියකුට වඩා ඉහළය. එයට හේතුව දෙවියෙක් ඊර්ෂ්‍යාව, කෝපය සහ අයථා පක්ෂපාතකම්වලින් නිදහස් යයි අපට දැනගන්නට ලැබී තිබුණත්, දෙවියන්ට තවමත් සංවේදිතා ඇත.

එසේ නම් බුදුපියාණන් වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද? උන්වහන්සේ හමුවීමට ලැබීම කෙබඳුද? බුදුපියාණන් වහන්සේ අඩි 6ක් පමණ උස, තද කළු කෙස් සහ රන්වන් පැහැ වර්ණයෙන් යුක්ත වූහ. උන්වහන්සේ ගිහියකුව සිටියදී කොණ්ඩය සහ රැවුළ දිගට වැවී තිබුණ අතර, ගිහිගෙය අතහැර යනවිට අනෙක් සියලුම භික්ෂූන් මෙන් ඒ සියල්ල මුඩු කළහ. (M.I.163) බුදුපියාණන් වහන්සේ සිත් ඇදගන්නා අයුරින් කඩවසම්, පුද්ගලයකු බව සියලු මූලාශ්‍රවලට අනුව සනාථ වේ. සෝනදණ්ඩ බ්‍රාහ්මණයා බුදුපියාණන් වහන්සේ පිළිබඳව මෙසේ විස්තර කරයිඃ "කඩවසම්, දැකුම්කලු සහ ඇසට ප්‍රිය සහ ඉතා ලක්ෂණ වර්ණයකින් යුක්ත විය. උන්වහන්සේට දෙවියෙකු වැනිවූ රූපයක් සහ මුහුණක් තිබුණි. උන්වහන්සේ කඩවසම්ය."(D.I.115) උන්වහන්සේ පිළිබඳව වච්චගොත්ත මෙසේ පැවසුවේයඃ "ගෝතමගේ පෙනුම, සැබැවින්ම විස්මයජනකයි, උන්වහන්සේගේ වර්ණය කෙතරම් පැහැදිලිද සහ දීප්තිමත්ද? සරත් කාලයේ පැහැදිලි සහ දීප්තිමත් රන්වන් ජුජුබේ ඵලයක් මෙන්ය. නටුවෙන් ගිලිහුණු පැහැදිලි සහ දීප්තිමත් පාම් ගෙඩියක් මෙන්ය, පුහුණු රන්කරුවකු නිපුණ අයුරින් තළා - රතු - රන්වන් පැහැයෙන් ඉතා තියුණු ලෙස නිම කළ භූෂණයක්, කහ පැහැති රෙද්දක් මත කෙසේ දිලිසේද,

බැබළේද සහ දීප්තිමත්ද, ඒ හා සමානවම යහපත් ගෝතමගේ ඉඳුරන් තැන්පත්ය. උන්වහන්සේගේ වර්ණය පැහැදිලිය, බැබළෙයි." (A.I.181) නමුත් සත්තකින්ම උන්වහන්සේ වියපත් වනවිට සිරුර අනෙක් සියලු සම්මුති ද්‍රව්‍යයක මෙන්ම අනිත්‍යයට යටත් විය. ආනන්ද ස්වාමීන් වහන්සේ බුදුපියාණන් වහන්සේගේ මහලු විය මෙසේ පැහැදිලි කළහ: "හරි පුදුමයි, බුදුපියාණන් වහන්සේගේ සම පෙර මෙන් පැහැදිලි නැත; බැබළෙන්නේ නැත; උන්වහන්සේගේ අවයව බුරුල්ය; රැලි වැටී ඇත. උන්වහන්සේගේ ශරීරය කෙතරම් පහතට නැමී ඇත්ද? උන්වහන්සේගේ ඇස්, කන්, නාසය, දිව සහ ශරීරය වෙනස්වී ඇති අයුරු කෙසේද?"(SV.217)

පරිනිර්වාණයට පෙර, අවසාන වර්ෂයේදී බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ පිළිබඳව මෙසේ පැවසූහ: " මම දැන් මහලුව, වියපත්ව, විඩාබරව සිටිමි. ජීවන ගමනේ පාරගමනය කර ඇත. වයස 80ක් පමණ වූ මම මගේ ජීවිතයේ අවසානයට එළඹෙමින් සිටිමි. පරණවූ කරත්තයක් තවදුරටත් ගෙන යා හැක්කේ අණ්ඩ දමමින් මෙන්ම, මගේ ශරීරයත් ගෙන යා හැක්කේ අණ්ඩ දමමින්ය." (D.11 100) කෙසේ නමුත් තරුණ වියේදී බුදුපියාණන් වහන්සේගේ කායික යහපත් පෙනුම, මනරම් පෞරුෂය සහ ධර්මය විසින් ජනයා උන්වහන්සේ වෙත ආකර්ෂණය කර ගනු ලැබූහ. උන්වහන්සේ අභිමුඛයේදී මිනිසුන්ට සැලකිය යුතු බලපෑමක් ඇතිවන්නට ඇත. එක් අවස්ථාවක සාරිපුත්ත තෙරුන් වහන්සේට නකුල ගෘහපතිතුමා හමුවූ අතර, උන්වහන්සේ ඔහුගේ ශාන්ත හැසිරීම දැක, මෙසේ පැවසූහ: "ගෘහපතිතුමනි, ඔබගේ ඉඳුරන් ඉතා තැන්පත්ය, ඔබගේ වර්ණය පැහැදිලිය, දීප්තිමත්ය. මම හිතනවා ඔබ අද දින බුදුපියාණන් වහන්සේ සමඟ මුහුණට මුහුණලා සාකච්ඡා කළා කියා." නකුලපිතා පිළිතුරු දෙමින්, එසේ නොවන්නේ කෙසේද ස්වාමිනි? බුදුපියාණන් වහන්සේගේ අමා දහම් වැස්සෙන් මේ දැන් මම නැවෙමි." (S.111.2)

බුදුපියාණන් වහන්සේ දක්ෂ ප්‍රසිද්ධ කථිකයෙකි. ප්‍රසන්න කටහඬ, මනා පෙනුම සහ තැන්පත් බව සමග සිත් ඇදගන්නා සුලු බව සංයෝගවූ උන්වහන්සේගේ දේශනා, රැස්වූ පිරිස වසඟකර ගැනීමට සමත් විය. බුදුපියාණන් වහන්සේ දේශනා සිදු කළ අවස්ථාවක් දුටු උත්තර එය මෙසේ පැහැදිලි කළේය: "උන්වහන්සේ රැස්වීමකදී ධර්මය දේශනා කරන විට එහි රැස්වෙන පිරිස ප්‍රසංශා කිරීම හෝ හෙළා දැකීම නොකළහ, ඊටත් වඩා උන්වහන්සේ ධර්මය පිළිබඳව කථාකරමින් ඔවුන් සතුටට පත් කළහ. ගෝතමගේ ශ්‍රී මුඛය තුළින් පිටවන ශබ්දයේ අට ආකාර ගතිලක්ෂණ තිබුණි. ඒ ශබ්දය අසාමාන්‍යයි. තේරුම් ගත හැකිය, ප්‍රසන්නයි, ඇසෙනසුලුයි,

ව්‍යාඛ්‍යතයි, පැහැදිලියි, ගැඹුරුයි, සහ ප්‍රතිනාදකයි. එමනිසා උන්වහන්සේ රැස්වීමකදී උපදේශනය කරන විට ඉන් ඔබ්බට උන්වහන්සේගේ කටහඬ නොයයි. එම රැස්වූ පිරිස සතුටට පත්ව, ආධ්‍යාත්මික උත්තේජනය ලැබ, ප්‍රබෝධයට පත්ව සහ ප්‍රීතිමත්ව තමන්ගේ අසුන්වලින් නැගිට, උන්වහන්සේ දෙස ඇස් යොමු කරමින්ම ඉතාම අකමැත්තෙන් වෙන්ව යති." (M.11.140)

බුදුපියාණන් වහන්සේගේ දේශනාවලට සවන්දෙන විට මිනිස්සු කෙතරම් නිශ්ශබ්දව සහ අවධානයෙන් සිටියෝද යන්න පිළිබඳව පසේනදී රජතුමා වරක් පුදුමයෙන් මෙසේ ප්‍රකාශ කළේය:"මම වංශවත් සහ අභිෂේක ලැබූ රජ කෙනෙක්මි. දඬුවම් ලැබීමට සුදුසු සහ රටින් පිටුවහල් කිරීමට සුදුසු අය රටින් පිටුවහල් කිරීමට සහ රටින් පිටකිරීමට බලයක් ඇති කෙනෙක්මි. නමුත්, සමහර විට යම් කරුණක් මම තීරණය කරන විට, මිනිස්සු මටද බාධා කරති. සමහර විට මටද, 'මම කථා කරන විට මට බාධා නොකරන්න' යයි කියන්නට අවස්ථාවක් නැත. නමුත්, බුදුපියාණන් වහන්සේ විවිධ රැස්වීම්වලදී ධර්මය දේශනා කරන විට, උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් කහින ශබ්දයක්වත් පිට නොවේ." දේශනා කරන විට එක් අවස්ථාවකදී බුදුපියාණන් වහන්සේ ධර්මය උගන්වන විට එක භික්ෂුවක් කැස්සේය; ඔහුගේ පැවිදි දිවියේ සගයකු වන තවත් භික්ෂුවක් ඔහුගේ දණහිසට තට්ටුකර "නිශ්ශබ්ද වන්න, ශබ්ද නොකරන්න, අපගේ ගුරුතුමා වන බුදුපියාණන් වහන්සේ ධර්මය දේශනා කරමින් සිටින සේක" යනුවෙන් කීවේය. මෙය දුටු මම මෙසේ සිතුවෙමි. "චමත්කාරයි, සැබැවින්ම විස්මයජනකයි, කෝටුවක් හෝ කඩුවක් නොමැතිව මෙම රැස්වීම කෙතරම් හොඳින් පුහුණුවීමක් ලැබ ඇත්ද?" (M.11 122)

බුදුපියාණන් වහන්සේ කිසිම විටක උන්වහන්සේට අකමැති වීමට කිසිම හේතුවක් ඇති නොකළ නමුත්, සමහර අවස්ථාවල ඊර්ෂ්‍යාව, සමහර විට ධර්මය සමඟ එකඟ නොවීම, සමහර විට බුදුපියාණන් වහන්සේ සසල නොවී පැහැදිලිව සහ ශාන්තව තර්ක කර ඔවුන්ගේ විශ්වාස බැහැර කළ නිසා උන්වහන්සේට නොකැමති අයද සිටියහ. වරක් බුදුපියාණන් වහන්සේ කපිලවස්තු ප්‍රදේශයේ වැඩ සිටින විට, ශාක්‍ය වංශික දණ්ඩපානීට උන්වහන්සේ ධර්මය කියාදුන් විට ඒ පිළිබඳව ඔහු ප්‍රශ්න කළේය. එවිට බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ. දණ්ඩපානීට බලපෑමක් ඇති නොවීය. ඔහු හිස සොලවමින්, දිව වනමින්, තම සැරයටියට වාරුවී එතැනින් නික්ම ගියේය. ඔහුගේ නළලෙහි රැලි තුනක් මතු වී තිබිණි. (M.I. 108 ) බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ පණිවුඩයේ සත්‍යය දණ්ඩපානීට ඒත්තු ගන්වන්නට උත්සාහ කරමින් ඔහු පසුපස ලුහුබැන්දේ නැත. උන්වහන්සේ

විවේචනයට හේතුභූතවූ කරුණු පිළිබඳව එසේ කළේ ඇයි, කළේ කුමක්ද? යනාදිය පැහැදිලි කරමින් අවශ්‍ය විට අනවබෝධය නිවැරදි කරමින් එවැනි විවේචනවලට සන්සුන්ව ප්‍රතිචාර දැක්වූහ. සැමවිටම උන්වහන්සේ කලබල නොවී විනීතව සහ විවේචනය ඉදිරියේ සිනහසෙමින් තම ශ්‍රාවකයන්ද එසේ කිරීමට දිරිගැන්වූහ. "යමෙකුට මා හෝ ධර්මය හෝ සංඝයා විවේචනය කිරීමට අවශ්‍ය නම්, ඒ වෙනුවෙන් කෝප වීම, නොරිස්සීම හෝ අවුල්වීම අවශ්‍ය නැත. ඔබ එසේ කළහොත්, ඔබ ඔබට බාධා කරයි, ඔවුන් කීදේ හරිද, වැරදිද කියා ඔබට දැනගැනීමට නොහැකි වෙනවා. ඔබට පුළුවන්ද?" "නැත ස්වාමීනී." "ඉතින් අනෙක් අය මා, ධර්මය හෝ සංඝයා විවේචනය කරත් නම්, එවිට හුදෙක් වැරදි කුමක්ද කියා, "එය වැරදියි, එය හරි නැත, එය අපේ ක්‍රමය නොවේ, අප අය කරන්නේ නැත" යනුවෙන් පැහැදිලි කරන්න. (D.1.3) සමහර අවස්ථාවල බුදුපියාණන් වහන්සේ විවේචනය කිරීම පමණක් නොව, ඊටත් වඩා "නොහොබිනා, රළු වචනවලින්" අපහාසයට පත් කරනු ලැබූහ. එවැනි අවස්ථාවල උන්වහන්සේ සාමාන්‍යයෙන් ඉතා ගෞරවනීය නිශ්ශබ්දතාවක් දරා සිටියහ.

බුදුපියාණන් වහන්සේ බොහෝ විට ඉතා මෘදු සහ ප්‍රියජනක පුද්ගලයෙකු වශයෙන් දැනගන්නට ලැබී තිබේ. සැබැවින්ම උන්වහන්සේ කරුණාවන්ත ගුණ ඇති පුද්ගලයකු ලෙස පෙනී යන අතර එය එසේම විය. නමුත්, අවශ්‍ය යයි සිතූ අවස්ථාවල උන්වහන්සේ විචාරශීලී නොවූහයි එයින් අදහස් නොවේ. ඒ කාලයේ ඇතැම් තාපස කණ්ඩායම් ඔවුන්ගේ සාවද්‍ය ධර්ම තුළින් මිනිසුන් නොමග යවන බවට විශ්වාස ඇතිවූ අවස්ථාවල උන්වහන්සේ ඉතාම විවේචනාත්මක වූ සේක. නිගණ්ඨයන් පිළිබඳව උන්වහන්සේ මෙසේ පැවසූහ:"නිගණ්ඨයෝ විශ්වාස නොකටයුතු, දුරාචාර, විළිබිය නැති සහ නොසැලකිලිමත් පුද්ගලයෝය. ඒ අය හොඳ මිනිසුන්ගේ මිත්‍රයෝ නොවෙති. ඒ අය පූජනීය බව පෙන්වමින් අනික් අය හෙළා දකිති. ඒ අය ලෞකික දේවල්වලට ඇලෙන අතර, ඒවා තමන්ගෙන් ගිලිහීම ප්‍රතික්ෂේප කරති. ඒ අය සොරුය, නරක ආශාවලින් යුක්ත වෙති, දුෂ්ට අදහස්වලින් යුක්ත වෙති. (A.V.150) වැරදි අවබෝධයෙන් බෞද්ධ භික්ෂූන් ධර්මයේ සංස්කරණ විකෘති කළ විට බුදුපියාණන් වහන්සේ එක් වතාවක් මෙසේ පැවසූහ: "මෝඩ පුරුෂය (මොඝපුරිස), මම ධර්මය එසේ උගන්වන්නේ යැයි ඔබ සිතන්නේ කොහොමද!" යනුවෙන් තදින් තරවටු කළ සේක. (M.I.132) නමුත්, උන්වහන්සේගේ තරවටු කිරීම් සහ දෝෂාරෝපණ කිසිවිටක රිදවීමට නොව, මිනිසුන් වඩා උත්සාහවන්ත කිරීමට සහ පෙලඹවීමට හෝ ඔවුන්ගේ ක්‍රියාවන් හෝ විශ්වාස නැවත පරීක්ෂා කරවීම සඳහාම විය.

බුදුපියාණන් වහන්සේගේ දින චර්යාව ඉතා පිරුණු එකක් විය. උන්වහන්සේ රාත්‍රියේ ඔරලෝසු පැය 1 ක් පමණ (සිංහලයෙන් පැය 2 1/2ක් පමණ) සැතපෙති. ඊට පසු අවදිව අලුයම භාවනා කළ අතර, බොහෝ විට මෛත්‍රී භාවනාව පුරුදු කළහ. අරුණෝදයේම බොහෝවිට උන්වහන්සේ උඩට පහළට සක්මන් කළහ. පසුව, උන්වහන්සේ හමුවීමට පැමිණි පිරිසට කථා කළහ. දහවල් වීමට ප්‍රථම උන්වහන්සේ සිවුර සහ පාත්‍රය රැගෙන ළඟම තිබෙන නගරයට හෝ ගමට පිණ්ඩපාතයේ වැඩියහ. සැම නිවෙසක් ඉදිරිපිටටම වැඩමකර නිශ්ශබ්දව වැඩ සිටින උන්වහන්සේ මිනිසුන් පූජා කළ ඕනෑම ආහාරයක් කෘතඥතා පූර්වකව පිළිගෙන, නැවත වාසස්ථානයට වැඩියහ. නැතහොත් සමහර විට යාබද කැලෑබද ප්‍රදේශයකට වැඩම කර, ආහාර වැළඳූහ. බුදුපියාණන් වහන්සේ ආහාර ගත්තේ දිනකට එක් වරකි. උන්වහන්සේ ජනප්‍රියවූ පසු මිනිස්සු තම නිවෙස්වලට දානය සඳහා උන්වහන්සේට විශේෂ අමුත්තකු ලෙස, ආරාධනය කළහ. උන්වහන්සේට රසවත් ආහාර ලැබීම පිළිබඳව වෙනත් තවුසෝ විවේචනය කළහ. එවැනි අවස්ථාවල උන්වහන්සේ දානය වළඳා, අත් සහ පාත්‍රය සෝදා කෙටි ධර්මානුශාසනාවක් කළහ. ආහාරයෙන් අනතුරුව උන්වහන්සේ සාමාන්‍යයෙන් බිම සැතපී කෙටි නින්දකට පත්වූහ. රාත්‍රියේදී උන්වහන්සේ සැතපෙන විට සිංහ සෙය්‍යාවෙන් (සීහසන) දකුණු ඇලයට එක් අතක් හිසට යටින් සහ පාද දිගුකර දෙකකුල් එකක් මත එකක් තබාගෙන සැතපුණහ. හවස් කාලයේ උන්වහන්සේ පැමිණෙන පිරිසට කථා කළහ. භික්ෂූන්ට උපදෙස් දුන්හ. යෝග්‍ය පරිදි ධර්මය පිළිබඳව කථා කිරීමට මිනිසුන් වෙතද වැඩියහ. පශ්චිම රාත්‍රියේදී සැම දෙනාම නිඳන විට, බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව හිඳගෙන සිටියහ. සමහර විට දෙවිවරු පැමිණ ප්‍රශ්න ඇසූහ. වෙනත් භික්ෂූන් මෙන්ම බුදුපියාණන් වහන්සේද සාමාන්‍යයෙන් වර්ෂයේ මාස 9න් එක් ස්ථානයකින් තවත් ස්ථානයකට වැඩියහ. එයින් උන්වහන්සේට මිනිසුන් මුණගැසීමට බොහෝ අවස්ථා ලැබුණ අතර, මාස 3ක් වස්සාන කාලය (වස්ස) තැන්පත්ව ගත කළහ. වර්ෂා කාලයේදී සාමාන්‍යයෙන් උන්වහන්සේ කුටියක (කුටි) වැඩ සිටියහ. මෙම කුටි Vultures Peak (වල්චස් පීක්) හෝ රජගහ නුවර Bamboo Grove (බැම්බූ ග්‍රෝව්) වේළුවනාරාමය හෝ ශ්‍රාවස්තියේ ජේතවනය වැනි විවිධ ස්ථානවල උන්වහන්සේ වෙනුවෙන් කුටි සකස් කර තිබුණි. බුදුපියාණන් වහන්සේගේ වාසස්ථානය වෙත පැමිණෙන අමුත්තන්ට, ආනන්ද මහරහතන් වහන්සේ පවසා ඇත්තේ කහිමින් හෝ දොරට තට්ටු කිරීමෙන් සංඥා කළ විට බුදුපියාණන් වහන්සේ දොර විවෘත කරන බවයි. සමහර විට පැමිණෙන පිරිසට තමන් වහන්සේට බාධා නොකරන ලෙසද ආනන්ද ස්වාමීන් වහන්සේට උපදෙස් දුන්හ. බුදුපියාණන් වහන්සේ කිසිවකු මුණනොගැසෙන බවට සඳහන් කළ විට, එක් පුද්ගලයකු එම කුටිය ඉදිරිපස හිඳගෙන,"මම

උන්වහන්සේ හමුවන තුරු මෙතනින් යන්නේ නැහැ" යි කිවූ අවස්ථාවක් පිළිබඳවද අපි අසා ඇත්තෙමු.

බුදුපියාණන් වහන්සේ චාරිකාවෙහි යෙදෙන විට ඕනෑම ස්ථානයක සැතපුණහ. ගසක් යට, පාර දෙපස නවාතැනක, මැටිවළන් පොළක ආදී වශයෙනි. වරක් හත්ථක, බුදුපියාණන් වහන්සේ එළිමහනේ සැතපෙනු දැක,"ඔබ වහන්සේ සතුටින්ද?"කියා ඇසුවේය. බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ සතුටින් සිටින බව පැවසූහ. එවිට හත්ථක මෙසේ පැවසුවේයඃ "නමුත් ස්වාමීන් වහන්ස, ශීත සෘතුවේදී රාත්‍රිය ඉතා ශීතයි. සඳේ අමාවක භාගය ඉතාම ශීතල අධික කාලයයි. පොළොව ගවයන්ගේ කුරවලින් තදින් පෑගී ඇත, බිම ඇදහැලුණු කොළවලින් අතුරන ලද වැස්ම දුබලවී ඇත, ගස් මත ඇත්තේ කොළ ස්වල්පයකි. ඔබවහන්සේගේ සිවුරු ඉතා සිනිඳුයි. සුළඟ සීතලයි." බුදුපියාණන් වහන්සේ තවදුරටත් සහතික කළේ උන්වහන්සේ සරල සහ චාම් ජීවිත රටාවක් තිබියදීත් සතුටින් සිටින බවයි. (A.I.136)

ධර්මය පැහැදිලි කිරීම සඳහා බුදුපියාණන් වහන්සේට එතරම්ම කාර්යබහුල කාලසටහනක් තිබුණු නිසාද, විවිධ කරුණු සම්බන්ධයෙන් නිතරම උන්වහන්සේගේ උපදෙස් පතා පිරිස පැමිණෙන නිසාද සමහර විට උන්වහන්සේට සම්පූර්ණයෙන්ම තනිව සිටිය යුතු අවශ්‍යතාවන් තිබුණි. අවස්ථා කිහිපයකදීම උන්වහන්සේ ආනන්ද ස්වාමීන්වහන්සේ සමඟ පැවසුවේ තමන් වහන්සේ හුදෙකලාවට යන බවත්, තමන්ට දානය රැගෙන පැමිණෙන පිරිස පමණක් තමන් වහන්සේ වෙතට එවන ලෙසත්ය. (S.V.11) බුදුපියාණන් වහන්සේ හුදෙකලාවට යන්නේ මිනිසුන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට ඇති දුෂ්කරතාව නිසා සහ උන්වහන්සේට ප්‍රසිද්ධ වාද මඟහරින්නට ඕනෑවූ නිසා බව උන්වහන්සේ විවේචනය කරන්නෝ කියා සිටියහ. නිග්‍රෝධ තවුසා උන්වහන්සේ ගැන මෙසේ කියා සිටියේයඃ"ගෝතම තාපසතුමාගේ ප්‍රඥාව හුදෙකලා ජීවිතයෙන් විනාශවී ඇත, ඔහුට රැස්වීම් පුරුදු නැත, ඔහු වාදවලට දක්ෂ නැත, ඔහු දැනුමෙන් අඩුයි." නමුත් සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සේවය අවශ්‍යවූ ඕනෑම පුද්ගලයකුට ඒ අවස්ථාව ලබාදී ඇත. සහනයක් ලැබීමට, ප්‍රබෝධයක් ලැබීමට ආර්‍ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කිරීමට අවශ්‍ය මඟපෙන්වීම ලබාගැනීමට ආදී වශයෙනි. සැබැවින්ම බුදුපියාණන් වහන්සේගේ ගුණයන් අතර ඉතාම ආකර්ෂණීය සහ කැපී පෙනෙන දෙය නම්, සෑම කෙනකු වෙතම උන්වහන්සේ පැතිරූ ආදරය සහ කරුණාවයි. උන්වහන්සේ සිදුකළ සෑම දෙයකම අරමුණ මේ ගුණාංගයයි. බුදුපියාණන් වහන්සේම මෙසේ පවසා ඇතඃ "තථාගතයන් වහන්සේ හෝ තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයන් මේ

ලොව ජීවත්වන විට, කටයුතු කරන්නේ බොහෝ දෙනකුගේ යහපත පිණිසයි. ලෝකය කෙරෙහි ඇති කරුණාව නිසයි." (A.11.146)

# 06.ධර්මය, කර්මය සහ ස්වාභාවික විපත්

සම්පූර්ණ විශ්වයම එකිනෙකාට සම්බන්ධ හේතූන් සහ ඵල ඇතුළත් ජාලයක් බව බුද්ධ ධර්මය උගන්වයි. හේතුකාරක වර්ග දෙකකි: ස්වාභාවික හේතුකාරක සහ ධර්මානුකූල හේතුකාරක වශයෙනි. ස්වාභාවික හේතුකාරකයට සහ ධර්මානුකූල හේතුකාරකයට මිනිසුන් හොඳ හෝ නරක වීම අදාළ නැත. එය හුදෙක්ම විශ්වයේ විවිධ බලවේග එකිනෙකා මත ක්‍රියාත්මක පදාර්ථයකි. වැහි කුණාටුවක් හෝ අස්වැන්න පැසීම ස්වාභාවික හේතුකාරකයකට උදාහරණයකි. ස්වාභාවික හේතූන් සත්තකින්ම අප මත බලපෑමක් ඇති කරයි. වැහි කුණාටුවකට හසුවීමෙන් අපට සෙම්ප්‍රතිශ්‍යාවක් ඇතිවිය හැකිය. නමුත්, සෙම්ප්‍රතිශ්‍යාවකින් පෙළීම සදාචාරය හෝ දුරාචාරය හා සබැඳි පැරණි ක්‍රියාවන් සමඟ සම්බන්ධතාවක් නැත. එය ස්වාභාවික හේතුවක ස්වාභාවික ඵලයකි. ධර්මානුකූල හේතුවක් යනුවෙන් අදහස් කරන්නේ, මිනිසුන් සිතන, කථාකරන සහ ක්‍රියාකරන අයුරු සහ ඔවුන් සිතන ආකාරයේ ප්‍රතිඵලයකි. බුද්ධ ධර්මයේ කර්මය හුදෙක් ධර්මානුකූල හේතුවක් සමඟ අදාළ වේ. කෙනෙකුට උපකාරී වීම, ස්තුතිවන්ත වීම සහ ඒ පිළිබඳව සතුටු වීම, යමක් සොරකම් කිරීම, එයට හසුවීම සහ ඊට පසු ලජ්ජාවට හෝ නින්දාවට පත්වීම යනාදිය ධර්මානුකූල හේතුකාරක වේ. පුද්ගලයෙකුගේ සතුට හෝ අසතුට ඔවුන් ක්‍රියාකළ ආකාරයේ ඍජු ප්‍රතිඵල වේ. පුද්ගලයෙකුගේ ක්‍රියාවන් සඳහා "විපාක දීමක්" හෝ "දඬුවම් දීමක්" සිදු නොවේ. ඔවුන්ගේ සතුට හෝ අසතුටම හුදෙක් ඔවුන්ගේ ක්‍රියාවල ප්‍රතිඵල වේ. දැන් අපි කර්මය නමැති ධර්මය සැලකිල්ලට ගෙන මෑත කාලයේ ඉන්දියන් සාගරයේ ඇතිවූ සුනාමිය විග්‍රහ කරමු.

සුනාමිය ස්වාභාවික හේතුකාරකයෙන් ඇතිවූ සිද්ධියකට උදාහරණයකි. පොළොව මත භූචලන ලෝහ සසල වීමෙන් භූමි කම්පාවක් ඇතිවී, මුදා හැරෙන ශක්තියෙන් විශාල රැලි නිර්මාණය වේ. ඒවා වෙරළේ හැපුණොත්, අතිශය ප්‍රබල විනාශයක් ඇති කරයි. මෑතකදී ඇතිවූ සුනාමිය බලපෑ ප්‍රදේශවල ජීවත් වූ පුද්ගලයන්ට ආකාර දෙකකින් දුක්විඳින්නට සිදුවිය. ස්වාභාවික හේතුකාරකයෙන් සහ ධර්මානුකූල හේතුකාරකයෙනි. ඒ කර්මයයි. මහ ගංවතුරකින් ගසක් වැටීමෙන් පුද්ගලයෙකුට පහර වදින්නට පුළුවන. ලෝහ කැබැල්ලක් වැදී කැපීමට හෝ තාප්පයකට වැදී විනාශ වීමට ඉඩ ඇත. මේවා ස්වාභාවික හේතුකාරකවලින් ඇතිවන වේදනාකාරී ප්‍රතිඵලවලට උදාහරණයි. ඒවාට පැරණි, සදාචාර හෝ දුරාචාර ක්‍රියාවන් හා සබඳතාවක් නැත.

කර්මය, මිනිසුන්ගේ හිතාමතා කළ සිතුවිලි, වචන සහ ක්‍රියාවන් (විපාක) හා අදාළ වේ. පුද්ගලයන් සුනාමියට ප්‍රතිචාර දැක්වූ විවිධ ආකාර සහ ඔවුන්ට බලපෑ ආකාරය පිළිබඳව මම උදාහරණයක් දෙන්නම්. අපි කියමු, එක් මිනිසකු සහ ගැහැනියක සුනාමියෙන් තුවාල ලැබ, ඔවුන්ට ඔවුන්ගේ නිවාස සහ ජීවනෝපායද අහිමිවූ බවක්; එම මිනිසා බලාපොරොත්තු සුන්වී, "ඇයි මම?" ඔහු හඬයි. "මම පමණද අද නගරයෙන් පිට? " ඔහු කෝපයෙන් සහ කනගාටුවෙන් කියයි. මේ ආකාරයට සිතමින් ඔහු ඔහුගේ වේදනාව වැඩිකර ගනියි. නමුත්, ඉතා ඉක්මනින් ඔහුගේ සිතුවිලි වෙනස් වෙයි. ඔහු ඔහුගේ අසල්වැසියාගේ නිවසටත් ටිකක් හානි සිදුවී ඇති බව දැනගනියි. ඔහු මෙසේ සිතයි: "ඒ එපා කරපු මිනිසා, මම ඔහුට කවදාවත් කැමති නැහැ, ඔහුගේ නිවස විනාශ නොවීම දුකට හේතුවක්." ඔහු තවදුරටත් තමාගේ දුක වැඩිකර ගනියි. එසේම ඔහු කැත සහ අශුභවාදී මානසික තත්ත්වයක් තහවුරු කරයි. "හොඳයි, සෑම මිනිසාම තමාටම" ඔහු වටපිට බලමින් අහල පහළ නිවෙස්වලින් යමක් සොරකම් කිරීමට ඇත්දැයි සොයමින්, ඇවිදින්නට පටන් ගනියි. දැන් ඔහුගේ අසුබවාදී සිතුවිලි සහ හැඟීම් කායික ක්‍රියා සඳහා යොමුවී ඇත.

අපි දැන් එම කාන්තාවගේ ප්‍රතික්‍රියාවන් කුමක්දැයි විමසමු. ඇය තමාගේ ආරම්භක කම්පනයෙන් සුවය ලැබූ පසු ඇයගේ පළමු සිතුවිල්ල වූයේ, "මා නොමැරී ජීවත් වීමට ලැබීම කෙතරම් වාසනාවක්ද?" ඇය දුක් විඳ ඇත, නමුත් ඇය කනගාටුවෙමින්, බලාපොරොත්තු සුන්කර ගනිමින් හෝ කෝපවීමෙන් තමාගේ වේදනාව වැඩිකරගෙන නැත. ඊට පසු ඈ මෙසේ සිතයි: "මට වඩා නරක තත්ත්වයේ සිටින අය ඇති. ඔවුන්ට උපකාර කරන්නේ කෙසේද කියා මම සොයා බැලිය යුතුයි."ඈ තුවාලවූවන් සොයන්නට පටන් ගත්තාය. අනෙක් අය ගැන සිතමින් ඈ තමාගේම තත්ත්වය පිළිබඳව උපේක්ෂා සහගතව සිතුවාය. නැවත වරක් ඇයගේ වේදනාවට මෙය එකතු කිරීමක් නොවීය. පසු දින, රජය විසින් බෙදාහරින ලද ආහාර ස්වල්පයක් ලබාගැනීමට ඇයට හැකිවිය. ඇය ඇවිදගෙන යන විට ඇයට ආහාර නොලැබූ දරුවකු දකින්නට ලැබුණි. ඈ දරුවා සනසා ඔහුත් සමඟ ආහාර බෙදාගත්තාය. දරුවාට වෙනත් කෙනෙකු නොමැති බව දැන ඈ ඔහු බලාගැනීමට තීරණය කළාය. දින කිහිපයකට පසු දරුවාගේ පියා දරුවා දැක, එම කාන්තාව දරුවා බලාගැනීම පිළිබඳව ඇයට කෘතඥ වූයේය. දරුවාගේ පියා සුනාමියෙන් බලපෑමක් නොවූ යාබද නගරයක, ඔහුගේ සහෝදරිය සමඟ ජීවත් වෙයි. ඔහු මෙම කාන්තාවටද ඔහු සමඟ ජීවත්වීමට ආරාධනය කරයි. එවිට ඇයට ජීවත්වීමට ආහාර හා නවාතැනක්ද ලැබේ. එම කාන්තාවගේ ධනාත්මක සිතුවිලි සහ ක්‍රියා ඇයගේ ජීවිතයට ස්ථිර සහ ධනාත්මක බලපෑමක් ඇතිකර ඇත.

මෙම කථාවේ එන මිනිසා එක් ආකාරයකටත්, කාන්තාව තවත් ආකාරයකටත්, ප්‍රතිචාර දැක්වූයේ ඇයි? එයට හේතුව ඔවුන් අතීතයේදී ඔවුන්ගේ විවිධ අත්දැකීම්වලට ප්‍රතිචාර දැක්වූ ආකාරයයි, ඒ ඔවුන්ගේ පෙර කර්මය නිසා. මිනිසාගේ පැරණි සෘණාත්මක මානසික පුරුදුවලින් (කම්ම) අදහස් කරන්නේ ඔහුට දැන් සෘණාත්මක මානසික පුරුදු ඇති බවයි. පිළිවෙළට ඔහුට සෘණාත්මක මානසික පුරුදු අනාගතයේදීද ඇතිවීමට බොහෝ ඉඩකඩ ඇත. මෙම මානසික පුරුදු වෙනත් ලෙසකින් දුක් විඳිනවාට වඩා ඔහුට විඳින්නට සිදුවේ. (විපාක) ඔහුගේ සෘණාත්මක සිතුවිලි ඔහුගේ කායික වේදනාවලට එකතු වේ. පුද්ගලයෙකු විශාල ගලක් තම පාදය මත වැදීමෙන් ඔහුට කායික වේදනාවක් ඇතිවේ. ඔහු ඒ පිළිබඳව තරහක් ඇති කර ගත්තොත් (තරහ, සෘණ සහ අප්‍රසන්න හැඟීම්) මෙම මානසික වේදනාව කායික වේදනාවට එකතු වීමක් පමණයි සිදුවන්නේ. මෙම කාන්තාව (ඇය මුස්ලිම්, බෞද්ධ, ක්‍රිස්තියානි, හෝ ආගමක් නැති) හොඳ සිතුවිලි සහ ක්‍රියා ඇතිකිරීම වැදගත් ලෙස සැම විටම ඉගෙනගෙන සහ විශ්වාස කර ඇත. එසේම ඒවා වැඩිදියුණු කරගැනීමට සැමවිටම උත්සාහ කර ඇත. අතීතයේ ඇය සතුව තිබූ මානසික පුරුදුවලින් (කම්ම) අදහස් කරන්නේ, ඇයට දැන්ද ධනාත්මක මානසික පුරුදු තිබෙන බවත්, වෙනත් ලෙසකින් අනාගතයේදී ද ඇයට ධනාත්මක මානසික පුරුදු ඇතිවන බවත් ය. මෙම මානසික පුරුදු ඇයගේ දුක්විඳීම් අවම කර ඇති අතර, දරුවාගේ පියා ඇය රැකබලා ගැනීමට මඟ පෑදුණි. වෙනත් වචනවලින් කියනවා නම් ඇයගේ ධනාත්මක, එයින් පෙර ක්‍රියාවන් (කම්ම) වර්තමානයේ ධනාත්මක ප්‍රතිඵල (විපාක) ලැබීමට හේතුවිය.

එමනිසා බුද්ධාගමට අනුව විපතට පත්වීමේ - අත්විඳීමෙන් ඇතිවූ කායික වේදනා විවිධ ස්වාභාවික හේතූන්ට ඔවුන් ප්‍රතිචාර දක්වන ආකාරය ඔවුන්ගේ කර්මයයි. අනාගතයේදී ඔවුන්ගේ සෘණාත්මක හෝ ධනාත්මක ප්‍රතිචාරවල ප්‍රතිඵල (හෙට, ලබන මස, ලබන වසර, සමහර විට ලබන ආත්මය) ඔවුන්ගේ විපාකයි. සීමිත දැනුමක් සහ බලයක් ඇති මිනිසුන් වශයෙන් ස්වාභාවික හේතූන් සම්බන්ධයෙන් අපට ඇත්තේ සීමිත බලපෑමකි. කෙසේ නමුත් අපට හැකියාවක් තිබෙනවා, අවස්ථාවන් තුළට අපගේ ප්‍රතිචාර හැඩගස්වමින් බලපෑම් කිරීමට, අප ප්‍රායෝගික අයුරින් අපගේ මතය දියුණු කිරීමට උත්සාහ නොගතහොත්, අනාගතයේදී බලාපොරොත්තු නැති සහ පිළිගත නොහැකි අවස්ථාවන්ට අපට යටත්වීමට සිදුවේ. විශේෂයෙන්ම භාවනාව තුළින් අප අපගේ මනස දියුණු කරගැනීමට උත්සාහ කළහොත්, අපට කරදර විඳදරා ගැනීමට, හොඳින් සූදානම් වීමට සහ අනාගත විපත් ජයගැනීමට පවා හැකිවේ.

මේ ප්‍රවෘත්ති දෙකම උදාහරණවලින් පිරී ඇත. මිනිස්සු මෙසේ අසති: "එවැනි බිහිසුණු අවස්ථාවක දුක, කාංසාව සහ බියෙන් නිදහස්ව සිටිය හැක්කේ කෙසේද?" නමුත් සමහර පුද්ගලයෝ එසේ සිටිති. ශ්‍රී ලංකාවේ එක් මිනිසෙකුට ඔහුගේ බිරිය සහ දරුවෝ දෙදෙනා අහිමි වූහ. මුළුමනින්ම විනාශ විය. කෙසේ නමුත්, පුහුණුවන බෞද්ධයකු වශයෙන්, දින දෙකකට පසු කුසගින්නෙන් පෙළෙන, හඬමින් සිටින, දරුවන් දෙදෙනෙකු තමන්ගේ මියගිය දෙමව්පියන් අසල සිටින විට හමුවීමත් සමඟ ඔහු තමාගේ වේදනාවෙන් ප්‍රකෘති තත්ත්වයට පත්විය. ඔහු එම දරුවන් හදාවඩා ගැනීමට තීරණය කළේය. පෙනෙන ආකාරයට, අනෙක් මිනිසුන්ද මෙම දරුවන් දැක ඇත. නමුත් උපකාර කිරීමට කිසිවක් කර නැත. එම පුද්ගලයා සමඟ කථාකළ විට ඔහු පවසා ඇත්තේ, එම හදාවඩාගත් දරුවන් දෙදෙනා ඔහුගේ ජීවිතයට නව අර්ථයක් සහ කරදර මධ්‍යයේ ඉදිරියට යාමට ශක්තියක් ලබාදී ඇති බවයි. කොල්ලකමින් සහ සොරකම් කරමින්, අවුල්සහගත තත්ත්වයෙන් වාසි ලබාගැනීමට කටයුතු කළ වෙනත් මිනිසුන් පිළිබඳව ද අපි දැනගත්තෙමු. අප සැම කෙනෙක්ම අප කටයුතු කරන ආකාරයට, ක්‍රියා කිරීමට තෝරාගන්නා අතර, අපි ඒවායේ ප්‍රතිඵල ඒ අනුව භුක්ති විඳිමු. සිංගප්පූරු ජාතිකයෙකු මේ විපත දැනගත් විට, ඔහුගේ වාහනය පුරවාගෙන තායිලන්තයට ගියේ විපතට පත්වූවන්ට ආහාර සහ ජලය බෙදාදීමේ අභිප්‍රායෙනි. ශෝකයට කරුණ නම්, ඔහුගේ වාහනය ලිස්සා ගොස්, ඔහු මරුමුවට පත්වීමයි. මිනිස්සු මෙසේ ඇසූහ: "ඔහුගේ හොඳ ක්‍රියාවන් තිබියදීත්, ඔහු දුකට පත්වූයේ ඇයි?" නමුත්, එවැනි ප්‍රශ්නයකින් පෙන්නුම් කරන්නේ ස්වාභාවික හේතුකාරකයක් හා ධර්මානුකූල හේතුකාරකයක් අතර තිබෙන ව්‍යාකුලත්වයයි. අනෙක් අයගේ වේදනාව වෙනුවෙන් මේ පුද්ගලයාගේ වේගවත් සහ ප්‍රායෝගික ප්‍රතිචාරය ඔහු සතුව තිබූ විශාල අනුකම්පාව පෙන්වයි. ඒ නිසා ඔහුගේ ඊළඟ භවයේදී ඉතාම ධනාත්මක ප්‍රතිඵල ඔහුට ලැබේවි. ඔහුට ඇතිවූ අනතුර ඔහුගේ හොඳ හෝ නරක ක්‍රියාවලට අදාළ නොවේ. එය ස්වාභාවික හේතුකාරයක ප්‍රතිඵලයකි, ක්ෂණික ලෙස අවධානය අඩුවීම, තිරිංග දෝෂ සහිත වාහන, ලිස්සන සුලු මාවත්, වර්ෂාව නිසා ආදී වශයෙන්. අප යහපත්වූ නිසාම, අපට කවදාවත් ස්වාභාවික හේතුන්ගෙන් පීඩා නොවේයැයි අදහස් කළ නොහැකියි. එයින් අදහස් කරන්නේ ස්වාභාවික හේතුන් නිසා පීඩා විඳින විට අපගේ වේදනාව, පීඩාව වැඩිකරවන ඍණාත්මක හේතුන් අඩුවීමට ඇති සම්භාවිතා පිළිබඳවයි.

සුනාමියෙන් මරණටයට සහ හානියට පත්වීම එම පුද්ගලයන්ගේ පැරණි, අයහපත් ක්‍රමය නිසා සිදුවූ බව අවබෝධයක් නැති බෞද්ධයෙකු කියන්නට පුළුවන. මෙය බුදුපියාණන් වහන්සේ දේශනා කළ ධර්මයට විරුද්ධ බව

තදින්ම කිව යුතුයි. දේවදහ සූත්‍රයේ (M.11.214 සහ (A.1.173) බුදුපියාණන් වහන්සේ වදාරා ඇත්තේ සෑම අත්දැකීමක්ම පැරණි ක්‍රම නිසා (සබ්බං තං පුබ්බෙ පුබ්බෙ කතහේතු) යැයි විශ්වාස කිරීම වැරදි සහ ව්‍යාජ අදහසක් (මිච්ඡාදිට්ඨි) බවයි. සීවක සූත්‍රයේ (S. IV. 228) උන්වහන්සේ කියා ඇත්තේ අප ඇතැම් වේලාවට අත්දකින වේදනා කර්මය නිසා විය හැකිය, නමුත්, ඒවා ලෙඩ රෝග, දේශගුණය, නොසැලකිල්ල හෝ බාහිර හේතූන් (ඕපක්කමිකානි) නිසා විය හැකිය, සුනාමිය තුන්වන හේතුවට සහ අවසාන හේතුවට හොඳ උදාහරණයයි. සියලු කර්ම, ධනාත්මක හෝ ඍණාත්මක වූවත්, සැබැවින්ම බලපෑමක් ඇත.

නමුත් සියලු ප්‍රතිඵල කර්මය නිසා සිදු නොවේ. නමුත් මෙම ආපදාවට සම්බන්ධයක් නොවීමට තරම් වාසනාවන්ත වූ අප ගැන කියන්නට ඇත්තේ කුමක්ද? කර්මය පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ධර්මය අපට අදාළ වන්නේ කෙසේද? ඉහත සඳහන් කළ පුරුෂයා සහ කාන්තාව මෙන් සුනාමිය පිළිබඳව අපගේ ප්‍රතිචාරය ඍණාත්මක හෝ ධනාත්මක විය හැකිය. පුද්ගලයකු මෙම ඛේදවාචකය පිළිබඳව කියවා, ඔහුගේ උරහිස සොලවා, ක්‍රීඩා පිටුවට යොමු වන්නට හැකිය. ආපදාවට ලක්වූවන් උදෙසා පරිත්‍යාගයක් සඳහා ඉල්ලීමක් කළ විට, මේ සතියේ මුදල් නැතැයි කියා ප්‍රතික්ෂේප කරන්නට ඉඩ ඇත. එසේ නැත්නම් ආධාරයක් දී, සෑම තැනම ඇගයීමට ලක්වීම සඳහා ඒ බව ප්‍රචාරය කරන්නට ඉඩ ඇත. ඔහු සෑම විටම කරන ආකාරයට වෙනස් දෙයක් කිරීමට අවස්ථාව ලැබුණත් එයින් ප්‍රයෝජන ගැනීමට අපොහොසත් විය හැකිය. ඔහු දියුණු වීමට හෝ වෙනස් වීමට අපොහොසත් වී ඇත. ඔහු හුදෙක්ම පරණ පුරුදු වන, කෑදරකම, උඩගු බව, අනුකම්පා විරහිත බව යනාදිය කරගෙන යනවා ඇත. නමුත්, සෑමවිටම වඩාත් අනුකම්පා රහිත සහ තමා තුළම ගැලෙන පුද්ගලයකුට ස්ථානීයව තියුණු අනුකම්පාවක් හටගත්තා යයි සිතමු. එවිට අතීතයේ ඔහු සෑමවිටම කළ ආකාරයටම අනුකම්පාවේ ආලෝකය මගහැරීම වෙනුවට ඔහු ක්‍රියාත්මක වීමට තීරණය කරයි. ඔහු රතු කුරුසයට ගොස් ඉතා නොමසුරු පරිත්‍යාගයක් කරයි. ස්වෙච්ඡා සේවකයන් සඳහාවූ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින්, එම මොහොතේම පෙලඹුණු ඔහු එම මොහොතේම අස්සන් කර, ඉදිරි සති කිහිපය තුළ ඔහුගේ සියලු නිදහස් කාලය, පරිත්‍යාග එකතු කරමින් සහ වෙනත් ආකාරයෙන් උදව් කරමින් ගත කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ ආත්මාර්ථකාමී මානසික පුරුදු දුර්වලවී, ධනාත්මක පුරුදු ශක්තිමත් විය. ඔහු ගම් මට්ටමටම දියුණු විය; වෙනස් විය. ඉදිරි අනාගතයේදී එසේ ධනාත්මක අයුරින් හැකි සෑම අවස්ථාවකදීම ඔහු නිරන්තරවම ක්‍රියා කළේ නම්, ක්‍රමයෙන් ඔහු තවත්

ප්‍රසන්න පුද්ගලයකු බවට පත්විය හැකිය; සමහර විට ඉතාම සන්තෝෂවන්ත පුද්ගලයකු බවට පත්විය හැකිය.

ඒ නිසා සුනාමි වැනි ඛේදවාචකයේදී වුවත් සැබැවින්ම ධනාත්මක පැත්තක්ද ඇත. පළමුව එය නොමසුරු බව, සත්කාරය සහ අනුකම්පාව දියුණු කරගැනීමට අවස්ථාවකි. දෙවනුව, තත්ත්වාරෝපිත ලෝකයේ ජීවිතය අසතුටුදායකය යන බුදු දහම ... දුක්ඛ සත්‍යම, මෙනෙහි කිරීමට අපට අවස්ථාවක් ලැබේ. එවැනි මෙනෙහි කිරීමක් අප ස්වයංතෘප්තියෙන් පුබුදුවා, අපගේ ජීවිතය කෙතරම් සැපදායි වුවත්, එය ඕනෑම අවස්ථාවක වෙනස් වියහැකි බව අපට සිහිපත් කරයි. මෙය නිසරු ලෞකික ලුහුබැඳ යාමෙන් අර්ථවත් ආධ්‍යාත්මික අරමුණු වෙත යොමුවීමට අපට උපකාර කරයි.

# 07.බුදුපියාණන් වහන්සේ ගුරුවරයකු වශයෙන්

පණිවිඩයක් කෙතරම් තර්කානුකූල හෝ සත්‍යය වුවත්, එය අනෙක් අයට සන්නිවේදනය කළ නොහැකි නම් එහි ප්‍රයෝජනයක් නැත. ධර්මයෙහි අපට පරිපූර්ණ ඉගැන්වීමක් ලබාදී ඇත. බුදුපියාණන් වහන්සේ තුළ අපට පරිපූර්ණ ගුරුවරයෙක් ඇත, කෙටි කාලයක් තුළ මේ දෙකේ සම්මිශ්‍රණය පළමු වරට අනාවරණය කිරීමෙන් පසු ධර්මය විශිෂ්ට ලෙස පැතුරුණේය. සියලු මිනිස් සංහතියටම තමන් වහන්සේගේ පණිවිඩය පළමුවරට අනාවරණය කළ සහ එසේ කිරීමට ස්ථිර උත්සාහයක් ගත් ගුරුවරයා බුදුපියාණන් වහන්සේය. උන්වහන්සේ මුළු විශ්වයටම සර්වවිශ්වීය පළමු ආගමික නායකයා විය. උන්වහන්සේ තමන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන්ට ධර්මය බොහෝ දුරට ව්‍යාප්ත කිරීමට උපදෙස් දුන්හ. "බොහෝ දෙනාගේ සතුටට, ලෝකයට අනුකම්පාවෙන්, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ ශුභසිද්ධියට, යහපත සහ සතුට වෙනුවෙන් ඉදිරියටම යන්න. දෙදෙනකු එකම මඟ නොයන්න. ආරම්භය, මැද, අවසානය ප්‍රසන්නවූ ධර්මය උගන්වන්න. සම්පූර්ණයෙන්ම සම්පූර්ණ කළ සහ හැම අතින්ම පිරිසිදු, පූජනීය ජීවිතයේ වචනයෙන් සඳහන් කළ පරිදිම හරය අනාවරණය කරන්න." (Vin. IV.20)

තමන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු ධර්මය තවදුරටත් පැතිරී යෑම අපේක්ෂා කළ උන්වහන්සේ උන්වහන්සේගේ පැවිදි සහ ගිහි ශ්‍රාවකයන්ට ඒ අනුව උපදෙස් දුන්හ. "භික්ෂූන්, භික්ෂුණීන්, ගිහි උපාසක උපාසිකාවන් ගැඹුරු ලෙස උගත්, බුද්ධිමත් සහ මනා පුහුණුවක් ලබන තුරු, ධර්මය මතක තිබෙන තුරු, ධර්මයේ වැදගත් බවින් අඩු, අත්‍යවශ්‍ය බවින් අඩු කරුණු (උදාහරණ වශයෙන් පරිත්‍යාගශීලී බව හෝ පුද්ගලයෙකු දෙමව්පියන් ආදීන්ට ගරු කිරීම් ආදිය) සහ ධර්මයේ වැදගත් බවින් වැඩි කරුණු (උදාහරණ වශයෙන් චතුරාර්‍ය සත්‍ය, පටිච්චසමුප්පාදය ආදිය) නිපුණ වනතුරු, සුචරිතවත් වනතුරු, ධර්මය ඒ අය විසින්ම ඉගෙනගන්නා තුරු, ඒ අයට උගන්වන්නට හැකිවන තුරු, උගන්වන තුරු, ධර්මය පිළිබඳව හොඳින් විශේෂ දැනුමක් ඇතිකරගන්නා තුරු, සොයාබලන තුරු, හෙළිදරව් කරන තුරු, තේරුම් කරදෙන තුරු, පැහැදිලි කරන තුරු, වෙනත් අය උගන්වන අසත්‍යය ධර්මය අසත්‍යය බව ඔප්පු කරන තුරු, දේශ දේශාන්තරවල ධර්මය ඒත්තු ගැන්වීමට සහ නිදහස් කරගැනීමට හැකිවන තුරු මම පිරිනිවන් නොපාමි. පූජනීය ජීවිතය සාර්ථක වනතුරු, සපල වනතුරු, ඇගයෙන තුරු සහ ජනප්‍රිය වනතුරු, එය ඉතා හොඳින් දෙවිවරු සහ මිනිසුන් අතර ප්‍රසිද්ධ වනතුරු මම පිරිනිවන් නොපාමි." (D.11.104)

බුදුපියාණන් වහන්සේගේ ධර්මය ප්‍රසිද්ධ කිරීමේ අරමුණ වූයේ කරුණාවයි. උන්වහන්සේ මෙසේ වදාළහ: "තම ශ්‍රාවකයන්ගේ ශුභසිද්ධිය උදෙසා ගුරුවරයකු අනුකම්පාවෙන් කුමක් හෝ කළයුතුව තිබේද, ඒ සියල්ලම මම ඔබ සැම වෙනුවෙන් කර ඇත්තෙමි." (M.I.169)උන්වහන්සේ තණ්හාවෙන් ඉතාම අසහනකාරී තත්ත්වයට පත් මිනිසුන්, වෛරය නිසා වධවේදනා විඳින මිනිසුන් සහ මෝහය නිසා නොමග ගිය මිනිසුන් දුටුවහ. ඒ මිනිසුන්ට ධර්මය ශ්‍රවණය කරන්නට සලස්වා පුරුදු පුහුණු කළහැකි වුවොත්, ඔවුන් සතුටට පත්කිරීමට හැකි බවත්, සුචරිතවත් වී නිදහස් වීමට හැකි බවත් උන්වහන්සේ දුටුවහ. උන්වහන්සේගේ මෙම අනුකම්පාව, උන්වහන්සේ වෙහෙස නොබලා ක්‍රියා කරන විශාරද ගුරුවරයකු බවට පත් කළේය. උන්වහන්සේගේ ඉගැන්වීමේ තාක්ෂණය, අධ්‍යයනය කර, අපට අනෙක් අයට ධර්මය නිරාවරණය කිරීමේ ප්‍රයත්නයට උපකාරී වනවා පමණක් නොව, මෙම ඉතාම අනුකම්පා සහගත බුද්ධිමත් මිනිසා කෙරෙහි අපේ කෘතඥතාව තීව්‍ර වන්නටද හේතු වේ.

බුදුපියාණන් වහන්සේ මිනිසුන් වෙත ළඟාවූයේ ඔවුන්ගේ අවශ්‍යතා සහ චිත්ත ස්වභාවය අනුවය. සාමාන්‍යයෙන් යහපත් පුද්ගලයන් උන්වහන්සේ මුණගැසීමට පැමිණි අතර, අයහපත් හෝ දුකට පත් මිනිසුන් වෙත උන්වහන්සේ වැඩියහ. මේ අවස්ථා දෙකේදීම, උන්වහන්සේ පළමුව ප්‍රාරම්භක කාරණය (ආනුපුබ්බි කථා), හෙවත් නොමසුරුබව, දැහැමි බව, දිව්‍යලෝක, ආශාවන්වලින් ඇතිවන භයානකත්වය සහ ඒවා අතහැරීමෙන් ඇතිවන වාසි පිළිබඳව කථා කළහ. ( D.I. 110) මෙයින් බුදුපියාණන් වහන්සේට අසන්නාගේ බුද්ධි මට්ටම සහ ග්‍රාහකත්වය දැනගන්නට ලැබුණි. ප්‍රතිචාරය හොඳනම්, උන්වහන්සේ ඊට පසු බුදුවරුන්ට අනන්‍ය සාධාරණවූ දුක, දුකට හේතුව, දුක නැති කිරීම සහ දුක නැති කිරීමේ මාර්ගය නම් වූ දහම උගන්වති."

බොහෝ විට බුදුපියාණන් වහන්සේ අප හඳුන්වන ධර්ම දේශනා හෝ සංවාද, ප්‍රශ්නෝත්තර මාර්ගයෙන් කණ්ඩායම් හෝ පුද්ගලයන් ඇමතූහ. උන්වහන්සේ සමග කථා කළ ජනයා, උන්වහන්සේ තුළ තිබූ සැම දෙනා පිළිගන්නා ගුණය ද, කථා කිරීමේ ගුණය ද, විනීතව, ප්‍රසන්නව පැහැදිලිව කථා කිරීමට ඇති සූදානම ද හඳුනා ගත්හ. (D.I.116) තමන්වහන්සේ දරන අදහස්වලට තදින්ම බැඳුණු මිනිසුන් හමුවූ විට ඔවුන් වෙනස් කළ නොහැකි බව පසක් කොට ගෙන උන්වහන්සේ ඵලක් නැති තර්ක මගහැරීම සඳහා එකඟවන්නාවූ කරුණු පමණක් සාකච්ඡාවට ගැනීමට යෝජනා කළහ. එවැනි අවස්ථාවල උන්වහන්සේ මෙසේ පැවසූහ: "මේ කරුණු සම්බන්ධයෙන් එකඟතාවක් නැත, අපි ඒවා පසෙක දමමු, අපට එකඟ වියහැකි කරුණු

ගෙන අපි සාකච්ඡා කරමු." (D.II. 124) සමහර විට තමන් වහන්සේගේම ධර්මය පිළිබඳව සාකච්ඡා කරනවා වෙනුවට ඔවුන්ගේ ඉගැන්වීම පළමුව, පැහැදිලි කරන ලෙස උන්වහන්සේ විරුද්ධවාදීන්ට ආරාධනය කළහ. විවිධ ආගම් අතර, විශාල ලෙස තරඟ සහ ඊර්ෂ්‍යාව තිබූ කාලයක, බුදුපියාණන් වහන්සේගේ සාධාරණත්වය බොහෝ විට පුදුමය ඇති කළේය. වරක් තවුසන් පිරිසක් බුදුපියාණන් වහන්සේ හමුවූ අතර, ඔවුන්ගේ නායකයා උන්වහන්සේගේ ධර්මය පැහැදිලි කරන ලෙස ඉල්ලුවේය. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "එහෙම වූවත්, වඩා හොඳයි ඔබ සැමගේ ඉගැන්වීම මට කියන්න." තවුසෝ මවිතයට පත්වූහ. එකිනෙකාට මෙසේ පැවසූහ: "පුදුමයි සැබැවින්ම විස්මයජනකයි, ගෝතම තවුසා කෙතරම් උතුම්ද, ඔහු තමාගේ අදහස් නොදී තබාගෙන, අනෙක් අයට ඒ අයගේ අදහස් කියන්නට ආරාධනය කරයි." (D.III. 40) මිනිසුන් විශේෂයෙන්ම ගැළපෙන සහ අදාළ ප්‍රශ්න ඇසූවිට, බුදුපියාණන් වහන්සේ ඔවුන් අගය කර, සාකච්ඡා කර, ප්‍රශ්න කිරීමට සහ විමසීමට උනන්දු කළහ. භද්‍ද එවැනි ප්‍රශ්නයක් ඇසූ විට, බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ:"හොඳයි, කිවූ දෙය හොඳයි, හොඳයි කිවූ දෙය, භද්‍ද මිතුර, ඔබගේ තේරුම් ගැනීම පිළිගනිමි. ඔබගේ බුද්ධිය පිළිගනිමි." (S.V.15)

පැරණි ඉන්දියාවේ ආගමික ජීවිතයේ සාකච්ඡා, වාද විවාද ඉතා සාමාන්‍ය අංගයක් විය. එසේම කථකයන් තමන්ගේ ධර්මය තමන්ගේ විර්ද්ධවාදීන්ගේ හෝ විවේචකයන්ගේ පහරගැසීම්වලින් ආරක්ෂා කරගැනීමට කරන කථා ඇසීමට විශාල පිරිසක් එක් වූහ. සමහර විට අනික් අයගේ කෑ මොරගැසීම් නැවැත්වීමට හෝ සමච්චලයට ලක්කිරීමට පාර්ශ්වයන් මෙම වාද විවාද තුළින් උත්සාහ කරන විට, පාලනය කර නොගත හැකි තරමට දැඩි ආවේග සෑහෙන ප්‍රමාණයකට උණුසුම් විය. මෙම වාද විවාදවලට සම්බන්ධ වූවත්, ඇතැම් විට ජය ලබාගැනීමට හෝ අඩු තරමින් ජය ලැබෙන බවට හැඟීමක් ඇති කිරීමට, ප්‍රයෝගකාරී ක්‍රියාවල යෙදීමට සූදානම් වූ නිසා කථකයාගේ අභිමානය සහ කීර්තිය අවදානමට ලක් විය. හත්ථක නමැති භික්ෂුව, වාද කිරීම තුළින් සතුටක් ලැබුවේය. නමුත්, පසුව විවිධ පරාජයන් ලැබුවේය. ඊට පසු ඔහු තමාගේ විරුද්ධවාදීන් එක් විශේෂ අවස්ථාවක හමුවීමට සූදානම් කළේය. ඊට පසු පැය කීපයක් කලින් මතුවී පෙනෙන්නට සිට, ඊට පසු තමන්ගේ විරුද්ධවාදීන් තමන්ට මුහුණදීමට ඉතා බිය වූ බවට ඔහු අගය කරන බව පුරසාරම් දෙඩුවේය. (Vin.II.266) සමහර විට බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රගමනයේ මුල් කාලයේදී එවැනි විවාද මඟහැරියේ බොහෝ දුරට මෙම හේතූන් නිසා විය හැකිය. (S.N. 780)

නමුත්, ක්‍රමයෙන් ධර්මය වඩාත් ජනප්‍රිය වන විට සහ වෙනත් නිකායවල භික්ෂූන් අභියෝග කිරීම් හෝ අසත්‍ය, තොරතුරු සැපයීම ආරම්භ කළ විට, බුදුපියාණන් වහන්සේ වාද-විවාද බහුලව සිදු කළහ. සැබැවින්ම, උන්වහන්සේ එකල ඒත්තු ගැන්වීමේ ඉතාම සමත් තර්ක කරන්නා ලෙස ඉක්මනින්ම පිළිගන්නා ලදී. වාද-විවාද පැවැත්වීමේ ඇතැම් නීති ප්‍රමිති පද්ධතියක් තිබුණු අතර, බුදුපියාණන් වහන්සේ සැමවිටම මෙම නීතිවලට බැඳී සිටි අතර, අනෙක් අයද එසේ කිරීම බලාපොරොත්තු වූහ. බුදුපියාණන් වහන්සේ උගත් බ්‍රාහ්මණයන් සමඟ වරක් මෙසේ වාද-විවාදයක් පවත්වන අතරේ චංකි නමැති තරුණයෙක් ඒ මැදට පැන්න විට, බුදුපියාණන් වහන්සේ දැඩි සේ මෙසේ පැවසූහඃ"නිශ්ශබ්ද වන්න චංකි, අපි කථා කරන අතරට පැමිණ බාධා නොකරන්න.' (M.II. 168) තුන්වරක්ම ප්‍රශ්නයක් ඇසීමෙන් අනතුරුවත්, පුද්ගලයෙකුට පිළිතුරු සැපයිය නොහැකි වුවහොත්, නීතියට අනුව, ඔවුන් පරාජය පිළිගත යුතු බවට බුදුපියාණන් වහන්සේ බලකර සිටියහ.(A. I. 185-88) වරක් බුදුපියාණන් වහන්සේ එක තවුසෙකුගෙන් ඔහු දරන අදහස අප්‍රමාදව විශ්වාස කරන්නේ දැයි ඇසූහ. තවුසා මෙසේ පැවසුවේයඃ "මම එය විශ්වාස කරමි, එසේම මේ සියලු දෙනාත් එසේමයි" කියමින් ඉදිරියෙන් සිටි විශාල පිරිස පෙන්වූයේය. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන් සේක. "කාරණය, ඔවුන් විශ්වාස කරන දේ නොවේ. එය ඔබේ අදහසද?" (M. III. 37)

නමුත්, උන්වහන්සේගේ අරමුණ වූයේ තමන් වහන්සේගේ විරුද්ධවාදීන් පරාජය කිරීම නොව, ඔවුන් පැහැදිලි අවබෝධයකට යොමු කිරීමයි. මෙම අවසන් අරමුණට එන්නට උන්වහන්සේ බොහෝ විට භාවිත කළේ සොක්‍රටීස් ක්‍රමයට සමානකම් තිබෙන දෙයකි. එනමින් හඳුන්වන්නේ බටහිර රටවල ඒ ක්‍රමය පළමුවරට භාවිත කළේ ග්‍රීක් ජාතික දර්ශනවාදී සොක්‍රටීස් නිසාය. මිනිසුන් සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාවට යොමු කිරීමට හෝ කරුණක් ඔප්පු කිරීම සඳහා පැහැදිලි ප්‍රශ්න ඇසීමයි. උදාහරණ වශයෙන් වරක් සෝනදණ්ඩ නමැති බ්‍රාහ්මණයෙක් එක සාකච්ඡාවකදී මෙසේ ප්‍රකාශ කළේයඃ "සැබෑ බ්‍රාහ්මණයකු සතුව පිරිසිදු පෙළපතක් ඇත. ඔහු පූජනීය ග්‍රන්ථ සම්බන්ධයෙන් ඉතා දැනුමැති කෙනෙකි. ඔහු වර්ණයෙන් පැහැපත්ය. ඔහු සුචරිතවත්ය. ඔහු ප්‍රඥාවන්තය. ඔහු සිරිත් විරිත් පිළිබඳ ප්‍රවීණයෙකි." බුදුපියාණන් වහන්සේ මෙසේ ඇසූහඃ"මෙම ගුණාංග එකක් හෝ අඩු පුද්ගලයකු බ්‍රාහ්මණයකු ලෙස හැඳින්විය හැකිද?" සෝනදණ්ඩ මොහොතකට සිතුවේය. ඊට පසු දුඹුරු වර්ණයක් ඇති පුද්ගලයකු සැබෑ බ්‍රාහ්මණයකු වියහැකි බව පිළිගත්තේය. එම ප්‍රශ්නයම දිගටම අසමින් සෝනදණ්ඩ බුදුපියාණන් වහන්සේගේ අදහසටම ගෙන ඒමට හැකිවිය. ඒ පෙළපත, දැනුම,

වර්ණය හෝ සමාජ තත්ත්වය නොව, මිනිසකු උසස් වන්නේ, සුචරිතය සහ ප්‍රඥාව නිසාම බවයි. (D.I.120-121)

සාර්ථක සන්නිවේදනයක් ඇතිකරන නිසා, හාස්‍යය මනෝවිද්‍යාවේ වැදගත් කාර්යයභාරයක් ඉටු කරයි. ඒ නිසාවෙන් සමහර විට බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීමේදී හාස්‍යය ඇතුළත් කරයි. උන්වහන්සේගේ දේශනා තුළ බුද්ධිමත් යුගලාර්ථ වචන, ප්‍රීතියට පමුණුවන කථාන්දර සහ බොහෝ සෙයින් උපහාසයත් ඇතුළත් වේ. අජාසත්ත රජතුමා තම පියා ඝාතනය කිරීමෙන් පසු, තමාගේම පුතා තමා ඝාතනය කිරීමට සැලසුම් කරන්නේ යැයි සැක කිරීමට පටන් ගත්තේය. ඔහු ලෝකයේ යසඉසුරට තිබෙන තණ්හාව, වේදනාකාරී බව අවබෝධ කරන්නට පටන් ගත්තේය. ඔහු බුදුපියාණන් වහන්සේගේ මඟපෙන්වීම ලබාගන්නට උන්වහන්සේ වෙත ගොස් මෙසේ ඇසුවේයඃ "බුදුපියාණන් වහන්ස, භික්ෂුවකගේ ජීවිතයෙන් ලබන්නට ඇති යහපතක් මෙතැන සහ දැන් පෙනෙන්නට තිබේද?" බුදුපියාණන් වහන්සේ ඔහුගෙන් ප්‍රශ්නයක් අසමින් පිළිතුරු දුන්සේක. "ඔබ ළඟ සිටි දාසයකු පැනගොස් භික්ෂුවක බවට පත්වූ පසුව ඔහු දැන් කව්ද කියා දැනගෙන ඔහු නැවතත් රැගෙන විත් සිරකරනවාද?" "සැබවින්ම නැත." රජතුමා පිළිතුරු දුන්නේය. "ඊට ප්‍රතිවිරුද්ධව, මම අසුනින් නැගිට ඔහුට ගෞරව කර ඔහුගේ ඕනෑකම් පිරිනමමි." "හොඳයි, දැක්කද?" බුදුපියාණන් වහන්සේ පැවසූහ. "ඒ මෙතැන සහ දැන් දැකගත හැකි භික්ෂුවක වීමේ වාසිය" (D.I. 60-61) මෙම පිළිතුරේ හාස්‍යමය ස්වභාවය පැහැදිලිව අජාසත්තට පහසුවෙන් සිටීමට අදහසක් විය. එය ඔහු දොම්නසින් ඉවත් කිරීමට සහ බුදුපියාණන් වහන්සේ ඊට පසු දෙන්නට යන වඩාත් කල්පනාකාරී වියයුතු පිළිතුරට ඉක්මනින් සම්පූර්ණයෙන්ම ග්‍රහණය කරගැනීමට පහසුවකි.

බුදුපියාණන් වහන්සේ බොහෝ විට බ්‍රාහ්මණයන්ගේ අයිතීන් කියාපෑම සහ ඔවුන්ගේ ඇතැම් විශ්වාසයන් දුර්වල බව සැලකූ විට යහපත් ස්වභාවයේ උසුළු විසුළු කළහ. අනෙක් අයට වඩා තමන් දෙවියන්ගේ මුඛයෙන් උපන් නිසා, ඉහළ බව ඔවුන් කියා සිටි විට බුදුපියාණන් වහන්සේ මෙසේ ප්‍රකාශ කළහඃ "නමුත්, ඔබ අනෙක් සියලු අය මෙන් මවගේ දරු ගැබෙන් බිහිවූවෙහිය."(M.II.145) බ්‍රාහ්මණයන්ගේ සියල්ල දන්නා දෙවියන් අසීරුතාවට පත්ව සිටින ස්වාභාවයෙන් ද, මඳ නොරිස්සුම් බවකින් යුක්ත නොවන ආකාරයෙන් ද, අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දිය නොහැකිව සිටින ආකාරයෙන් ද, නිරූපණය කෙරෙන කථාන්දර බුදුපියාණන් වහන්සේ පැවසූහ. (D. I. 215-222)

උපමා සහ රූපක භාවිත කිරීම බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමේ තවත් ගතිලක්ෂණයක් විය. තමන් වහන්සේ ජීවත්වූ ලෝකයේ තමන් වහන්සේගේ පුළුල් උනන්දුව සහ දැනුම මෙහෙයවමින් උන්වහන්සේ සාරවත්, විවිධත්වයෙන් යුතු උපමා සහ රූපක තමන් වහන්සේගේ ඉගැන්වීම් පැහැදිලි කිරීමට සහ ඒවා වඩාත් මතක තබාගැනීමට හැකිවන සේ භාවිත කළහ. උදාහරණ වශයෙන්, උන්වහන්සේ ධර්මය පුහුණු කිරීමට අපොහොසත් පුද්ගලයකු, සුවඳ නැති ලස්සන මලකට උපමා කළහ. (D.P. 51) වඩුවකු සිදුරක තිබෙන ලී ඇණයකට දෙවන ලී ඇණයෙන් තට්ටු කරන්නා සේ, අපි ඍණාත්මක සිතුවිලි ධනාත්මක සිතුවිලිවලින් ආදේශ කළයුතු බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. (M.I. 119) එසේම, අවධාරණයට ලක්කිරීමට නාට්‍යයක් හෝ රඟදැක්වීමට හෝ තමන්ගේ අදහස පැහැදිලි කිරීමට අතේ තිබූ ඕනෑම දෙයක් භාවිත කිරීමේ හැකියාවක් උන්වහන්සේට තිබුණි. අභය කුමරු වරක් බුදුපියාණන් වහන්සේ කවදා හෝ මිනිසුන් අසතුටු වන දෙයක් කියා තිබේද කියා ඇසුවේය. ඒ අවස්ථාවේදී කුමාරයා තම උකුළ මත තමාගේ ළදරුවා තබාගෙන සිටියේය. බුදුපියාණන් වහන්සේ දරුවා දෙස බලා මෙසේ පැවසූහ: "ඔබගේ පුත්‍රයා මුඛය තුළට ගලක් දාගත්තොත් ඔබ මොකද කරන්නේ?" අභය කුමරු මෙසේ පිළිතුරු දුන්නේය. "දරුවාට රිදුණත් මම එය කෙළින්ම ඉවතට ගනිමි. ඇයි? එය දරුවාට අනතුරුදායක නිසා සහ මට ඔහු ගැන අනුකම්පාවක් ඇති නිසා." එවිට බුදුපියාණන් වහන්සේ මෙසේ පැහැදිලි කළහ: මිනිසුන් අසන්නට අකමැති, එහෙත් ඔවුන්ට කිවයුතු දේ සමහරවිට තමන් වහන්සේ ඔවුන්ට කියන බවත්, නමුත් තමන් වහන්සේගේ අභිලාෂය වූයේ සෑම විටම ඔවුන් කෙරෙහි ඇති මහාකරුණාව බවත්ය. (M.I. 395)

බුදුපියාණන් වහන්සේගේ සූක්ෂ්ම ඉගැන්වීමේ තවත් ලක්ෂණයක් වූයේ පැරණි අදහස් හෝ, පුරුදුවලට නව හෝ ප්‍රායෝගික අර්ථ යොදමින් යළි අර්ථ නිරූපණය කරමින්, ඒවා අදාළ කිරීමට උන්වහන්සේට තිබූ හැකියාවයි. වඩාත් බලසම්පන්න ආශිර්වාදය කුමක්ද කියා උන්වහන්සේගෙන් කෙනකු ඇසුවොත්, ඒ අය බලාපොරොත්තු වෙන විවිධ වශීකරණ හෝ මන්ත්‍ර සඳහන් කරනවා වෙනුවට, උන්වහන්සේ සඳහන් කළේ, අවංක බව, කරුණාව සහ ඍජු බව පුද්ගලයකුට ආශිර්වාදයක් වන බවයි. උන්වහන්සේට උච්ඡේදනය ඉගැන්වීම ගැන චෝදනා කළ විට, උන්වහන්සේ එසේ කළ බවට පිළිගත්හ. නමුත් ඊට පසු තමන් වහන්සේගේ පිළිගැනීමට සීමා පනවා ගත්තේ ... උන්වහන්සේ ඉගැන්වූයේ ලෝභය, ද්වේෂය සහ මෝහය නිරුද්ධ කිරීමට බවයි. (M.I. 375) බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණ සහ රැහෙන් පැන්නූවෙක් (වසල) වචන භාවිත කළේ කුල ක්‍රමය අනුමත කළ අයගේ ක්‍රමයට නොව, පුද්ගලයකුගේ දැහැමි බව හෝ එය නැති බව පෙන්වීමටයි. (S.N. 136)

සමහර ආගම්වල ගැලවීමට ඇතැම් ලබ්ධීන් විශ්වාස කිරීම පමණක් අවශ්‍ය වේ, නිර්වාණයට පත්විය හැක්කේ අවබෝධයෙන්ම පමණි. ඒ නිසා බුදුපියාණන් වහන්සේගෙන් ඉගෙනීමට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන් වීමට යොමුවූවන් ලෙස, හොඳින් උගත් ගිහි උපාසක සහ උපාසිකාවෝ සහ එම කාලයේ බුද්ධිමත්තු සිටියහ. බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ: "එක් එක් පුද්ගලයා ධර්මය අවබෝධකර ගැනීමට ප්‍රඥාවන්ත විය යුතුයි." (පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති) (M.I.37) නමුත් මෙයින් අදහස් කරන්නේ, බුදුපියාණන් වහන්සේට අහිංසක මිනිසුන්ට කියන්නට දෙයක් නොතිබුණා යැයි කියා නොවේ. ඊට ප්‍රතිවිරුද්ධව, උන්වහන්සේගේ නිපුණත්වය සහ නිර්මාණශීලීත්වය සැම මට්ටමකම අවබෝධය තිබුණු මිනිසුන්ට සහ දරුවන්ට පවා බුද්ධිමත් අයුරින් තමන් වහන්සේගේ පණිවුඩය දීමට හැකි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ ආකාරයේ මිනිස්සු උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත් වූහ. සැබැවින්ම, උන්වහන්සේ කෙතරම් සාර්ථක වූවෝ ද යත්, උන්වහන්සේගේ කාලයේ සිටි සමහර ගුරුවරුන් තමන්ගේ ශ්‍රාවකයන් උපායෙන් ඉවතට ගැනීමට මැජික් භාවිත කරන බවට උන්වහන්සේට චෝදනා කළහ. (M.I. 375)

බුදුපියාණන් වහන්සේගේ ධර්මය ඉගැන්වීමේ අභිප්‍රාය වූයේ කරුණාවයි. උන්වහන්සේගේ මහාකරුණාව අනන්තවූ නිසා වෙනත් අයට ධර්මය ප්‍රකාශ කිරීම හෝ පැහැදිලි කිරීමේ උත්සාහයන් හේතුකරගෙන, කිසිවිටක උන්වහන්සේ වෙහෙසට පත්කිරීමක් සිදු නොවීය. උන්වහන්සේගේ පරිනිර්වාණයට මාස කිහිපයකට පෙර උන්වහන්සේ මෙසේ වදාළහ: "පුද්ගලයකු තරුණ වයසේ සිටින තුරා ඔහුට ප්‍රඥාවේ සුවාවබෝධයක් තිබෙන නමුත්, වියපත් වන විට ප්‍රඥාව අඩුවී යන බවක් ඇතැම් අය පවසන නමුත්, එය එසේ නොවේ. මම දැන් වියපත්, මහලුයි, වයසයි, මම මගේ ජීවිතය ගතකර තිබෙනවා, මම දැන් 80 වැනි වියේ, මගේ ජීවිතයේ අවසානයට යොමුවී තිබෙනවා. දැන් මට අවුරුදු 100ක් ජීවත්වීමට නියමිත ශ්‍රාවකයන් හතර දෙනෙකු සිටිනවා නම්, එම කාලය තුළ ඔවුන් තමන් ආහාර අනුභව කරන විට, පානය කරන විට, වැසිකිළි යන විට හෝ සැතපෙන විට හැර අනෙක් වේලාවලදී භාවනා කරන හතර ඉරියව්ව පිළිබඳව මගෙන් ප්‍රශ්න කරනවා නම්, මම තවමත් ධර්මය පැහැදිලි කිරීම නිමා නොකරන තත්ත්වයක සිටිමි. ඔබ මා ගිලන් මැස්සක රඳවාගෙන යන තත්ත්වයක පසු වුවද, ප්‍රඥාවේ සුවාවබෝධයේ වෙනසක් ඇත්තේ නැත. යම් කිසිවකු මා පිළිබඳව නිවැරදිව කථා කරන්නේ නම් මෙසේ කිව හැකිය:"මෝහයට යටත් නොවුණු පුද්ගලයකු ලෝකයට පහළ වී ඇත. බොහෝ දෙනකුගේ යහපත පිණිස ලෝකයට

මහාකරුණාවෙන්, යහපතට සහ දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ සතුට පිණිස. (M.I. 83)

මේ සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ වචනවලට සත්‍යය වූ සේක. බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට වැඩ සිටියදී එක් පුද්ගලයෙක් ප්‍රශ්නයක් ඇසීම සඳහා උන්වහන්සේ වෙත පැමිණියේය. ආනන්ද සහ අනෙක් ශ්‍රාවකයෝ, බුදුපියාණන් වහන්සේ වෙහෙසට පත්ව රෝගී තත්ත්වයේ පසුවන බව පවසා, ඔහුට යන්නට ඉඩ නොදුන්හ. මෙය දුටු බුදුපියාණන් වහන්සේ සංඥාවෙන් ඔහු කැඳවා ඔහුගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයූහ. (D.II. 149) බුදුපියාණන් වහන්සේ මිනිස් වර්ගයාට දුන් උතුම්ම ත්‍යාගය සත්‍යයයි. එය ලැබීමට කැමති සැම දෙනාටම එය ලබාදීමට උන්වහන්සේගේ මහාකරුණාව විසින් පොලඹවන ලදී.

# 08.බුද්ධාගමේ සහ ක්‍රිස්තියානි ආගමේ ප්‍රාතිහාර්යයන්

උතුම් සදාචාරය පිළිබඳ ගුරුවරයකු වන ජේසුතුමාද හාස්කම්වලින් උපන් මිනිසෙකි. එතුමාගේ උපත අද්භූතජනකයි. එතුමා, එතුමා ජීවත් වූ කෙටි කාලයේදී විවිධ හාස්කම් දක්වා ඇත. එතුමා ඉදිරියේ විස්මයජනක දේ සිදුවී ඇත. එතුමාගේ භෞතික ජීවිතය අවසාන වූයේ ප්‍රාතිහාර්යකිනි. ඒ එතුමා මළවුන්ගෙන් නැඟිටීමෙනි. එතුමා තමාගේ පුදුමාකාර බල පෙන්වන්නට ප්‍රතික්ෂේප කළ අවස්ථා තිබුණි. යක්ෂයන් පොලඹවන විට හෝ ෆාරිසස් එසේ කිරීමට ඔහුට අභියෝග කළ විට හා අනෙක් අවස්ථාවන්හිදී ඔහු සම්පූර්ණයෙන්ම අවිධිමත් ලෙස හාස්කම් ක්‍රියාත්මක කළේය. ඔහු ගසක් මැලවී මැරෙන්නට සැලැස්වූයේය ... හේතුව සුදුසු ඍතුව නොවන නිසා ඒ ගසට ගෙඩි තිබුණේ නැත. (මාර්ක් 11, 12-14) ඔහු සහභාගිවූ විවාහ උත්සවයකදී වයින් අවසාන වූ විට වතුර වීදුරු කිහිපයක් වයින්වලින් පිරවූයේය. (ජෝන් 2,1-11) තවත් අවස්ථාවක සමහර මාළු මරන්නන්ගේ දැල් මාළුවලින් පිරවූයේය. (ලූක් 5, 1-11) මාළුවාගේ මුඛයේ කාසියක් ප්‍රාතිහාර්යයෙන් දිස්වීමට ජේසුතුමා සලස්වා තමාගේ ශ්‍රාවකයන්ට එම මාළුවා අල්ලා ඌගේ කටින් එය රැගෙන බදු ගන්නට සැලැස්වීම වැනි උදාහරණ ඔහුගේ අතිවිශේෂ හැකියාවන් සුළු අවස්ථාවන්ට යොදාගත් බව පෙනේ. (මැතිව් 17, 24-27)

ජේසුතුමාගේ රෝගීන් ප්‍රාතිහාර්යයෙන් සුවකිරීම වෙනස් පිළිවෙළකට සිදුවිය. ඒවා ප්‍රකට ආකාරයට අනුකම්පාවෙන් ඇතිවූ පෙලඹවීමකි. ඒවායේ සමහර අවස්ථාවල ඔහුට ආශිර්වාදයක් ප්‍රකාශ කිරීමට අවශ්‍ය නොවීය. රෝගියා ස්පර්ශ කළ පමණින් හෝ ඔහුට දැන්වූ පමණින් සුවය ලැබුණි. ඔහුගේ ඇඳුම්වලින් සහ ශරීරයෙන් විස්මයජනක බලයකින් යුත් දියර නිකුත් විය. වර්ෂ ගණනාවක් රෝගීව සිටි ස්ත්‍රියක් ජේසුතුමාගේ ලෝගුව ස්පර්ශ කළ වහාම සුව වූවාය. (මාර්ක් 5, 25-32) තවත් අවස්ථාවක පොළොවට කෙළ ගසා එම කෙළ දූවිලි සමඟ මිශ්‍රකර, අන්ධ මිනිසකුගේ ඇස්වල තැවරූ විට ඇස් පෙනීම නැවත ලැබුණි. (මාර්ක් 8, 22-23) නමුත්, ස්ථිරවම, ජේසුතුමා සම්බන්ධ වඩාත් පුදුමාකාර ප්‍රාතිහාර්යය සිදුවූයේ ඔහුගේ මරණයෙන් සුළු වේලාවකට පසු ජෙරුසලමේදීය. මැතකදී මියගිය බොහෝ පුද්ගලයෝ තමන්ගේ සොහොන්වලින් නැඟිට නගරය වටා ඇවිද්දහ. "බොහෝ මිනිස්සු ඔවුන් දැක්කහ." (මැතිව් 27,52-53) ඔවුන්ගේ ආදරණීයයන්ට, ශෝකයම නිසා කථාකර ගන්නට බැරිවන්නට ඇති. රෝමානු ආණ්ඩුකාරවරයා ඔහුගේ නිලධාරීන් සහ ඔවුන් යටතේ වැඩ කළ බොහෝ හමුදා භටයන් ඒ හා සමානවම පුදුම වන්නට ඇත. මේ පිළිබඳව වාර්තා රෝමයට යවන්නට ඇත. පුද්ගලයකුට මළවුන්ගෙන් නැඟිට අඩුම ගණනේ එක්කෙනෙකු හෝ

දෙදෙනෙකුවත් ඔවුන් ලැබූ අපූර්ව අත්දැකීම ලියන්නට හෝ වෙන අයකු ලවා ලියවන්නට ඇති. නමුත්, පුදුමයට මැතිව්ගේ කිතුනු දහමේ හැර මෙම සිද්ධිය ගැන එකල වෙන කිසිම ලේඛනයක හෝ ඊට පසුව හෝ නැත; තවමත් පුදුමයි, මාර්ක්, ලූක්, ජෝන්, පෝල් හෝ අනෙක් දූතයන් මෙම අපූර්ව සිද්ධිය සඳහන් කිරීම ප්‍රයෝජනවත් යැයි නොසිතීම පුදුමයකි.

ජේසුතුමාගේ ප්‍රාතිහාර්ය බලය සම්බන්ධයෙන් අපූර්ව දෙයක් නම්, එය අඩුවැඩි වීම හෝ සමහර විට ක්‍රියාත්මක වීම හෝ අනෙක් අය සම්බන්ධයෙන් එසේ නොවීම ද පෙනීගොස් ඇත. ඔහු නසරෙත්වල රෝගී පිරිසක් සුව කිරීමට උත්සාහ කළ විට ඔහුගේ බලය ක්‍රියාත්මක වූයේ එයින් සුළු පිරිසකට පමණි, පෙනෙන ආකාරයට තරමක් දුරට ජේසුතුමා එක්තරා ප්‍රමාණයකට වික්ෂිප්ත කරමිනි. (මාර්ක් 6,5-6), තවත් අවස්ථාවක ඔහු අන්ධ පුද්ගලයකු ස්පර්ශ කර ඊට පසු ඔහුට පෙනේද කියා ඇසුවේය. ඒ මිනිසා පිළිතුරු දෙමින් පැවසුවේ ඔහුට අපැහැදිලි හැඩ පමණක් හඳුනාගැනීමට හැකි බවයි. ඒ මිනිසාගේ සම්පූර්ණ පෙනීම ලබාගැනීමට ජේසුතුමාට ඔහු දෙවන වරටත් ස්පර්ශ කිරීමට සිදුවිය. (මාර්ක් 8,22-25)

ජේසුතුමාට ප්‍රාතිහාර්ය බලය පිළිබඳ හැඟීමක් තිබූ අතර, ඔහුට දෙවියන්ගේ ආශිර්වාදය තිබූ බව හෝ ඔහු වරම්ලත් පුද්ගලයකු බවට සාක්ෂි පෙනෙන්නට තිබුණි. ඔහු මෙසේ පැවසුවේයඃ"මම මගේ පියා කළදේ නොකළහොත් මා විශ්වාස නොකරනු. නමුත් මම එය කළොත්, ඔබ මා විශ්වාස නොකළත්, ඔබ දන්නා ප්‍රාතිහාර්ය විශ්වාස කරන්න. මා තුළ පියා සිටින බව සහ පියා තුළ මා ඉන්නා බව අවබෝධ කරගන්න." (ජෝන් 10, 37-38) තවත් එක් අවස්ථාවක කියා සිටියා, ඔහු සුවකළ එක් අන්ධ පුද්ගලයකු අන්ධයකු ලෙස විශේෂයෙන්ම ඉපදී ඇත්තේ, ජේසුතුමාට ඔහු සුවකර දෙවියන්ගේ බලය ප්‍රදර්ශනය කිරීමට බවයි. (ජෝන් 9,1-3)

නමුත් ජේසුතුමාගේ සුවිශේෂ හිමිකම් ඔහුගේ ප්‍රාතිහාර්ය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කළේය. ඔහුට සහ ඔහුටම පමණක් දෙවියන්ගේ ආශිර්වාදය තිබුණා නම් හෝ ඔහු වරම්ලත් පුද්ගලයෙක් නම්, එයින් ඔප්පු වන්නේ ඔහු හෝ ඔහුගේ නමින් කටයුතු කරන අයටද ප්‍රාතිහාර්ය පෑමට හැකි නම්, අනෙක් අය විසින් කරන ප්‍රාතිහාර්ය පැහැදිලි කරන්නේ කෙසේද යන්නයි? මෙම පෙනෙන්නට තියෙන දෙගිඩියාවට පිළිතුර, අනෙක් අය විසින් සිදුකරන ඕනෑම ප්‍රාතිහාර්යක් සැබැවින්ම යක්ෂයාගේ ක්‍රියාවක් බවට ස්ථිරවම කියා සිටීමයි. (රිවිලේෂන්ස් දේවවාක්‍යය අනාවරණය 16,14) නමුත් එක් ප්‍රශ්නයක් විසඳීමේදී සිදුවූයේ මෙම පැහැදිලි කිරීම තවත් ප්‍රශ්නයක් ඇති කිරීමයි. යක්ෂයා සමහර පුද්ගලයන්ට ප්‍රාතිහාර්ය කිරීමේ බලය දුන්නා නම් සමහරවිට

ජේසුතුමාගේ බලයත් යක්ෂයන්ගෙන් ලැබුවා වියහැකි බවට යුදෙව් නිකායේ සාමාජිකයෝ කියා සිටියහ. ජේසුතුමා අසත්‍යයැයි යමෙක් චෝදනා කරන්නේ නම් එය බොහෝ දුරට දුර්වල එකකි. (මැතිව් 12,22-26)

ප්‍රාතිහාර්ය යනුවෙන් හැඳින්වෙන දේ සම්බන්ධයෙන් බුදුන් වහන්සේගේ ආකල්පය විමසීමට පෙර, කරුණු කිහිපයක් පැහැදිලි කරගැනීම අවශ්‍ය වේ. සාමාන්‍යයෙන් ප්‍රාතිහාර්ය සිදුකරන්නේ, යම් ආකාරයකින් ඒවාට සම්බන්ධ වන්නේ අද්භූත පුද්ගලයන් සමඟය, ක්‍රිස්තියානි ආගමේ යක්ෂයා හෝ දෙවියන් සමඟය. යක්ෂයා ප්‍රාතිහාර්ය කරන්නේ මිනිසුන් නොමඟ යැවීමට හෝ කාමයට පෙලඹවීමටයි. දෙවියන් එසේ කරන්නේ ඔහුගේ බලය යාච්ඤාවන්ට පිළිතුරු දීමටයි. නමුත් බුදුපියාණන් වහන්සේ "ප්‍රාතිහාර්ය" (පාතිහාරිය) මානසික චෛතසික දියුණුවේ ප්‍රතිඵලයක් හෝ නියත ඵලයක් සේ අවබෝධ කළහ. ඒ අනුව, බෞද්ධ සන්දර්භය තුළ ප්‍රාතිහාර්යයට වඩා බලයක් (ඉද්ධි) ලෙස හැඳින්වීම වඩා සුදුසු වේ. උන්වහන්සේගේ කාලයේ සමහර තවුසන්ට ඔවුන්ගේ ආධ්‍යාපනික පුහුණුකිරීම් නිසා ඉර්ධි බල තිබූ බව බුදුපියාණන් වහන්සේ ඍජුව පිළිගත්හ. ඔවුන් එවැනි බලයන්ගේ වැදගත් බව වැරදි ලෙසට වටහාගන්නට ඉඩ තිබේ. නැත්නම් ඒවායෙන් වැරදි තීරණවලට එන්නට ඉඩ තිබේ. නමුත් නරක බලවේග සමඟ සම්බන්ධකම් තිබුණේයැයි උන්වහන්සේ කිසිවිටක චෝදනා නොකළහ.

සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේට සියලු මනුෂ්‍යත්වය ඉක්මවූ හැකියාවන් කෙරෙහි පරීක්ෂාකාරී වන සුලු ආකල්පයක් තිබූ බව සත්‍යය කරුණකි. වරක් එක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේට කථාකර,"ඔබවහන්සේගේ එක් භික්ෂුවකට මනුෂ්‍යත්වය ඉක්මවූ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම පිණිස ඉර්දි බල වික්‍රමයක් හෝ ප්‍රාතිහාර්යක් (උත්තරී මනුස්ස ධම්ම ඉද්ධි පාතිහාර) පෑමට අවසර දෙන ලෙසත්, එවිට වඩා වැඩි පිරිසක් ඔබවහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකර ගන්නවා ඇතැයි" සඳහන් කළේය. කල්පනාකාරී බවින් සහ සැකයෙන් යුතු පුද්ගලයන් තුළ එවැනි හැකියාවන් පිළිබඳව සාධාරණ සැකයක් ඇතිවිය හැකි බව උන්වහන්සේ පිළිතුරු දුන්හ. කෙසේ නමුත් සැම දෙනා තුළම විශ්වාසය ඇතිකරන එවැනි එක බලයක් වූ "අධිමානුෂික හැකියාව, ඉර්ධි වික්‍රම සහ අධ්‍යාපනයේ හාස්කම" (අනුසාසනී) බව සඳහන් විය. මෙයට, පහත සඳහන් ආකාරයට අනෙක් අයට අවවාද කිරීම සමඟ ධෛර්යවත් කිරීම ඇතුළත් වන බව උන්වහන්සේ වදාළහ. "මේ ආකාරයට සැලකිල්ලට ගන්න, එහි නොවේ. ඔබේ මනස මේ ආකාරයට යොමු කරන්න, එහි නොවේ. එය අතහරින්න, එහි නොවේ, මෙය ලබාගන්න, එය නොපසුබටව කරගෙන යන්න." (D.1.211ff) වෙනත් වචනයකින් කියනවා නම්, පෙනෙන්නට තියෙන ප්‍රාතිහාර්යවලින්, ව්‍යාකූල නොවී,

මිනිසුන්ට ඇතැම් ආකාරවලට සිතන්න, සලකා බලන්න සහ හැසිරෙන්න උනන්දු කිරීම වඩා හොඳ බව බුදුපියාණන් වහන්සේ සිතූහ.

තවත් අවස්ථාවක එක් පොහොසත් වෙළෙන්දෙක් උණබම්බු රිටක් මත වටිනා සඳුන් භාජනයක් තබා නගර මධ්‍යයේ එය ස්ථාපිත කර, ඊට පසු එම රිට මතට ඉර්ධි බලයෙන් නගින්නට හැකිවන අයට එම භාජනය ලබාගත හැකි බවට නිවේදනයක් නිකුත් කළේය. මේ ගැන අසා, දැනගෙන, ධ්‍යාන බලයෙන් පාවෙන්නට හැකියාව තිබූ බවට ප්‍රකට පින්ඩෝල නමැති එක් භික්ෂුවක් එම අභියෝගය පිළිගෙන භාජනය ලබාගත්තේය. බුදුපියාණන් වහන්සේ මේ බව අසා දැඩි වචනයෙන් එම භික්ෂුවට තරවටු කළහ:"ඔබ කාලකණ්නි කාසියක් ලබාගැනීම පිණිස වස්ත්‍රය උස්සන ගණිකාවක වගෙයි." (Vin. 11. 110-111) ඊට පසු උන්වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට තමන් දියුණු කළ කිසිම ඉර්ධි හැකියාවක් ප්‍රදර්ශනය කිරීම වරදක් ලෙස නීතියක් පැනවීය. පින්ඩෝලගේ ප්‍රදර්ශනයට පසුව, බුදුපියාණන් වහන්සේගේ එයට ඇති ප්‍රතිචාරය පැහැදිලි කිරීම පහසු වේ:"සෝෂාකාරී, ප්‍රකෝපකාරී පිරිස් පින්ඩෝල වටා එක්රොක් වන්නට විය." නිසැක වශයෙන්ම මිනිසුන් බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට, ගෞරව කිරීම උන්වහන්සේ බලාපොරොත්තු වූයේ ඔවුන්ගේ සුචරිතය සහ ප්‍රඥාව සඳහා මිස විස්මය හෝ ප්‍රාතිහාර්යවලින් වශීවීමක් සඳහා නොවේ. ප්‍රාතිහාර්ය බලය ආධ්‍යාත්මික හෝ සුචරිතය හා බැඳුණු නිපුණත්වවලට සාක්ෂි ලෙස පිළිනොගත යුතු බව බුද්ධ ධර්මයෙන් බොහෝ කාලයක් පුරා පෙන්වා දී තිබේ. දේවදත්තට එවැනි බල තිබූ අතර, ඔහු බුදුපියාණන් වහන්සේට සැලකිය යුතු තරම් ප්‍රමාණවත් ප්‍රශ්න ඇති කළේය. ජුදාස්ට පාපිෂ්ඨ භූතයන් එළවා දැමීමේ හැකියාව තිබුණු අතර, ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුව කිරීමටද හැකියාව තිබුණි. ඔහු ජේසුතුමාගේ විශ්වාසය කඩ කළේය. බුදුපියාණන් වහන්සේට අනුව ප්‍රාතිහාර්ය එක් දෙයක් වන අතර, ධර්මය සම්පූර්ණයෙන්ම වෙනස් දෙයකි. උන්වහන්සේ මෙසේ පැවසූහ:"ප්‍රාතිහාර්ය කළත් නොකළත්, ධර්මය කියාදීමේ මගේ ප්‍රයත්නය, ධර්මය පුරුදු කරන කවුරු වුවත්, දුකෙන් සම්පූර්ණයෙන්ම නිදහස් කරගැනීමට මඟ පෙන්වයි. එසේනම්, ප්‍රතිහාර්ය පෑමේ ඇති ඵලය කුමක්ද?" (D.111. 4)

ජේසුතුමාගේ පූජක ධුරයේ වැදගත් කොටසක් ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුවකිරීම සඳහා වැයවුණේය. මිනිසුන් ඔහුගේ අවධානය සහ ඉගැන්වීම් පිළිගැනීමට ප්‍රධාන හේතුවද එය විය. ඔහු අන්ධ, අංශභාග සහ ලාදුරු රෝගීන් සුවකර ඇත. එසේම මියගිය අයට නැවත ජීවය ලබාදී ඇත. අවධානයට ගත යුතුයි, බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ කිසිම ශ්‍රාවකයෙකු ප්‍රාතිහාර්යයෙන් ලෙඩ සුවකිරීම හෝ යක්ෂයන් පලවා හැරීම

පිළිබඳව ත්‍රිපිටකයේ උදාහරණ නැත. මෙයට හේතු අතරින් කොටසක් ඉහත සඳහන් වේ. නමුත් මිනිසාගේ දුක්විඳීම යන ප්‍රශ්නය උන්වහන්සේ රෝග, ජරාවට පත්වීම, සහ මරණය, පැවැත්මක අන්තර්ගත වීම, සහජයක් ලෙස දුටුවහ. සැබැවින්ම එය එසේමයි. ඒ නිසා උන්වහන්සේට රෝගියකු සුවකිරීමෙන් අනාගතයේදී ඔවුන් රෝගී නොවන බවට සහතික විය නොහැකිය. මරණයට පත් පුද්ගලයකු නැගිටවීමෙන් හුදෙක් අදහස් කරන්නේ නැවත ඉපදුණු පුද්ගලයා පසුව මියයන බවයි. ප්‍රාතිහාර්යයෙන් සුවකිරීම චමත්කාර ජනකද? සත්තකින්ම! ඒවා පිරිවර ආකර්ෂණීය කිරීම සහතිකද? සත්තකින්ම! නමුත් බෞද්ධ අදහසට අනුව, ඒවා සැබැවින්ම ප්‍රශ්නයේ හදවතට නොයයි. එය ඉතාම මූලික මට්ටමින් විසඳීම උන්වහන්සේගේ අරමුණ විය.

බුදුපියාණන් වහන්සේ රෝගීන් කෙරෙහි අනුකම්පාවක් නැතැයි මෙයින් අදහස් නොකෙරේ. එසේම, උන්වහන්සේ ඔවුන්ගේ තත්ත්වය මගහැරියා නොවේ. එයින් බොහෝ දුර සිට, උන්වහන්සේ සුව කළහ. සාමාන්‍ය ක්‍රමයට ඔවුන් සුවපත් කළහ. උපකාර කළහ. උපකාර තුළින් ඔවුන් සැනසූ සේක. රෝගීන්ගේ සුවදුක් බැලීමට යාම සහ රැකබලා ගැනීම සුචරිතවත් ක්‍රියා ලෙස සැලකූ සේක. අනුකම්පාවෙන් මේ දෙකම කළහ. උන්වහන්සේ තමන් වහන්සේගේ ශ්‍රාවකයන් මෙසේ කිරීමට උනන්දු කළහ. (උදාහරණ A.111. 144; 295ff. SV. 79-80; 381) පාචනයෙන් පෙළෙන භික්ෂුවක සෝදා, උන්වහන්සේට නොසැලකූ භික්ෂූන්ට ආමන්ත්‍රණය කර, සමකාලීන භික්ෂුවකට දැක්වූ අසතුටුදායක සංග්‍රහය පිළිබඳ වරද පෙන්වාදී බුදුපියාණන් වහන්සේ මෙසේ කියා සිටියහඃ " මට සාත්තු කරන පුද්ගලයා රෝගියෙකුටද සාත්තු කරයි." (යෝ භික්ඛවේ මං උපට්ඨෙය්‍ය සො ගිලානං උපට්ඨෙය්‍ය) (Vin. 1. 301-2) මෙම දේශනාව සහ ජේසුතුමා දුකට පත් අයට උදව් කිරීම අතර සමාන බවක් දැකගැනීමට කෙනකු අපොහොසත් නොවනු ඇත. "මම ඔබට කියමි, ඕනෑ වෙලාවක, මා අනුගමනය කරන අඩුම වැදගත් පුද්ගලයකුටත් ඔබ මෙය කරන්නෙහි නම්, එය ඔබ මට කළා හා සමාන වෙයි." (Matt. 12.31-40) නොසලකා හරින ලද සහ වරප්‍රසාද නොලත් පුද්ගලයන්ට උපකාර කිරීම සම්බන්ධයෙන්, බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා එක හා සමානය.

# 09.බුදුපියාණන් වහන්සේගේ චාරිකා පිළිබඳ අධ්‍යයනයක්

තමන්ගේම ජීවිත කාලය තුළදී සාර්ථකවූ විශිෂ්ට ආගමික ගුරුවරුන් දෙදෙනා වන්නේ මහමද්තුමා සහ ගෝතම බුදුපියාණන් වහන්සේ පමණි. දෙදෙනාටම දිගුකාලීන ඉගැන්වීමේ වෘත්තීය ප්‍රගමනයන් තිබූ අතර, දෙදෙනාම තමන්ගේ අදාළ ආගම් ශක්තිවන්තව ස්ථාපනය වෙනවා දැකීමට ජීවත් වූහ. අශෝක අධිරාජ්‍යවරයා බුදුදහම පිළිගෙන ප්‍රවර්ධනය කරන තුරු, බුදුදහම සුළු මට්ටමේ ධර්මයක්ව පැවති බව මහාචාර්ය බෂාම් සඳහන් කර ඇත. බෂාම් තමාගේ උපකල්පනය පාදක කරගෙන ඇත්තේ බුදුදහම පිළිබඳ අශෝක අධිරාජයාගේ කාලයට පෙර, පුරාවිද්‍යා සාක්ෂි නොමැතිවීමේ සාධකය පදනම් කරගෙනය. නමුත්, මෙය වඩාත් දුර්වල තර්කයක් ලෙස මට පෙනේ. බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් උන්වහන්සේගේ විපුල සාක්ෂිකරුවන් වූ අතර, ඔවුහු ඔබමොබ සැරිසරන පුද්ගලයෝ වූහ. එබැවින් ඔවුන් අපවත්වූ පසු ඉතිරි කර යාහැක්කේ කුමන භෞතික සාක්ෂි ද? ඔවුහු ස්ථිර පන්සල් සුළු ප්‍රමාණයක් ඇති කළහ. එසේ සෑදූ පන්සල්, මඩ, උණබම්බු සහ පිදුරු සෙවිලි කළ ඒවාය. ස්තූප වන්දනා කිරීම ක්‍රිස්තු පූර්ව දෙවන ශතවර්ෂය වනතුරු වැදගත් ස්වරූපයක් ගත්තේ නැත.

බුදුපියාණන් වහන්සේ උතුරු ඉන්දියාවේ පුළුල් කලාප පුරාම හොඳින් ප්‍රසිද්ධ වූ බවට සහ උන්වහන්සේගේ ධර්මය සෑම පන්තියකම ජනයා විශාල සංඛ්‍යාවකින් ධර්මය වැලඳ ගැනීමට ආකර්ෂණය වීමත්, විශේෂයෙන්ම, ඉහළ පැළැන්තියෙන් සිටිය බවට සෑහෙන සහ ඒත්තු ගන්වන සාක්ෂි පාලි ත්‍රිපිටකයෙන් ඉදිරිපත් වේ. මෙම අලුත් දහම සම්බන්ධයෙන් ජෛන ආගමිකයන්ගේ තදින්ම සිදුකෙරුණ විවේචනාත්මක ආකල්ප බුද්ධාගම තමන්ට සැබෑ අභියෝගයක් ලෙස දුටු බව ත්‍රිපිටකය හඟවයි. බුදුපියාණන් වහන්සේගේ සාර්ථකත්වයට වැදගත් හේතුව වූයේ උන්වහන්සේගේ අසාමාන්‍ය පෞරුෂය බවට කිසිම සැකයක් නැත. උන්වහන්සේගේ සහ අප අතර විශාල කාල පරතරයක් තිබියදීත්, සූත්‍ර පෘථුල ලෙස සංස්කරණය වීම සහ ඒවායේ භාවිත වඩාත් දරදඬු අස්වාභාවික භාෂාවත්, උන්වහන්සේගේ උණුසුම් සහ මහාකරුණාව සහිත නියෝජනයත් සම්පූර්ණයෙන්ම සෑම පිටුවකම බැබළේ. උන්වහන්සේගේ ධර්මයේ සහේතුක අනුකූලතාව ද වැදගත් සාධකයක් විය යුතුයි. කෙසේ නමුත්, ගුරුවරයකුගේ ආකර්ෂණීය වීම හෝ ඉගැන්වීම සිදුකරන්නේ නිරවුල් ප්‍රායෝගික බුද්ධියකින් වුවත්, ආගමේ වෙනසක් කරන්නට බලාපොරොත්තු වන්නෝ ධර්මය සමඟ සම්බන්ධවීමක් නොවෙත් නම් එය ඔවුන්ට ආකර්ෂණය නොවේ. බුදුපියාණන් වහන්සේ

ඉතාම මුල් කාලයේ සිටම ධර්මදූතයෙකි. එයත් සමඟම ඉහත සඳහන් කළ කරුණු දෙක උන්වහන්සේගේ ධර්මය ඉගැන්වීමේදී කලින්ම සාර්ථකත්වය ලැබීමට වඩාත් වැදගත්වූ සාධකයයි. උන්වහන්සේට ශාන්ත හදවතක්, නමුත් ඉතා සංචලනය වන සුලු සිරුරක් තිබුණි. උන්වහන්සේ නිරන්තරව හැකිතාක් මිනිසුන් වෙනුවෙන් සංචාරය කළහ.

ත්‍රිපිටකයට අනුව, බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් පසු මුළුමනින්ම වාගේ සිදුකළ පළමු කාර්යය වූයේ, අනෙක් අයට තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය ඉගැන්වීම සඳහා දීර්ඝ සංචාර ඇරඹීමයි. සමාන ලෙසම, විශේෂයෙන්, පළමු ශ්‍රාවක හැටනමට උන්වහන්සේගේ උපදෙස් වූයේ, තමන් වහන්සේ ඔවුන්ට කියාදුන් ධර්මය අනෙක් අයට කියාදීමට "ඉදිරියටම යා යුතුය" යන්නයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ජීවිතයේදී ගමන් කළ ප්‍රදේශය වූ උත්තර් ප්‍රදේශය සහ බිහාර යන නූතන ඉන්දියානු ප්‍රාන්තවලට අනුරූපී වේ. උන්වහන්සේ නැගෙනහිරෙන් ඔබ්බට කජන්ගල ලෙස තවමත් හඳුන්වන, වර්තමානයේ කන්ක්ජොල්, රජ්මහල් සිට දකුණට කිලෝ මීටර් 18ක් ඉන්දු බන්ගලාදේශ සීමාවේ දකුණට සහ අමතරව බටහිරට මාතුරා, දිල්ලියෙන් කිලෝ මීටර් 180ක් දකුණට යන ප්‍රදේශවලට ද වැඩම කර ඇත. මෙම ස්ථාන දෙක කිලෝ මීටර් 1000කට ආසන්නව වෙන්ව ඇත. එකල ගැඹුර දැකිය නොහැකි තත්ත්වයක තිබූ හිමාලයේ පාකන්ද පිහිටි කැලෑ හේතුකරගෙන බුදුපියාණන් වහන්සේගේ උතුරු දෙසට ගමන් සැබැවින්ම සීමිත විය. එසේම උන්වහන්සේ දකුණු කෙළවරේ පිහිටි ගංගා නම් නදිය දියබෙත්මට ඔබ්බෙන්, තවත් දකුණට වැඩිය බවට විශ්වාසය තැබිය නොහැකිය. එසේ වුවත්, උන්වහන්සේ සංචාරය කළ ප්‍රදේශ දළ වශයෙන් හතරැස් කිලෝ මීටර් 200,000කට සමාන ප්‍රදේශයක්, කුමන ප්‍රමාණයෙන් වුවත් විශාල ප්‍රදේශයක් ආවරණය වී ඇත.

බුදුපියාණන් වහන්සේ ගංගා නම් ගඟේ නිම්නයේ පිටත මායිම්වලට ඉඳහිට වැඩිය බවට සාක්ෂි ඉදිරිපත් වේ. උදාහරණ වශයෙන් උන්වහන්සේ මාතුරා වෙත එක්වරක් වැඩි බව ද, සමහර විට නැගෙනහිර පිහිටි අංගාවෙත (චම්පා, හද්දිය, කජන්ගල වර්තමාන භාගලපූර් දිසත්‍රික්කයට අනුරූපීව) වරක් හෝ දෙවරක් වැඩම කර ඇත. සුවිශේෂීව, ත්‍රිපිටකයේදී ඇතැම් විට සඳහන්ව තිබිය හැකිය. හද්දිය හෝ හද්දියනාගාර කිලෝ මීටර් 12ක් පමණ, දකුණට භාගල්පූර් පිහිටි හදරිය නැමැති ගම්මානය නිසැකවම හැඳින්විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ බොහෝ චාරිකා නැගෙනහිර කොටසේ පිහිටි ප්‍රදේශ වන ශ්‍රාවස්ථි, රජගහ, වේසාලි සහ කොසඹෑ යන විශාල නගර අතර සිදුවිය.

නගර සහ මාර්ග සහ පාරවල් සහ ගම හරහා අධිවේගී මාර්ගවල රිය මඟ ත්‍රිපිටකයේ විස්තර කර ඇත. කෙසේ නමුත් මෙම නම් ඒවායේ ගුණාත්මකභාවය හෝ ඒවායේ පළල අනුව නොව, ප්‍රධාන මාර්ගවල යන එන වාහන සංඛ්‍යාවෙේ නම්වලට යොමුවීම සුළු සැකයක් ඇති කරයි. පැරණි ඉන්දියාවේ සියලු මාර්ග තරමක් දූවිල්ල වැඩිය. ග්‍රීෂ්ම ඍතුවේදී කාණු සහිත මාර්ග සහ වැසි කාලයේ මඩෙන් පිරුණු ගංගා පසුකර යා නොහැකි තරම්ය. දීර්ඝ ගමන්වලට මංපහරන්නෝ ද තවත් අවදානමක් එකතු කරති.

ශ්‍රාවස්ථි සහ සාකේත අතර මාර්ගයේ ගමන් කළ අය බොහෝ විට මංපහරන්නන්ට ලක් වූහ. එසේම බියකරු අංගුලිමාල ශ්‍රාවස්ථි අවට කැලෑබද ප්‍රදේශවල හොරෙකු සහ මිනීමරුවෙකුව සිටියේය. (M. 11. 97; Vin. IV. 87) වරක් බුදුපියාණන් වහන්සේ සහ පරිවාරකයෙක් කෝසල නගරයට සංචාරය කරන විට, එම මාර්ගයේ බෙදුමකට පැමිණියහ. තමන් වහන්සේ එක් බෙදුමකින් ගමන් කළයුතු බව සහ පරිවාරකයා අනෙක් බෙදුම ගතයුතු බව උන්වහන්සේ පැවසූහ. මෙම වාදය තරමක් වේලාවක් තුළ පැවතුණු අතර, සහායකයා තරහින් බුදුපියාණන් වහන්සේගේ පාත්‍රය බිම දමා ඔහු නිවැරදි යැයි  සිතූ මාර්ගයේ ගමන් කළේය. වැඩිදුර යාමට පෙර, මංකොල්ලකරුවෝ ඔහුට පහර දුන්හ. ඔවුහු "ඔහුට අතින් සහ පයින් පහරදී වස්ත්‍ර ඉරා දැමූහ." (Ud. 90)

වඩාත් දුර දිස්ත්‍රික්කවල ගමන් කරන්නන්ට ආහාර, ජලය සහ නවාතැන් ලබාගැනීමේ දුෂ්කරතා තිබෙන්නට ඇත. සතර දිශාවෙන්ම පැමිණෙන සංචාරකයන්, ගවයකුගේ අඩිසටහනක් තිබෙන දිය කඩිත්තකින් ජලය බීමට ගන්නා බවත්, ඒ හැර කිසිම තැනක ජලය නොමැති බවත් ත්‍රිපිටකයේ සඳහන් වී ඇත. එවැනි දෙමව්පිය යුවළක් පාළුකරයේ වල්මත්වී සිටින විට තමන්ගේම දරුවා මරා කෑමෙන් කුසගින්න නිවාගෙන ජීවිතය බේරාගෙන ඇත. වඩාත් සාමාන්‍යයෙන් එකදිගට නොරැඳී ගමන්කිරීම හරියටම පහසු නැත. වෙහෙසකි. අවශ්‍ය නම් පමණක්ම ගමන් ආරම්භ කරයි. එසේම කෙසේ වුවත්, හැකිතාක් මිනිසුන් ප්‍රමාණයක් වෙත ළඟාවීමේ අරමුණින් බුදුපියාණන් වහන්සේ, උන්වහන්සේගේ වැඩිපුර කාලවේලාවක් මහමග ගතකළ බව පෙනේ. උන්වහන්සේගේ අධිෂ්ඨානය සහ අනුකම්පාව එයයි!

උන්වහන්සේ ඇතිකරගත් නීතිරීතිවලට අනුව සහ දීර්ඝ කාලයක් ඇතිකරගත් සමන (පැවිදි) සම්ප්‍රදායටත් අනුව, බුදුපියාණන් වහන්සේ වස්සාන ඍතුවේ මාස 3ක් එක ස්ථානයක සහ වර්ෂයේ ඉතිරි කාලයේ සක්මන් චාරිකා ද කළහ. විවරණ සම්ප්‍රදායයට අනුව උන්වහන්සේ, බුද්ධත්වය ලද 20 වැනි වර්ෂයට පසුව, අවසාන ඍතුව හැර සෑම වර්ෂා ඍතුවකම,කෝසල නගරයේ

අගනුවර වූ ශ්‍රාවස්ථියේ හෝ එයට සමීපව වැඩ විසූහ. එයට හේතුව උන්වහන්සේගේ දේශනා වැඩි ප්‍රමාණයක් මෙම නගරයේ පැවැත්වූ නිසාය. අනෙක් ප්‍රදේශවලට වඩා උන්වහන්සේගේ දේශනා වැඩි ප්‍රමාණයක් මෙම නගරයේ පැවැත්වීමට හේතුව ලෙස හඟවා ඇත්තේ මෙම සම්ප්‍රදායයේ ඇති යම් පදනමක් නිසා බවයි. එය ඇත්තක් නම් උන්වහන්සේ වියපත් වීම නිසා උන්වහන්සේ තමන් වහන්සේගේ චාරිකා සීමා කිරීමට තීරණය කරන්නට ඇත. එකල උන්වහන්සේගේ වයස අවුරුදු 55ක් පමණය. බුදුපියාණන් වහන්සේගේ සියලු චාරිකා පාගමනින් සිදුවූ අතර, භූමිය ආශ්‍රිතව විවිධ ගංගා තිබූ නිසා බොහෝ විට උන්වහන්සේ බෝට්ටු හෝ පාරු භාවිත කරන්නට ඇත. කෙසේ නමුත් උන්වහන්සේ ඇත්තටම එසේ කළ බවට විශේෂ සඳහනක් නැත.

වරක් භික්ෂූන් එම ගඟ හරහාම පිහිනමින් සිටි ගව රැළකගේ වලිග සහ පසුපස අල්ලාගෙන ගඟක් තරණය කළ බවක් අපි කියවා ඇත්තෙමු. පාලම්, බෝට්ටු හෝ පහුරු නැතැයි යන හැඟවීම මත බුදුපියාණන් වහන්සේට ද මෙම භික්ෂූන් කළ දේම කරමින් පිරිමසා ගැනීමට සිදුවූවා ද විය හැකිය. බුදුපියාණන් වහන්සේ වාහනවල හෝ කරත්තවල සංචාර කළ බවට සඳහනක් නැත. එකම ස්ථානයක පමණක් උන්වහන්සේ සෙරෙප්පු භාවිත කළ බවට විස්තර කර ඇත. ඒ නිසා සමහර විට උන්වහන්සේ වැඩිපුරම පාවහන් නොමැතිව වැඩම කළ බව සිතිය හැකිය. (Vin. 1V. 186)

බුදුපියාණන් වහන්සේ වැඩම කළ සමහර දුර ප්‍රමාණයන් පිළිබඳව අපට අදහසක් දෙමින් උන්වහන්සේගේ බොහෝ චාරිකාවල "සැරුම් මඟ" ත්‍රිපිටකයේ සඳහන් වේ. උදාහරණ වශයෙන්, බුද්ධත්වය ලැබී, පළමු මාස 12 තුළ උන්වහන්සේ උරුවෙල සිට ගයා සහ බරණැස හරහා ඉසිපතනයට වැඩ, එහි වස්සාන ඍතුව මාස තුනම ගතකර, බරණැස, ගයා, උරුවෙල සහ ලතිවාන හරහා රජගහට අඩුම ගණනේ කිලෝ මීටර් 300ක්වත් ඇවිද ඇති බවට අපට ගණනය කළ හැකිය. ත්‍රිපිටකයේ වැඩිම තනි ගමන ලෙස සඳහන්ව ඇත්තේ රජගහ සිට වේසාලි සහ ශ්‍රාවස්ථි සහ ආපසු කීටාගිරි සහ අවාලි හරහා රජගහට පැමිණීමයි. එය අඩුම තරමේ කිලෝ මීටර් 1600ක් පමණ වන වටගමනකි. (Vin.V.170ff) මෙවැනි ගමනක් උන්වහන්සේ ආරම්භ කර ඇත්තේ වස්සාන ඍතුවක් අවසානයේ හුදෙකලාවකින් පසුව සහ මාස 9කට පසු නැවත ඊළඟ හුදෙකලාවකම නියම වේලාවට විය යුතුයි. අවාසනාවට, මෙම ගමන් හෝ වෙනත් ගමන්වලට ගිය කාලය දැනගැනීමට නොහැකිය.

බුදුපියාණන් වහන්සේ නාලන්දා, පැට්නා සහ වේසාලි හරහා රජගහ නුවර සිට කුසිනාරාවලට, කිලෝ මීටර් 300ක් පමණ මුළු දුරක් වැඩිය බව ජනප්‍රිය මහාපරිනිර්වාණ සූත්‍රයෙන් අපි දැන උගත්තෙමු. සූත්‍රයට අනුව, උන්වහන්සේ වස්සාන ඍතුවේ වස්සාන හුදෙකලාව අවසන් කර (ඔක්තෝබර්) පිටත්වූ බවත්, සැබැවින්ම වෙසක් මස (මැයි) පුරපොහෝ දින කුසිනාරාවලදී පරිනිර්වාණයට පත් වූ බවත් උපකල්පනය කළ හැකිය. මෙයින් අදහස් වෙන්නේ කිලෝ මීටර් 95ක් සංචාරය කිරීම සඳහා මාස හතක් ගත වූ බවයි. උන්වහන්සේගේ වියපත් බව සහ රෝගී තත්ත්වයෙන් පෙළීම යන කරුණට ඉඩහරිමින් පවා, එය ඉතා දිගු කාලයක් ලෙස පෙනේ. ත්‍රිපිටකයෙන් පසුව, ප්‍රකාශනය වූ ග්‍රන්ථවල පමණක් උන්වහන්සේගේ පරිනිර්වාණය වෙසක් මස සිදුවූ බව සඳහන් වේ. එසේම සූත්‍රවලට අනුව උන්වහන්සේගේ අවසාන චාරිකාව මන්දගාමී සහ ස්ථාවර වේගයකින් සිදුවූ බවට ඇඟවීමක් කර ඇත. බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ චාරිකා සෙමෙන් පියවර තබමින් සිදුකළා විය හැකිය.

බුදුපියාණන් වහන්සේ හිරු උදාවීමට ප්‍රථමයෙන් අවදිව, හිරු උදාවීමත් සමඟම ළඟම තිබෙන නගරයට හෝ ගමට පිණ්ඩපාතය සඳහා වඩින බවත්, ආහාර ගැනීමෙන් පසු, තවමත් සිහිල දනවන විට ගමන් අරඹන බවටත් සාධක ඉදිරිපත් වේ. උන්වහන්සේ මධ්‍යම  දහවල උෂ්ණත්වය අප්‍රසන්න වනතුරු සක්මන් කර ඊට පසු පස්වරුවේ විවේකය ලබාගත්හ. අවට ගමක් තිබේනම් පසුදින අලුයම වනතුරු එහි රැඳී සිටිති. එසේ නැත්නම් ඊළඟ ගමට වඩින තුරුම නොනැවතී සක්මන් කරති. උන්වහන්සේ එක් ස්ථානයක කෙතරම් කාලයක් වැඩ සිටිත් ද යන්න බොහෝ සාධක මත රැඳී තිබේ ... ප්‍රදේශයේ වැසියන් උන්වහන්සේ සමඟ කථාකිරීමට සහ ඇහුම්කන්දීමට පැමිණ ඇත් ද, ආහාර සහ ජලය තිබේ ද, පරිසරය ගැළපේ ද යනාදියයි. උදාහරණ වශයෙන්, බොහෝ තරුණ මිනිසුන් භික්ෂූත්වය ලබාගැනීම හේතුවෙන් තමන්ගේ පවුල් අතහැර යාම පිළිබඳව මිනිසුන් පැමිණිලි කිරීමට පටන්ගැනීම නිසා උන්වහන්සේගේ, රජගහනුවර පළමු නැවතී සිටීම කෙටි කළක් බව අපි අසා ඇත්තෙමු. (Vin.1V.43) වරක් උන්වහන්සේ තුනා යන ගමට වැඩම කළ අතර, එහි සිටි බ්‍රාහ්මණ පදිංචිකරුවන් උන්වහන්සේගේ පැමිණීම දැන ඔවුන්ගේ ළිං වී පොතු සහ ගොම දමා අවහිර කළ නිසා බීමට ජලය නැතිවිය. (Ud.78) වර්තමානයේ බෞද්ධ භික්ෂූන්ට ලැබෙන උණුසුම් සහ ගෞරවනීය පිළිගැනීම් සැමවිටම බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට ලැබුණේ නැත. උන්වහන්සේ බොහෝ විට භික්ෂූන් 500ක් හෝ ("සමූහයක්" යන්න අදහස් කරන සම්ප්‍රදායානුකූල අංකයක්) හෝ හුදෙක්ම විශාල භික්ෂූන් කණ්ඩායමක් සමඟ සංචාරය කළ බව

විස්තර කෙරේ. සමහර අවස්ථාවල තමන් වහන්සේ තනිවම යම් කාලයක් සක්මන් කළයුතු බව කියමින් උන්වහන්සේ පරිවාරක හෝ සහකාරයන් ඉවත් කළහ. (S.111. 94)

සාමාන්‍යයෙන් සිතන ආකාරයට, බුදුපියාණන් වහන්සේ මූලිකවම වනාන්තරයේ වෙසෙන්නෙක් නොවේ. උන්වහන්සේ ආරම්භ කළ ආශ්‍රම 4ක් වර්තමානයේ පුරාවිද්‍යාඥයන් හඳුනාගෙන ඇත. ඝෝසිතාරාම, ජීවකාරාම, ජේතවන සහ වේළුවන අතරින් පළමුවැන්න සැබැවින්ම නගරයේ ප්‍රාකාර අතර ද අනෙක් තුන අදාළ නගරවල පහසුවෙන් ඇවිදිය හැකි දුරක ද පිහිටා තිබේ. මේ ස්ථානවල නතරවී සිටින විට බුදුපියාණන් වහන්සේගේ නවාතැන්, සාධාරණ ලෙස පහසුකම් සහිතව තිබෙන්නට ඇත. නමුත් උන්වහන්සේ මහමඟ සිටින විට තත්ත්වය ඉතා වෙනස් විය. උන්වහන්සේට කුමක් වූවත්, තිබූ දෙයක් මත සැතපීමට හෝ නවාතැන් ලෙස ගැනීමට සිදුවිය. පොළොව මත තණකොළ එළූ කුඹල්කරුවකුගේ මඩුවක සැතපුණු බවක්, අපි කියවා දැනගෙන සිටින්නෙමු. (M.I.509) තවත් අවස්ථාවක, උන්වහන්සේ කපිලවස්තුවට වැඩමකර සුදුසු නවාතැනක් නොමැතිව, පොළොව මත එළූ පැදුරක් මත භාරන්දුගේ අසපුවේ රාත්‍රි ගතකළහ. (A.I. 277) තවමත් උතුරු ඉන්දියානු ගම්වලට ආසන්නව තිබෙන බොහෝ අඹ වන වදුලුවලින් එකක උන්වහන්සේ හුදෙක් නිතරම සැතපෙන්නට ඇත. ශීත ඍතුවේ එක් රාත්‍රියක උන්වහන්සේ පිටත සිටින විට, උන්වහන්සේ සතුටින් ද කියා හත්ථක ඇසුවේය. උන්වහන්සේ මෙසේ පැවසූහ: "ඔව් දරුවා, මම සතුටින් සිටිමි. ලෝකයේ සතුටින් සිටින එක් කෙනෙකි මම."මේ පිළිබඳව හත්ථක පුදුමයට පත්විය. එය මාසයේ අඳුරු භාගයයි. අයිස් මිදෙන කාලයයි, ගවයන්ගේ රළු කුරවලින් පොළොව පෑගී තද වී ඇත, පොළොව කොළ ඇතිරියෙන් වැසී ඇත. පොළොව සීතලය. බුදුපියාණන් වහන්සේගේ සිවුර ද ඉතා සියුම් එකක් සේ පෙනුණි. බුදුපියාණන් වහන්සේ කෙසේ නමුත් තමන් වහන්සේ සතුටින් බව නැවතත් අවධාරණය කළහ. (A.I. 136)

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ චාරිකාව තුළින් උන්වහන්සේ ජීවිතයට ලැබූ නිදහස ද භුක්තිවිඳින්නට ඇත. උන්වහන්සේ සඳහන් කළ ආකාරයට "ගෘහ ජීවිතය බාධාවන්ගෙන් පිරී ඇත, දූවිල්ලෙන් පිරුණු මාර්ගයකි, සියලු ලෞකික දේවල් අත්හළ පුද්ගලයාගේ ජීවිතය සුළඟ මෙන් නිදහස්ය." (D.I.62) කෙසේ නමුත්, තැනින් තැනට යාම, ඒ පිටුපස ඉතා වැදගත් ප්‍රායෝගික හේතුද ඇත. අවශ්‍යමයැයි අප පිළිගන්නා සන්නිවේදනය නොමැති ලෝකයක උන්වහන්සේට උන්වහන්සේගේ දහම දුරට සහ සම්පූර්ණයෙන්ම පැතිරීමට ඉඩ සලස්වන ලදී. උන්වහන්සේ සමඟ යම්

පෞද්ගලික හමුවීමක්, විශේෂයෙන්ම අලුතින් පැවිදි කරන ලද භික්ෂු භික්ෂුණීන්ට වැදගත් බව උන්වහන්සේ දැන සිටියහ. උන්වහන්සේ වැඩම කළේ කුමන දිස්ත්‍රික්කයට ද හා කොපමණ කාලයකින් ද යන්න තීරණය කිරීමට මෙය සාධකයක් විය හැකිය. (S.III. 90) උන්වහන්සේගේ චාරිකා තුළ උන්වහන්සේ එක් දිස්ත්‍රික්කයකට වැඩමකර, උගන්වා, ශ්‍රාවකයන් බිහිකර, භික්ෂූන් හා භික්ෂුනීන් වශයෙන් කිහිප දෙනෙකු පැවිදිකර, ඊට පසුව සමහර විට අවුරුදු බොහෝ ගණනකට නැවත නොඑන්නට ද ඇත. එවැනි දිස්ත්‍රික්කයකින් යම් භික්ෂුවකට නැවතත් උන්වහන්සේ හමුවීමට අවශ්‍ය නම්, ඒ කාලයේ බුදුපියාණන් වහන්සේ වැඩසිටින්නේ කොතැනක ද, එතැනට ඔහුට හුදෙක්ම ගමන් ඇරඹිය හැකිය.

මහාකච්චාන විසින් සෝන කුටිකන්න පැවිදි කරනු ලැබුණි. වර්ෂයකට පසු ඔහුට තමා පේවුණු දහම ඉගැන්වූ පුද්ගලයා දැකීමට ආශාවක් ඇතිවුණේය. ඔහු තමාගේ උපදේශකයා අමතා මෙසේ පැවසුවේය. "මම තවමත් බුදුපියාණන් වහන්සේ මුහුණට මුහුණ දැක නැත්තෙමි. උන්වහන්සේ කෙබඳු කෙනෙක් ද කියා පමණක් මම අසා ඇත්තෙමි. ඔබ මට අවසර දෙන්නේ නම්, බුදුපියාණන් වහන්සේ දැකීමට මම යන්නෙමි." (U.D.58) ගෘහස්ථ වගකීම්වලින් බැඳී සිටින ගිහි ශ්‍රාවකයන්ට බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට දීර්ඝ චාරිකා ආරම්භ කිරීමට ඉතා අපහසු වන්නට ඇත. එසේම ඔවුන්ට සමහරවිට උන්වහන්සේ නැවත දැකගැනීමට අවුරුදු බොහෝ ගණනක් ගතවිය හැකිය. දුරින් පිහිටි දිස්ත්‍රික්කවල පදිංචිකරුවන් බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ දකින්නට වඩින්නේ යැයි ඇසූවිට ඔවුන්ට ඇතිවන ප්‍රබෝධය පිළිබඳව යම් අදහසක් ථපථය සූත්‍රයෙන් ලබාදෙයි. එසේම උන්වහන්සේගේ ක්‍රමානුකූල පැමිණීමේ පුවත ඔවුන් කරා ළඟා වූ විට, එම උද්වේගය තවත් වැඩි වෙයි. (S.V.348-349) බුදුපියාණන් වහන්සේ පිළිබඳ තොරතුරු සහ උන්වහන්සේ උගන්වන්නේ කුමක් ද කියා දැනගැනීමට මිනිසුන්ගේ ඇති තද ආශාව වෙනත් තැනකදී අපි කියවා ඇත්තෙමු.

වරක් බුදුපියාණන් වහන්සේ සමඟ ශ්‍රාවස්ථියේ වස්සාන ඍතුව ගතකළ භික්ෂුවක් කපිලවස්තුවට පැමිණියේය. එම භික්ෂුව පැමිණියේ කොහි සිට ද කියා මිනිසුන් දැනගත් විට, බුදුපියාණන් වහන්සේ පිළිබඳව ප්‍රශ්නවලින් පිරුණු වදන් ප්‍රවාහයක් ඔහු වෙත ගලා ආවේය. (S.V.450) තවත් අවස්ථාවක කෝසල සහ මගධයෙන් පැමිණි බ්‍රාහ්මණ පිරිසක්, වේසාලියට පැමිණි විට, බුදුපියාණන් වහන්සේ හරියටම නගරයේ වැඩසිටින බව දැන, උන්වහන්සේ හමුවීමට හැකි එම අවස්ථාව අත්නොහැරිය යුතු බවට තීරණය කළහ. පෙනෙන ආකාරයට බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ

සහායකට තමන් වහන්සේට බාධා නොකළ යුතු බවට උපදෙස් දී තිබුණි. කිසිසේත් වෙනස් නොවන බ්‍රාහ්මණයෙකු පවසා සිටියේ මේ ජනප්‍රිය ගුරුවරයා හමුවන තුරු තමා එතැනින් නික්ම නොයන බවයි. මෙම අවහිරතාව දුටු සාමණේර සිහ මිනිසුන් තුන්දෙනකු බුදුපියාණන් වහන්සේ හමුවීමට පැමිණ ඇති බවට උන්වහන්සේට දන්වන මෙන් සහායකගෙන් ඉල්ලා සිටියේය. සහායක කියා සිටියේ තමාට එය කරන්නට නොහැකි වූවත්, සිහට අවශ්‍ය නම් එසේ කිරීමට තමා විරුද්ධ නොවන බවයි. එය එසේ කරන ලදී. බුදුපියාණන් වහන්සේ ආරාමයෙන් පිට සෙවණ ඇති තැනක පැදුරක් එළන ලෙස සිහට පවසා ... බ්‍රාහ්මණයන්ට කථා කළහ. (D.I.151)

නමුත් බුදුපියාණන් වහන්සේට එකම විට සැමතැනම සිටිය නොහැක. ඒ නිසා භික්ෂූහු සහ භික්ෂුණීහු බොහෝ විට උන්වහන්සේ ඉදිරියේ යම් කාලයක් ගතකිරීමේ වරප්‍රසාදය ලබාගැනීම පිණිස බොහෝ විට දීර්ඝ ගමන් අරඹති. උදාහරණ වශයෙන් වරක් උන්වහන්සේ චාතුමාවේ වැඩසිටින විට අඩුම තරමින් භික්ෂූහු 500ක් වත් උන්වහන්සේ බැහැදැකීමට පැමිණියහ.(M.I. 456) කෙසේ නමුත්, ඕනෑම වේලාවක ඔබ මොබ වඩින බුදුපියාණන් වහන්සේ වැඩ සිටින තැන නිශ්චිතවම දැනගැනීමට සැමවිටම නොහැකි විය. බාවරී නම් තවුසාගේ ශ්‍රාවකයන් 16 දෙනා බුදුපියාණන් වහන්සේ හමුවීම පිණිස උතුරු ඉන්දියාවට, සමහරවිට මහාරාශ්ට්‍ර හරහා ගලනා ගෝදාවරියේ සිට පිටත්වීම පිළිබඳව සූත්ත නිපාතයේ පරායන වග්ගයේ අපි කියවා ඇත්තෙමු. පළමුව ඔවුහු උන්වහන්සේ ශ්‍රාවස්ථියේ සිටිනා බව දැනගත්හ. "අවුල් වූ කෙසින් සහ මුවසමින් නිමකළ වස්ත්‍ර" හැඳගත් ඔවුන් එහි ගොස් තිබේ. ඔවුන් කොසඹෑ සහ සාකේත හරහා ගොස් ශ්‍රාවස්ථියට පැමිණි විට ඊට කලින් බුදුපියාණන් වහන්සේ පිටව ගොස් ඇති බව ඔවුහු දැනගත්හ. ඔවුහු සේතව්‍ය, කපිලවත්තු, කුසිනාරා, පාවා සහ වේසාලි හරහා උන්වහන්සේගේ මාර්ගය පසුපස ගියහ. අවසානයේ උන්වහන්සේ කෙසේ හෝ හමුවීම සඳහා පාසානක සිද්ධස්ථානය (ගයාවේ උතුරේ බරබාර් කන්ද) වෙත, "සීතල ජලය සොයනා මිනිසකු, ලාභ සොයනා වෙළෙන්දකු, ග්‍රීෂ්මයෙන් වෙහෙසවූවකු සෙවණක් සොයායන්නාක් මෙන් ඔවුහු ඒ කන්ද නැග්ගහ." (S.N. 1014)

වර්තමානයේ මෙන්ම ඉන්දියාවේ බුදුපියාණන් වහන්සේගේ කාලයේදීද බොහෝ භාෂා සංඛ්‍යාවකින් සහ උප භාෂාවලින්ද කථාකර ඇති බවට සැකයක් නැත. එය උන්වහන්සේටද විශේෂ ප්‍රශ්න ඇතිකරන්නට ඇත. බුදුපියාණන් වහන්සේ කුමන භාෂාවෙන් කථා කළා ද කියා ත්‍රිපිටකයේ සඳහන් නොවූවත්, උන්වහන්සේ පාලි භාෂාවෙන් කථා කළහයි ථේරවාද විශ්වාස සඳහන් කරයි. වෙළෙඳුන් විදේශ සේවයේ නියුතු අය සහ විවිධ පාලන ප්‍රදේශවල නිරත සංචාරය කරන්නන් මෙන්ම, තමන් වහන්සේගේ මව්

භාෂාවට අමතරව උන්වහන්සේ වෙනත් භාෂා ද භාවිත කරන්නට වැඩි සම්භාවිතාවක් ඇත. එය කෝසල නගරයේ උපභාෂාව ද විය හැකිය. උන්වහන්සේ සමහරවිට තවත්, වෙනත් භාෂා රැසක් පිළිබඳව ව්‍යක්ත භාවයකින් සිටින්නට ඇත. තමන්ගේම උපභාෂාව තවත් අයකු කථාකරන ප්‍රදේශයක කථාකිරීමට බලකිරීමක් කරන්නේ නම්, අවුල් සහගත තත්ත්වයක් සහ ගැටුමක් ඇතිවන බව බුදුපියාණන් වහන්සේ අරනවිභන්ග සූත්‍රයේ සඳහන් කළහ. එය මෙසේ සඳහන් වේ: "යමෙකු ඕනෑවට වඩා දේශීය භාෂාව ස්ථාපිත නොකළ යුතුයි. යමෙකු මෙය කරන්නේ කෙසේ ද? විවිධ ප්‍රදේශවල ඒවා එකම නමින් හැඳින්විය හැකිය, පැටි, පත්තා, විත්ථා, සේරව, ධාරෝපා, පොනා, හනා හෝ පිසිලා (මේ සියල්ලම භාජනයක් හෝ දීසියක් හඳුන්වන විවිධ වචනයි) එම නිසා එක් ප්‍රදේශයකදී හඳුන්වන කුමන හෝ වචනයක්, "මේ පුද්ගලයා යම් දෙයක් පිළිබඳව සඳහන් කරනවා" යැයි සිතමින් පුද්ගලයෙක් එම වචනය භාවිත කරයි. එසේම යමෙක් එම වචනය ඒ අනුව භාවිත කරයි. භාෂා සහ උප භාෂා පරාසයක් පිළිබඳව හොඳින් දන්නා සහ ඉතා විවෘත සහ භාෂා පිළිබඳව ප්‍රායෝගික පුද්ගලයකුගේ වචන මේවායි.

බුදුපියාණන් වහන්සේ ඒ හා සමානවම ප්‍රාදේශීය චාරිත්‍ර පිළිබඳව විවෘත වූහ. වරක් භික්ෂූන් පිරිසක් උවමනාවට වඩා වැඩි කාලයක් ස්නානය කරන බව ද ජලයේ ක්‍රීඩා කරන බව ද දැනගත් උන්වහන්සේ ඔවුන් මාසයකට වතාවක් පමණක් ස්නානය කළයුතු බවට නීතියක් පැනවූහ. පසුව දුරබැහැර ප්‍රදේශයක විසූ භික්ෂූන් පිරිසකගේ නිතර සිදුනොවන පිළිකුල් සහගත ස්නානය (පුදුමසහගත නොවන) දැක මිනිස්සු, බුදුපියාණන් වහන්සේට පැමිණිලි කළහ. එවිට එම ප්‍රදේශයේ චාරිත්‍රවලට අනුව නිතර ස්නානය කිරීමට ඔවුන්ට අවසර ලැබුණි. නැවත වරක් විනීත, හොඳින් සංචාරය කළ පුද්ගලයෙකුගෙන් බලාපොරොත්තු වියහැක්කේ මෙයයි. කුමක් වුවත්, බුදුපියාණන් වහන්සේ පටු අදහස් ඇත්තෙක් නොවූහ. උන්වහන්සේගේ සංචාර උන්වහන්සේට වඩා නම්‍යයශීලී සහ විවෘත මනසක් ඇතිකළාට සැකයක් නැත.

# 10.බුදුපියාණන් වහන්සේ වදාළ සනීපාරක්ෂාව - වච්චකුටි

නූතන වැසිකිළි සහ ඒවාට සම්බන්ධ ජලප්‍රවාහන පද්ධතිය අපි වැඩිදෙනෙක් ප්‍රශ්නයක් නැතිවම හොඳින් පිළිගනිමු. එසේම සමහරවිට එය තේරුම් ගත හැකිය; නිතරම සහ ගැඹුරු ලෙස සිතීමට හෝ මිනිස් අපද්‍රව්‍ය විශේෂයෙන් ප්‍රසන්න හෝ නැණගුණ දියුණු කරන අභ්‍යාසයක් නොවේ. කෙසේ නමුත් එම විෂයය පිළිබඳව යමක් දැනගැනීම නූතන ශිෂ්ටාචාරය ඇගයීමට ද, එහි වාසි අතීතය ආරෝපණය කිරීමේ සාමාන්‍ය පුරුද්ද දුරැලීමට ද උපකාරී වේ.

ජීවිත අපේක්ෂාව සහ ලෝකයේ ජනගහනය දැන් ඉතිහාසයේ කිසිදිනක නොතිබූ තරමට ඉහළ යාමට හේතු තුනක් ඇත. ඒවා නම්, නූතන ආහාර නිෂ්පාදනය, නූතන බෙහෙත්වල දියුණුව සහ ජල මුද්‍රිත හෝ වැසිකිළි කාණු සහ ජලප්‍රවාහන පද්ධති උත්පාදනයි. ඉතිහාසයේ වැඩිම කාලයක් පුරා බොහෝ සංස්කෘතිවල මිනිසුන් මලපහ කළේ ඔවුන්ගේ නිවස තුළ හෝ ඒ ආසන්නයේය. මලපහ ඉවත්කරන්න යම් ආකාරයකින් උත්සාහයක් දැරුවත් සාමාන්‍යයෙන් අදහස් කළේ ජලයේ (ගංගා, ඇළ සහ පොකුණු) ඒවා අතහැරීමටයි. මේ නිසා බීමට ගන්නා ජලය අපිරිසිදු විය. රෝමන් ජාතිකයන්ට සහ සමහර අයට ඉතා හොඳ පොදු වැසිකිළි තිබුණ බව ඇත්තකි. නමුත්, ඊට පසු ඒවායේ තැන්පත් අපද්‍රව්‍ය සැකයක් නැතිවම නගරයේ බිත්තිවලට ඔබ්බෙන් සෝදාගොස් එකතුවී දුගඳ හැමූ අතර, ගඳගහන වැසිකිළිය මැස්සන් සහ ලෙඩ රෝග බෝවීමට හේතු විය.

රජගහට පිටතින් පිහිටි විශාල වළකට නගරවාසීන් තමන්ගේ මුත්‍රා පිටකිරීම සහ අසූචි දැමීමට පුරුදු වුණු බව එක් සංස්කෘතික බෞද්ධ ග්‍රන්ථයක සඳහන්වී තිබේ. වර්ෂාව පවතින විට ජලයත් එයට ගලාගොස් වළ තුළ පණුවන් ඇතිවේ. මෙය සුළු දෙයක් නොවේ. අදටත් ඉන්දියාවේ ජනගහනයෙන් භාගයකට කිට්ට ප්‍රමාණයක් අසූචි එළිමහනේ පිටකරයි. සෑම වර්ෂයකම ලක්ෂ ගණනාවක් වැඩකරන දින අහිමි වීමට ප්‍රධාන හේතුව ජලය ආශ්‍රිත ලෙඩ රෝග නිසා රැකියාවට නොපැමිණීමයි.

මෙය විශේෂයෙන්ම, ඉන්දියානුවෙකු සමහර විට ශ්‍රේෂ්ඨතම ඉන්දියානු පුරවැසියා වන, බුදුපියාණන් වහන්සේ සැබැවින්ම ඉතාම ලෞකික කාරණයක් වන මිනිස් අපද්‍රව්‍ය ආරක්ෂාකාරීව ඉවත් කිරීම පිළිබඳව පෙරකී ලෙස උන්වහන්සේගේ මනස යොමුකිරීම පුදුමයකි. බුදුපියාණන් වහන්සේ සනීපාරක්ෂක ඉන්ජිනේරුවෙක් නොවූහ. නමුත් උන්වහන්සේ යහපත් සෞඛ්‍යයට සම්බන්ධ කරුණක් වන මිනිසුන්ගේ සුභසිද්ධිය පිළිබඳව

සැලකිලිමත් වූහ. "සෞඛ්‍යය ඉහළම ලාභයයි." ධම්මපදයේ 204 පදයෙන් උන්වහන්සේ පැහැදිලි කළහ.

සුළු පිරිසක් දන්නා දෙයක් වුවත්, ප්‍රායෝගිකව සහ සනීපාරක්ෂක අයුරින් වැසිකිළි ගොඩනගන්නේ කෙසේ ද කියා විස්තරාත්මක උපදෙස් බුදුපියාණන් වහන්සේ විනය පිටකයේ සඳහන් කර ඇත. එවැනි වැසිකිළියක් ( වච්චකුටි), අදට හඳුන්වන වළ සහිත වැසිකිළියක්; අපද්‍රව්‍ය බැහැර කරන වළ (වච්චකූප), කුඩා සිදුරක් සහිතව ගලක් හෝ කොන්ක්‍රීට් වළකින් (පරිභණ්ඩ) වසා සැදිය යුතුවේ. සිදුරේ දෙපැත්තේම පුද්ගලයකුට සිටගැනීමට හෝ උක්කුටියෙන් ඉඳගැනීමට හැකිවන සේ ඉහළට එසවූ උස් තලාවන් (වච්චපාදුක) තිබිය යුතු බවට බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. මෙසේ කිරීමට අවශ්‍ය වන්නේ පොළොව මත ඉහිරෙන ජලයෙන් පාද වියළිව තබාගැනීමට ආරක්ෂාවක් ලෙසයි. ශරීර කෘත්‍ය කිරීමෙන් අනතුරුව, හොඳින් සෝදාගෙන හෝ තණකොළ හෝ ලී කැබැල්ලකින් පිසදාගැනීමට උපදෙස් ලැබුණි. අවසානයේ අත් සෝදාගැනීම පිණිස වැසිකිළියෙන් පිටත වතුර කළයක් තිබිය යුතුයි.

බුදුපියාණන් වහන්සේ සනීපාරක්ෂණයේ ඇති වැදගත් බව අවබෝධකර ගත් අතර, පන්සල්වල වැසිකිළි අඛණ්ඩව සේදීම සහ අතුගෑම කළයුතු බවට අවධාරණය කළහ. වැසිකිළි හා සම්බන්ධ සමාජ සිරිත් යනුවෙන් උන්වහන්සේ හැඳින්වීමක් විනය පිටකයේ සිදුකර ඇත. වැසිකිළි කෘත්‍යයන් නිමකිරීමට ආසන්න වූ විට, ඊළඟට යමෙකු එනවිට ඇතුළේ යමෙකු සිටින බවට ඇඟවීමට, කහිමින් සඥාවක් කළයුතු බව ද උන්වහන්සේ පැහැදිලි කළහ. සිවුර අපිරිසිදු වීම වැළැක්වීම සඳහා ඉවතට ගෙන එල්ලිය යුතුය. වැසිකිළි කටයුතු කරන විට කෙඳිරිනොගෑ යුතුය, දත් නොමැදිය යුතුයි, හෝ පොළොව මත කෙළ නොගැසිය යුතුය. එසේම, වැසිකිළි කටයුතු අවසාන කිරීමෙන් පසු ඊළඟ පුද්ගලයා ගැන අනුග්‍රහයක් වශයෙන් ජල භාජන පිරවිය යුතුය. ( Vin. 11. 222)

පෙනෙන ආකාරයට දැන් විස්තර කළ ආකාරයේ වැසිකිළි සැම පන්සලකම නැත. වඩා නිවැරදිව කියනවා නම්, පොළොව යට මුට්ටි (ගූත්ථකටක) විකල්පයක් වූ අන්තරගතය පසුව ඉවතට දමන ලදී. විනය පිටකයේ සඳහන් වන්නේ හිස් නොකර, එහි අන්තර්ගතය තාප්පයෙන් ඉවතට දැමීම හෝ පාරට දැමීම පිණිස යොදාගන්නා පොළොව යට තබන මුට්ටියයි. මේ ක්‍රමයට මාර්ගයේ ගමන්කරන බ්‍රාහ්මණයකුගේ හිස මත ඉවත්කරන අපද්‍රව්‍ය වැටේ. ඔහු සතුටින් නොවන බවට විස්තර සඳහන් වේ. (Vin. 1V. 265)

7 වන ශතවර්ෂයේදී යිජින්ග් නමැති චීන භික්ෂුවක් ඉන්දියාවේ සිටියේය. ඉන්දියානු භික්ෂූන් වැසිකිළි කටයුතු ඇතුළුව හැසිරුණ ආකාරය පිළිබඳව ඔහු

සැලකිලිමත් වූයේය. පෙනෙන ආකාරයට හොඳින් අනන ලද මැටිවලින් බෝල සාදා වැසිකිළියට යාම සම්මතයක් වී තිබුණි. ඒවායින් සමහරක් අසූචි පිටකිරීමෙන් පසු, සේදීමට ප්‍රථමයෙන්, පිසදැමීම පිණිස භාවිත කළ අතර, ඉතිරිය පසුව ජලය සමඟ අත් සේදීම සඳහා භාවිත කරන ලදී. එකල සබන් නොතිබූ බව ද මතක තබාගත යුතුය. සමහරවිට තිබූ හොඳම සනීපාරක්ෂක විකල්පය මෙය විය හැකිය.

බෞද්ධ භාවනාවේ හදවත නිවැරදි සිහිකල්පනාවයි. (සම්මා සති) මෙම පුහුණුවේ පූර්ව පියවරවලදී භාවනායෝගියා මෘදු ලෙස හුස්ම ගැනීමේ සහ පිටකිරීමේ ස්වභාවය දැනගන්නා අතර, ඊට පසු තමාගේ සියලුම කරුණු පිළිබඳව දැනගැනීම කෙරෙහි එය පුළුල් වේ. මුළු ශරීරයේම හැඟීම්, මනස සහ ඊට පසු මනසේ අන්තර්ගතය පිළිබඳවත් සිහිය යොමුකරයි. නමුත් පුද්ගලයකුට නිශ්ශබ්ද කාමරයක අසුන්ගෙන පමණක් සිහියෙන් සිටීමට හැකිනම්, ඔහුට හෝ ඔහුගේ ජීවයේ කුඩා කොටසක් පිළිබඳව පමණක්, අඩුම අවධානය ඇති කොටසක් පිළිබඳව සිහිය රඳවාගත හැකිය. සැබෑවටම ඵලදායි තත්ත්වයකට ඒමට නම් පුද්ගලයකු සිදුකරන සෑම ක්‍රියාවක් පිළිබඳවම සිහිය ගලා යායුතුයි. ජනප්‍රිය සතිපට්ඨාන සූත්‍රයේ බුදුපියාණන් වහන්සේ මෙසේ පවසති: "යන එන විට, ඔහුගේ අත් දිගහරින විට හෝ හකුළුවන විට, සිවුරු අඳින විට සහ පාත්තරය රැගෙන යන විට, ආහාර ගන්නා විට සහ බීමක් ගන්නා විට, සපන විට, රස බලන විට, මලපහ කරන විට, මූත්‍ර පිටකරන විටත් භික්ෂුවකට සම්පූර්ණ අවධානය තිබේ." ඔහුට සක්මන් කරන විට, සිටගෙන සහ ඉඳගෙන ඉන්නා විට, සැතපෙන විට සහ අවදිවන විට, කථාකරන විට සහ නිශ්ශබ්දව සිටින විටත්, සම්පූර්ණ අවධානය තිබේ. " මලපහ කරන විට සහ මූත්‍ර පිටකරන විටත්" (උච්චාරපස්සාවකම්මේ), අප සිහියෙන් සිටිය යුතු බව බුදුපියාණන් වහන්සේ වදාළේ සියලු කටයුතු කෙතරම් සාමාන්‍ය සහ සුලබ වුවත්, පැහැදිලි සහ සිහිකල්පනාවෙන් යුතු අරමුණින් සිදුවිය යුතු බවයි. ඉතාම ගම්භීර මට්ටමේ සිට ලෞකික දක්වා සෑම ක්‍රියාවක්ම සිහියෙන් යුතුව කළවිට, එය ආධ්‍යාත්මික වැඩිදියුණුව ඇතිකර ගැනීමට අවස්ථාව උදාකරයි.

අනුරාධපුර, රිටිගල හෝ අවට නටබුන් හෝ ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක පැරණි නටබුන් දැකීමට ඇවිද්දොත් ඕනෑම පුද්ගලයකුට දැන් හඳුන්වන මූත්‍ර ගල්, හෙවත් පැරණි වැසිකිළියක් දකින්නට පුළුවනි. මෙම අවධානය ගන්නා සුලු සහ සමහර විට ආකර්ෂණීය ලෙස සැරසූ ද්‍රව්‍ය පන්සල්වල පිහිටුවා ඇත්තේ සනීපාරක්ෂක හේතූන් නිසාමය. ඒවායේ ඇති අලංකෘතකරණයන් ආදිය පිළිබඳව පැරණි ශ්‍රී ලාංකික සංස්කෘතියට ණයගැති වන අතරවාරයේ

ඒවා පිටිපස ඇති සංකල්පය ඉන්දියානු වන අතර, සියල්ල බුදුරජාණන් වහන්සේට ණයගැතිය.

# 11.අශිෂ්ට ජාතකය

විවිධ අශිෂ්ට කථාන්දර ඇතුළත් ජාතක කථාවක් වන්නේ කච්චප ජාතකයයි. එසේම එය ඉංග්‍රීසි භාෂාවට මීට පෙර පරිවර්තනය කර ඇතැයි මම සිතමි. තවත් විවිධ හා තරමක් අසැබි එකතුවක් මෙන්ම එම ග්‍රන්ථයේ පළවූ සම්පූර්ණ ඉංග්‍රීසි පරිවර්තනය, මහාචාර්ය ඊ.බී.කොවල් සංස්කරණය කළ අතර, විද්වතුන්ට පමණක් කියවීම පිණිස එය ලතින් භාෂාවට පරිවර්තනය කිරීම වඩා හොඳ යයි සිතුවේය. බෝධිසත්වයන්ගේ උපේක්ෂාව සහ පලිනොගැනීමේ ගුණාංගය මතුකර දැක්වීම මෙම කථාවේ පරමාර්ථයයි. නමුත් කතුවරයා හෝ කතුවරයෝ, විවිධ උත්සව සහ චාරිත්‍රවලදී තමන්ට කෑමට හැකි ප්‍රමාණයට වඩා වැඩි ආහාර ප්‍රමාණයක්, ඉබ්බකුගේ කටුවක් සේ පෙනෙන පාත්‍රවලින් රැගෙන ගිය කෑදර බමුණන් උපහාසයට ලක්කිරීමට මෙය අවස්ථාව කරගනී. විහිළුවට ලක්කිරීමට අශිෂ්ට මූලද්‍රව්‍යයක් ඇතුළත් කිරීමත් සමඟ කථාවේ ස්වරය සාමාන්‍යයෙන් විනෝදවත් එකක් බවට පත්වී ඇත. මෙම සැහැල්ලුවට අනුකූලව, මම අංගජාත "ඩික්" හෙවත් ශිෂ්නය යනුවෙන් පරිවර්තනය කර ඇත. කච්චප (ඉබ්බා) සහ කොන්ඩන්න සාමාන්‍යයෙන් අන්තර්-විවාහ සිදුනොවන වංශ හෝ ගෝත්‍රවල ගෝත්‍ර විචිනයකි. මෙම කථාවේ සඳහන් වඳුරා (මක්කට) Rhesus Macaque උතුරු ඉන්දියාවේ ඉතාම විශේෂ වර්ගයේ සත්ත්වයන්ගෙන් ඉතාම කලහකාරී සහ දඟකාරී සත්ත්වයෙකි. සිත්ඇදගන්නා සුලු දෙය නම් බෝධිසත්වයන් වහන්සේ සැමවිටම ජාතක කථාවල අනෙක් වර්ගයේ වඳුරු ආත්මවල ඉපදුණු බවත් කිසිවිටෙක Macaque මබ් වර්ගයේ වඳුරු ආත්මයක් නොලැබීමත්ය. එක් භික්ෂුවක හෝ උගත් ගිහියකු මෙම කථාව ආගමික උත්සවයකදී හෝ පුරපෝය රාත්‍රියකදී කියන විට ගම්වැසියන් මොරදෙමින් සිනහවන ආකාරය කෙනෙකුට සිතින් මවාගත හැකිය. මෙම පරිවර්තනය සඳහා මට උපකාර කිරීම පිළිබඳව මම ආනන්දජෝති ස්වාමීන්වහන්සේට ස්තුතිවන්ත වෙමි.

# කච්චප ජාතකය

වරක් බ්‍රහ්මදත්ත නම් රජ කෙනකු බරණැස් නුවර රජ කළ කල්හි, බෝධිසත්වයන් වහන්සේ කාසි නගරයේ බ්‍රාහ්මණ පවුලක උපන්හ. තක්ෂිලාවේදී අධ්‍යාපනය නිමාකර ඔහු ඉඳුරන් පිනවීම අත්හැර තාපසකයකු ලෙස පැවිදිවීමට තීරණය කළේය. ගංගා නම් ගඟ ඉවුරේ හිමාලයේ ඔහු ආශ්‍රමයක් ගොඩනැගුවේය. බෝධිසත්වයෝ එහිදී ආධ්‍යාත්මික බල සහ ධ්‍යාන

ලැබුවේය. මේ ආත්මයේදී බෝධිසත්වයන් වහන්සේ උපේක්ෂාව පරිපූර්ණ වී අසාමාන්‍ය ලෙස සාධාරණ වූ බව පෙනේ. එක් දිනක් උන්වහන්සේ කොළ අතුවලින් නිමවූ නිවහන ඉදිරිපස සිටියහ. එක් දඟකාර අකීකරු වඳුරෙක් උන්වහන්සේ මත බඩගා උගේ ලිඟුව උන්වහන්සේගේ කන තුළට දමන්නට උත්සාහ කළේය. බෝධිසත්වයන් වහන්සේ එය වළක්වා, උපේක්ෂාසහගත බව නිසා හුදෙක් සන්සුන්ව දිගටම වාඩිවී සිටියහ. ඊට පසු තවත් දිනක එය සිදුවිය. එක් ඉබ්බෙක් ජලයෙන් ගංඉවුරට පැමිණ, මුඛය විවෘතව තිබියදී නින්දට පත්විය. මෙය විපරම් කළ ජවසම්පන්න වඳුරා උගේ ලිඟුව ඉබ්බාගේ මුඛයට ඇතුල් කළේය. නැගිටගත් ඉබ්බා, ඌගේ කට පෙට්ටගමක පියන කෙනෙකු ශබ්දයක් නැඟෙනසේ වසන්නාක් මෙන් සපාකමින් වසා ගත්තේය. මහත් වේදනාවට පත් වඳුරා උගේ ලිඟුව තදින් අල්ලා ගත්තේය. වේදනාව දරාගැනීමට අපහසු වූ වඳුරා මෙසේ සිතුවේයඃ "මා මේ වේදනාවෙන් බේරාගත හැක්කේ කාට ද? අර තවුසාට පමණයි. මම ඔහු වෙත යමි." ඉබ්බා තමාගේ අතින් අල්ලාගෙන වඳුරා බෝධිසත්වයන් වහන්සේ වෙත ප්‍රවේශ විය. උන්වහන්සේ අකීකරු වඳුරාට සරදම් කරමින් මෙම පළමුවෙනි පැදිය කියූ සේකඃ

"ඔබට ඉස්තරම් ආහාරයක් (අර භාජනයේ) ඇත. විශාල අතක් පුරා හාල් සමඟ බ්‍රාහ්මණයකු වගේ ඔබ දානයට ගියේ කොහේ ද? කුමන අවමඟුලට ද ඔබ ගියේ?"

මෙය ඇසූ දඟකාර වඳුරා දෙවන පැදිය කීවේයඃ

"මම ඇත්තටම මෝඩ වඳුරෙකි. මම අල්ලන්නට බැරි දෙයක් අල්ලා ඇත්තෙමි. ඔබට මා නිදහස් කරන්නට හැකිනම් මම නැවත කඳු මතට යන්නෙමි."

බෝධිසත්වයන් වහන්සේ වඳුරාට අනුකම්පා කරමින්, ඉබ්බා අමතමින් තුන්වන පැදිය කියූ සේකඃ

"කාෂ්‍යප ගෝත්‍රය ඉබ්බන්ය. කොන්ඩන්යන් වඳුරන්ය. කාෂ්‍යප කරුණාකර කොන්ඩන්නව, ඔබ සමඟ කාමයේ හැසිරීමෙන් නිදහස් කරන්න."

බෝධිසත්වයන් වහන්සේගේ වචන අසා ඉබ්බා උන්වහන්සේගේ තර්කනයෙන් සතුටුව, වඳුරාගේ ලිඟුව අත්හැරියේය. වඳුරා නිදහස ලැබූ ක්ෂණයෙන් බෝධිසත්වයන් වහන්සේට හිස නමා පසුපස නොබලාම දිව ගියේය. ඉබ්බා බෝධිසත්වයන් වහන්සේට වැඳ තමාගේම වාසස්ථානයට නැවත ගියේය. බෝධිසත්වයන් වහන්සේ ධ්‍යානවලින් නොනික්මම, අවසානයේ මියගොස් බ්‍රහ්ම ලෝකයේ ඉපදුණහ.

# 12.බුදුපියාණන් වහන්සේ, රෝග සුවකිරීම සහ ඖෂධ

බුදුපියාණන් වහන්සේගේ ජීවිත කාලය තුළදී උන්වහන්සේගෙන් ප්‍රකටවූ ගුණාංග මතුකිරීමට හෝ අගයන්නට විවිධ විශේෂණ නාම ලබාදී තිබුණි. ඒ අතර, "සතුටින් සිටින පුද්ගලයා'' "දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ ගුරුවරයා'' "සත්ත්වයන්ට අධිපති ගුරුවරයා" ආදියයි. මෙම විශේෂණ පදවලින් ඉතාම සිත් බඳනා වචනය, ඉත්තිවුත්තකයේ සහ වෙනත් බොහෝ තැන්වල සඳහන් වේ. ඒ, උත්තරීතර ගුරුවරයා (අනුත්තර භිසක්ක) වෛරය සහ ලෝභය, භය සහ දැඩි ආශාව, මෝහය සහ ආත්මාර්ථකාමීත්වය යන පීඩාවන් සංසිඳවීමට සහ අවසානයේ සුවකිරීමට බුදුපියාණන් වහන්සේට තිබූ හැකියාව අරමුණු කරගෙන මෙසේ සඳහන් කර ඇතැයි සාමාන්‍යයෙන් සිතේ. නිසැකවම, පරමත්තජෝතිකාව එය තේරුම්ගත් ආකාරයට, "බුදුපියාණන් වහන්සේ නිපුණ වෛද්‍යවරයෙකු මෙන්ය. කෙලෙස් නම් රෝගය සුවකිරීමට උන්වහන්සේට හැකිය." මෙය යුක්තිසහගත අර්ථකථනයක් වන අතර, එය බුදුපියාණන් වහන්සේ නිපුණ සහ අනුකම්පා සහිත වෛද්‍යවරයකු හා සම කිරීමට හේතුවන කොටසක් පමණි. සම්ප්‍රදායානුකූල අර්ථයෙන් වෙදකම් කිරීම සහ සාත්තු සේවය සැපයීම, රෝග සුවකිරීම හා සෞඛ්‍යය පිළිබඳව අන්තර් ඥානයක් සහ ප්‍රායෝගික බවක් සහිත බොහෝ දෑ උන්වහන්සේට පවසන්නට තිබුණි.

ධම්ම පදයේ බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "සෞඛ්‍යය ඉහළම ලාභයයි" "ආරෝග්‍යා පරමාලාභා" යන්න සම්පූර්ණයෙන්ම පුද්ගලයකු කල්පනා කිරීමට ඉඩ ඇති සුලබ කියමනකි, නමුත් එය බොහෝ පුද්ගලයන් තමන් රෝගීවන තුරු කවදාවත් අවධානය යොමු නොකරන කියමනකි. ශ්‍රී ලංකාව වැනි සමාජවල පරිභෝජන ආර්ථිකයට වඩාත් සමෘද්ධිමත් සහ සන්කලිත වනවිට ස්ථුලභාවය, හෘද රෝග, අධිරුධිර පීඩනය, දත් සහ විදුරුමස් ප්‍රශ්න ආදී තව රෝග ඇතිවන්නට පටන් ගනී. මේ සියලු රෝගවල මූලිකත්වය ගන්නේ ව්‍යායාමය අඩුකම සහ දුර්වල ආහාර පුරුදුයි. වර්ධනය වන සෞභාග්‍යයේ වාසිදායක ප්‍රතිඵලවලින් ශරීර සෞඛ්‍යය දුබල කිරීමට ඉඩ නොතබන්නැයි සිහිපත් කිරීම, බුදුපියාණන් වහන්සේගේ නිරීක්ෂණය විය යුතුය.

විවිධ රෝග තිබෙන ආකාරයටම රෝගීන්ට විවිධ අනාවැකි ද තිබිය හැකිය. මේ ගැන බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ: "ලෝකයේ තුන් ආකාරයේ රෝගීහු සිටිති. මොනවා ද ඒ තුන් ආකාරය?

(i) සුදුසු ආහාර, ඖෂධ, සාත්තුව ලැබුණ ද නොලැබුණ ද සුව නොවන රෝගියෙක් සිටී.

(ii) සුදුසු ආහාර, ඖෂධ, සාත්තුව ලැබුණ ද නොලැබුණ ද කෙසේ හෝ සුවය ලබන රෝගියෙක් සිටී.

(iii) සුදුසු ආහාර, ඖෂධ හා සාත්තුව ලැබීමෙන් පමණක් සුවය ලබන රෝගියෙක් අවසන් වශයෙන් සිටී.

සුදුසු ආහාර, බෙහෙත් සහ සාත්තු සේවය නියම කළයුත්තේ අවසාන වර්ගයේ රෝගීන්ටය. නමුත් අනික් අය රැකබලාගත යුතුයි." නුවණ ඇතිව සහ පැහැදිලි ඇසකින් සිදුකළ නිරීක්ෂණයක් පමණක් නොව, මෙහි ඉතා වැදගත් බවක් ද ඇතුළත්ය; බුදුපියාණන් වහන්සේගේ අවසාන වැදගත් කරුණ නම්; ඉන්දියානු වෙදකමේ පියා වන සුශෘත උපදෙස් දී ඇත්තේ මියයන්නට සම්භාවිතාවක් ඇති රෝගියෙකුට වෙදකම් නොකරන ලෙසයි. ඒ රෝගියාගේ මරණය පිළිබඳව දෝෂාරෝපණවලට ලක්වීමෙන් වැළකීමටයි. මෙයට ප්‍රතිවිරෝධීව, රෝගීන් මියයන්නට සම්භාවිතාවක් තිබුණත් ඔවුන්ට ප්‍රතිකාර සහ සාත්තු සේවය ලබාදිය යුතු බව බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළහ.

මෙය සමහරවිට මුල් කාලයේ ඉඟිකළ, අද කාලයේ හඳුන්වන වේදනාව අඩුකිරීමට සහනය සැලසීමයි. සුශෘත ඉගැන්වූ බොහෝ සදාචාරාත්මක ප්‍රතිපත්ති ඉතා ඉහළ විනයක පවතින බවට සැකයක් නැත. නමුත් මේ කාරණය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගේ නියමය උත්තරීතරය. එසේම ඔවුන්ගේ කාලයට වඩා ඉදිරියෙන් තිබේ.

ශරීරය සහ සිහි ඇති බව අතර සම්බන්ධයක් ඇති බව හඳුනා ගනිමින් සහ ඒ නිසා එක්තරා වෛද්‍යමය තත්ත්වයන්හි පුද්ගලයකුගේ මානසික තත්ත්වය සාධකයක් වියහැකි බවත් මේ ආකාරයට තමන් වහන්සේගේ ශ්‍රාවකයන්ට මෙය අනිවාර්යය නොවිය යුතු බවත් උන්වහන්සේ උපදෙස් දුන්හ: "මගේ කය රෝගී වුවත්, මගේ මනස එසේ නොවේ යැයි සිතමින් ඔබ, ඔබ පුහුණු කළ යුතුයි."

ජනප්‍රිය දුර්මතවලට ප්‍රතිවිරුද්ධව, පීඩා සහ රෝග ඇතුළුව, සියලු කායික තත්ත්වයන් අනිවාර්යයෙන්ම අතීත කර්මවලින් සිදුවේයැයි බුදුපියාණන් වහන්සේ කියා සිටියේ නැත. උන්වහන්සේ සඳහන් කළේ රෝගවලට හේතුවන කාරණා අතරින් අඩුම තරමින් කාරණා 8න් එකක් පමණක් කර්මය වන අතර, අනික් ඒවා පිත (පිත්ත), සෙම (සෙම්හ), සුළඟ (වාත), සියලු කාරණා 3ක් එකතුවන අසංකුලතාවක් නිසා (සන්නිපාත) සෘතු වෙනස් වීම (උතුපරිනාම), නොසැලකිල්ල (විසම්පරිහාර) සහ බාහිර ශක්තීන් (ඔපක්කමික, උදාහරණ - අනතුරු) නිසා සිදුවන බවයි.

අනෙක් අවස්ථාවල නුසුදුසු ආහාර සහ වැඩිපුර ආහාර ගැනීම, එසේම බුද්ධිමත් ලෙස ආහාර ගැනීමේ පුරුදු "රෝගවලින් නිදහස් වීම සහ පීඩා, සෞඛ්‍යය, ශක්තිමත් සහ සැපපහසු ජීවිතයකට" ආධාර වෙන බව බුදුපියාණන් වහන්සේ වදාළහ.

කර්මය හේතු නොකරගෙන ඇතිවන රෝග සහ අසනීපවලට වෛද්‍යමය මැදිහත්වීම ග්‍රහණය වියහැකි නිසා, වෛද්‍යවරයාගේ කාර්යභාරය වැදගත් බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. ඒ නිසාවෙන්, වෛද්‍යමය ආචාරධර්මවලට අදාළ තොරතුරු සමඟ ධර්මය සම්පූර්ණ වේ. උන්වහන්සේ මෙසේ වදාළහ:"රෝගීන් රැකබලා ගන්නා අය විශාල යහපතකි. (අනෙක් අයට)" එයට හේතුව, මුල්කාලීනව ආයුර්වේද නිබන්ධය (සුශෘතසංහිතා සහ චරකසංහිතා) ඉදිරිපත් කළ ආකාරයට ත්‍රිපිටකය වෛද්‍යවරයා (භිසක්ක, තිකිච්ඡාක හෝ වෙජ්ජ) සහ සාත්තු සේවිකාව වෛද්‍යවරයා (ගිලානුපට්ඨාක) අතර වෙන්කර හඳුනා ගැනීමක් ඉතා හොඳින් කර ඇත. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී වෛද්‍යවරයා සමහරවිට රෝගියාගේ කාමරයේ සියලු කාර්යයන් සහ රෝගියාට සාත්තු සේවා සැපයීම ද කළේය. එමනිසා බුදුපියාණන් වහන්සේ වෛද්‍යවරයාට / සාත්තු සේවකයාට මෙම අවවාද දුන්හ: "රෝගීන්ට සාත්තු සැපයීම ලබාදෙන්නා තුළ පස් ආකාරයක ගුණාංග පවතිනවා නම්, රෝගියකුට සාත්තු සේවා ලබාදීමට ඔහු සුදුසු වේ. ඒ පහ මොනවා ද? ඔහුට බෙහෙත් සූදානම් කිරීමට හැකිනම්, හොඳ සහ නරක මොනවා ද යන්න ඔහු දනී. හොඳ දේ ඔහු රෝගියාට ලබාදෙයි. හොඳ නැති දේ ඔහු ලබා නොදෙයි. ඔහු රෝගියාට සාත්තු සේවාව ලබා දෙන්නේ ආදරයෙනි. ආපසු ලාභයක් ලබාගැනීමට නොවේ, අසූචි, මුත්‍ර, වමනය සහ කෙළවලින් නොසැලේ. ධර්මය කථාකරමින් රෝගියාට උපදෙස් දීමට, ප්‍රබෝධය ඇතිකිරීමට, සතුටු කිරීමට සහ ඔහු සැනසවීමට හැකිවීම යනාදියයි.

මෙහි සඳහන් කාරණා පහෙන්, පළමුවැන්න සඳහා සම්පූර්ණයෙන්ම ඖෂධ පාලනය සම්බන්ධයෙන් නිපුණත්වය ලබා තිබීම වෛද්‍යවරයකුගේ වගකීමට අදාළ වේ. පෙරකී පරිදි, වෛද්‍යවරයකුගේ පැවැත්ම සඳහා මුල්ම හේතුව වන්නේ සාර්ථකව ලෙඩ සුවකිරීමයි. නිසියාකාරව ඖෂධ නියම නොකළහොත්, ඇතැම් බෙහෙත් වර්ග භයානක වියහැකිය, දෙවන කරුණ සමහරවිට වෘත්තීය ඇරඹීමකට පෙර වෛද්‍යවරයකු දෙන ප්‍රතිඥාවයි. තුන්වන සහ හතරවන කරුණු කොන්දේසියි, ඒ වෛද්‍යවරයා රෝගියෙකුට, එසේ කිරීමට ඉල්ලීමක් කළත්, කිසිම විටකවත් රෝගියෙකුට හානියක් නොකළ යුතුයි. තුන්වන කරුණෙන් උපදෙස් දෙන්නේ රෝගියා කෙරෙහි කරුණාවන්ත ආකල්පයක් වෛද්‍යයවරයා තුළ තිබිය යුතු බවත්, ඔවුන්ගේ සුභසිද්ධිය තමාගේ පෞද්ගලික ලාභවලට වඩා ඉහළින් තැබිය යුතු බවත්ය. හතරවන

කරුණ නම්, සමහරවිට වෛද්‍යවරයාට මිනිස් සිරුරේ පිළිකුල උපදවන අංගයන් සමඟ ගනුදෙනු කරන්නට සිදුවන බව මතක් කරයි. වෛද්‍යවරයා මේ කටයුතු කළයුත්තේ ඇලීමකින් තොරවයි. ඒ තමාගේම මානසික තුලනය සහ රෝගියා අපහසුතාවයන්ට පත් නොකිරීමට සහ අවමන් නොකිරීමටයි. පස්වන සහ අවසාන කොන්දේසිය නම් ආධ්‍යාත්මික උපදේශනය සහ සහනය සැලසීම ලෙස, සුවකිරීමේ භූමිකාව ඉෂ්ට කිරීම යන කරුණත් හඳුනාගැනීමයි. වෛද්‍යවරයාට මෙම ක්ෂේත්‍රයේ අඩුම තරමේ කුමන හෝ හැකියාවක් තිබිය යුතුයි.

බුදුපියාණන් වහන්සේ රෝගීන්ට කරුණාවන්ත වීම පමණක්ම දේශනා කළේ නැත. බොහෝ අවස්ථාවල උන්වහන්සේ ම නියමාකාරව ඒ ක්‍රියාවෙහි නියුතු වූහ. මේ අතර ඉතා ජනප්‍රිය සිද්ධිය වූයේ උන්වහන්සේ සහ ආනන්ද ස්වාමීන් වහන්සේ, අනෙක් ස්වාමීන් වහන්සේලා විසින් නොසලකා හරින ලද සහ තමාගේම අසූචි මත වැතිර සිටි එක් භික්ෂුවකට සහනය සැලසූහ; එය සිතීමට තරම් අප්‍රසන්න සහ අවමන් සහිත තත්ත්වයකි. උන්වහන්සේ ගැන සොයාබලා, බුදුපියාණන් වහන්සේ අනෙක් ස්වාමීන් වහන්සේලා කැඳවා, රිද්මයානුකූලව, නමුත් ස්ථිර වචනයෙන් තමන්ගේම සමකාලීනයකුට නොසැලකීම පිළිබඳව චෝදනා කළහ. "ඔබ මට උපකාර කරන්නේ නම්, රෝගීන්ට උපකාර කරන්න" මෙම අනුශාසනාවට හේතු වූ ඉන්දියාවේ සහ බුද්ධාගම පැතුරුණ සියලු රටවල බුදුපියාණන් වහන්සේගේ මෙම උදාහරණය වෛද්‍ය සත්කාරය දියුණු වීමට කෙතරම් බලපෑවේ ද කියා අපි නොදනිමු. නමුත් ඒවා බොහෝ කාලයක් මතකයේ තිබූ බවත් බොහෝවිට උපුටා දක්වා ඇති බවත් අපි දනිමු. තවමත් චීනයේ ජනප්‍රිය වැදගත් මහායාන කෘතියක් වූ බ්‍රහ්මජාල සූත්‍රය (ක්‍රි. පූ. තුන්වන ශතවර්ෂයේ) එයම ප්‍රකාශකර ඇත. "බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයකු රෝගී පුද්ගලයකු දුටුවහොත්, ඔහු බුදුපියාණන් වහන්සේට පූජාවක් කරනවා මෙන්ම, එම පුද්ගලයාට අවශ්‍ය දේ සැපයිය යුතුය." බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වීමෙන් වර්ෂ 1700 කට පසු 12 වන ශතවර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද සද්ධම්මෝපායන ග්‍රන්ථයේ ශ්‍රී ලාංකික කතුවරයා මෙසේ සඳහන් කළේය: "රෝගීන්ට සාත්තු සේවය ලබාදීම බුදුපියාණන් වහන්සේ අගය කළ සේක. උන්වහන්සේ එසේ කිරීම පුදුමයක් ද? අනුන්ගේ සුභසිද්ධිය තමාගේම සුභසිද්ධියක් ලෙස දකින මහා ප්‍රාඥයකු පරිත්‍යාගශීලියකු ලෙස ක්‍රියාකිරීම පුදුමයක් නොවේ. රෝගීන්ට උපස්ථාන කිරීම බුදුපියාණන් වහන්සේ අගය කර ඇත්තේ මේ නිසාය. මහා ගුණ යහපත්කම පුරුදු කරන පුද්ගලයකු තුළ අනෙක් අය කෙරෙහි ආදර කැක්කුමක් තිබිය යුතුයි." නමුත්, නොසලකා හරින ලද රෝගී භික්ෂුවගේ අවශ්‍යතා සැපයීමට අමතරව, බුදුපියාණන් වහන්සේ රෝගී සහ දුක්විඳින

රෝගීන්ගේ සුවදුක් විමසා "අනුකම්පාවෙන් යුතුව" අනුශාසනා සිදුකිරීම පිළිබඳව තොරතුරු අඩුම ගණනේ හය වතාවකදී පමණ අවස්ථාවන්හි ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒ සැම අවස්ථාවකම රෝගීන් එම රෝගයෙන් වඩා යහපත් තත්ත්වයට සුවපත්වී ඇත.

සෞඛ්‍යය යථා තත්ත්වයට ගැනීමට වෛද්‍යවරුන්ගේ මැදිහත්වීම ඉතා වැදගත් බව බුදුපියාණන් වහන්සේ දැනසිටි අතර, රෝගියාගේ ආකල්පයට ද කාර්යභාරයක් ඇත. බුදුපියාණන් වහන්සේට මේ පිළිබඳව කියන්නට දෙයක් තිබුණි. අංගුත්තර නිකායේ උන්වහන්සේ මෙසේ පවසා ඇතː "පස් ආකාරයක ගුණාංග තමා සතුව තිබීමෙන්, රෝගී පුද්ගලයකුට තමාටම මහත් උපකාරයක් විය හැකිය. ඒ පහ කුමක් ද? කුමන බෙහෙත් තමාට හොඳ ද කියා ඔහු දනී; ඔහුගේ ප්‍රතිකාරයේ නිවැරදි මාත්‍ර ඔහු දනී; නියම කරන ලද ආකාරයටම ඔහු බෙහෙත් ගනී; තමාට කරුණාවෙන් සාත්තු සේවාව ලබාදෙන්නාට ඔහු තමාගේ රෝගය විස්තර කරයි. "එය මෙසේ ඇති වෙයි, එය මෙසේ නැතිවෙයි, නැවත, එය තිබෙන විට එය මේ වගෙයි." එසේම ඔහු රෝගයෙන් ඇතිවෙන විවිධ වේදනා විඳදරා ගනියි. මෙය ප්‍රායෝගික, නිරවුල්, ප්‍රායෝගික බුද්ධියෙන් යුතු උපදෙසකි.

රෝගී බව සහ ආගම යන දෙක සම්බන්ධව පවසන විට, සුවකිරීම බොහෝවිට හාස්කම් සමඟ සම්බන්ධ කරනු ලැබේ. ස්වාභාවිකත්වය ඉක්මවූ අධිප්‍රමාණ උපක්‍රම මාර්ගයෙන් වෛද්‍ය ක්‍රමයෙන් පීඩා සුවකරන්නට හැකිවීම පිළිබඳව බොහෝ උසස් ආගමික නායකයන් කීර්තියට පත්වී තිබේ. එලෙස කියනදේ සත්‍යදැයි පරීක්ෂා කිරීම දුෂ්කරය. නිත්‍ය වශයෙන්ම නූතන ලෙඩ සුවකරන්නන් පිළිබඳව කියා සිටීම් සහ ඒ පිළිබඳ ඇදහිලි බොහෝවිට වංචනික ඒවා බවට ඔප්පුවී ඇත. වර්තමානයේ ඇමරිකාවේ ඊනියා මාධ්‍ය තුළින් ක්‍රිස්තියානි ධර්මය ප්‍රවර්ධනය කරමින් මුදල් එකතුකරන ක්‍රිස්තියානි පූජකවරුන් මෙයට හොඳම උදාහරණයකි. එසේම පසුගිය දශක තුළ ඇදහිලි සුව කිරීම් පිළිබඳව සැලකිලිමත්ව කරන ලද විද්‍යාත්මක අධ්‍යයනයකින් මෙතෙක් ඒවායේ වලංගු සාක්ෂි සමහර ඒවා, ඉතා කුඩා ප්‍රමාණයක් ඉදිරිපත්වී තිබේ. කරුණු කෙසේ වුවත්, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් හාස්කම් යොදමින් ලෙඩරෝග සුවකිරීම් හෝ එසේ කළ බවට ත්‍රිපිටකයේ සඳහන්වී නැත. බුදුපියාණන් වහන්සේගේ හේතුන් සහ ලෙඩරෝග සුවකිරීම් පිළිබඳ අවබෝධය සහ උන්වහන්සේගේ ධර්මයේ ද සාමාන්‍ය ස්වභාවය ගැන යම් දෙයක් කියැවේ.

# 13.බැටළු හම පොරවාගත් වෘකයන්ගෙන් ප්‍රවේසම් වෙන්න!

"බැටළු හම පොරවාගත් වෘකයන්ගෙන් ප්‍රවේසම් වෙන්න!" යන අනතුරු ඇඟවීම සිත්ගන්නාසුලු සහ හොඳින් දන්නා එකකි. නමුත් එය එන්නේ කොහෙන් ද? සාමාන්‍යයෙන් සිතන්නේ එහි මූලාරම්භය බයිබලයේ සඳහන් එකක් ලෙසයි; ඉංග්‍රීසි බසින් වැකි කඩ නිසැකවම සපයයි. ජේම්ස් රජුගේ පිටපතේ මැතිව්ගේ කිතුනු දහම මෙසේ සඳහන් කරයිඃ "බැටළු හම පොරවාගත් ව්‍යාජ අනාගතය හෙළිකරන්නන්ගෙන් ප්‍රවේසම් වන්න, ඔවුහු රහසින් කොල්ලකන වෘකයෝය." නමුත් අපි තවදුරටත් ඉදිරියට ගියොත් අඩුගණනින් නව ගිවිසුම් ප්‍රඥප්තියට වර්ෂ 500කටත් ප්‍රථමව, ග්‍රීක ජාතික ඊසොප් නමැති කථාන්දර කියන්නාගේ බොරු වෙස්ගත් වෘකයකු, හොර වංචාවෙන් පැහැරගැනීමක් සිදුකිරීම පිළිබඳව මිථ්‍යා කථාවලින් හොඳින්ම දන්නා පිටපත, ජෝර්ජ් ටවුන්සෙන්ඩ් විසින් 1867 දී ප්‍රකාශිත පරිවර්තනයයි. ටවුන්සෙන්ඩ්, බැටළු හම පොරවාගත් වෘකයා මිථ්‍යා කථාව මෙසේ විස්තර කරයිඃ "එකමත් එක කාලයක ආහාර වඩාත් පහසුවෙන් ලබාගැනීම සඳහා එක් වෘකයෙක් උගේ පෙනුම වෙස්ගැනීමකින් වෙනස් කරන්නට අධිෂ්ඨාන කළේය. බැටළු සමකින් වසාගෙන, තමාගේ ඇඳුමෙන් ගොපල්ලා රවටමින්, වෘකයා බැටළු රංචුව සමග තණබිමට ගියේය. හැන්දෑවේදී වෘකයා පට්ටිය තුළ සිටියදී ගොපල්ලා දොර වැසුවේය. ගේට්ටුව වසාදැමූ පසු ඉදිරිපස සම්පූර්ණයෙන්ම සුරක්ෂිත විය. නමුත් ගොපල්ලා පසු දිනට අවශ්‍ය මස් ලබා ගැනීම සඳහා රාත්‍රී කාලයේදී එහි පැමිණි කල බැටලුවා වෙනුවට වෘකයා අල්ලාගෙන මොහොතකින් ඌ මරා දැමුවේය. කෙසේ නමුත්, ඊසොප්ගේ කථාව මෙන්ම මේ කාලයේදීම ග්‍රීසියෙනුත්, පලස්තීනයෙනුත් බොහෝ ඈත ප්‍රදේශයේ මේ හා සමාන බැටළුවකු සේ වෙස්වලා ගත් කුරිරු වෘකයකු පිළිබඳ කථාන්දරයක් ප්‍රචලිතව පැවැතියේය. මහාබෝධි ජාතකයේ (528) අපට මෙවන් කවි දෙකක් සොයාගත හැකිය.

එක් කලෙක වෘකයෙක් බැටළු වෙස් ගෙන

ගියේ විශ්වාසයෙන් එළු රැන අතරට

මරමින් බැටළුවන් හා එළුවන්

බිය ගන්වා එවුන් හැම ඌ යන්නට ගියේය.

ඒ හා සමානව වෙස් වලාගත් මහණ බමුණෝ

රවටති ජනයා උපවාසයෙන් බිම වැතිරුමෙන්
කැතකුණුහි ගැලීමෙන් උක්කුටික ව්‍රතයෙන්
හිඟමින්, හුස්ම සිරකොට ගනිමින්,
කියති තමන් සර්වඥ යයි කරමින් අදමිටුකම්

මෙම පිටපතේ සංකල්පයට අනුව, වෘකයකු බැටළුවාගේ හැඩයෙන් (උරබ්හරූපේන) සිටි බව සහ උගේ රැවටිල්ලට හසුවූවන් එළු සහ බැටළු රැළක් බවත් සඳහන් වේ. වෘකයා රැවටීම පිණිස තමාගේ ශරීරය බැටළු සමකින් වසාගත් බව "බොරු වෙස් ගත්" (චාදන) යන වචනයෙන් අඟවයි. ඊසොප්ගේ කථාවේ මෙන් නොව, බයිබලයේ උපමාවට සමාන මෙම ජාතක පැදි වෘකයා ආගමිකව සිදුකරන වංචා සමඟ සමකරයි. බයිබලයට අනුව ඒ අය "ව්‍යාජ - අනාගතය හෙළිකරන්නන්" වන අතර, ජාතක කථාවේ ඒ අය ශුද්ධ බව ඇඟවීමට උග්‍ර තපස භාවිත කරන තවුසෝය.

සිත් ඇදගන්නා අයුරින් ඊසොප්ගේ කථා සහ ජාතක කථාවලට අනුකූල වන, වෙනත් සතකුගේ සමකින් වෙස්වලා ගත් එක්තරා සතකු පිළිබඳව තවත් කථාවක් ඇත. ඊසොප්ගේ මෙම කථාවේ බූරුවෙක් සිංහයකුගේ සමක් දමාගෙන, බූරුවා සිංහයෙකැයි සිතූ අනෙක් සතුන් බියට පත් කරමින් ඌ සතුටු වෙයි. අවසානයේ ඌට නරියකු හමුවූවත් නරියා රැවටීමට නොහැකි වන්නේ, නරියා බූරුවාගේ කඩහඬ හඳුනන නිසාය. සිහචම්ම ජාතකයේ (189) එක් භාණ්ඩ අලෙවි කරන්නෙකුට තමාගේ බූරුවා මත සිංහයකුගේ සම දැමීමේ පුරුද්දක් තිබුණි. ඊට පසු ඔහු බූරුවා වී හෝ බාර්ලි කුඹුරුවල තණ බුදින්නට දමා ගමට ගොස් තමාගේ ව්‍යාපාර කළේය. කුඹුරු බලාගන්නෝ සිංහයා බයකර එළවා දැමීමට බිය වූහ. එක් දිනක බූරුවා බූරු නාදය නංවන විට, කුඹුර මුරකරන්නෝ රැවටීම හඳුනා ගත්හ. ඔවුහු බූරුවාට ගල් මුගුරුවලින් ගසා මැරූහ. කථා දෙකම එක සමාන වේ - ඊසොප්ගේ සහ ජාතකයේ ද ප්‍රධාන චරිතය බූරුවෙකි. (ගද්‍රභ) එසේම ඌ හැඳගත්තේ සිංහයකුගේ සමක් වන අතර, සෙල්ලම නතර වන්නේ කඩහඬ නිසාය. ඊසොප්ගේ කථාවේ බොරු වෙස්ගන්නේ බූරුවා වන අතර, ජාතක කථාවේදී බූරුවා, අයිතිකරුවාගේ කෛරාටික භාවයට ගොදුරු වන අසරණ සතකු බවට පත් වෙයි.

# 14.ජලය, ජලය, සැම තැනම

පරිත්‍යාගය (දාන) හෝ බෙදාහදා ගැනීම (චාග) යන ගුණාංග බෞද්ධ සුචරිත බව හොඳින් දන්නා දෙයකි. ප්‍රධාන වශයෙන්ම දානය දෙන්නේ, ආහාර බව ද හොඳින් තහවුරු වූ පුරුද්දකි. කෙසේ නමුත්, ආහාර හැර වෙනත් දේ පරිත්‍යාග කිරීම සහ සංඝයා හැර වෙනත් අයටත් දන්දීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ බොහෝවිට කථා කළහ. අවධානය ස්වල්ප වශයෙන් ලැබෙන මෙම ත්‍යාගවලින් එකක්, සමහරවිට නැවත ඉස්මතු කළහැකි දෙයක් ලෙස ජලය හැඳින්විය හැකිය. පැරණි කාලයේ ඉන්දියාව වැනි රටක ඕනෑම තැනක ග්‍රීෂ්ම ඍතුව උණුසුම් වූ එක් ගමක සිට තවත් ගමක් අතර දුර දීර්ඝ වන ගමනාගමනය බොහෝ සංචාරකයන් සිදුකළේ පයින්මයි. ජලය ලබාගැනීම හුදෙක් පහසු එකක් නොවන අතර, එය ඉතා වැදගත් කරුණකි. මඟීන් මහපාරේදී ජලය නැතිව සිටින විට, ජනශුන්‍ය ප්‍රදේශවල මිනිසුන් පිපාසයෙන් මියයන බව, නිවසින් බැහැරව සිටින විට බොන්නට ප්‍රමාණවත් ජලය නොමැති විට ඇතිවන අපහසුව පිළිබඳව ඡේද දොළොසක පමණ තොරතුරු ත්‍රිපිටකයේ බෞද්ධ  ග්‍රන්ථවල සඳහන්ව ඇත.

"තාපය නිසා වධවේදනා විඳිමින් වෙහෙසට පත්ව සහ පිපාසයෙන්" යුතු මඟියෙක් පිළිබඳව බුදුපියාණන් වහන්සේ වදාළ විස්තරයක් අංගුත්තර නිකායේ සඳහන් වේ. ඊට පසු ඔහුට මහත් සහනයක් ඇතිකරමින්, "සියලු වර්ගවල ගස්වලින් සෙවණ ලද, සුන්දර විවේක ස්ථානයක් පිරිසිදු මිහිරි ජලය සහිත තටාකයක් වෙත ඔහු පැමිණෙයි. ඔහු එම තටාකයේ කිමිදෙනු ඇත; ස්නානය කරනු ඇත. ජලය බී ඉවතට පැමිණ ඉඳගෙන, පසුව එම ගස් සෙවණේ දිගාවෙයි." අංගුත්තර නිකායේ තවත් සූත්‍රයක උන්වහන්සේ ගමනක් යමින් සිටි මිනිසකුට පිපාසය සෑදී, ජලය නොමැති නිසා ආයාසයෙන් ගවයකුගේ කුර සටහන් ඇති දිය කඩිත්තකින් ජලය බීමට සිදුවූ ආකාරය සඳහන් කරයි. ජලය නොමැති බැවින් ඇතිවෙන වෙනත් ගැටලු පිළිබඳව දැන උන්වහන්සේ මහත් අනුකම්පාවෙන් මේ තත්ත්වය නිවැරදි කිරීමට මාර්ගයක් යෝජනා කළහ; බීමට ජල පහසුකම් නොමැති ප්‍රදේශවල ජලය ලබාදෙන ලෙස ශ්‍රාවකයන් දිරිගැන්වූහ. භික්ෂුවක පන්සලකට හෝ ආශ්‍රමයකට වැඩි විට එහි පදිංචිකරුවන් වෙනත් ආගන්තුක සත්කාරවලට අමතරව, අභිනවයන්ට පාද සෝදා ගැනීමට ජලයත්, පිපාසය සංසිඳවා ගැනීමට ජලයත් ආදී වශයෙන් ලබාදිය යුතු බව විනය පිටකයේ උන්වහන්සේ සඳහන් කර තිබේ. මෙයට අමතරව මහජනතාවට බීමට පහසුකම් සැලසීම ද කළහැකිය. වතුර ටැංකි හෝ කෘතීම ජලාශ (පපා) සහ ළිං හෑරීම (උදාපාන) යහපත් උත්පත්තියකට

හේතුවන බව බුදුපියාණන් වහන්සේ වදාළහ; (S.I.33) උන්වහන්සේ මෙසේ ද වදාළහ: "වල්බිහිවූ ඉඩම්වල ජල ටැංකි ඉදි කළයුතුයි." (S.I.100) බුදුපියාණන් වහන්සේගේ ජාතක විස්තරවල, සත්ත්වයන් ද මෙම සත්කාරවලට ඇතුළත් කිරීමට උන්වහන්සේ අනුශාසනා කළහ. එක් තවුසෙකු දීර්ඝ කාලයක් නියඟයන් පැවති කැලෑවල වෙසෙන ලද සත්ත්වයන්ට ජලය ලබාදීම පිණිස දීර්ඝ දුරක් යෑම සහ උන්වහන්සේගේ කරුණාවට සතුන් කළගුණ දැක්වූ ආකාරය අම්බ ජාතකයෙන් ඉතා අලංකාර ලෙස විස්තර කරයි. භක්තිමත් මිනිසුන් පාර දෙපැත්තේ ළිං අසල සිටිමින් යනඑන මගීන්ට, එහි පැමිණෙන සතුන්ට, බීම සඳහා ජලය පුරවා තැබීම සඳහා විශාල ගල්වලින් සෑදූ ද්‍රෝණිකාවන් තැබූ අයුරු දුභියමක්කට ජාතකයෙන් පෙන්වයි. පෙනෙන ආකාරයට, මෙසේ කිරීම පුණ්‍ය කටයුත්තකි.

සංචාරකයන්ට සහ මඟීන්ට පාරවල්වලදී බීමට ජලය ලබාදීම, දීර්ඝ බෞද්ධ චාරිත්‍රයක් බවට පත්කිරීම සඳහා එවැනි දේශනා ඉවහල්වී ඇත. නගර සහ පුරවල තානායම් ඇතිකිරීමට සහ පාළු පාරවල් අතර ජලය සහිත කළ තැබීමට නාගර්ජුන නමැති දර්ශනවාදියා බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 700කට පසුව ලිවූ "සුහර්ලේඛා" යන මිත්‍රශීලී හසුන තුළින් තමාගේ රාජකීය වාර්තාකරුවා උනන්දු කළේය. ශ්‍රී ලංකාවේ පැරණි රජවරුන් සැබැවින්ම විශාල අමුණු සහ ජල ටැංකි ඉදිකිරීම සම්බන්ධයෙන් ජනප්‍රිය වූ අතර, ඒවා මිනිසුන්ට විශාල යහපතක් උදා කළේය. මූලිකවම ධර්මයට ඇති ඇල්මට වඩා ආර්ථික සහ දේශපාලනමය පෙලඹීම නිසා මෙසේ කටයුතු කර ඇත. නමුත ශ්‍රී ලංකාව, බුරුමය සහ වෙනත් බෞද්ධ රටවල මිනිසුන්, මඟීන්ට සහ මහජනතාවට බීමට ජලය සැපයීම, අසරණ සරණ පරිත්‍යාග ලෙස සිදුකළ බවට සටහන්ව ඇත.

ජනප්‍රිය හෙබර් නමැති බිෂොප්තුමා 1820 දී තමන්ගේ ශ්‍රී ලංකා සංචාරය පිළිබඳව කළ විස්තරයේ මෙසේ සඳහන් වේ: "මම කිසිම තැනක නුදුටු චාරිත්‍ර යක් මෙසේ දුටුවෙමි. එය අපූර්ව කරුණාවන්ත දෙයක් ලෙස අනාවරණය විය. පාර දිගේ එක්තරා දුරකදී විශාල හැඳි සවිකල විශාල වතුර කළ මඟීන්ගේ භාවිතය සඳහා තබා ඇත. මගේ සේවකයන් නිතරම ඉතා කැමැත්තෙන් වතුර උගුරක් ගන්නවා දැක ඇත්තෙමි. ඊට පසු ඔවුන් මගේ දෝලාවේ සහෘදයන් හා එක්වෙයි." මෙම චාරිත්‍ර ය දැන් ශ්‍රී ලංකාවේ එතරම් සාමාන්‍ය නොවේ. සමහරවිට එතරම් අවශ්‍ය නොවිය හැකිය. වර්තමානයේ සෑම තැනකම කුඩා කඩවල වතුර බෝතල් සහ සිසිල් පැන් අලෙවිය සඳහා ඇත. බුරුමයේ මෙම චාරිත්‍රය විශාල ලෙස පැතිර ඇත, ජනප්‍රිය ද වේ. මිත්‍ර කණ්ඩායම් (වයිනයියතුල්බා) ඇතිකර ගනිමින් "ජලය දන්දීමේ සමිති" සාමාන්‍ය දෙයක් වන අතර, අවශ්‍ය තැන්වලදී ජලය දැමීම සඳහා මැටි කළ සහ ජලය පානය

කිරීම සඳහා කෝප්ප සමඟ බොහෝවිට ඔවුන්ගේ කුඩා පැල්පත් පහසුව සඳහා සූදානම් කර ඇත.

ශ්‍රී ලංකාවේ ද සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළුව, වර්තමානයේ ලෝකයේ මිලියන ගණන් මිනිසුන්ට පානය කිරීමට පිරිසිදු ජලය අහිමිවී ඇත. බියපත් කරන තරම් සංඛ්‍යාවක් දූෂණය වූ ජලය පානය කර රෝගී වෙයි, නැතිනම් මියයති. දානමය පුණ්‍යකර්මයෙහි සාම්ප්‍රදායික අරුත ඉක්මවා ගොස්, අවශ්‍ය ජනයාට ජලය පිදීමේ ගුණය යළි සලකා බැලීම බෞද්ධ භක්තිකයන්ට අපූරු දෙයක් නොවනු ඇද්ද? දුප්පත් මිනිසුන්ට ජලය සැපයීම සඳහා ඉතා භක්තිමත් බෞද්ධයන් පරිත්‍යාග කරන්නේ නම්, එය කෙතරම් චමත්කාර ද? දුප්පත් ගමකට ළිඳක් සහ විද්‍යුත් පොම්පයක් පරිත්‍යාග කිරීමට සලකා බැලීම ස්තූපයක් ඉදිකිරීමේ කුසලය මෙන්ම ආනුභාවයක් නොවේ ද? ශ්‍රී ලංකාවේ, "ප්‍රැක්ටිකල් ඇක්ෂන්" නමැති රාජ්‍ය නොවන ආයතනයක් හිරුඑළිය බලයෙන් සරල, ලාභ සහ ඵලදායී වතුර පෙරනයක් නිපදවා ඇති අතර, ඒවා ශ්‍රී ලංකාවේ දැන් බෙදාහරිමින් පවතී. එම ආයතනයේ වෙබ් ලිපිනයේ මෑතකදී වාර්තාවක් සඳහන්වී තිබුණි. "කිරින්ද, අන්දරයායේ, ජයරත්න මහතා 7 දෙනෙකුගෙන් යුතු ඔහුගේ පවුලට බීමට ජලය ලබාගැනීම සඳහා ජල පෙරනයක් සවිකර ඇත. එම පද්ධතිය පිළිබඳව කරන ලද තක්සේරුවකදී ඔහුගේ පවුල දිනකට නැවුම් ජලය ලීටර් 8-10ක් භුක්ති විදිති. ඔහුගේ බිරිඳ මෙසේ කියයි:"කලින් දුර ප්‍රදේශවලින් ජලය රැගෙන ඒමට මම පැය ගණනාවක් ගත කළෙමි. නමුත් දැන් මම මගේ කාලය ගෙදර දොරේ වැඩ සහ ගවයන් බලාගැනීමට ගතකරමි. එයින් පවුලේ ආදායම සෑහෙන ලෙස වැඩිවී ඇත." මෙවැනි ව්‍යාපෘති හෝ ඒ හා සමාන ඒවා සංවිධානය කරන්නේ නම්, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ධර්මය පිළිබඳව කෙතරම් හොඳ හැඟීමක් ඇතිවේ ද? බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ සහ ශතවර්ෂ ගණනාවක් බෞද්ධයන් පුරුදු කළ ජලය ලබාදීම යළි ප්‍රමාණවත් කළයුතුයි; දිරිගැන්විය යුතුයි; නවීකරණය කළයුතුයි.

# 15.විවාහ උත්සව සහ විවාහය පිළිබඳව බුදුපියාණන් වහන්සේ පැවසුවේ මොනවා ද?

බොහෝ සංස්කෘතීන් තුළ අවබෝධ කරගත් පරිදි විවාහය යනු, ආගමික, නෛතික හෝ සමාජීය අධිකාරිය විසින් පිළිගත්, පුද්ගලයන් දෙදෙනකුගේ එක්වීමකි. බොහෝ ආකාරයේ විවාහ තිබේ, සැමවිටම තිබී ඇත. බහුපුරුෂ විවාහ, බහුභාර්යා විවාහ, ඥාති සොහොයුරු සොහොයුරියන් අතර විවාහ, බලහත්කාර විවාහ ද, ඉස්ලාම් ලෝකයේ සමහර කොටස් අතර සිදුවන තාවකාලික විවාහ ද යන ක්‍රම පැවතී ඇත. පැරණි ඊජිප්තුවේ පාරාවන් තමන්ගේ එක් සහෝදරියක හා විවාහවීම ද සාමාන්‍ය දෙයක් විය. බටහිර සමහර රටවල දැන් එකම ලිංගයට අයත් අය හා විවාහවීම සඳහා ද නෛතික හා සමාජමය පිළිගැනීමක් ලැබී ඇත. ගිහි බෞද්ධයන්ට මූලික සදාචාරයන්ගෙන් පිටතට බුද්ධාගමෙන් ලබාදෙන්නේ ස්වල්ප මඟපෙන්වීමක් බව බුදුදහම විවේචනය කරන්නෝ සමහර විට කියති. බුදුපියාණන් වහන්සේ විවාහය පිළිබඳව කියා ඇති විස්තර පරීක්ෂා කර බලන විට, මෙම කියමන කෙතරම් අසතුටුදායක තොරතුරක් ද කියා පෙන්නුම් කරයි.

පළමුවෙනි සහස්‍ර වර්ෂය පැමිණීමට පෙර ඉන්දියාවේ විවාහ චාරිත්‍ර සහ විවාහ උත්සව පිළිබඳව බොහෝ දේ බුදුපියාණන් වහන්සේගේ කාලයේ ප්‍රධාන විධිමත් ආගමක් වූ හින්දු ආගමේ විවිධ නීති පොත් අපට කියයි. තරුණියක ඇයගේ පළමුවෙනි ඔසප්වීමෙන් මාස කිහිපයකින් පසු විවාහකර දෙන්නට සිදුවන අතර, එසේ කිරීමට අපොහොසත් වන පියාට කාලය පසුවීමත් සමඟම බොහෝ චෝදනා අත්විඳින්නට සිදු වේ. විවාහ ඍතුවක් තිබෙන අතර විවාහය සඳහා යථා දිනය සහ වේලාව තීරණය කරනු ලබන්නේ ජ්‍යොතිෂයයි. පවුල් දෙකේ කුලය ඉතා වැදගත් ලෙස සැලකිල්ලට ගනු ලැබුණි. ඉහළම කුල දෙක වූ බ්‍රාහ්මණ සහ රණවිරු කුලය සමහරවිට විවාහයෙන් සම්බන්ධ වූ අතර, එයින් පහත් කුලවල අය සමඟ විවාහ සිදු නොවීය. ශුද්‍ර කුලය හෝ වෙනත් බාහිර කුලවල අය සමඟ විවාහ විශ්වාස කළ නොහැකි විය. බ්‍රාහ්මණ කුලයට අනුව විවාහ අට ආකාරයකින් සිදුවිය. නමුත් එවායින් සමහරක් අතර වෙනස සැමවිටම පැහැදිලි නැත. පළමු පහ තරුණයාගේ හෝ තරුණියගේ කැමැත්තෙන් තොරව දෙමව්පියෝ සූදානම් කළහ. සාමාන්‍යයෙන් ගෙවීමක් හෝ අඩුම තරමින් තෑගි හුවමාරුවක්වත් අවශ්‍ය විය. තරුණයා සහ තරුණිය එකිනෙකාට කැමතිවී විවාහ වීමට දෙමව්පියන්ගෙන් අවසර ඉල්ලූ විට, එයට අවස්ථාව දීම සන්ධර්ව විවාහය යනුවෙන් හැඳින්වීය. විවාහය සඳහා තරුණියක පැහැරගැනීම රක්සස යනුවෙන් හැඳින්වූ අතර, එයට "ඇඬීම සහ කඳුළු, ප්‍රචණ්ඩත්වය සහ විනාශය"

සම්බන්ධ වේ. තවමත් නීත්‍යානුකූල වන නමුත්, අවසාන සහ පහත්ම වර්ගය, පයිසාකා, හෙවත් තරුණිය නිදාගන්නා විට, බීමත්ව සිටින විට, එසේ නැත්නම් සිදුවන්නේ කුමක් ද කියා නොදැන සිටියදී දූෂණය කිරීමෙන් පසු විවාහ වීමයි. මෙම අට ආකාර නිල විවාහ හැර, සැබැවින්ම, තවත් වෙනත් ආකාරයේ විවාහමය සැලසුම් ඇත. වහලියක හෝ සේවිකාවක ක්‍රමයෙන් බිරිඳක වශයෙන් සැලකිය හැකිය, කාන්තාවක පුරුෂයෙකු තමාට මුදල් ගෙවූ නිසා ඔහු හා ජීවත්වීමට කැමැත්ත දිය හැකිය, යුද්ධයෙන් රවටාගත් කාන්තාවක බිරිඳක විය හැකිය. මිනිසකු සහ ගැහැනියක අයිතිය පැවරීමෙන් එක්වී, පසුව එක් පුද්ගලයකුට වෙන්වීමට ඕනෑවූ විට තාවකාලික බිරිඳක (මුහුත්තික හෝ තම්බානික) යනුවෙන් හැඳින්වේ.

රාමායණයට අනුව (ක්‍රි. පූ. එකේ/4 වන ශතවර්ෂය) සැම විවාහ මංගල්‍ය කට පෙර උත්සව තිබී ඇත. එහිදී බ්‍රාහ්මණ පූජකයන්ට තෑගි දීම, පවුල් දෙකේ පෙළපත පරීක්ෂා කිරීම, සහ මනාලයාගේ කොණ්ඩය දෙපැත්ත (කකපක්ස) කපා දැමීම ආදිය ඇතුළත්ය. සමහරවිට මෙය සම්පූර්ණ වගකීමෙන් පිරිමිකම පිළිබිඹු කරන සංඥාවකි. බ්‍රාහ්මණ කුල විවාහ පවත්වන්නේ බ්‍රාහ්මණ පූජකයෙකි. විවිධ ප්‍රදේශවල විවාහ උත්සව සුළු වශයෙන් වෙනස් වුවත්, ඒ සියල්ලම පොදු ලක්ෂණවලින් යුක්ත වේ. තරුණියගේ පියා යුවළගේ අත් අල්ලාගෙන එක්වී ඊට පසු යුවළ පූජනීය ගින්න වටේ පියවර 7ක් යති. ඇතැම් නීති පොත්වලට අනුව ඔවුන්ගේ විවාහයෙන් දවස් තුනක්වත් අඩුතරමින් යුවළ ලිංගික සේවනයෙන් වැළකී සිටිය යුතුය. විවාහ උත්සවය පවත්වන තුරු මේ විවාහ යුවළවල් තමන්ගේ අනාගත සහකරු/සහකාරිය දැකබලාගෙනවත් නැති නිසා, කායික කුලුපගතාවකට පැමිණීමට පෙර අඩුම තරමින් හඳුනාගැනීමට අවස්ථාවක් මෙයින් ලැබේ.

අඩුතරමින් බුදුපියාණන් වහන්සේගේ කාලයේදීවත් පැරණි ඉන්දියාවේ විධිමත් දික්කසාද තිබුණේ නැති බවක් පෙනේ. මිනිසකු තමාගේ බිරිඳ පිළිබඳ තෘප්තියක් නැත්තේ නම් ඔහු හුදෙක් තවත් තැනැත්තියක ලබාගත්තේය. සමහරවිට පළමු බිරිඳ තබාගෙනම හෝ සමහරවිට ඇය අතහැර, බ්‍රාහ්මණ නීති පොතට අනුව පුරුෂයකුට තමාගේ බිරිඳ වඳනම්, විශ්වාසය කඩකර ඇත්නම්, කලහකාරීනම් සහ නිදන්ගත රෝගයකින් පෙළේනම් හෝ යම්කිසි වර්ෂ ගණනාවකදී පුතකු ලබානැත්නම් ඇය ඈත් කළ හැකිය. පෙරකී ලෙස, විවාහයේ මූලික බලාපොරොත්තුව සුජාත දරුවන් සෑදීමයි. බ්‍රාහ්මණ නීති පොතේ විවාහමය ආදරය සහ දයාව කලාතුරකින් පමණක් සඳහන්කර ඇත්තේ ඇයි ද යන්න පුදුමයට කරුණක් නොවේ. පසුකාලීන ශතවර්ෂවලදී බිරිඳ දික්කසාද කිරීමට යම්කිසි අධිකාරියක්, සමාජයක්, ගෝත්‍රයේ ප්‍රධානියාගේ

හෝ රජුගේ අවසරය අවශ්‍ය විය. පක්ෂ දෙකම තමන්ගේ විවාහයෙන් අසතුටින් සිටීනම් අර්ථශාස්ත්‍ර දික්කසාදය ලබාදෙන ලෙස රජුට උපදෙස් දෙයි.

බුදුපියාණන් වහන්සේ ජීවත් වූ ප්‍රදේශය වූ උතුරු ඉන්දියාවේ මිඩ්ල් ලෑන්ඩ්හි සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ කාලයේ කිසිම ආකාරයක බ්‍රාහ්මණ පාලනයක් නොවීය. එසේම අඩුතරමින් තවත් ශතවර්ෂ කීපයක්වත් එසේ නොවෙන්නට ඇත. මනුසස්ත්‍ර, යජ්නවල්කියාසස්ත්‍ර සහ විවිධ ධර්මසාස්ත්‍ර වැනි බ්‍රාහ්මණ සහ හින්දු නීති පොත්වල ඉදිරිපත් කරන්නේ පරමාදර්ශයයි; ඍජු ලෙස බලපාන විද්‍යමාන තත්ත්වය නොවේ, ඔවුන්ගේ නීති සැමවිටම රජයේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක නොවීය. එසේම, බොහෝ ප්‍රජාවන් සහ ප්‍රදේශවලට ආවේණික විවාහ මංගල්‍ය සහ විවාහ චාරිත්‍ර තිබුණි. විවාහ මංගල්‍ය සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් බ්‍රාහ්මණ ඉගැන්වීම් ඒ අය නොසැලකූහ; සමහරවිට ඒවාට විරුද්ධත්වය ද ප්‍රකාශ ඉදිරිපත් කළහ.

බුදුපියාණන් වහන්සේ සහ පළමු බෞද්ධයන් විවාහය පිළිබඳව සිතුවේ කුමක් ද? සහ ඔවුන් ඒවා පැවැත්වූයේ කෙසේද කියා, බුදුපියාණන් වහන්සේගේ ජීවිතය සහ ඉගැන්වීම්වලට සම්බන්ධ පැරණිතම සටහනවූ පාලි ත්‍රිපිටකයෙන් අපට යමක් කියයි. විවාහ උත්සවයට භාවිත කරන සාමාන්‍ය වචන මංගලකිරිය හෝ ආවාහමංගලයයි. තරුණියක තරුණයාගේ නිවසට ගෙනඒමට සූදානම් කිරීම විවාහය ලෙස සඳහන් වේ. එසේම තරුණයා තරුණියගේ නිවසට යෑම විවාහන ලෙස සඳහන් වේ. මේ ආකාර දෙකම සංගීතය සහ නැටුම්වලින් යුක්තය.

දරුවන් විවාහ කරදීම පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන්වී නැත. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ ද කිසිවක් සඳහන්කර නැත. කෙසේ නමුත්, ත්‍රිපිටකයේ සඳහන් සියලුදේ නම්, විවාහවන තරුණියන්ගේ වයස් සීමාව 16-20 ලෙසත්, ඉහත සඳහන් කරුණුවලට බොහෝ සමාන වේ. මනමාලිය සහ මනමාලයා එකම වයස්වල වීම හොඳයයි සිතයි. (තුල්‍යාවාය) විවාහවන වයස සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ සඳහන් කළ එකම දෙයනම්,පිරිමි තමන්ට වඩා හුඟක් වයසින් අඩු කාන්තාවන් හා විවාහවීම නුසුදුසු බවයි. මෙය සුත්ත නිපාතයේ සඳහන් වේ.

මිනිසුන්ට එක් බිරිඳකට වඩා සිටීම පිළිබඳව ත්‍රිපිටකය සඳහන්කර ඇත්තේ ඉඳහිට පමණි. සමහරවිට අධිරාජයන්ට සහ ඉතා පොහොසත් අයට පමණක් එකවිට එක් භාර්යාවකට වැඩියෙන් සිටින්නට ඇත. බුදුපියාණන් වහන්සේ විශේෂ ආකාරයේ විවාහ වෙනුවෙන් කථානොකළත්, උන්වහන්සේ එක විවාහයකට අනුමැතිය පළකළ බව උපකල්පනය කළහැකිය.

උන්වහන්සේගේ පියා, ශුද්ධෝදනට බිරින්දෑවරුන් දෙදෙනෙකු සිටි අතර, කුමාරයෙකු වශයෙන් උන්වහන්සේට බිරින්දෑවරුන් රාශියක් ලබන්නට ඉඩකඩ තිබුණි. නමුත් උන්වහන්සේ එක් බිරිඳක පමණක් තෝරාගත්හ. විවාහය පිළිබඳ දේශනාවකදී බුදුපියාණන් වහන්සේ සාකච්ඡා කළේ එක් විවාහයක් පිළිබඳව පමණි. නැවත වඩා මනාප විවාහ ආකාරය මෙය බවට හඟවමින් උන්වහන්සේ එය පිළිගත්හ. කාන්තාවකට පින නැත්නම් සහායක බිරිඳක (සපත්ති) සමඟ තෘප්තිමත් වන්නට සිදුවන බව සංයුක්ත නිකායේ උන්වහන්සේ සඳහන්කර තිබුණි. කාන්තාවන්ට එකවිට බහුභාර්යා/බහුපුරුෂ සේවනය අවාසිදායක බව ත්‍රිපිටකයේ ඉඳහිට සාකච්ඡාවී ඇත. "උප-භාර්යාවක වීම වේදනාකාරී වේ.""ගැහැනියකට  ඇති ඉතාම නරක, අවාසනාව උප-බිරිඳ සමඟ දබර කිරීමයි." එකම ගෙදර විවිධ බිරින්දෑවරුන් අතර ඇතිවන ආතතිය සහ උපක්‍රමශීලී මෙහෙයුම විස්තර කරන තවත් පැරණි ඉන්දියානු සාහිත්‍යය එවැනි ප්‍රශ්න ස්ථිර කරයි.

විවාහය සඳහා තරුණියන් මිලදී ගැනීමේ සහ විකිණීමේ පුරුද්ද බුදුපියාණන් වහන්සේ විවේචනය කළහ. "අනෙක් අයගේ බිරින්දෑවරුන් සහ දූවරුන් පැහැර ගැනීම සහ තමන් සමඟ ජීවත්වීමට ඔවුන්ට බල කිරීමේ පුරුද්ද අතහැරීම පිළිබඳව උන්වහන්සේ වජ්ජීන්ට පැවසූහ. (D.11.74) ඒ නිසාවෙන් ත්‍රිපිටකයේ ඊට බොහෝ කාලයකට පසුව බොහෝ ග්‍රන්ථවල සඳහන් සහ අනුමැතිය ලද එකම වර්ගයේ විවාහය වන්නේ, ගෙවීමක් නොකර දෙමව්පියන් තම දියණියන් විවාහකරදීම හෝ තරුණයා හෝ තරුණිය තමාගේ සහකරු තෝරාගැනීමයි.

සිද්ධාර්ථ කුමාරයාගේ විවාහය පිළිබඳව ත්‍රිපිටකයේ කිසිවක් සඳහන්වී නොමැති අතර, සැබැවින්ම  ඔහු ඔබමොබ ඇවිදින භික්ෂුවක වීමට පෙර ජීවිතය පිළිබඳව ද සඳහන්වී ඇත්තේ ඉතා ස්වල්පයකි. ඔහු විවාහ වූ බව අප දන්නේ එහි ඔහුගේ බිරිඳ පිළිබඳව සඳහනක් තිබීම නිසාය. නමුත් ඔහුගේ බිරිඳගේ නම සඳහන් නොවේ. පුත්‍ර රාහුල පිළිබඳව සඳහනක් ඇත. (1 වන ශතවර්ෂයේ, ක්‍රි. පූ. / 2 ශතවර්ෂය.) ලලිත විස්තරයෙන් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳව සාහිත්‍යමය විස්තරයක් සපයමින් සිද්ධාර්ථ කුමාරයා තමාගේ මුදුව (අංගුලියක), තරුණිය තෝරාගැනීමෙන් පසුව දුන් බව සඳහන් වේ. පෙනෙන ආකාරයට එකල මුදුවක් මාරුකරගැනීම චාරිත්‍රයක් බවට අඩුගණනේ සමහර ප්‍රජාවන් අතර සිදුවුණි. මෙම පුරුද්ද පිළිබඳව ත්‍රිපිටකයේ කොතැනකවත් සඳහන්වී නැත.

විවාහ මංගල්‍යයට වාසනාවන්ත දිනයක් උපකල්පනය කරමින් ජ්‍යොතිෂය යොදාගැනීමට තෝරාගැනීම, මෝඩ සහ ඵල රහිත දෙයක් ලෙස සලකමින් නක්ඛත්ත ජාතකය උසුළු විසුළු කරයි. පවතින සමාජීය සම්මතයන්වලින් බලපෑම් ලැබ පළමු බෞද්ධයෝ සමහරවිට තමන්ගේ කුලයේම පුද්ගලයන් විවාහකර ගත්හ. නමුත්, මානව සමානතාව පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ආරම්භවීමත් සමඟ කුල බාධක දුර්වලවීමෙන් අඩුතරමින්, බෞද්ධ ප්‍රජාව අතරවත් එය දුර්වල විය. ලලිතවිස්තර, 12 වන පරිච්ඡේදයේ බුදුපියාණන් වහන්සේගේ පියා තමාගේ පුතණුවන්ට ගුණයහපත් තරුණියක නම් අඩු කුලයේ වුවත් ඔහුට ඇ හා විවාහ වියහැකි බව සඳහන් කර තිබේ. "බිරිඳගේ කුලය හෝ පෙළපත් පිළිබඳව ඔහු සැලකිල්ලක් නොදක්වයි. ඔහු පතන්නේ ගුණයහපත් බව පමණි."

විවාහ සම්බන්ධතා සම්බන්ධයෙන් ඇතැම්විට "කැඩීමට" හෝ "වෙන්කිරීමට" යන අදහස දෙන "විවරණ" යන වචනය හැර දික්කසාද යන වචනය ත්‍රිපිටකයේ නැත. යුවළක් ආදරයෙන් බැහැරවූ විට එක් පුද්ගලයෙකු නිවසින් බැහැරවීමක් හෝ නිවසින් පලවාහැරීමක් සිදුවේ. සාමාන්‍යයෙන් මේ තත්ත්වය ඇතිවන්නේ බිරිඳටයි. උග්ග නැමැති බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයාට බ්‍රහ්මචාරී වන්නට උවමනා වූ විට ඔහු තමාගේ බිරින්දෑවරුන් හතරදෙනාටම තවදුරටත් එම නිවසේම සිටිය හැකි බවත්, එසේ නැතිනම් දෙමව්පියන් වෙත යන්නට හෝ තවත් ස්වාමිපුරුෂයකු හා යාහැකි බවත් පැවසුවේය. පෙනීයන ආකාරයට, වැඩිමහල් බිරිඳ තවත් කෙනෙකු පිළිබඳව සිතමින් සිටින නිසා උග්ග කැමැත්තෙන්ම ඇය ඔහුට භාරදුන්නේය. (A.1V.210)

අසම්පූර්ණ කොටස් වශයෙන් ත්‍රිපිටකයේ ආරක්ෂිතව සඳහන්ව තිබෙන්නේ, ඔවුන්ගේ විවාහ උත්සව බ්‍රාහ්මණයන්ගෙන් වෙන්කොට හඳුනාගැනීමට, බ්‍රහ්මණයන්ගේ පූජකයෙකු නිල කටයුතු කරනවා වෙනුවට, ඔවුන්ගේ පවුලේ වැඩිමහල්ලෙකු හෝ වෙනත් පවුලක වැඩිමහල්ලෙකු විවාහය පැවැත්වූ බවයි. උත්සවයේ අත්‍යවශ්‍ය අංගය වන්නේ, මනාලියගේ පියා ඇයගේ අතගෙන මනාලයාගේ අතෙහි තබමින් චාරිත්‍රානුකූලව මල් බඳුනක් හෝ කළයක් (හින්කර හෝ කුණ්ඩි) ඔහුගේ දකුණු අතේ තබාගෙන සිටීමය. ඊට පසු දෙදෙනාගේ අත් උඩින් වතුර වත්කරයි. සංස්කෘතික බසින් මෙම උත්සවය හඳුන්වන්නේ අතදීම (පනිප්‍රදාන) යනුවෙන් වන අතර, විවාහයේ අවසානය මෙයින් සලකුණු කරයි. උත්සවය පවත්වන පුද්ගලයා ඊට පසු අලුත විවාහ වූ දෙපළට ආශිර්වාද කරයි. ජලය අත්වලට වත්කිරීම අදටත් තායි විවාහවලදී අලුත් අංගයක් වන අතර, ඉන්දියාවේ ද ඇතැම් කොටස්වල මේ චාරිත්‍ර සිදුවෙයි. එක් ජාතකයක විවාහ උත්සවවලදී ආශිර්වාද මෙසේ

සිදුවෙයිඃ "ඔබගේ ප්‍රිය බිරිඳ සමග මිතුදම කිසිදිනක හීනයක් නොවේවා!" (අජෙය්‍යම් එස තව හෝතු මෙත්ති හරියාය කක්කන පියාය සද්ධිම් Ja.V1.323)

බෞද්ධ භික්ෂු භික්ෂුණීන්ට, ඔවුන්ට ඇති නීතිරීති අනුව, අතරමැදියකු වීම හෝ මගුල් කපුවෙකු වීම තහනම්ය. කෙසේ නමුත්, ඔවුන්ට විවාහ උත්සවවලට සහභාගි වීමට අවසර ලැබුණි. සැබවින්ම විනය පිටකයේ මහා වග්ගයට අනුව එක් විශේෂ ආශ්‍රම ප්‍රජාවක ආධාරකරුවකු තමාගේ පුතාගේ හෝ දියණියන්ගේ විවාහ උත්සවයට ආරාධනය කළහොත් එම භික්ෂුව එයට ආචාරසම්පන්න වේ. විවාහ උත්සවයකදී භික්ෂුවකට ඇති භූමිකාව කුමක් ද කියා නිශ්චිත නැත. සැබවින්ම ඔවුන්ට භූමිකාවක් තිබිය හැකිය. සමහරවිට ඔවුන්ගේ පැමිණීම සුභදායක ලෙස සැලකිය හැකිය, එසේ නැත්නම් එය කරගෙන යාමට ප්‍රභාවක් එකතුවිය හැකිය. සමහරවිට ඔවුන් ත්‍යාග ලැබීමට බ්‍රාහ්මණයන්ගේ ස්ථානය ගත්තා විය හැකිය. අලුත විවාහවූවන්ට ආශිර්වාද කළා වියහැකිය. අලුත විවාහ වූ මනාලියගේ අපහසුව බුදුපියාණන් වහන්සේ අනුකම්පාවෙන් විස්තර කළහඃ "තරුණ බිරිඳක ඇයගේ ස්වාමියාගේ නිවසට ගෙනයන විට, දහවල් හෝ රාත්‍රියේ ඇයගේ නැන්දම්මා, මාමණ්ඩිය, ඇයගේ ස්වාමියා සහ සේවකයන් හා වහලුන් ඉදිරියේදී පවා මහත් බියක් සහ ලජ්ජාවක් ඇතිවේ."

ඉන්දියානු සාහිත්‍යයේ අඹුසැමියන් අතර ඇති ආදරය සහ ස්නේහය පිළිබඳව පළමු වැදගත් සඳහන ත්‍රිපිටකයේ ඇත. දශක කීපයක් ස්වාමිපුරුෂයකු සහ පියකු ලෙස, කෙටි කාලයකට වුවත්, පෞද්ගලික අත්දැකීමෙන් විවාහය පිළිබඳව බුදුපියාණන් වහන්සේට කථා කළහැකි විය. ස්වාමිපුරුෂයකු බිරිඳට ගෞරව සහ සැලකිය යුතුය, කිසි දිනක හෙළාදැකිය යුතු නැත, ඇයට අවංක විය යුතුය, ඇයට බලය දියයුතුය සහ ඇයට ආර්ථිකව සැලකිය යුතුය. බිරිඳක තමාගේ වැඩ හොඳින් කළයුතුය. සේවකයන් පාලනය කළයුතුය, ස්වාමියාට අවංක වියයුතුය. පවුලේ ආදායම ආරක්ෂා කළයුතුය, එසේම නිපුණ සහ ක්‍රියාශූර වියයුතු යයි බුදුපියාණන් වහන්සේ වදාළහඃ "ධර්මය අනුගමනය කරන යුවළක්, එකිනෙකාට ආදරයෙන් කථා කළයුතුය." (අඤ්ඤමඤ්ඤං පියංවදා) එසේම, "පුද්ගලයකු තමාගේ දරුවන් සහ සහකරු/සහකාරිය රැක බලාගැනීම ඉහළම ආශිර්වාදයයි." (පුත්තදාරස්ස සංගහො...ඒතං මංගලම් උත්තමං) උන්වහන්සේ මෙසේ ද පැවසූහ. "හොඳ බිරිඳක් උත්තරීතර මිතුරියයි." (භාරියා ව පරමා සඛා) එසේම ජාතකයේ සඳහන් වන්නේ විවාහයට ඉතා හොඳ අභිප්‍රායක් ලෙස තමන් සිතන බව අඟවමින් ස්වාමියා සහ බිරිඳ "සතුටු සිතින් එක හදවතකින් සහ සමගියෙන්" (පමෝදමන එකචිත්ත සමග්ගවාසං) ජීවත්විය යුතු බව උන්වහන්සේ වදාළ

බවයි. "සමගියෙන් එකට සිටීම සහ අන්‍යොන්‍ය ආදරයෙන් (සම්පියේන පි සංවාසං සමග්ගත්ථාය සම්පවත්තෙන්ති) සිටිනවා වෙනුවට බ්‍රාහ්මණ පූජකයන් ඔවුන්ගේ බිරින්දෑවරුන් මිලදී ගැනීම බුදුපියාණන් වහන්සේ විවේචනය කළහ. මේ ලෝකයේ ආදරය නොමැතිව එකතුවීම දුකකි." (ලෝකස්මිං හි අප්පියසම්පයෝගෝ වා දුක්ඛා ජාතකයෙන් කියයි.)

බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව, ස්වාමියා සහ බිරිඳ එකිනෙකාට ගැඹුරු ලෙස ආදරය කරත් නම් සහ සමාන කර්ම ඇත්තේ නම් ඔවුන්ට ඊළඟ ජීවිතයේ ද ඔවුන්ගේ සම්බන්ධය යළිත් පිහිටුවිය හැකි බවයි. උන්වහන්සේ තවදුරටත් පැවසුවේ, දෙදෙනෙකු එකිනෙකා කෙරෙහි ඇති ශක්තිමත් සම්බන්ධය, පෙර ආත්මයේ ශක්තිමත් ආදරයක් තිබීම ලෙස පැහැදිලි කළහැකි බවයි. "පෙර ආත්මයක එකට ජීවත්ව, මෙම භවයේදී ආදරයෙන් සිටීම ද සහතිකයෙන්ම ඒ ආදරය ජලයේ පිපෙන නෙළුම් මලක් මෙන්ය." මෙම අදහස මහාවස්තුවේ විස්තර වශයෙන් පැහැදිලි වෙයි. "ආදරය මනසට ඇතුල්වන විට සහ හදවත සතුටුවන විට, බුද්ධිමත් මිනිසකුට සහතික වශයෙන්ම කිවහැක්කේ මේ කාන්තාව මීට පෙර මා සමඟ ජීවත්වී ඇත" යනුවෙනි.

බුදුපියාණන් වහන්සේට ඉතා ළැදි ශ්‍රාවකයන් වූ සහ දශක ගණනාවක් සතුටෙන් විවාහ ජීවිතය ගතකළ නකුලපිතා සහ නකුලමාතා පරමාදර්ශී බෞද්ධ යුවළයි. වරක් නකුලපිතා තම බිරිඳ ඉදිරිපිටදීම බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: "බුදුපියාණන් වහන්ස, නකුලමාතා මගේ නිවසට මා හුදෙක් තරුණයකු ලෙසත් ඇය හුදෙක් තරුණියක ලෙසත් පැමිණි දින සිටම, මා කිසිදිනක සිතුවිල්ලෙන්වත්, ශරීරයෙන්වත් ඇයගේ විශ්වාසය කඩකර නැත. තවත් අවස්ථාවක, දිගුකාලීන අසනීපයකදී වුව ද ඇයගේ ස්වාමියා සැමවිටම උනන්දු කරමින් සහ බියසැක දුරුකරමින් ඇ ඉතා ළැදියාවෙන් ඔහු රැකබලා ගත්තාය. මේ බව දැනගත් විට බුදුපියාණන් වහන්සේ නකුලපිතාට මෙසේ පැවසූහ: ඔබට අනුකම්පාවෙන් සපිරි, ආදරයෙන් සපිරි, ඔබගේ උපදේශකයා සහ ගුරුවරයා (අනුකම්පික, අත්තකාම, ඔවදික, අනුසාසික A.111,295-8) මෙන් නකුලමාතා ලැබීමෙන් ඔබට ලාභයක් ලැබී ඇත. ඔබට විශාල වශයෙන් ලාභයක් ලැබී ඇත." බෞද්ධ යථා දර්ශනය අනුව, සම්බන්ධකම් දරාගැනීම සහ දියුණුවීම සඳහා අවශ්‍ය වන වට්ටෝරුව වනු ඇත්තේ අවංක බව, අන්‍යොන්‍ය ආදරය, අනුකම්පාව සහ එකිනෙකාගේ ආධ්‍යාත්මික උපදේශකයකු සහ ගුරුවරයකු වීම යන ගුණාංගය.

සාර්ථක විවාහයකට විශ්වාසවන්ත භාවය එක් ඉතාම වැදගත් අංගෝපාංගයක් බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්හ. ස්වාමියා බිරිඳගේ

විශ්වාසය කඩ නොකළ යුතුය, එසේම බිරිඳ ස්වාමියාගේ විශ්වාසය කඩ නොකළ යුතුය.

ජාතක කථාවක එක් චරිතයක් මෙසේ කියයිඃ "අප අනෙක් අයගේ බිරින්දෑවරුන් සමඟ සීමාව ඉක්මවා යන්නේ නැහැ. එසේම අපගේ බිරින්දෑවරුන් අපට විරුද්ධව සීමාව ඉක්මවා යන්නේ නැහැ. අප අනෙක් අයගේ සහකරුවන් හා සබඳවන්නේ බ්‍රහ්මචාරීන් වශයෙනි."(මයං ච හරියංනතික්කමාම අමේහ ච හරියා නතික්කමන්ති අඤ්ඤත්‍රහි බ්‍රහ්මචරියං චරාම Ja. V1. 53 )

"පුරුෂයාට අවංක"(එකභත්තකිනි) යනුවෙන් යහපත් භාර්යාවක ධර්ම ග්‍රන්ථ නාමාවලියේ ඇගයීමට ලක්කර ඇත. යහපත් පුරුෂයෙකු, සමාන ලෙස විස්තර කළහැකිය. බෞද්ධ සම්ප්‍රදායයට අනුව ඉතා ළැදි සහ හිතවත් කලත්‍රයා සොත්තිසේන රජුගේ බිරිඳ සම්බූලයි. ඔහු විරූපීවන රෝගයකින් පෙළෙන විට, ඔහුට රජකම අත්හැර වනයට යාමට සිදුවිය. රජුගේ පෙරත්තය නොසලකමින් ඇද සතුටින් ඔහු පිටුවහල් වනවිට ඔහු හා කැටුව ගියාය. ඉවසීමෙන් සහ ආදරයෙන් ඇ ඔහු රැකබලා ගත්තාය. අවසානයේ ඔහු රෝගයෙන් සුවය ලැබුවේය. ඔහු ඇයගේ හිතවත්කම සැකකර ඇය මඟහැරියත්, ඇ ඔහු අත් නොහැරියාය. අවසානයේ ඔහු ඇයගේ හිතවත්කම හඳුනාගෙන ඇය විශ්වාස නොකිරීම පිළිබඳව සමාව ඉල්ලුවේය. දෙදෙනා යළි සමගි වූහ.

විවාහය පිළිබඳ විශ්වාසය සහ ආදරය බොහෝ වෙනත් ජාතක කථාවල ද වැදගත් මාතෘකාවක් විය. එවැනි කථාවක, භාර්යාවකගේ ස්වාමියාට ඇති කැපවීම, එක් දුෂ්ට රජකුගේ කුමන්ත්‍රණයකින් බේරාගැනීමට හැකිවිය. තවත් කථාවක බෝධිසත්වයන් වහන්සේ එක් පුරුෂයකුට, ඔහුගේ කැපවීමෙන් සහ බොහෝ කාලයක් දුක්විඳ භාර්යාවට ලැබීමට සුදුසු ගෞරවය ලබාදෙන මෙන් උපදෙස් දෙයි. විශේෂයෙන් සිත් සසල කරවන එක් කථාවක එක් ස්වාමිපුරුෂයකුගේ සියලු මිත්‍රයන් ඔහු අත්හැර යනවිට, එක් බිහිසුණු, බියකරු අද්භූත සත්වයෙකුගෙන් කරදර වනවිටත්, ඔහුගේ බිරියගේ දිරිය බව, මොහොතකට සසල වන විට ඔහුගේ ආයාචනයෙන් ඇයගේ පැකිළීම නැතිවී, ඇ ඔහු වෙත දිව ගොස් මෙසේ පැවසුවායඃ "අවුරුදු 60ක් මා සමඟ සිටි උතුම් ස්වාමිපුරුෂයාණනි! මම ඔබ හැර දමා නොයමි. ඔබ මට ඉතා සෙනෙහෙවන්ත බව ලෝකයේ හතර දිසාව පවා දනී" තවත් කථාවක, තමා පුරුෂයා වෙනුවෙන් මියයෑමට කැමති වූ බිරිඳක නිසා සිදුවන්නට තිබූ එක්තරා මරණයකින් දෙදෙනාම ගැලවීම පිළිබඳව සඳහන් කරයි. (Ja. 111.184-7)

මහාවංශයේ හෝ චූලවංශයේ විවාහ උත්සව හෝ විවාහ පිළිබඳව කිසිවක් සඳහන්වී නැත. රොබට් නොක්ස්ට මේ විෂයයන් පිළිබඳව කිවහැකි එකම දෙය වූයේ උඩරැටියන් දෑවැදි දුන් බවත්, විවාහ වූයේ තමාගේම කුලය තුළින් බවත්, "තමන්ගේ තෘප්තියට එකඟත්වයට පැමිණෙන්නට පෙර කාන්තාව සහ පුරුෂයන් සාමාන්‍යයෙන් හතර හෝ පස්වතාවක් විවාහ වන" බවත්ය. සහෝදර බහුපුරුෂ සේවනය (කාන්තාවක සහෝදරයන් කිහිපදෙනෙකු ස්වාමිපුරුෂයන් ලෙස තබාගැනීම) සාමාන්‍ය දෙයක් වූ බවත් ඔහු සඳහන් කළේය. දෙදෙනෙකු එකට ජීවත්වීමට තීරණය කළවිට, ඒ දෙදෙනා දෙමව්පියන්ගෙන් අවසර ගෙන වෙන්වූහ. සම්පූර්ණ කටයුත්ත සාපේක්ෂව විධිමත් නොවූ අතර, උත්සව මඟ වශයෙන් හෝ ඇත්තේම නැතිවිය. බුරුමයේ මෑතක් වනතුරුම ඒ සමානම තත්ත්වයක් පැවතුණි. පහතරට චාරිත්‍ර පිළිබඳව 1685 දී ජෝ රිබෙරියෝ ලියමින් මෙසේ පැවසූහ: "තරුණියක තමාගේම කුලයේ පුරුෂයෙකු හා විවාහවීමට පොරොන්දුවක් ඇතිකරගෙන, ඥාතීන් එකගනම්, ඒ අය විශේෂ භෝජන සංග්‍රහයක් පවත්වන අතර, විවාහ ගිවිසි යුවළ විවාහයෙන් එකතුවෙයි. පසුදින පුරුෂයාගේ සහෝදරයෝ ඔහුගේ තැන ගනිති, සහෝදරයන් හත්දෙනෙක් සිටිත්නම් ඈ ඒ සියලු දෙනාගේ බිරියයි. සහෝදරයන් අතර මාරුවෙන් මාරුවට රාත්‍රි ගතකරන අතර, ස්වාමිපුරුෂයාට අනෙක් සහෝදරයන්ට වඩා වැඩි අයිතියක් ඇත. දවල් කාලය තුළ යහන් ගැබ කිසිවෙකු නැතිනම්, ඔහුට අවශ්‍යනම් ඇය සමඟ හුදෙකලා වියහැකිය. ඇයට කිසිවකු ප්‍රතික්ෂේප කළ නොහැකිය. කුමන සහෝදරයා වුව ද, විවාහ පොරොන්දුවට අනුව, කාන්තාව සැමගේ බිරිඳයි."

මේවා හෝ වෙනත් මූලාශ්‍ර විවාහ උත්සවයක් වැනි දෙයක් පිළිබඳව සඳහන් නොකරයි. නූතන සිංහල විවාහ උත්සව (පෝරුව) සැමවිටම "පාරම්පරික" ලෙස හැඳින්වූවත්, සැබවින්ම, ඉතා මෑතදී ඇතිවූවකි. විශේෂ උත්සවයක් පැවැත්වීම පිළිබඳ ක්‍රිස්තියානු අදහස හා සමානව මුලදී මෙය නිර්මාණය කරන්නට ඇත. පෙරකී ලෙස නූතන සිංහල විවාහ උත්සව ආරම්භයට අනුව, මනාලයා සහ මනාලියට පියා විසින් අතපැන් වත්කිරීම වැනි ඉතාම පැරණි බෞද්ධ උත්සවවල අංග තෝරාගන්නට ඇත.

# 16.බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳ ජනප්‍රවාද

නිතරම සඳහන් කරන "බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව මුළුමනින්ම වාගේ ප්‍රකටය. ශාස්ත්‍රීය සහ ජනප්‍රිය ලේඛකයන් යන දෙවර්ගයටම අයත් ලේඛකයන් විසින් පුළුල් ලෙස ඒ පිළිබඳව මත පළකර ඇත. පරම යථාර්ථය පිළිබඳව ප්‍රශ්න ඇසූවිට, වැදගම්මකට නැති කල්පිත මඟහැරීම් සඳහා හෝ භෞතික සන්සිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි අදහන්නකු නිසා හෝ ඔහු පිළිතුරු දෙන්නේ කෙසේ ද කියා නොදන්නා නිසා බව ඇතැම් අය කියා සිටියහ. ඇතැම් අය උන්වහන්සේ දෙවියන් ගැන කිසිත් නොපැවසූ බවත්, ඒ "දෙවියන් වචනවලින් පරිබාහිර" නිසා බවත් පැවසූහ. එක් ලේඛකයෙක් මෙසේ කියයිඃ "බෞද්ධයන් උන්වහන්සේගේ නිශේධනය සඳහා දැක්වූ නිශ්ශබ්දතාව පිළිබඳව, වැරදි අවබෝධයක් ඇති කරගෙන බව" දෙවියන් නැති බව ඇඟවීමට බුදුපියාණන් වහන්සේ මුනිවත රැක්කාහු යයි බෞද්ධයන් වැරදි ලෙස අවබෝධ කරගෙන ඇත. දෙවියන් කොහෙත්ම නැති බව ඔබ තීරණය කළ පසු, ඔබගේ සිත යොමුකරන්නේ කුමන අරමුණට ද? ඔබ කිව්වොත් අරමුණ තමාය කියා, ඔබ සැමවිටම, ඔබ පිළිබඳව උනන්දුවෙන් සිටින්නෙහිය. ඔබ ගැන උනන්දුවක් ඇතිකර ගැනීමෙන් යහපතක් නැත."

සම්මානනීය කතෝලික චින්තක රේමන් පනික්කාර් මෙසේ ලීවේයඃ "බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාවට මූලික හේතුව, මානව විෂය පිළිබඳව ආවේණික සීමාකිරීම් අපගේ දැනීමේ අසම්පූර්ණත්වය තුළවත්, යථාත්ත්වයේ ගුප්ත, අප්‍රකට ස්වභාවය තුළවත් මුල්බැසගෙන නොමැතිවා සේ මට පෙනී යයි. ඒ වෙනුවට මට හැඟෙන්නේ, බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාවට මූලික හේතුව උන්වහන්සේ මූලික සත්‍යයතාවන් නැතැයි යන යථාවේ හරියටම වාසය කිරීමයි."

2500 වසරක බෞද්ධ පාණ්ඩිත්‍යය වැරදි අයුරින් ගත් බවත්, නමුත් අවසානයේදී තමා එය නිවැරදි එල්ලයට ගත් බවත්, බුදුපියාණන් වහන්සේගේ ජීවන දර්ශනය The Creed of Buddha නමැති ග්‍රන්ථය තුළින් එහි කර්තෘ, එඩ්වඩ් හෝම්ස් සඳහන් කරයි. "පාරභෞතික ප්‍රශ්න සාකච්ඡා කරන විට බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව සිටියහ. උන්වහන්සේට කියන්න කාරණා නොතිබුණා නොවේ, නමුත් උන්වහන්සේට එයින් එපිට බොහෝ දේ තිබුණි. උන්වහන්සේ තමන් වහන්සේගේ බලවත් සිතුවිලිවලින් උතුරා යන තරම් යටවී සිටියහ. උන්වහන්සේගේ කාලයේ ගැටලුවලට අනුබල දෙන්නන්

උන්වහන්සේට භාවිත කිරීමට ආරාධනා කළ ප්‍රකාශන මාධ්‍ය, උන්වහන්සේගේ බුද්ධියට සහනයක් වීමට තරම් නොවන, පටු සහ නොවැදගත් ඒවා විය. එය ආධ්‍යාත්මික චිත්තවේග තල මත තිබෙන නිසා එය ආධ්‍යාතමික සිතුවිල්ල මත තිබේ."

පූජක චන්ද්‍රකාන්තන්ට වෙනස් අර්ථ නිරූපණයක් ඇත. "එක් දාර්ශනිකයෙක් වරක් බුදුපියාණන් වහන්සේ බැහැදැක මෙසේ ඇසුවේය: "වචන නැතිව, වචන හෝ කථා නැතිව ඔබ වහන්සේට සත්‍යය කිවහැකි ද?" බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව සිටියහ. සුළු වේලාවකට පසු දාර්ශනිකයා සෙමෙන් නැඟිට, ආකර්ෂණීය ලෙස ආචාර කර බුදුපියාණන් වහන්සේට ස්තුති කළේය. "ඔබගේ මෛත්‍රියෙන්, මම මගේ සියලු මිථ්‍යා විශ්වාස සම්පූර්ණයෙන්ම ඉවත් කරගෙන නිවැරදි මාර්ගයට පැමිණියෙමි. "දාර්ශනිකයා පිටවූ පසු උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක ආනන්ද ස්වාමීන් වහන්සේ මෙසේ ඇසුවේය: "බුදුපියාණන් වහන්ස, මෙම දාර්ශනිකයා පැමිණියේ කුමකට ද?" බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක: "හොඳ අශ්වයෙක් කසයක සෙවණැල්ලටත් දුවයි. "බුදුපියාණන් වහන්සේට නිශ්ශබ්දතාව සත්‍ය වෙතට යන අනිවාර්ය මාර්ගය වශයෙන්, සත්‍යයෙන් වෙන් වූ දෙයක් ලෙස නොපෙනේ. ඒ සත්‍යයට ඇති මාර්ගය ලෙස නිශ්ශබ්දතාවෙහි මේ වන විටත් සත්‍යයේ යථාර්ථය ඇතුළත්වී ඇත. ඒවා එකම යථාර්ථයේ කරුණු දෙකකි. ක්‍රිස්තියානි සම්ප්‍රදායේත් නිශ්ශබ්දතාව දෙවියන්ගේ භාෂාව ලෙස කථාකිරීම පුදුමයක් නොවේ. ක්‍රිස්තියානි භාෂිතයට අනුව බුදුපියාණන් වහන්සේට නිශ්ශබ්දතාව සත්‍යයේ සත්ප්‍රසාද මංගල්‍ය බව අපට කිවහැකිය." චන්ද්‍රකාන්තන් පියතුමා උපුටා දක්වන දෙබස අපට පාලි හෝ සංස්කෘත බෞද්ධ ග්‍රන්ථ කිසිවක දක්නට නැත. එය හුදෙක් ඔහුගේ නිර්මාණයකි. එසේම අපට පෙනෙන ආකාරයට බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳව ඔහුගේ තීරණයට බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දහමේ කිසිසේත් සම්බන්ධතාවක්ද නැත.

විද්වතුන් සහ උගතුන් හැර, ජනප්‍රිය ලේඛකයන් මෙන්ම ඒ හා සමානවම ඕනෑම දෙයක්, නමුත්, බුදුපියාණන් වහන්සේගේ සඳහන් කරනු ලබන නිශ්ශබ්දතාව සම්බන්ධයෙන් නිශ්ශබ්දය. හින්දු ගුරු ශ්‍රී චින්මොයි, බුදුපියාණන් වහන්සේ මෙසේ සඳහන් කළබව කියයි: "සමහරවිට නිශ්ශබ්දතාව හොඳම පිළිතුරයි." නැවත මෙම උපුටාගැනීම ව්‍යාජ එකකි. මීරා නමැති කන්‍යා මව අගයන්නියක වූ පන්ජාබ් ජාතික කිවිඳිය අම්‍රිටා ප්‍රීටම් සහ ඕෂෝ නමැති ඉන්දියානු මතවාදියා මෙසේ ලියා ඇත: "මීරාගේ නැටුම් සහ බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව එක්වූ විට, ඕෂෝගේ සැබෑ දර්ශන විද්‍යාව විකසිත වේ." නැගෙනහිර දර්ශන විද්‍යාව Philosophy of the East

නමැති ග්‍රන්ථයේ කර්තෘ ඇලන් ස්මිත් මෙසේ ලියයි: "බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දතාව දර්ශන විද්‍යාවකට ඔසවා තැබූහ. එය උන්වහන්සේගේ ඉගැන්වීමේ හොඳම සාරයයි. ශ්‍රී රවි ශංකර් නමැති ජනප්‍රිය හින්දු ගරුවරයා - රිෂිමුක් සඟරාවේ මෑත කලාපයක මෙසේ සඳහන්කර තිබුණි: "බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු කෙතරම් කාලයක් නිශ්ශබ්දව සිටියහ දැයි කිවහොත්, දෙවිවරු බියවී යම් දෙයක් කියන ලෙස උන්වහන්සේට ආයාචනා කළ බව සඳහන් වේ." ශංකර්ට අනුව, බුදුපියාණන් වහන්සේ එවිට මෙසේ සඳහන් කර ඇත: "දන්නා අය, මා නොකීවත් දනිති. දන්නේ නැති අය මගේ වචනයෙන් ද දැන නොගනිති. අන්ධ මිනිසකුට ආලෝකය පිළිබඳව විස්තරයකින් ඵලක් නැත. ජීවිත පැවැත්මේදී අමෘතය රස නොබැලූ අයකුට ඒ පිළිබඳව කථාකිරීමෙන් වැඩක් නැත. ඒ නිසා මම නිශ්ශබ්ද වෙමි." ඉතාම සමීප දෙයක්, ඉතාම පෞද්ගලික දෙයක් ඔබ කෙසේ ප්‍රකාශ කරන්නෙහි ද? බුදුන් වහන්සේ ඉගැන්වූ සහ කළ කී දෑ පිළිබඳව ලියූ බොහෝ රචකයන් මෙන්, ශංකර් විසින් බෞද්ධ පෙළපොත්වල හෝ බෞද්ධ සම්ප්‍රදාය තුළ පදනමක් සොයා ගත නොහැකි වචන සිද්ධීන් නිර්මාණය කර ඇත.

මේවා සහ වෙනත්, විවිධ "පරස්පර විරෝධී" අර්ථකථන හෝ "දුරවබෝධ" පවත්වා ගැනීමෙන් අඟවන්නේ, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමේ විලාසය සහ තමන් අවබෝධ කරගත් සත්‍යය සන්නිවේදනය කළ ප්‍රධාන මාර්ග ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට නිශ්ශබ්දතාව ප්‍රධාන අංගයක් වන බවයි. යථාර්ථය ඉතා වෙනස්ය. අද්භූත හෝ වෙනස් ලෙසකින් ප්‍රශ්නවලට ප්‍රතිචාර නොවූවත්, සමාජ සන්දර්භය තුළ නිතර සිදුවෙන, නමුත් වැදගම්මකට නැති, අතොරක් නැති දෙඩවිල්ලට විකල්පයක් ලෙස බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව වෙනුවෙන් කථාකරන්නෙකි. (M.I. 161) උන්වහන්සේ එසේම තරහ සහ ප්‍රකෝපය ඉදිරියේ නිශ්ශබ්දතාව උනන්දු කළහ. (S.I.162) ඉඳහිට උන්වහන්සේ මාස බාගයක් පමණ හුදෙකලාවට වැඩිය අතර, ඒ කාලය තුළ කථාවෙන් වැළකුණහ. (S.V.12)

බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳව කියනු ලබන කවදාවත් ඇතිවූ සාකච්ඡා පිළිබඳව සඳහන් වූ අල්ප, මුල් මූලාශ්‍ර අතරින් එකක් වන්නේ ඔබමොබ යන වච්ඡගොත්ත තාපසතුමා සමඟ ඇතිවූ දෙබසයි. මේ පුද්ගලයා බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න මාලාවක් ඇසුවේය. ලෝකය සීමිත ද, අනන්ත ද, දෙකම ද හෝ එකක්වත් නැද්ද, ආත්මය ශරීරයම ද, නැතහොත් වෙනස් ද ආදියයි. මේ සියල්ලටම බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: "මම එම අදහසේ නැත වච්ච" (නකෝ අහං වච්ඡ ඒවංදිට්ඨී) අවසානයේ ඔහු උන්වහන්සේගෙන් මේ කරුණු පිළිබඳව මතයක් නැත්තේ ඇයි ද කියා විමසුවේය. එවැනි ප්‍රශ්න සහ ඒවාට දියහැකි පිළිතුරු "හුදෙක් මත අල්ලා

ගැනීමක්, මත අවුලක්, මත සමඟ දැඟලීමක්" බව බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ. ඒවා අතහැරීමට මඟ නොපෙන්වයි. වෙනස් නොවේ, සන්සුන් බව, නැවැත්වීම, නොකැලඹුණ බව, ඉහළ දැනුම, තේරුම්ගැනීමට හෝ නිර්වාණයට නොවේ." වච්ඡගොත්තගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙනවා වෙනුවට නිශ්ශබ්දව, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේට ඉදිරිපත් කළ ප්‍රශ්නවලට පිළිතුරු නොසැපයීමට හේතු පැහැදිලිව කියා දුන්හ. ඒවා සැබවින්ම වැදගත් කරුණු කෙරෙහි අවධානය ව්‍යාකූල කරන මත පමණක් යැයි උන්වහන්සේ පැවසූ සේක. (M.I. 484-8) මෙම දෙබස බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්ද වීම පිළිබඳව ශක්තිමත් උදාහරණයකි.

ඇත්තටම ත්‍රිපිටකයේ බුද්ධ ග්‍රන්ථවල වෙළුම් 45හිම ප්‍රශ්නයක් ඇසූ විට බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව සිටි අවස්ථා සඳහන්ව ඇත්තේ ස්ථාන දෙකක පමණයි. තවත් අවස්ථාවක වච්ඡගොත්ත ම බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසුවේය: "ආත්මයක් තිබේ ද?" බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්ද වූ සේක. වච්ඡගොත්ත නොනවත්වාම අසුවේය. "එසේනම් ආත්මයක් නැද්ද?" නැවතත් බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර නොදැක්වූහ. සමහරවිට තරහවී හෝ බලාපොරොත්තු කඩවීමෙන් වච්ඡගොත්ත නැගිට, පිටව ගියේය. ආනන්ද ස්වාමීන්වහන්සේ මෙම ප්‍රශ්න නිශ්ශබ්දව දරාගෙන සිටියේ ඇයි ද කියා ඇසූ විට බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: "ආත්මයක් තිබේ ද යන ප්‍රශ්නයට මම 'ඔව්' යයි පිළිතුරු දුන්නෙම් නම් සදාකාලික යයි කියන ගුරුවරුන්ගේ පැත්ත ගැනීමක් සිදුවෙනවා. එසේම මම 'නැත' යයි කීවෙම් නම් මා උච්ඡේදවාදීන්ගේ පැත්ත ගැනීමක් සිදුවෙනවා. මම 'ඔව්' යයි කීවෙම්නම් සියලු දෙයම ආත්මයක් නැතිව යයි යන දැනුම සමඟ අනුරූප වෙනවා නේ ද?" "නැත ස්වාමීනි," ආනන්ද ස්වාමීන්වහන්සේ පිළිතුරු දුන්හ. "එසේම මම නැත, ආත්මයක් නැත ලෙස පිළිතුරු දුන්නානම්, දැනටමත් වික්ෂිප්තවී සිටින වච්ඡගොත්ත ඊටත් වඩා වික්ෂිප්තවී සිතන්නට පුළුවනි." පෙරදී මට ආත්මයක් තිබුණි, දැන් මට නැත" යනුවෙන් (S.IV.400)

මෙම දෙබසේදී බුදුපියාණන් වහන්සේ පැහැදිලිව සහ සරලව තමන් වහන්සේ නිශ්ශබ්දව සිටියේ ඇයිද කියා පැහැදිලි කළහ, උන්වහන්සේට තමන් වහන්සේ කිසියම් විශේෂ දාර්ශනික ආකල්පයකින් හැඳින්වීමට අවශ්‍ය නොවූ අතර, උන්වහන්සේගෙන් ප්‍රශ්න කරන්නා තවදුරටත් අවුල් කිරීමට ද අවශ්‍ය නොවීය. සැමදෙනාම අවසානයේ නිර්වාණයට පත්වේ ද කියා ඇසූ පුද්ගලයා වූ උත්තිය සමඟ ඇති වූ හමුවීමේදී ඔහු විසින් ඇසූ ප්‍රශ්නයට බුදුපියාණන් වහන්සේ දැක්වූ නිශ්ශබ්දතාව අනෙක් එකම උදාහරණයයි. බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දව සිටි අතර, ආනන්ද ස්වාමීන්වහන්සේ ඒ වෙනුවට පිළිතුරු දුන්හ. (A.V. 194) බුදුපියාණන් වහන්සේගේ නිශ්ශබ්දතාව පිළිබඳව

හේතුවක් මේ අවස්ථාවේදී දුන්නේ නැත. නමුත් පෙරදී මෙන්ම උන්වහන්සේ ප්‍රශ්නය අදාළ නොවන බවට සැලකූ සේක.

බුදුපියාණන් වහන්සේගේ කියනු ලබන නිශ්ශබ්දතාව පිළිබඳව තිබෙන සියලු විචිත්‍ර සහ කල්පිත පැහැදිලි කිරීම් මෙම සිද්ධීන් දෙක මත පාදකවී ඇත. බුදුපියාණන් වහන්සේ කියූ බවට හෝ නොකියන්නට තෝරාගත්තා යන්න කීමට නොව, ඊට වඩා ඒවායේ ආරම්භය මුල් මූලාශ්‍ර විමසීමට නොහැකිවීම හෝ වඩාත් සමහරවිට රචකයාගේ විශේෂ මතයට අනුව බුදුපියාණන් වහන්සේ ඇතුල් කරගැනීමට ඇති කැමැත්ත නිසා සිදුවී ඇත.

# 17.බුදුපියාණන් වහන්සේ සැබැවින්ම හින්දු භක්තිකයෙක් ද?

බුද්ධාගම හින්දු ආගමේ ශාඛාවක් හෝ ප්‍රතිසංස්කරණයක් ලෙස ආරම්භ වූ බව බොහෝ විට, ශාස්ත්‍රීය ප්‍රකාශනවලින් ද කියා සිටියි. මෙම ප්‍රකාශය පැහැදිලි කරගෙන ඊට පසු ඔප්පු කළ යුතුය. බුදුපියාණන් වහන්සේගේ කාලයේ බොහෝ ඉන්දියානුවන් සමහරවිට ජීවවාදීන් වූ අතර, පූජක නිලය, ධර්මග්‍රන්ථ, පොදු දේවමෙහෙයට අයත් භාෂාව සහ විවිධ අයුරින් පිහිටුවා ගත් පිළිවෙත් ක්‍රම සමග බ්‍රාහ්මණ ආගම, ප්‍රධාන විධිමත් ආගම විය. එය වේදය මත පදනම් වූ අතර උත්තරීතර දෙවියා බ්‍රහ්ම විය. නැතහොත් සමහර මත අනුව එය ප්‍රජාපති විය, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසු, දැනටත් හඳුන්වන සහ පිළිගත් හින්දු ආගමට බ්‍රාහ්මණ ආගම ක්‍රමයෙන් විකාශනය විය. මෙම ක්‍රියාවලියේ බොහෝ බ්‍රාහ්මණ ධර්ම සහ පුරුදුකිරීම් ඇණහිටීම් ඇතිවීම් හෝ අන්තගාමී වෙනස්වීම් සිදුවිය. ඒ නිසා, බ්‍රාහ්මණ සහ හින්දු ආගම අතර බොහෝ පොදු කරුණු ඇති අතර, පැහැදිලිව ම පෙනෙන වෙනස්කම් ද ඇත. උගත්තු සමහරවිට වේද හින්දු ආගම සහ පුරාණ හින්දු ආගම ලෙස ආගම් දෙක වෙන්කර හඳුන්වති. මෙම තත්ත්වය යුදෙව් ආගම අතර ඇති සම්බන්ධයට සමහර අතින් සමාන වේ. ක්‍රිස්තියානි ආගම යුදෙව් ආගමට වඩා දියුණු වූ අතර, සමහර ගුණාංග තබාගනිමින් බොහෝ නව අදහස් ඇතිකර ගත්තේය. ඒ නිසා ආගම් දෙක අසමාන ආගම් බවට පත්විය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී ආගම් පිළිබඳ විශේෂඥයන් දෙදෙනෙකු වූයේ බ්‍රාහ්මණයන් සහ ශ්‍රමණ හෝ ඔබමොබ යන තවුස් පිරිසකි. බ්‍රාහ්මණයන් බ්‍රාහ්මණ ආගමේ පාරම්පරික පූජකයන් වූ අතර, වේදය අවසාන ආධ්‍යාත්මික බලධරයා ලෙස සලකනු ලැබුණි. අනෙක් අතට සමනාස්/ශ්‍රමණ වේදය සහ බ්‍රාහ්මණික විශ්වාස සහ පුරුදු ප්‍රතික්ෂේප කළ අතර, සමාජීය ධර්ම සහ බලාපොරොත්තු සැලකිල්ලට නොගත්හ. එසේම ලබ්ධි සහ ධර්ම ග්‍රන්ථ පිළිබඳ වෙසෙසි දැනුම සම්බන්ධයෙන් ලැබූ පළපුරුද්දට ප්‍රමුඛත්වයක් දුන්හ. ඔවුහු භාවනාව, අත්තකිලමථානුයෝගය, යෝගී ආශ්වාස ප්‍රශ්වාසය සහ උපවාසය යන ක්‍රමවලින් අත්හදා බැලීම් කළහ. ඔවුහු සාමාන්‍යයෙන් බ්‍රහ්මචාරී, දානයෙන් පමණක් යැපෙන සහ ඔබමොබ යන පුද්ගලයෝ වූහ. සංකේතමය සමණයෙකු "ප්‍රමාණවත් දානයක් පිළිගෙන, ඔහු තමාගේ තටු පමණක් රැගෙන, වෙන කිසිවක් නොමැතිව එහාමෙහා පියාඹන කුරුල්ලෙකු හා සමාන" බව බුදුපියාණන් වහන්සේ වදාළහ.(D.I. 71) සමණයන් සමහරවිට දියේ බැස එගොඩ වන (තිත්ථකර) ලෙස ද හඳුනාගෙන ඇත. එයට හේතුව

ඔවුන් තත්වාරෝපිත පැවැත්ම හෝ භික්ෂුව (භික්ඛු) නමැති අතිශය දැඩිගංගාව තරණය කිරීමට මාර්ගයක් සොයමින් ඒ සඳහා උත්සාහ කරමින් සිටීමයි. එසේම ඔවුහු තමන්ගේ ආහාර ඉල්ලාගනිමින්, හෝ තපසින් ලබාගත්හ. ඒ ඔවුන් බොහෝ වෙහෙසවී සිටීමයි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී අඩුම ගණනේ සමණයන්ගේ සහෝදර සංගම් දොළොසක් හෝ නිකායවල් තිබුණි. නමුත් වැඩිම ආකර්ෂණයක් ලැබුණේ බැඳීම්වලින් තොර පුද්ගලයන් (නිගණ්ඨයන්) ලෙසින් හැඳින්වූ ජෛන භක්තිකයන්ට සහ බුදුපියාණන් වහන්සේගේ කණ්ඩායමටයි. (සංඝ)

බ්‍රාහ්මණ ආගම ඇදහූ අය, විශේෂයෙන්ම බ්‍රාහ්මණ පූජකයන්, සමණයන් (ශ්‍රමණ), ප්‍රතිවාදීන්, මිථ්‍යාලබ්ධිකයන් සහ සමාජයෙන් පිටමන් කරනු ලැබූවන් යන අය සමාන ලෙස සලකනු ලැබූහ. එයට හේතුව ඔවුන් නීති නොසලකා හැරීමයි. බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ භික්ෂූන්, කාලකණ්ණි ශ්‍රමණයන් සහ දාසයන් (සමණක සහ ඉබ්භහ, D.I. 90) ලෙස විවිධ බ්‍රාහ්මණයන් හැඳින්වූ බව ත්‍රිපිටකයේ නිතරම සඳහන් විය. පතන්ජලි (ක්‍රි. පූ.150) ආගම් දෙක අතර තිබූ එදිරිවාදිකම මතුකරමින් සමණක සහ බ්‍රාහ්මණයන් "බළලා සහ මීයා, බල්ලා සහ නරියා, නයා සහ මුගටියා" මෙන්ම ඔවුන් තමන්ගේ ජීවන රටාව සහ ආධ්‍යාත්මිකතාවට ප්‍රවේශවීම යන දෙකටම ස්වභාවයෙන් ප්‍රතිවිරුද්ධ යන අදහසින් ලියා ඇත. ඔහු තවදුරටත් මෙසේ සඳහන්කර ඇත. "දෙපාර්ශ්වය අතර විරුද්ධතාව සදාකාලිකය." (යේසං ච විරෝධා සාස්වතිආබ්, මහාභාෂ්‍ය 11,4,9) බුදුපියාණන් වහන්සේ බොහෝදුරට සමණක සම්ප්‍රදාය තුළ වැඩසිටි අතර, ත්‍රිපිටකය පුරාම උන්වහන්සේ ආමන්ත්‍රණය කර ඇත්තේ "සමණ ගෝතම" යනුවෙනි. උන්වහන්සේ ලෝකය අභිනිෂ්ක්‍රමණය කළවිට වේදය ඉගෙනගැනීමට උන්වහන්සේ බ්‍රාහ්මණ ගුරුවරයෙකු සෙව්වේ නැත. නමුත් ඒ වෙනුවට ගෞරවනීය සමණ ගුරුවරයෙකු වූ, ආලාරකාලාම සහ උද්දක රාමපුත්‍ර වෙත වැඩියහ.(M.I. 63-64)

ආගමික ජීවිතයට බ්‍රාහ්මණික ප්‍රවේශය බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ ආකාරයටම, උන්වහන්සේ එම ධර්මයේ බොහෝ දේ ද ප්‍රතික්ෂේප කළහ. බ්‍රහ්මණ ආගමේ ප්‍රධාන විශේෂ ආගමික චාරිත්‍රය වන්නේ අග්ගි (සංස්කෘත භාෂාවෙන් අග්නි), ගින්දරට අධිපති දෙවියන්, සහ යාග (යාග) කරමින් අග්ගිට සහ වෙනත් දෙවිවරුන්ට පූජාවන් (හුත) සිදුකිරීමයි. වේදයේ වෙනත් කිසිම දෙවිවරයෙකුට වඩා අග්ගි පිළිබඳව සඳහන් කර ඇති අතර, වේදයත්, සම්හිතාස්, ගෘහිය සූත්‍ර සහ බ්‍රාහ්මණයන් නිරවද්‍ය ලෙස මෙම පූජාවන් කළේ කෙසේ ද, ඒවායේ තේරුම සහ ඒවායේ ගුණය සඳහන් කර තිබේ. මෙම පිළිවෙත් ක්‍රම, විශේෂයෙන්ම බිලි පූජා හරහා සත්ත්ව ඝාතනය පිළිබඳව

බුදුපියාණන් වහන්සේ බෙහෙවින් විවේචනය කළහ. සත්පුන් මනසකින් ලැබිය හැකි දෙයකින් දාසයෙන් එකක්වත් බිලි පූජාවකින් ලැබිය නොහැකි බව උන්වහන්සේ වදාළහ. ගින්දරට වන්දනා කිරීම අසාර්ථක දෙයක් ලෙස හැඳින්වූ උන්වහන්සේ "එය අසාර්ථක බව ප්‍රකාශ කිරීමේ මාර්ගයක්" (අපායමුඛාණි) ලෙස බැහැර කළහ. යමෙක් පූජනීය ගින්දරට අවුරුදු 100ක් පුරා පූජා පැවැත්වූයේ නම් හෝ තව කෙනෙක් මනසින් දියුණු වූවකුට ගෞරව කළේනම් හෝ එය අවුරුදු 100ක් පූජා තැබීමට වඩා හොඳයි." (Dhp.107; D.I.9; A.1V.41ff) නැවතත් "ගින්දරට නමස්කාර කිරීම, ස්වයං වන්දි විඳීම, පූජනීය දේව ගීතිකා ගායනා කිරීම, යාගහෝම පැවැත්වීම හෝ ගිනි පූජා පැවැත්වීම යනාදියෙන් අමරණීයත්වය දිනාගත නොහැකිය; එසේ නැත්නම් සැකයෙන් ඔබ්බට නොගිය පුද්ගලයෙකුට පාරිශුද්ධත්වය ලබාගත නොහැකිය." (S.N.249) බුදුපියාණන් වහන්සේ තුන් ආකාර මනසින් හටගන්නා කෙලෙස් තුනක් වන ලෝභය, වෛරය සහ මෝහය (ලෝභ, දෝස සහ මෝහ) සඳහන් කිරීමට තෝරාගත් අතර, ඒවා ගින්දර ලෙස හඳුන්වමින් බ්‍රාහ්මණ ආගමේ තුන් ආකාර පූජනීය ගින්දරට සමගාමී සහ ප්‍රතිවිරෝධී බව ද පෙන්වා දුන්හ. (Vin.1.35) බ්‍රාහ්මණ ආගමින් පුද්ගලයෙකුගේ ජීවිතය මෙම ගින්දරින් මෙහෙයවමින් සහ අවුළුවමින් සිටීමට උපදෙස් දෙන අතර, බුදුපියාණන් වහන්සේ උගන්වන්නේ පුද්ගලයෙකුට මෙම ගින්දර තුන නිරුද්ධ කරමින් නිර්වාණයට පැමිණීමටයි. සම්පූර්ණ නිදහස ලැබීමේ තත්ත්වයට බුදුපියාණන් වහන්සේ බොහෝ නම් දී ඇති අතර, වඩාත් පොදු නාමය නිර්වාණයයි, එහි අදහස "නිවීම" යි. ඒ, දැවෙන මානසික කෙලෙස් නිවා දැමීමයි.

බ්‍රාහ්මණ සමාජ ක්‍රමයේ මුල්ම මුල්ගල වූ කුල ක්‍රමය බුදුපියාණන් වහන්සේ ඉතා දැඩි භාෂිතයෙන් ප්‍රතික්ෂේප කළහ. සැම කෙනෙකුම සුචරිතවත් නම් ඒ අය බ්‍රාහ්මණයකු ලෙස සැලකීම වටිනා බව බුදුපියාණන් වහන්සේ උගන්වා ඇත. වැරදි ලෙස වටහාගත්, බ්‍රාහ්මණ මතය වී ඇත්තේ, බ්‍රාහ්මණයකු වන්නේ බ්‍රාහ්මණ දෙමව්පියන්ට දරුවකු වී ඉපදී අඩු ගණනේ පිළිවෙළට පරම්පරා ගණනක් තුළදී පිරිසිදු ශිෂ්ටසම්පන්න වීමෙන් බවත්ය. (D.I. 113) බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ: "පුද්ගලයෙකු හුදෙක් බ්‍රාහ්මණ මවකගේ දරු ගැබකින් ඉපදීම හෝ මතුවූ පමණින් බ්‍රාහ්මණයකු ලෙස මම නොසලකමි. එවැන්නෙක් හුදෙක් වෛදික ගීතිකා ගායනා කරන්නෙක් වේ." (Dhp.396) ඇත්තටම "විරුද්ධවාදිකම් අතර, මිත්‍රත්වය, ප්‍රචණ්ඩත්වය අතර සාමකාමීත්වය, ඇලීම අතර තෘප්තිමත් වූ කවරකු වුවත් ඒ අය සැබෑ බ්‍රාහ්මණයෙක් යයි මම කියමි.(Dhp. 406)"පුද්ගලයෙකු දේව ගීතිකා ගැයුමත්, බ්‍රාහ්මණයෙකු ලෙස උපන් අය අභ්‍යන්තරය කුණුවී තිබේනම්,

අශෝභන වී ඇත්නම් සහ වංචනික ක්‍රමවලින් ජීවත් වේ නම් ඔහු බ්‍රාහ්මණයෙක් නොවේ. රණවිරු කුලය, සේවා කුලය, රැහැන් හෝ කසළ ශෝධකයකු වූවත් යම් පුද්ගලයෙක් උදයෝගිමත් නම්, අධිෂ්ඨානශීලී සහ සැමවිටම උත්සාහ දරන්නේ නම්, ඔහුට ඉහළම පිරිසිදුබව ලබාගත හැකිය. බ්‍රාහ්මණයිනි, ඔබ මෙය යථාවක් බව දැනගත යුතුයි." (S.I.166) වරක් බුදුපියාණන් වහන්සේ "කුල හතරම පිරිසිදු යයි කියා උගන්වති "යන්න අසා බ්‍රාහ්මණයෙක් උන්වහන්සේ සමඟ වාද කර, එය ප්‍රතික්ෂේප කරන්නට එහි ගියේය. මෙම බ්‍රාහ්මණයා, බ්‍රාහ්මණයකුගේ මුවින් ඉපදුණු නිසා, ඔවුන් පිරිසිදු බව තදින්ම කියා සිටියේය. එවිට බුදුපියාණන් වහන්සේ අනික් අය මෙන්ම ඔබත් මවගේ දරු ගැබෙන් බිහිවූ නිසා එය දකින්නට පුළුවන් සත්‍යයක් බව කියා සිටියහ. (M.11.147ff) බ්‍රාහ්මණයන් නිර්මාණය කර ඇත්තේ දෙවියන්ගේ මුවින්, රණවිරුවන්ගේ බාහුවෙන්, වෙළෙඳුන්ගේ කලව සහ වහලුන්ගේ පාදවලින් යන විශ්වාසය සඳහන්වී ඇත්තේ (රිග් වේදයේ 10,90) ය.

බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූහු, ඕනෑම කුලයකට අයත්, අඩු කුලයේ සහ රැහැනෙන් පැන්නූ අයකුගෙන් පවා ආහාර පිළිගත්හ. ඉහළ කුලවල අයට එවැනි පහත් කුලවල අය අපිරිසිදු සහ රැහැනෙන් පැන්නූ අය, අපවිත්‍ර අය ලෙසත්, දකින්නට පුළුවන. බුදුපියාණන් වහන්සේ අග්ගිකභාරද්වාජ බ්‍රාහ්මණයා වෙත දානය සඳහා ප්‍රවේශවූ විට, ඔහු බුදුන්වහන්සේ වළක්වාලමින්, උන්වහන්සේට අපහාස කළේයඃ "ඔබ හිස මුඩුකරගත්, කාලකණ්ණි භික්ෂුව, ඔබ රැහෙන් පන්නා දැමූ පුද්ගලයෙක්!" (Sn.p. 21) වරක් බුදුපියාණන් වහන්සේ ථූන නමැති බ්‍රාහ්මණ ගමට වැඩිය විට, මිනිස්සු උන්වහන්සේ වඩිනවා දුටුවහ, ඔවුහු තමන්ගේ ළිං තණකොළ සහ වී පොතුවලින් පිරවූහ. ඒ නිසා උන්වහන්සේට ජලය පානය කර ඔවුන්ගේ ජලය අපිරිසිදු කළ නොහැකි විය. (Ud.78) වර්තමානයේ බොහෝ පුද්ගලයන් කුලය යන කරුණ සාධාරණත්වය හෝ සමතාව සම්බන්ධයෙන් සැලකිල්ලට ගනු ලැබේ. නමුත් බ්‍රාහ්මණයන්ට, එය ඊට වඩා වැඩි දෙයකි. එය ඔවුන්ට ඔවුන් පිළිබඳ අදහස්වල අත්තිවාරමයි, සමාජයේ ඔවුන්ගේ කාර්යභාරය සහ දේවත්වයෙන් නිමවූ සමාජ ක්‍රමයක කූටප්‍රාප්තිය වූ ඔවුන් එයට මුක්කු ගැසීමකි.

බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ බ්‍රාහ්මණ ආගමේ වැදගත් පුරුද්දක් නම්, ඔවුන්ගේ සිරිතක් වූ දිය ස්නානය කිරීමයි. ගඟෙන් හෝ පූජනීය ගඟකින් හෝ ඊට වඩා ගමේ ළිඳක හෝ දිය නෑමෙන් පුද්ගලයකු කර ඇති පව් සෝදා නොහැරිය හැකි බව බුදුපියාණන් වහන්සේ තරයේ දරා සිටියහ. (M.I. 39) උන්වහන්සේ දැරූ අදහස වූයේ සැබෑ දූෂණය ඇතිවන්නේ ඍණාත්මක

සිතුවිලි සහ දුරාචාර හැසිරීමෙන් වන අතර, එය "පිරිසිදු" කළහැක්කේ පුද්ගලයකුගේ හදවත සහ ක්‍රියාවන් වෙනස් කිරීමෙන් බවත්ය. මෙය "ඇතුළාන්තය සේදීම" (සිනාටො අන්තරේන සිනාතේන, M.I.39) යනුවෙන් බුදුපියාණන් වහන්සේ හැඳින්වූහ. උන්වහන්සේට අනුව සදාචාරාත්මකව දැඩි සේ හික්මීම සහ ආචාරශීලී පරිශුද්ධියෙන් යුතුව ජීවත්වෙමින් "ජලය නොමැතිව නෑම" කළයුතුයි. (සිනානම් අනෝදකම් S.I. 43)

බ්‍රාහ්මණ ආගම දැඩි ගෘහස්ථ ආගමකි. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී මිනිසුන් ඒ අයට සැමවිටම තිබෙන හේතූන් මත විවාහ වූහ, නමුත්, බ්‍රාහ්මණ ආගම තුළ, එහි ප්‍රධාන ආගමික සිරිත්විරිත් සිදුකිරීමට නොහැකිවීම හෝ අවිවාහක පුද්ගලයකුට සහභාගි වීමට ද නොහැකිවීම සම්බන්ධයෙන් විවාහය අත්‍යවශ්‍ය විය. පූජාවක් පවත්වන බ්‍රාහ්මණයකු විවාහකයකු වියයුතු වන අතර ප්‍රජාවක අනුග්‍රහකයකුගේ බිරිඳ ද එම කටයුත්ත සිදුකරන විට, එහි සිටිය යුතු විය. එසේ නැත්නම්, එම කටයුත්ත අසාර්ථක වේ. සෑම පුද්ගලයකුම තම ජීවිත කාලය තුළ (ආශ්‍රම) පසුකළ යුතු පියවර හතරෙන් විවාහවී සිටීම සහ පවුලක් හදාවඩා ගැනීමත් සැලකිල්ලට ගනු ලැබේ.

සදාකාලිත්වයට එළඹීම සඳහා මිනිසකු පුතකු බිහිකළ යුතුයි. "තමාගේ අලුත ඉපදුණු පුතුගේ මුහුණ දැක මිනිසා තමාගේ ණය ගෙවා සදාකාලීත්වයට එළඹේ. පුතකු ලැබීම නිසා පියෙක් බලවත් අඳුර කපාහරියි. බිරිඳක් මිතුරියෙකි, දුවක් දුක ගෙන එයි, නමුත් පුතෙක් ඉහළම දිව්‍ය ලෝකයේ ආලෝකය වෙයි." "ඔබේ දරුවා නිසා (පුතා) ඔබ නැවත උපදී. ඒ මාරයා ඔබේ සදාකාලිකයි." "පුතකු ලැබ මිනිසෙක් ලෝකයක් ලබාගනී. පුතකු නිසා ඔහු සදාකාලිකත්වය ලබා ගනී. එසේම පුතකුගෙන් ලැබෙන මුනුබුරකු නිසා ඔහු සූර්යයාගේ මුඳුන ලබාගනී." (Aithareya Brahmana ඓතරේය බ්‍රාහ්මණ 7.13; Manusmrti මනුස්මෘති 9,107; Taittiriya Samhita තෛත්තිරීය සංහිතා, 6.3.10,5).මෙම අදහස්වලට පරස්පර වෙමින්, බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහඃ "පුතුන් ඔබ ආරක්ෂා කරන්නේ නැත" සහ "පුතුන් හෝ ගවයන් ලැබීමට සිතින් දැඩිව සිතන්නා මරණය විසින් රැගෙන යනු ඇත." (Dhp. 288; 62; 174, 287)

ජේසුතුමා සහ පළමු ක්‍රිස්තියානි පුද්ගලයාට මෙන්ම බුදුපියාණන් වහන්සේට ද ගෘහස්ථ ජීවිතය ආධ්‍යාත්මික අභිලාෂයන්ට බාධාවක් විය. මෙම කරුණ පිළිබඳව ශාන්ත පාවුළුතුමාගේ වචන අඩුම ගණනේ කොටසක්වත් බුදුපියාණන් වහන්සේ දේශනා කර ඇත. "ඔබ අසහනයෙන් නිදහස් වෙන්නේ නම් මම කැමතියි. අවිවාහක පුද්ගලයකු දෙවියන් සතුටු කිරීමට උත්සාහ කරන නිසා, ඔහු දෙවියන්ගේ වැඩ පිළිබඳව සැලකිලිමත් වේ. නමුත් විවාහක

පුද්ගලයකු ලෞකික කාරණා පිළිබඳව සැලකිල්ලට ගෙන කටයුතු කරන්නේ ඔහුට බිරිඳ සතුටු කිරීමට අවශ්‍ය නිසාය. ඒ නිසා අංශ දෙකකට තල්ලු කෙරේ. මම මෙසේ කියන්නේ මට ඔබට උදව් කිරීමට අවශ්‍යයි. මම ඔබ සීමා කිරීමට උත්සාහ නොදරමි. ඒ වෙනුවට මට අවශ්‍ය වන්නේ, ඔබ හරි දේ සහ සුදුසු දේ කර, ඔබ දෙවියන්ගේ සේවයට කිසිම සීමාවක් නැතිව සම්පූර්ණයෙන්ම ලබා දීමටයි." ( I Corinthians 7.32-35) බුදුපියාණන් වහන්සේ එය මෙසේ දැක්වූහ: "ගෘහස්ථ ජීවිතය හිරකරන සුලුයි, එසේම සිත් නොගන්නා සුලුයි. නිවෙස් අහිමි ජීවිතය මඳ පවන මෙන් නිදහස්ය. ගෘහස්ථ ජීවිතය ගත කිරීම පහසු නැත, සම්පූර්ණයෙන්ම පරිපූර්ණ වූ පැවිදි පූජ්‍ය ජීවිතය හක්ගෙඩියක් මෙන් පිරිසිදුය, විනීතය." (D.I. 63)

ආගමික ජීවිතයක අරමුණ දිව්‍ය ලෝකයට යාම හෝ බ්‍රාහ්මණ ආගමේ සඳහන් කරන පියවරුන්ගේ ලෝකයට (පිතෘලෝක) යාමක් ලෙස බුදුපියාණන් වහන්සේ නොසැලකූහ. දිව්‍යමය තත්ත්වයක් අපායට වඩා හොඳ බව උන්වහන්සේ සැලකූහ. නමුත් නිර්වාණයට පත්වීමට වඩා පැහැදිලිවම පහත් වේ. උන්වහන්සේට අනුව, දිව්‍යලෝක වැනි සියලු තත්වාරෝපිත තත්ත්වයන් අස්ථිර වන අතර, එවැනි ස්ථානවල පුද්ගලයකුට හිමි කාලය නිමාවූ විට, එම පුද්ගලයා මිනිසකු වශයෙන් නැවත උත්පත්තිය ලැබිය හැකිය, එසේම ශාරීරික සත්ත්වයන්ගේ සැම පීඩාවකටම උරුමක්කාරයෙක් වේ. ඒ අනුව, "බුද්ධිමත්හු දිව්‍ය ලෝකයේ විභූතිය පිළිබඳව උනන්දු නොවෙති." (Dhp.187)එසේම සෝවාන් ඵලයට හෝ පත්වීම "දිව්‍ය ලෝකයට යාමට වඩා හොඳයි." (Dhp 178) පහත සඳහන් ආකාරයට, සියලු බල සහිත දිව්‍යමය මැවිලිකරුවකුට බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ තැනක් නැත.

සමහර බ්‍රාහ්මණ පිළිවෙත්වලට බුදුපියාණන් වහන්සේ විරුද්ධවී නැත. නමුත්, හුදෙක් නොසලකා හැර ඇත. එවැනි උදාහරණයක් නම් තුන් ආකාර ණය (ත්‍රිර්න) යන ධර්මයයි. මේ අදහසට අනුව, මිනිසා මෙලොවට බිහිවූ වහාම ඔහු තමා මියයාමට පෙර ගෙවිය යුතු ණය තුනක් අත්විඳියි; ගුරුවරුන්ට ශිෂ්‍යයකු වශයෙන්, දෙවිවරුන්ට පූජා දෙමින් සහ තමාගේ පියාට සහ මුතුන්මිත්තන්ට පුතකු බිහිකිරීම. පුතකු ලැබීම පවුලේ පරම්පරාව පවත්වා ගැනීමට හේතු වේ. මෙය වැදගත් නමුත්, ඊටත් වඩා සදාකාලිත්වය තහවුරු කරයි. (Manusmarti; මනුස්මෘති 9,107 Taittiriya;තෛත්තිරීයSamhita; සංහිතා 6.3.10.5) මෙවැනි දෙයක් ධර්මයේ සඳහන්වී නැත. මෙම ධර්මයට සැබැවින්ම විවාහය අවශ්‍ය වේ, එසේම බ්‍රාහ්මණ ආගම අදහන්නන්ට බුදුපියාණන් වහන්සේගේ විවාහය පිළිබඳ වැදගත් බව අඩුකිරීම, තියුණු ලෙස කම්පා කරවන සුලු විය.

සමහරවිට බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණ පාරිභාෂිතයට සම්පූර්ණයෙන්ම වෙනස් තේරුමක් දෙමින් හෝ බ්‍රාහ්මණ සිරිත් අනුමත කරන්නට ඇත. නමුත් ඒවා සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයට සිදුකළ යුතු බව කියා සිටියහ. උදාහරණ වශයෙන් වේද තුනම මනාව අධ්‍යයනය කළ සහ වෙනත් පූජනීය දැනුම ලබාගත් බ්‍රාහ්මණයකුට ත්‍රිවිධ බහුශ්‍රැත අය (තෙවිජ්ජ) යන උසස් තත්ත්වය දෙනු ලැබුණි. මේ අතර බුදුපියාණන් වහන්සේ වදාළේ භාවනාව තුළින් විවිධ ඇතුළු නුවණ ලබාගත් අයකු සැබෑ ත්‍රිවිධ බහුශ්‍රැතයකු වන බවයි. (A.I.163) බ්‍රාහ්මණික සිරිත්වලට අනුව දවස ආරම්භයේදී දිශාවන්ට නමස්කාර කිරීම, සමහරවිට මූලික හතර, සමහරවිට මේ හතරට අමතරව හිසට විරුද්ධ දිශාවට සහ හිස් මුදුනට, සමහරවිට මේ සියල්ල ඇතුළුව අතරමැදි දිශාවටත් නමස්කාර කිරීම උපකල්පනය කරනු ලබයි. සිගාල නමැති එක් තරුණයකු තමාගේ මෑතදී මියගිය පියාගේ ඉල්ලීමට අනුව තමා දිශා හයටම නමස්කාර කරන බව බුදුපියාණන් වහන්සේට පැවසූ විට, බුදුපියාණන් වහන්සේ වදාළේ උන්වහන්සේත් දිශාවන්ට නමස්කාර කිරීම උගන්වා ඇති බවත්, නමුත් ඒ වෙනත් ආකාරයකට බවත්ය. උන්වහන්සේ පැහැදිලි කළේ එක් එක් දිශාව කෙනෙකු තමා දන්නා පුද්ගලයකු ලෙස සැලකිය යුතු බවය, දෙමව්පියන්, කලත්‍රයා, මිත්‍රයා, ගුරුවරිය, සේවකයා ආදී වශයෙන් සහ ඒ අයට "වැඳිය යුත්තේ" ගෞරවයෙන් සහ කරුණාවෙන් සංග්‍රහ කිරීමෙන් බවයි. (D.111, 180ff) දිශාවලට වඳින විවිධ ක්‍රම සහ හේතු සඳහා උදාහරණ Brhadaranyaka Upanisad බහදාරන්යක උපනිෂදයෙහි 3.7.10, සහ Chandogya Upanisad චාන්දෝග්‍ය උපනිෂදයෙහි 1.3,11; 5.6; 5.20,2 ගෞතම ධර්මසූත්‍රයේ උපදෙස් දී ඇති ආකාරයට සිගාල සමහරවිට උද්දේශීය දෙවිවරුන්ට නමස්කාර කරන්නට ඇත.

මේ අනුව බ්‍රාහ්මණ ආගමේ සෑම සියලු අත්‍යවශ්‍ය ධර්ම සහ පුරුදු විවේචනයට ලක්කරමින්, ප්‍රතික්ෂේප කරමින්, මඟහරිමින් හෝ නව අරුතක් බුදුපියාණන් වහන්සේ එක් කළහ. එසේම, උන්වහන්සේගේ ධර්මයේ ප්‍රධාන මූලධර්ම --- චතුරාර්‍ය සත්‍ය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, පැවැත්මේ තුන් ආකාර ගතිලක්ෂණ, ආත්මයක් නැතැයි යන ධර්මය සහ පටිච්චසමුප්පාදය, වේදයේ හෝ පසුකාලීනව බ්‍රාහ්මණ ග්‍රන්ථවල නැත. කිසිම වේදයක් කර්මය හෝ පුනරුත්පත්තිය සඳහන් නොකරයි. ඒවා බුද්ධාගමේ පරම මූලික සංකල්ප වුව ද පසුකාලීනව ඒවා හින්දු ආගමට අන්තර්ගත කර ගත්තේය. සැබැවින්ම මේවා සහ බුදුපියාණන් වහන්සේ අවබෝධ කරගත් වෙනත් සත්‍යයන් "මීට ප්‍රථමයෙන් අසා නැති බව" බුදුපියාණන් වහන්සේ පැහැදිලිව ප්‍රකාශ කළහ. (පුබ්බේ අනනුස්සුතේසු, S.V. 422)

පෙර කී ලෙස, පවතින ආගම්වලට ආදේශකයක් වශයෙන් තමන් වහන්සේගේ ධර්මය ඉදිරිපත් කළ සේක. එසේම බ්‍රාහ්මණ පූජකවරු සියලුදෙනාමත් ඒ පිළිබඳව දැන සිටියහ. බුදුපියාණන්ට සහ උන්වහන්සේගේ ධර්මයට විරුද්ධව, බ්‍රාහ්මණයන්ගේ සතුරුකම් පිළිබඳව ත්‍රිපිටකයේ බොහෝ දේ උදාහරණ වශයෙන් සඳහන්ව තිබීම පුදුමයක් නොවේ. ඔවුහු බෞද්ධ භික්ෂූහු බ්‍රාහ්මණ පාදයෙන් නිර්මාණය වූහයි කියන පරිදි රැහැනෙන් පලවා හරිනලද අය ලෙසට සම කරමින් "අපගේ නෑයන්ගේ පාද හූරන හොරිකඩයන්" (බන්ධුපාදපක්කා) කියමින් අවඥා කළහ. (D.I. 90) වරක් බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් ලෙසට පත්වූ බ්‍රාහ්මණයෝ, තමන්ගේ මිත්‍ර බ්‍රාහ්මණයන් දැන් "අපට අපහාස සහ පරිභව කරනවා. ඒ අය ඔවුන්ගේ පරිභව ප්‍රවාහය නවත්වා ගන්නේ නැහැ" යි පැවසූහ. (D.111,80) තමන්ගේ ගෝත්‍රයේ සාමාජිකයකු බුද්ධාගම වැලඳගත් බව දැනගත් අක්කෝසක බ්‍රාහ්මණයා බුදුපියාණන් වහන්සේ වෙත ගොස් උන්වහන්සේට පරිභව කරමින් දැඩි අශෝභන වචනවලින් බණින්නට විය. (S.I.161-162)

විවිධාකාරවූ භාවනා ක්‍රම පසුකාලීනව හින්දු ආධ්‍යාත්මිකත්වයේ කොටසක් බවට පත් වුව ද, එවැනි ආධ්‍යාත්මිකයන් බ්‍රාහ්මණ ධර්මයේ නොමැත. බුදුදහමේ මෙම පැතිකඩ බමුණෝ පරිහාසයටත්, හෙළා දැකීමටත් ලක් කළහ. එළිපත්තක් මත, කුණු ගොඩක් මත, නැතහොත් කාණුවක් මත සිටින බළලකු අවධානයෙන් සිටින්නා සේ ද, අවලෝකනය කරන්නා සේ ද, කල්පනා කරන්නා සේද මේ තවුසෝ භාවනා කරති. මේ තවුසෝ "අප භාවනා කරනවා, අප භාවනා කරන්නෝ!" යයි කියා සිටිති. ඔවුන්ගේ පහතට එල්ලා වැටුණු උරහිස, ඔවුන්ගේ හිස් පහතට එල්ලා වැටී, නොණ්ඩි ගසමින් ඔවුන් භාවනා කරනවා." (M.I.334) බුදුපියාණන් වහන්සේගේ ඇතැම් ශ්‍රාවකයන් සැමවිටම එවැනි දෝෂාරෝපණ පිළිගැනීමට සූදානම් වූයේ නැත. වරක් බ්‍රාහ්මණ ශිෂ්‍ය පිරිසකට කච්චාන නමැති ජ්‍යෙෂ්ට භික්ෂුවක වනයේදී අහම්බෙන් හමුවුණු අතර, ඔහු හා අනෙක් භික්ෂූන්ට ගෞරව කරන්නේ නූගත් දාසයන් (භාරතක) පමණක් බවත් කියමින් රහසින් පහර දුන්හ. මෙම අපහාසය නොසැලකිය යුතු නොවන බව තීරණය කරමින් කච්චාන මෙසේ පිළිතුරු දුන්නේය: "අහංකාරකමින් ඉදිමුණු ... ඉර උදාවේදී ස්නානය කරන, තුන් වේදය ගායනා කරන, මන්තර සජ්ඣායනය, නීති, බාර-භාර, ස්වයං වන්දි ... කුහකකම, වංක සේවකයන් සහ සාමාන්‍යයෙන් අනුගමනය කරන සෝදා පිරිසිදුවීමේ පිළිවෙත් ක්‍රම, මේවා බ්‍රාහ්මණයන්ගේ සලකුණුයි. නමුත් බ්‍රාහ්මණයකු වීමට අවශ්‍යවන්නේ නාභිගත මනසකින්, පැහැදිලි සහ

පලුදුවලින් නිදහස්, සියලු සත්ත්වයන් කෙරෙහි මෘදුව සිටීමයි." (S.I.1V. 117-18)

බ්‍රාහ්මණ ආගම, හින්දු ආගම කෙරෙහි මෙන්ම, බුද්ධාගම කෙරෙහිද තිබූ එදිරිවාදිකම් සහ විවේචන ශතවර්ෂ ගණනාවක් නොකඩවා පැවතුණි. මෛත්‍රී උපනිෂද් මෙසේ කියයිඃ "වේදයන්ගේ සත්‍ය නොවූ තර්ක, සැසඳීම් සහ අනුවර්තීවාදවලින් යුතු වංචාව විශ්වාස කරන්නන්ගෙන් ඈත්වීමට කැමති අය සිටිති... ආත්මයක් නැතැයි කියන (නෛරත්මාවාද) ධර්මයෙන් ලෝකය වික්ෂිපිත වී ඇත. මිථ්‍යා සැසඳීම් සහ සාක්ෂිවලින් වේදයන්ගේ ප්‍රඥාව සහ වෙනත් දැනුම අතර වෙනස ප්‍රත්‍යක්ෂ නොකරයි. වේදය වෙනුවට ධර්මය කෙරෙහි අවධානය යොමුකළ යුතු බව සමහර අය පවසනවා. නමුත් සත්‍යය වේදයයි. බුද්ධිමතුන් තමන්ගේ ජීවිත, වේදය මත පාදක කරගත යුතුයි. බ්‍රාහ්මණයකු වේදයේ තිබෙන දේ පමණක් අධ්‍යයනය කළ යුතුයි." මෙය නිසැකයෙන්ම බුද්ධ ධර්මයේ ආත්මයක් නැතැයි (අනත්ත) යන කියමන වේදය පිළිබඳ විශ්වාසය ප්‍රතික්ෂේප කිරීම සහ බෞද්ධයන් තමන්ගේ අදහස්වලට පක්ෂව ඉදිරිපත් කරන සහේතුක විතර්ක පිළිබඳ විවේචනයකි. ශංකරාචාරිය, වේදන්ත සූත්‍රය පිළිබඳව විවරණයක් කරමින් මෙසේ සඳහන් කළේයඃ "තමන්ගේ සතුට සඳහා සැලකිල්ලක් දක්වන සියලුම දෙනා බුදුපියාණන් වහන්සේගේ ධර්මය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුයි." බුද්ධාගම සමඟ එකඟ නොවීම් සහ හින්දු ආගමට එය තර්ජනයක් ලෙස දැක, ප්‍රමේයමාල මෙසේ සඳහන් කළේයඃ "තුන් ආකාර වේදයේ සත්‍ය කණාදගේ අනුගාමිකයන්, බෞද්ධයන් සහ වෙනත් මිථ්‍යා ලබ්ධිකයන් විනාශ කර ඇත. පෙරදී, එය විෂ්ණු තම ත්‍රිශූලයෙන් ආරක්ෂා කරනු ලැබුණි." බුද්ධාගම හුදෙක් බ්‍රාහ්මණ ආගමේ හෝ පසුව හින්දු ආගමේ ශාඛාවක් හෝ ප්‍රතිසංස්කරණයක් වූවානම් මේ සියල්ල තේරුමක් නැති සහ අනවශ්‍ය වන්නට ඉඩ තිබුණි. බුදුපියාණන් වහන්සේ සැබවින්ම බ්‍රාහ්මණ ආගමේ සමහර පාරිභාෂිතයන් පිළිගත් අතර, තමන් වහන්සේගේ ධර්මය බ්‍රාහ්මණ ආගමෙන් සහ බ්‍රාහ්මණ පූජකයන් වූ බ්‍රාහ්මණයන්ගෙන් අසමාන බව ද දුටුවහ.

සමහර බ්‍රාහ්මණ ධර්මයන් සහ පිළිවෙත් සහ උන්වහන්සේ වෙත එල්ල වූ බ්‍රාහ්මණ එදිරිවාදිකම් පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ විවේචන තිබියදී එකිනෙකා අතර සමහරවිට යහපත් සම්බන්ධතා ද තිබුණි. වඩාත් විවෘත සහ නිදහස් මතධාරී බ්‍රාහ්මණයන්, විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව බොහෝවිට කුතුහලය ඇති අය සහ උන්වහන්සේගේ අදහස්වලට ගරු කළ අය උන්වහන්සේ සමඟ විනීත සංවාදවලට එළඹියහ. ඉහත සඳහන් ආකාරයට, බ්‍රාහ්මණයන් හොඳ සංඛ්‍යාවක් බුද්ධාගම වැළඳගත් අතර, ඔවුහු බෞද්ධ භික්ෂූන් බවට ද පත්වූහ.

# 18.දුම් ඉරීම සහ පස්වන ශික්ෂා පදය

බෞද්ධ සදාචාර චර්යාවේ හුදු අවමය පංච ශීලයේ අන්තර්ගත වේ. අවංක බෞද්ධයෙක් නම් හුදෙක් ශික්ෂා පද රැකීමට වඩා වැඩි දෙයක් අවශ්‍ය වේ. නමුත්, ඊට වඩා යමක් අඩුවෙන් ඇත්නම් එය පුද්ගලයෙක් බෞද්ධයෙක් යැයි අවංකව හැඳින්වීමට අයෝග්‍ය වේ. ඔබ යමෙකුගෙන් ඇසුවොත් පංච ශීලය රැකිය යුත්තේ ඇයි හෝ එසේ කිරීමෙන් ඇතිවන යහපත කුමක් ද කියා, සාමාන්‍යයෙන් ඔවුන් පවසන්නේ,"නරක කර්ම කිරීමෙන් වැළකීමට" බවයි. "නරක කර්ම කිරීමෙන් වැළකීමට අවශ්‍ය මිනිස්සු සමහරවිට දුම් ඉරීම, ශීලය, විශේෂයෙන් පස්වන ශික්ෂාපදය උල්ලංඝනය කරන්නේ ද කියා අසති. මත්පැන් ගන්නා අය දුම් ඉරීම ද නරක බවට තිබෙන ජනප්‍රිය සංජානයනය නිසා මේ දෙක සමහරවිට එකිනෙක අතර සම්බන්ධ වේ. මෙම ගැටළුව සාකච්ඡාවට ගත් කල්හි, එහි දී මතු වූ මතවාද, දුම්පානය පස් වන ශික්ෂාපදය නොකඩයි යන්න හෝ එසේය, එය පස්වන ශික්ෂා පදයට එරෙහිය යන නැඹුරුතාව දක්වයි.

පළමුවෙනි කාණ්ඩයේ සිටින අය සම්පූර්ණයෙන්ම නිවැරදි ලෙස, පැරණි ඉන්දියාවේ දුම්කොළ නොතිබුණු නිසා මිනිසුන් දුම් ඉරුවේ නැති බවත්, ඒ නිසා දුම් ඉරීම පස්වන ශික්ෂා පදයට ඇතුළත් කිරීමට කිසිවිටක අදහස් නොකළ බවත් කියමින් තමන්ගේ ආකල්පය සාධාරණීකරණය කරනු ඇත. නමුත් මෙම පිළිතුර පිළිබඳව වඩාත් ප්‍රවේසමින් බැලිය යුතුයි, හේතුව එහි නිවැරදි සහ වැරදි දෙකම තිබේ. පැරණි ඉන්දියාවේ දුම්කොළ නොතිබූ බව නිවැරදිය; දකුණු ඇමරිකාවෙන් පිටත දුම්කොළ පිළිබඳව දැනගත්තේ 16 වන ශත වර්ෂයෙන් පසුවයි. කෙසේ නමුත් පැරණි ඉන්දියාවේ මිනිසුන් දුම් ඉරුවේ නැතැයි මෙයින් අදහස් නොකෙරේ. සැබැවින්ම ඔවුන් එය කළ බව අපි දනිමු. පැරණි ඉන්දියානු වෛද්‍ය ග්‍රන්ථවල සුශෘතසංහිතා සහ චරකසංහිතා යන දෙකේම දුම් ඉරීම සම්බන්ධයෙන් සඳහන් වේ. පළමුවන ග්‍රන්ථයේ සිගරට් නිපදවන හා භාවිත කරන ආකාරය ද සඳහන් වේ. විනෝදාස්වාදය පිණිස හා යහපත් සෞඛ්‍යය පිණිස යයි කියමින් සිගරැට්ටු (දුම්වැටි) නිපදවනු ලැබුයේ කරදමුංගු, කහ, සුදුහඳුන්, අගිල් ආදිය මුසු කොට සියුම් තලපයක් සාදා, බටයක් අච්චුවක් ලෙස ගෙන, ඒ තුළ අතුරා හැඩගස්වමිනි. මාපට ඇඟිල්ලක් තරමට ඝනත්වය ඇති එය සෙ.මී. 15ක් පමණ දිග ය. තලපය වියැලුණු විට බටය ඉවත් කොට, ප්‍රතිඵලය වශයෙන් ලැබෙන සිදුරු සහිත සිගරැට්ටුව, දැල්වීමට පෙර පිරිසිදු ගිතෙල්වලින් හෝ

සුදුහඳුන් තෙල්වලින් ආලේප කරනු ලැබේ. ඍජුව ඉඳගෙන, නමුත් පහසු ඉරියව්වකින් සිටිමින් දුම් උරමින්, එක වරකට දුම් රොටු තුනක් ගනිමින් මුඛයෙන් සහ නාස් පුඬු යන දෙකෙන්ම ආශ්වාස කරමින්, නමුත් ප්‍රශ්වාසය නාස් පුඬුවලින් පමණක් කිරීමට චරකසංහිතා නිර්දේශ කරයි. මේ ආකාරයේ දුම් ඉරීම සමහරවිට විනෝදයට කළත්, එය ප්‍රධාන වශයෙන්ම වෛද්‍යමය හේතු මත නිර්දේශ කරනු ලබයි. එය විරේකයක් වශයෙන් ද තෙහෙට්ටුවට, විශාදයට, උගුර සහ නාසයේ ප්‍රශ්නවලට පිළියමක් වශයෙන් ද, ගර්භිණී මව්වරුන්ට හිතකරයක් වශයෙන් ද යහපත් යයි සිතනු ලැබේ. එවැනි සිගරට්, දුම්කොළ මෙන් ඇබ්බැහිකාරී නොවේ. සිගරට්වල තිබෙන විෂ රසායනික ද්‍රව්‍යය ඒවායේ නොමැත. කෙසේ නමුත් ඕනෑම වර්ගයක දුමක් ආඝ්‍රාණය කිරීම පෙණහලුවලට යහපත් නොවේ. සුසෘතසංහිතා සහ චරකසංහිතා යන ග්‍රන්ථ දෙකේ පැරණිතම කොටස්වල ඇත්තේ බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකින් පසුව ඇතිවූ සිදුවීමකි. නමුත් දුම් ඉරීම උන්වහන්සේගේ කාලයේ සිදුවන්නට ඉඩ ඇත. කුමක් වුවත්, සිගරට් පිළිබඳව ත්‍රිපිටකයේ හෝ බෞද්ධ ග්‍රන්ථවල සඳහන් නොවේ.

කෙසේ නමුත් තවත් ආකාරයක දුම් ඉරීමක් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. ඇතැම් වර්ගවල ඖෂධ පැළැටි පුළුස්සා, එහි දුම කුඩා වානේ බටයක් (ධුමනෙත්ත) තුළින් දුම් ඉරූ බව පෙනී යයි. මෙම බටය නවා තිබූ අතර, එක් කොනක් මුඛයේ තබාගත් අතර, අනෙක් කොන නාස් පුඬු අතර රඳවා, නළයට පිඹීම මගින් දුම නාසය තුළට තල්ලුකර එය ආඝ්‍රාණය කරන ලදී. මෙම ඉරීමට බුදුපියාණන් වහන්සේ කැමැත්ත පළකළ අතර, විනයේ භික්ෂූන්ට පැනවූ නීති අතර, උන්වහන්සේ එවැනි දුම් උරන බට තබාගැනීමට භික්ෂු භික්ෂුණීන්ට අවසර දුන්හ. (Vin.1,204) නමුත් එවැනි දුම් ඉරීම් සෞඛ්‍යයට හොඳ යයි සිතමින්ම මෙසේ කළ බව ඉතා පැහැදිලිය. කුමන සතුටක් ලැබුණත් දුම් උරන බට භාවිතය සැබෑ භික්ෂුවකට නොවටිනා බව දසබ්‍රාහ්මණ ජාතකයේ සඳහන් වේ. වෙනත් වචනවලින් කියනවා නම්, චිකිත්සක නොවන හේතූන් සඳහා දුම් ඉරීම නොපිළිගත හැකි බව විශ්වාස කෙරේ. දුම් ඉරීම පස්වන ශික්ෂා පදය උල්ලංඝනය නොකරනවා ය යන තර්කයට බොහෝ කරුණු ඇත. එය සිදුකරන තර්කය කුමක් ද?

මේ පිළිබඳව සෙවීමට පෙර මත්පැන්වලින් වැළකීම වඩාත් ප්‍රධාන බෞද්ධ ආචාර ධර්මානුකූල ප්‍රතිපත්තියක් වන්නේ ඇයි කියා අවබෝධ කරගැනීම අවශ්‍යයි. බුදුපියාණන් වහන්සේ දේශනා කළ බොහෝ දේවල්වලට කේන්ද්‍රගතව ඇත්තේ මනසට අදාළවය. එහි ස්වභාවය, එහි විවිධ ප්‍රකාරතාවන්, එය වෙනස් කරන්නේ කෙසේ ද සහ එසේ කිරීමෙන් ඇතිවන ප්‍රතිඵලයි. සියලු ජනප්‍රියතම පූජනීය බෞද්ධ ග්‍රන්ථ අතරින් ධම්ම පදයේ

පළමුවෙනි පැදිය ආරම්භ වන්නේ, "මනෝ පුබ්බංගමා ධම්මා ... ආදියෙන්" වීම සහසිද්ධියක් නොවේ. නිර්වාණයට මාර්ගය බෞද්ධාගමේ අවසාන ඉලක්කය වූ මනස වෙනස් කිරීම මත රඳා පවතී. පෙර සහ පසු බොහෝ මිනිසුන් මෙන්ම බුදුපියාණන් වහන්සේ ද ඉතා ස්වල්ප ප්‍රමාණයක මත්පැන්වලට වුව ද මනස විකෘති කිරීමේ බලපෑමක් ඇති බව තේරුම්ගෙන ඇති අතර, මෙය ඉතා පැහැදිලිව ත්‍රිපිටකයේ සඳහන් වේ. එහි ඇති අවපීඩන ස්වභාවය ප්‍රතිෂේදය අඩු කරයි. මෙයින් වැරදි තීරණවලට එළඹීම, අසාර්ථක ලෙස අවදානම් සහිත තීරණ ගැනීම, නොමනා කථාව සහ හැසිරීම් ආදිය ද ඍණාත්මක සමාජීය අනිටු විපාක නිතර ඇතිවීම ද සිදුවේ. ඇමරිකාවේ සිදුකරන ලද අධ්‍යයනයක් තුළින් දරුණු අපරාධ සිදුකර, සිරභාරයට ගත් සැකකරුවන්ගෙන් 84%ක් මත්පැන් භාවිත කර ඇති බව හෙළිවේ. ශ්‍රී ලංකාවේ ද එයම හෝ ඒ හා සමාන විය හැකිය. පස්වෙනි සිල් පදය කැඩීම අනෙක් සියලු සිල්පද කැඩීමට හේතුවේ යැයි පවසන පැරණි බෞද්ධ ආප්තෝපදේශය සම්පූර්ණයෙන්ම සත්‍යයකි. ඒ නිසා පස්වෙනි සිල්පදය පිටුපස ඇති මූලික හේතුවෙන් අදහස් කරන්නේ වර්තමානයේ ප්‍රශ්න වැළැක්වීමට සහ පසුව වැදගත් ආධ්‍යාත්මික ඉලක්කයන් අත්පත් කරගැනීමට මනස පැහැදිලිව සහ නිරවුල්ව තබාගත යුතු බවයි.

ඊළඟට තිබෙන ප්‍රශ්නය නම්, "දුම් ඉරීමෙන් මනස විකෘති කරන විපාකයක් තිබේ ද?" එසේ කරන බවට සාක්ෂි නැත. කෙසේ වෙතත් ප්‍රබල කෝපි කෝප්පයක්, එකකට පසුව එකක් බැගින් සිගරට් දුසිමක් උරනවාට වඩා සිහිකල්පනාවට බලපෑමක් ඇති කරයි. එම නිසා දුම් ඉරීම ඍණාත්මක ලෙස මනසට බලපෑමක් ඇති නොකරන නිසා එය පස්වන ශික්ෂා පදය උල්ලංඝනය නොකරන බව පෙනේ. එම නිසා සදාචාරමය කොටසක් නැත. යමෙකු කරුණාවන්ත, අවංක, අනෙක් අය පිළිබඳව සිතන අයකු වෙමින් ඒ අතරම අඛණ්ඩ දුම් උරන්නකු ද විය හැකිය. එවැනි බොහෝ අය සිටින බවට සැකයක් නැත. කෙසේ නමුත්, ඉහත සඳහන් කළ පරිදි පන්සිල් බෞද්ධ සදාචාරයේ යම්තම් අවමය වේ. හොඳ බෞද්ධයකු වීමට ඊට වඩා තව බොහෝ දේ ඇත, බොහෝ වැඩි ප්‍රමාණයකින්!

ශික්ෂාපදවල එක් අංශයක් වන්නේ ඍණාත්මක (වාරිත) බව මඟහැරීම සහ ධනාත්මක (චාරිත) බව පුරුදු කිරීමයි. පන්සිල්වල ධනාත්මක දේ නම් (1) පරපණ නොනැසීම, නමුත් ජීවිත ප්‍රවර්ධනය කිරීම, (2) අනුන් සතු දේ නොගැනීම, නමුත් අපට තිබෙන දේ අනුන් හා බෙදාගැනීම, (3) අපගේ තෘප්තිය සඳහා අනුන් භාවිත නොකිරීම, නමුත් ඔවුන් කෙසේ කවරකුගෙන් සතුට ලබා ගන්නවාද යන්න පිළිබඳව ඔවුන්ට ඇති අයිතියට ගරු කිරීම, (4) බොරු නොකීම, නමුත් අපගේ දැනුමට අනුව සත්‍යය කථා කිරීම, (5) අපගේ

මනස මුළා නොකිරීම, නමුත් එය නිරවුල්ව, පැහැදිලිව සහ සිහිබුද්ධිය ඇතිව තබාගැනීම.

නමුත් කලාතුරකින් පමණක් හඳුන්වන තවත් කරුණක් ඇත; එහි ආත්මය (අත්ත) සහ අනෙක් අය (පර) යන කරුණුයි. බොහෝ මිනිසුන් සිතන්නේ ශික්ෂාපදවල ප්‍රධාන අරමුණ වන්නේ නරක කර්ම මගහැරීම බව මෙම පරිච්ඡේදයේ ආරම්භයේදී සඳහන් විය. නමුත්, ("වාරිත සහ චාරිත") යන ශික්ෂාපදවල කරුණුවලින් හොඳින් පැහැදිලි වන්නේ එය අපට යහපත් වෙනවා සේම, අනෙක් අයට යහපතක් සිදු වනවා වශයෙන් එය සිදුවිය යුතු බවයි. මෙම ශික්ෂාපදවලට අනුගත වීම, අනෙක් අය කෙරෙහි සැලකීමක් ලෙස බුදුන් වහන්සේ හැඳින්වූහ. එයින් "ආදරය සහ ගෞරවය ඇතිකරවයි. එය උපකාරී බව, ආරාවුල්වලින් තොරවීම, සුසංයෝගී බව, එක්සත් බව ඇති කිරීම සඳහා හේතු කාරක වේ." ශික්ෂාපද අනුගමනය කිරීම, අනෙක් අයට ත්‍යාගයක් දුන් විට දෙන්නා සහ ලබන්නාටම යහපතක් වෙනවා හා සමාන ලෙස බුදුපියාණන් වහන්සේ දුටුවහ. උන්වහන්සේ මෙසේ වදාළහ:"ශ්‍රේෂ්ඨ ශ්‍රාවකයකු පංච ශීලය පුරුදුවන විට, ඔහු භය, වෛරය සහ සියලු නරකින් "නිදහස" නමැති ත්‍යාගය අසීමිත ජීවීන් ප්‍රමාණයකට ලබාදෙයි. එසේම මෙසේ ත්‍යාග දීමෙන් භය, වෛරය සහ නපුරෙන් අසීමිත ප්‍රමාණයකින් නිදහස භුක්ති විඳියි." තවත් එක් අවස්ථාවක, "නිදහස දීම" සහ "ඒකාග්‍රතාවට පාදක වන ගුණය" බුදුපියාණන් වහන්සේ නම් කරමින් පංච ශීලය පුරුදු කිරීමේ වඩාත්ම වැදගත් යහපතක් නම්, යමෙකු "නිදොස් ලෙස ලබන සතුට" අත්විඳීම බවයි. තවත් වචනයකින් කියනවා නම් අවංක බෞද්ධයන් පංච ශීලය පුරුදු කළ යුත්තේ හුදෙක් "නරක කර්ම" මගහැරීමට නොවේ; ඔවුන් තමන්ගේ ශුභසිද්ධිය සහ සතුට සහ අනුන්ගේද ශුභ සිද්ධිය සහ සතුට පිළිබඳව සැලකිල්ලට ගන්නා අරමුණින්ය.

මීළඟට තර්කානුකූල අනෙක් ප්‍රශ්නය නම් "දුම් ඉරීම අපට සහ අනෙක් අයට හානිකරද?" පිළිතුර වන්නේ ප්‍රබල ලෙස "එසේ යැයි" පැවසීමය. දුම් ඉරීම සෘජුවම ජීවිතයට අභියෝග කරන විවිධාකාර රෝගවලට හේතුවන බව බොහෝ කල් සිට දැනගන්නට තිබේ. මෑත කාලයේදී එය "අක්‍රීය දුම් ඉරීමට ද" හේතුවන බව ද වෙනත් කෙනෙකුගේ දුම් ආඝ්‍රාණය කිරීම ද ඒ හා සමානවම භයානක බව ද දැනගන්නට තිබේ. බුදුපියාණන් වහන්සේ බොහෝවිට වදාළේ සමහර හැසිරීම්, "තමාගේ යහපතට, අනෙක් අයගේ යහපතට, දෙපාර්ශ්වයේම යහපතට" මගහැරිය යුතු හෝ කළයුතු බවයි. දුම් නොඉරීම හෝ අතහැරීම නිශ්චිතවම මේ අදහස හා එකඟවන හැසිරීමකි.

අවසාන වශයෙන්, සෑම තැනකම සිටින බෞද්ධ භික්ෂූන්, මත්පැන් නොගත යුතුය. නමුත් තායිලන්තයේ, බුරුමයේ සහ කාම්බෝදියාවේ ඔවුන්ට දුම් ඉරිය නොහැකිය. ශ්‍රී ලංකාවේ මේ පිළිබඳව සැලකිය යුතු තරම් විරෝධයක් ඇත. ඒ නිසා ශ්‍රී ලාංකික භික්ෂූන් අඩුගණනේ ප්‍රසිද්ධියේදීවත් මෙයින් වැළකේ. නමුත් සියලු බෞද්ධ රටවල භික්ෂූන්ට බුලත් සැපීමට මුළුමනින්ම අනුමැතිය ඇත. බුලත් සැපීම කරන සියලුම රටවල මුඛය, උගුර සහ දිවේ පිළිකා ඇතිකිරීමට බුලත් සැපීම ප්‍රධාන හේතුවක් බව පෙනීයයි. එයද දුම් ඉරීම හා සමානවම පිළිකාකාරකයි. එසේ නම් දුම් ඉරීම සම්පූර්ණ බෞද්ධ ජීවිතයකට ප්‍රතිවිරුද්ධ නම්, එය බුලත් සැපීමටත් අදාළ නොවන්නේ ඇයි? සමහරවිට ඒ පිළිබඳව වැදගත් සාකච්ඡා ඇති කිරීමට මේ හොඳම කාලය විය හැකිය.

# 19.බුදුපියාණන් වහන්සේගේ සමකාලීනයන් උන්වහන්සේ දුටු අයුරු

මෙම මිනිසා පිළිබඳව සැබෑවටම නොදන්නා අය අතර පවා, බුද්ධිගෝචරත්වයෙන්, අනුකම්පාව සහ සන්සුන් සංහිදියාවෙන් යුතු ජනප්‍රිය සබැඳියාවෙන්, සිද්ධාර්ථ ගෝතම හෝ ගෝතම බුද්ධ හෝ බුද්ධ යන නාමයෙන් තවමත් හැඳින්වේ. එහෙත් සැබැවින්ම බුදුන් වහන්සේ ඇසූදුටු ජනයා උන්වහන්සේ කෙරෙහි ප්‍රතිචාර දැක්වූයේ කෙසේ ද? ඉතාම පැරණි ග්‍රන්ථවල අවධානයෙන් යුතුව කරන ලද සෝදිසියකින් අනාවරණය වන සාක්ෂිවලින් මේ පිළිබඳව යම් තොරතුරක් සහ බලාපොරොත්තු නොවූ තොරතුරු ලැබී ඇත. එයින් අපට මෙම උතුම් පුරුෂයා වඩාත් තියුණු සහ පැහැදිලි ආලෝකයකින් දැකබලා ගැනීමට අවස්ථාව උදාවී ඇත.

ප්‍රසිද්ධ කරළියේ එතරම් කාලයක් වැඩසිට, පිළිගත් අදහස්වලට වෙනස්වූ විප්ලවකාරී අදහස් ප්‍රකාශ කරමින් සිටි බුදුපියාණන් වහන්සේ, විරුද්ධත්ව, විවේචන සහ සමහරවිට නොරිස්සීම් ද ආකර්ෂණය කළ බව පමණක් බලාපොරොත්තු විය හැකිය. එසේම උන්වහන්සේ එසේ කළහ. එවැනි ප්‍රතික්‍රියාවන්වලින් උන්වහන්සේ නොකැලඹුණු නමුත්, වඩාත් සම්පූර්ණයෙන්ම තමන් වහන්සේම පැහැදිලි කරමින් උන්වහන්සේ තමන්ගේ ස්ථාවරය සාධාරණීකරණය කිරීම සඳහා සාමාන්‍යයෙන් උත්සාහ ගත්හ. සාමාන්‍යයෙන් උන්වහන්සේ පෞද්ගලික මට්ටමකින් තමන් වහන්සේගේ විවේචකයන්ට ප්‍රහාර එල්ල නොකළහ.

බුද්ධත්වය ලැබී වසරක් තුළ බුදුපියාණන් වහන්සේ කාශ්‍යප සහෝදරයන් තිදෙනා සහ ඔවුන්ගේ ශ්‍රාවකයන් ධර්මාවබෝධය ලබා දී තමන් වහන්සේගේ දර්ශනය වෙත හරවා ගත්හ. මෙම සහෝදරයෝ තිදෙනා මගධ රාජ්‍යයේ ඉතා හොඳින් දන්නා සහ සම්මානනීය තවුසෝ වූහ. මීට ටික කාලයකට පසු සංජය බෙලට්ඨිපුත්ත නමැති තවත් ගුරුවරයකුගේ ශ්‍රාවකයෝ 250 දෙනෙක් ඔහු අතහැර බුදුපියාණන් වහන්සේගේ ශාසනයට ඇතුල් වූහ. මෙම සිද්ධීන් දෙක මගධ රාජ්‍යය පුරා විශාල උනන්දුවක් ඇති කළේය. මෙය බුදුපියාණන් වහන්සේගේ දහම් සේවයේ ඉතාම මුල් කාලයේදීම ජනප්‍රියත්වයක් ඇති කළේය. ඉතාම ඉක්මනින්, බොහෝ තරුණයන් පැවිදිවීමට ඉල්ලා සිටි අතර, ඒ සියලු දෙනා පිළිගැනීමට බුදුපියාණන් වහන්සේ සතුටු වූහ. නමුත් පැවිදිවීමට සූදානම් වූ හැමදෙනාටම එය

ලබාදීමෙන් නොබෝ කාලයකින් ප්‍රශ්න පැන නැගුණි. අයෝග්‍ය ලෙස පුහුණු වූ සහ නොහික්මුණු භික්ෂූහු සැම තැනම යමින් අපහසුතා ඇති කළහ. එසේම, බොහෝ පුරුෂයෝ තමන්ගේ පවුල් අත්හැරීමෙන්, පීඩාවට පත්වුණු පවුල් අතර නොසන්සුන්තාවක් ඇති විය. මේනිසා බුදුපියාණන්ට විරුද්ධව මැසිවිලි කියන්නට ද පටන් ගත්හ. මිනිස්සු මෙසේ කීහ: "ගෝතම භික්ෂුව අපට දරුවන් නැති කරමින්, අප වැන්දඹුවන් කරමින්, අපගේ පවුල් කඩා ඉහිරවමින් ඉදිරියට යයි." බුදුපියාණන් වහන්සේ මේ ගැන සැලකිලිමත් වූවත් උන්වහන්සේ එය පෙන්වූයේ නැත. මිනිසුන් තමන් ගැන කියන දේ පිළිබඳව උන්වහන්සේ දැනුම්වත් කළ විට, උන්වහන්සේ මෙසේ ප්‍රකාශ කළහ: "ඝෝෂාව බොහෝ කාලයක් රැඳෙන්නේ නැත, එය දින හතක් තිබී, ඊට පසු නැවතෙනු ඇත." (Vin.1ග43) විභව්‍ය අපේක්ෂකයන් පරීක්ෂා කිරීමට සහ භික්ෂූන් පැවිදි කිරීමට සහ පුහුණු කිරීමට උන්වහන්සේ නීති පැනවූයේ මින් අනතුරුවයි. විශාල සංඛ්‍යාවක් පැවිදි කිරීමට ශ්‍රාවකයන් පිළිගැනීම සඳහා සුදුසු සංවිධානයක් පිළිබඳව උන්වහන්සේ ප්‍රමාණවත් ලෙස නොසිතූ බවට කෙනෙකුට හැඟීමක් ඇතිවන්නට පුළුවන.

බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේම දුටුවත්, අනෙක් අය උන්වහන්සේ සමණ හෝ ධාර්මික සහ වේදය නොවන භික්ෂු සම්ප්‍රදායේ ස්ථිරව පිහිටා සිටි පුද්ගලයකු ලෙස දුටුවත්, උන්වහන්සේ එහි වඩාත් මූලික උපකල්පනයන්, විශේෂයෙන්ම දැඩි බව සහ ස්වයං අත්තකිලමථය පුහුණුව නොසලකා හැරියහ. මේ සම්බන්ධයෙන් අනෙක් භික්ෂූහු උන්වහන්සේ අප්‍රසාදයට ලක් කළහ. එවැනි ශික්ෂාවක් උන්වහන්සේ අවුරුදු ගණනාවක් පිළිපදිමින් සිට අවසානයේ ඒවා අත්හැර, සේදීම සහ ආහාර ගැනීම නැවතත් සාමාන්‍ය ආකාරයට කළහ. උන්වහන්සේට සමීපව සිටි ශ්‍රාවකයෝ පස්දෙනා කෝපයට පත්වූහ. "සශ්‍රීක ජීවිතයකට නැවතත් පැමිණි" බවට චෝදනා කරමින් උන්වහන්සේ ජුගුප්සාවට ලක්කරමින් පිටව ගියහ. උන්වහන්සේට කළ චෝදනාව ඇසුණු කාශ්‍යප ස්වාමීන් වහන්සේ එය බුදුපියාණන් වහන්සේට සැල කළහ. "ගෝතම භික්ෂුව සියලු දැඩි හික්මීම්වලට අකමැත්ත පළකරයි, දුෂ්කර ජීවිත ගතකරන සියලුදෙනා ඔහු විවේචනය කරයි, දෝෂාරෝපණය කරයි." බුදුපියාණන් වහන්සේ මෙය සත්‍යය නොවන බව පැවසූහ. තමන් වහන්සේ අවබෝධය සහ නිදහසට මඟපෙන්වන හා තපස අගය කරන බව උන්වහන්සේ පැහැදිලි කළහ; එසේ නොකළ අය විවේචනය කළහ; එසේම කෙනෙකු අනෙක් මඟට යාම අනවශ්‍ය බව හැඟවූහ. (D.I. 161ff)

බුදුපියාණන් වහන්සේ පිළිබඳව බොහෝ පුද්ගලයන් තුළ තිබූ සිත්ගන්නා සුලු හැඳිනගැනීමක් නම්, උන්වහන්සේ තරුණ වියේදීම සම්පූර්ණයෙන්ම විමුක්තිය ලබා තිබියදීත්, බොහෝ අයට එම තත්ත්වයට ඒමට, "වර්ෂවලින්

බොහෝ කාලයක් ගතවී තිබීමයි." (වයෝ අනුප්පත්තෝ) මේ පිළිබඳව පසේනදී රජතුමා උන්වහන්සේගෙන් විමසුවේය."ශාසන සහ නිකායන්වල ප්‍රධානීන් වන භික්ෂූන් සහ බ්‍රාහ්මණයන්, තමන් අද්විතීය නිර්වාණය ලැබූ බවට සඳහන් නොකළත්, ඔවුහු හොඳින් දන්නා ගුරුවරුන් සහ ප්‍රසිද්ධ මහජනයා පිළිගත් අය වෙති. එම නිසා, තවමත් තරුණ වියේ සිටිනා, ඉතාම මෑතදී භික්ෂුවක බවට පත්වූ ඔබ නිර්වාණය ලැබූ බව පවසන්නේ ඇයි?" (S.I.68) මෙම ප්‍රශ්නයට බුදුපියාණන් වහන්සේගේ පිළිතුර වූයේ රජ කෙනෙකු තරුණ වුණත්, නයෙකු බිත්තරයෙන් පිටතට ආ විගස වුවත්, ගින්දර මේ දැන් දැල්වූවත්, ඒවායෙන් තවමත් බලපෑමක් තිබිය හැකි නිසා ඒවා පිළිබඳව ප්‍රවේසමින් අවධානය ලබාදිය යුතු බවය. (S.I. 68-70)

බුදුපියාණන් වහන්සේගේ කාලයේ, ඉන්දියානු සමාජයේ ආගමික ප්‍රශ්න පිළිබඳව පොදු සාකච්ඡා සහ වාද පැවැත්වීම එක් අංගයක් විය. ඇතැම් අයට එවැනි සිදුවීම් ප්‍රසිද්ධ කරන නව අදහස් පිළිබඳව දැනගැනීමට අවස්ථාවක් උදාකළ අතර, තවත් සුළු පිරිසකට තමන් දක්ෂ සහ විනෝදය සපයන වාදකරන්නන් බවට ප්‍රවර්ධනය කිරීමට අවස්ථාවක් උදාකළේය. ප්‍රභේද වෙන්කර හඳුනාගත හැකි සහ තමන්ගේ තීක්ෂණ බුද්ධියෙන් අනෙක් අයගේ අදහස් බිඳහෙළිය හැකි සමහර උගත්, උතුම් පුද්ගලයෝ සිටියහ. ගෝතම භික්ෂුව එක්තරා ගමකට හෝ නගරයකට වඩින බව දැනගත් විට ඔවුහු "අපි ඔහුගෙන් මේ ප්‍රශ්නය අසමු, ඔහු මේ විදියට පිළිතුරු දුන්නොත්, අපි අර දේ කියමු, ඔහු ඒ විදියට පිළිතුරු දුන්නොත්, අපි මෙය කියමු. ඒ අනුව ඔහුගේ ධර්මය ප්‍රතික්ෂේප කරමු" යි සිතමින් ඔවුහු ප්‍රශ්නයක් විධිමත්ව සකස් කළහ.ඔවුහු ගෝතම භික්ෂුව වෙත යති. බුදුපියාණන් වහන්සේ සතුටට පත්වෙති; උත්තේජනය කරවති; ප්‍රබෝධවත් කරවති; ධර්මය පිළිබඳව සාකච්ඡාවකින් ඔවුන් සතුටු කරවති. ඊට පසුව ඔවුහු වැඩිපුර ප්‍රශ්න නොඅසති. උන්වහන්සේගේ ශ්‍රාවකයෝ වෙති." (M.I.176) බුදුපියාණන් වහන්සේගේ එවැනි විරුද්ධවාදීන් සහ තර්ක කරන්නන්ගේ විරෝධය නිරුද්ධ කර, ඔවුන්ගේ සිත් තුළ යහපත් හැඟීමක් ඇති කරන්නට තිබූ හැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන් සමහර පුද්ගලයෝ උන්වහන්සේ එසේ කරන්නේ ගුප්ත ක්‍රමවලින් බවට චෝදනා කළහ. (M.381)

බුදුපියාණන් වහන්සේ විවේචනයට ලක්වූ, අදටත් එසේ වන, තවත් අවධාරණයට ලක් කළයුතු විවේචනයක් නම්, නිර්වාණය පිළිබඳව මතය සහ උන්වහන්සේගේ ධර්මයේ ආත්මය නොවන ශූන්‍යවාදයයි. (උච්ඡේදවාදය) මෙය ඉගැන්වීම පිළිබඳව චෝදනා කළවිට උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: "මා ශූන්‍යවාදය පිළිබඳ දහම උගන්වන බවත්, මගේ ශ්‍රාවකයන් ඒ

පිළිබඳව පුහුණු කරන බවත් යමෙකුට කිවහැකි ක්‍රමයක් ඇත. මම ලෝභය, ද්වේශය සහ මෝහය ශූන්‍ය කරන ආකාරය කියා දෙමි. නා නා ප්‍රකාර නරක සහ මානසික තත්ත්ව ශූන්‍ය කරන ආකාරය කියා දෙමි. (Vin 1, 234-235) වඩාත් අන්තගාමී තවුසෝ සුළු ප්‍රමාණයක් උන්වහන්සේ තමන් වහන්සේගේ ජීවිතය පිළිබඳව නොසැලකිලිමත් වෙතියි උන්වහන්සේට චෝදනා කළහ.

බුදුපියාණන් වහන්සේ සමඟ ඇතිවන සාකච්ඡාවක අවසානයේදී බොහෝ විට සංවාදයට පැමිණෙන පිරිස උන්වහන්සේ කියූ දේ පිළිබඳව තමන්ගේ තෘප්තිමත් බව ප්‍රකාශ කරති. නමුත් සැමවිටම එසේ සිදු නොවේ. උක්කට්ඨා නගරයේ තමන් වහන්සේගේම භික්ෂූන් කණ්ඩායමක් සමඟ සාකච්ඡාවෙන් අනතුරුව "ඔවුන් බුදුපියාණන් වහන්සේගේ වචන පිළිබඳව සතුටට පත්නොවූ" බව අපට දැනගන්නට ලැබුණි. (M.I.6) බුදුපියාණන් වහන්සේ කපිලවස්තුවලට වැඩිය විට, උන්වහන්සේගේ මවගේ සහෝදරයා වූ දණ්ඩපානි, ධර්මය පිළිබඳව පැහැදිලි කරදෙන ලෙස ඉල්ලා සිටියේය. බුදුපියාණන් වහන්සේ කථාව අවසාන කරන තෙක් සවන් දී සිටීමෙන් අනතුරුව මහලු මිනිසා, "ඔහුගේ හිස වනා, දිව ද වනා, ඇහි බැම ඉහළට ගත්විට, ඔහුගේ නළල මත රැලි තුනක් මතුවූ අතර, ඊට පසු ඔහු සැරයටියේ වාරුවෙන්" පිටව ගියේය. (M.I. 108-109) වරක් බ්‍රාහ්මණයකු හා ඇතිවූ සාකච්ඡාවකදී, පැරණි තවුසන් තමන්ට මාර්ගඵල අවබෝධ නොවුණ බවට පිළිගනිමින්, ඔවුන්ට ඉගැන්වූ බව එම බ්‍රාහ්මණයන් ඉතාම විශ්වාසයෙන් යුතුව පැවසීම, එක්නෙකාට කණවැල අල්ලා ගෙන යන අන්ධ මිනිසුන්ගේ රැහැනක් හා සමාන යයි බුදුපියාණන් වහන්සේ පැවසූහ, "පළමුවැනියාට නොපෙනේ, මැද පුද්ගලයාට නොපෙනේ, අවසානයාට ද නොපෙනේ." මෙම අවස්ථාවේ බ්‍රාහ්මණයා, "මෙම උපමාව පිළිබඳව, කෝපයට සහ නොසතුටට පත්වී උන්වහන්සේට පරිභව කළේය." බුදුපියාණන් වහන්සේ අවඥාවෙන් විවේචනය කරමින් මෙසේ පැවසුවේයඃ ගෝතම භික්ෂුව අත්නොහැරිය යුතුයි! (M.11.200) මේ අවස්ථාවේදී සාකච්ඡාව දිගටම පැවැත්වුණු අතර, අවසානයේදී බුදුපියාණන් වහන්සේ පිළිබඳව යම් ගෞරවයක් බ්‍රාහ්මණයා තුළ ඇතිවන්නට පටන් ගත්තේය.

බුදුපියාණන් වහන්සේගේ ස්වල්පයක් ශ්‍රාවකයන් උන්වහන්සේ අත්හැරිය බවට උදාහරණ ත්‍රිපිටකයේ සටහන් වී ඇත. එක් උදාහරණයක් නම් යම් කාලයක් පැවිදිව සිටි සුනක්ඛත්ත පිළිබඳවයි. ධර්මය පිළිබඳව නොසතුටට පත්ව, ඔහු බුදුපියාණන් වහන්සේ වෙත ගොස්, "මම ඔබවහන්සේ අතහැර යමි, මම තවදුරටත් ඔබවහන්සේගේ ඉගැන්වීම් අනුව ජීවිතය ගත නොකරමි. "සුනක්ඛත්ත ගෙන් යම් ප්‍රශ්න කිහිපයක් අසමින් උන්වහන්සේ ඔහුගේ

ප්‍රකාශයට ප්‍රතිචාර දැක්වූහ: "එන්න, මගේ ඉගැන්වීම් හා ජීවත් වන්න කියා මම කිසිදා ඔබට කීවෙම් ද?" "නැත ස්වාමීනී." එසේ නම් ඔබ කවදා හෝ මගේ ඉගැන්වීම් අනුව ජීවත් වනවා යයි කියා තිබේ ද?" "නැත ස්වාමීනී." "තත්ත්වය එසේ නම් මෝඩ පුරුෂය, නුඹ කව්ද? අත්හරින්නේ කුමක් ද?" (D.111, 2-3) සුනක්ඛත්ත අසතුටට පැමිණුණේ කුමක් අරබයා ද කියා අපට දැනගන්නට නැත. වඩාත් පොදුවේ, භික්ෂූ ශාසනයෙන් බැහැර වූ නමුත්, ඒ අය ධර්මය කෙරෙහි තමන්ගේ බැඳීම හොඳින් පවත්වාගෙන ගියහ. "භික්ෂූත්වයෙන් බැහැරවී ගිහි ජීවිතයට නැවත පැමිණියත්, බුදුපියාණන් වහන්සේගේ ධර්මය සහ ශාසනය පිළිබඳව තවමත් වර්ණනා කරති. අනෙක් අය මෙසේ කියනවාට වඩා "අප අවාසනාවන්ත වුණා, අපට පින මදි වුණා, අප එතරම් හොඳින් අනාවරණය වූ ධර්මයක භික්ෂූත්වය ලැබූවත් අපට මුළු ජීවිතය පුරාම නිර්මල සහ පිරිසිදු ආධ්‍යාත්මික ජීවිතයක් ගතකරන්නට නොහැකි වුණා" යැයි ඔවුහු ඔවුන්ටම චෝදනා කර ගත්හ. ආශ්‍රම සහායකයන් හෝ ගිහි ශ්‍රාවකයන් ලෙස කටයුතු කරමින් ඔවුහු පංචශීලය රකින්නට පටන් ගත්හ." (M.11,5)

බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයෙන් පසු සිදුවූ ඉතාම අවුල්සහගත තත්ත්වය සිදුවූයේ උන්වහන්සේ වේසාලි නගරයේ තාවකාලිකව වැඩසිටි අවස්ථාවේදීය. අසුභ භාවනාව පිළිබඳව භික්ෂූන් සමූහයකට උන්වහන්සේ දේශනා කළහ. මේ පුහුණුව සඳහා කය පිළිබඳ අප්‍රසන්න අංග සිහියට නැඟීම අවශ්‍ය වෙයි; ශරීරයෙන් පිට කරන දේවල් අඛණ්ඩව පිරිසිදු නොකෙරේ නම් පහසුවෙන් දිස්වෙයි. ඒවා අප්‍රසන්න බව සහ පිළිකුල ද ඇති කරයි. මෙම පුහුණුවේ අරමුණ වූයේ, ශරීරය කෙරෙහි නොඇලීමක් ඇති කිරීමට, රාගික ආවේගයන් නිවාදැමීමට සහ සාමාන්‍යයෙන් කය කෙරෙහි ඇති ආකර්ෂණය ඇතිකරන අධිඅවධාරණය සමබර කිරීමයි. පසුව, තමන් වහන්සේට මාස භාගයක් හුදෙකලා විවේකයකට යාම අවශ්‍ය බවත් තමන් වහන්සේට ආහාර රැගෙන එන භික්ෂුවට හැර, වෙනත් කෙනෙකුට පැමිණිය නොහැකි බවත් බුදුපියාණන් වහන්සේ වදාළහ. උන්වහන්සේ බැහැරව සිටින විට මෙම පුහුණුව භික්ෂූන් කරගෙන ගිය අතර, ඔවුන්ට උග්‍ර ප්‍රතිඵල අත්විඳින්නට සිදුවිය. ඔවුන්ගෙන් සමහරුන් තමන්ගේ සිරුරු පිළිබඳව "පිළිකුල, අරුචිය සහ ලජ්ජාවට පත්ව" ජීවිතය නසාගත් බවත් ප්‍රායෝගිකව, "පිහිය ගත් බවත්" (සත්ථාහාරක) ත්‍රිපිටකය සඳහන් කරයි. තිස්දෙනෙක් පමණ ජීවිතය නැතිකර ගත්හ. බුදුපියාණන් වහන්සේ නැවත විවේකයෙන් පසුව වඩින විට, සමහර භික්ෂූන් දකින්නට නොමැති බව දුටුවහ. ඔවුන් කොහේ ද කියා විමසූ විට සිදුවී ඇති දෙය පැහැදිලි කරන ලදී. ඊට පසු උන්වහන්සේ ආනාපානසතිය පිළිබඳව දේශනයක් කරමින් නොකැලඹීම සහ සන්සුන් බව උපද්දවීමට ඇති හැකියාව අවධාරණය කළ බව ත්‍රිපිටකය සඳහන් කරයි. නමුත් මෙම විපත්තිය

පිළිබඳව බුදුපියාණන් වහන්සේ සඳහන් කළ බවට එහි කිසි දෙයක් සඳහන්ව නොමැත. (S.V. 321-3220) අද මෙන්ම මිනිසුන් තදින්ම ඒ පිළිබඳව කම්පනයට පත්වන්නට ඇතිවුවත්, අනෙක් අයටත් ඒ පිළිබඳව කියන්නට ඇති දෙයක් තිබෙන්නට පුළුවන් වුවත්, ත්‍රිපිටකයේ ඒ පිළිබඳව කිසිවක් සඳහන්ව නැත. බුදුපියාණන් වහන්සේට මිනිසුන්ගේ මනස කියවිය හැකි බවත්, නැතහොත් අඩුතරමින් ඔවුන්ගේ නැඹුරුතාවන් හා හැකියාවන් පිළිබඳව වැටහීමක් තිබූ බවත් විශේෂයෙන් ඔවුන්ගේ සිත් ඇද ගන්නා ආකාරයෙන් ධර්මය දේශනා කිරීමේ හැකියාවක් තිබූ බවත් නිරතුරුව පැවසේ. නමුත් මෙම වේසාලියේ සිදුවූ සිද්ධිය උන්වහන්සේට හැමවිටම එසේ නොකළ හැකි බවට සාක්ෂියකි.

ඉඳහිට ඇතිවන විවේචන සහ සෘණාත්මක තක්සේරු තිබියදීත්, උන්වහන්සේගේ කාලයේ වැඩසිටි වඩාත් ගරුකළ ගුරුවරයා වූයේ බුදුන්වහන්සේය, එසේ නැත්නම් උන්වහන්සේට වඩා අවුරුදු 15ක් ජ්‍යෙෂ්ඨ ජෛන තීර්ථන්කර, මහාවීර හා සමානව ගරුකළ පුද්ගලයෙක් විය. උන්වහන්සේ කියූ සහ ක්‍රියාකළ ආකාරය මිනිසුන්ගේ සිත් ඇදගැනීමට සමත් විය. උන්වහන්සේ අගයන එක් පුද්ගලයෙක් මෙසේ පැවසුවේය: "උන්වහන්සේ කියන ආකාරයටම ක්‍රියා කරයි. එසේම ක්‍රියාකරන ආකාරයටම කථාකරයි. අතීතයේ හෝ වර්තමානයේ උන්වහන්සේ හැර වෙන කිසිම ගුරුවරයෙක් මේ ආකාරයට අවල නොවේ.(D.I. 222) බුදුපියාණන් වහන්සේගේ විනිවිද යන ප්‍රඥාව සහ පැහැදිලිතාව සමග උන්වහන්සේගේ පැහැදිලි කිරීම නැවත නැවත සඳහන් කිරීම, උන්වහන්සේගේ වඩාත් පහසුවෙන් දකින්නට ලැබෙන හැකියාවක් වේ. ඒ කාලයේ කරනපාලි බ්‍රාහ්මණයා ලිච්ඡවීන්ට ගොඩනැඟිල්ලක් ඉදිකරමින් සිටියේය. ඈත එමින් සිටි තමාගේ මිතුරු පිංගියානි බ්‍රාහ්මණයන් දැක ඔහු වෙත යමින් මෙසේ ඇසුවේය.

"පිංගියානි, මේ උදෑසන ඔබ කොහි සිට එන්නෙහි ද ?"

"මම ගෝතම තවුසා දකින්නට ගොස් එමි."

"හොඳයි, ඔබ ඔහුගේ ඥානයේ ඇති නිරාකූලතාව ගැන කුමක් සිතන්නෙහි ද ? ඔහු ප්‍රඥාවන්තයෙක්ය කියා ඔබ සිතන්නෙහිද?"

"මම ඔහු කවර දෙයකට සමාන කරන්න ද ? ඔහුගේ නිරාකූලතාව ගැන කියන්න මම කවුද ? ගෝතම තවුසාගේ ඥානයේ නිරාකූලතාව ගැන විනිශ්චයක් දෙන්නට පුළුවන් ඔහු වැනි කෙනකුටම පමණයි!"

"ගෝතම තවුසාට ඔබ දී ඇති වර්ණනාව ඉතා ඉහළයි."

"නමුත් ඔහු හා සසඳන විට මම කව්ද? ගෝතම භික්ෂුව ඇගයීමට මම කවුද? සැබැවින්ම ඔහු අගයකර ඇත්තේ ඇගයීමට පත්වූ අයයි. ඔහු දෙවිවරුන් සහ මිනිසුන් අතර ඉතාම ඉහළ පුද්ගලයායි." (A. 111,37) තවත් අවස්ථාවක යම් කටයුත්තකට ශ්‍රාවස්තියට පැමිණි විශාල බ්‍රාහ්මණ කණ්ඩායමක්, බුදුපියාණන් වහන්සේ සියලු කුල හතරේම "පවිත්‍රතාව" පිළිබඳව උගන්වන බව අසා, මෙය තමන්ගේ තත්ත්වයට අභියෝගයක් ලෙස සලකා එය මඟනොහැරිය යුතු බවට තීරණය කළහ. ඔවුහු මේ පිළිබඳව බුදුපියාණන් සමඟ වාදයක් කරන ලෙසට අස්සලායන නමැති උගත් තරුණ බ්‍රාහ්මණයාට බල කළහ. නමුත් ඔහු එසේ කිරීමට ඔහුගේ අකමැත්ත ප්‍රකාශ කළේය:"ගෝතම භික්ෂුව ධර්මය උගන්වන අයෙකි. ධර්මය උගන්වන අය සමඟ වාදකිරීම දුෂ්කරය. මේ කාරණය පිළිබඳව ගෝතම භික්ෂුව සමග වාදකිරීමට මට නොහැකිය" යි පැවසුවේය.(M.11,147)

විශේෂයෙන්ම, ආගමික කාරණා සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගේ මහාත්ම ගුණය සහ විවෘතබව පිළිබඳව මිනිස්සු බොහෝවිට පුදුමය පළකළහ. එක් හමුවීමකදී වරක් භික්ෂු පිරිසකගේ නායකයා, උන්වහන්සේගේ ධර්මය පැහැදිලි කරන ලෙස බුදුපියාණන්ගෙන් ඉල්ලා සිටියේය. උන්වහන්සේ ඔවුන්ට මෙසේ පිළිතුරු දුන්හ: "විවිධ මත, මනාප සහ පූර්ව විනිශ්චය ඇති සහ වෙනස් ගුරුවරයකු අනුගමනය කරන ඔබලාට මා උගන්වන ධර්මය තේරුම් ගැනීම අපහසුය. එම නිසා අපි ඔබගේ ඉගැන්වීම සාකච්ඡා කරමු." එවිට භික්ෂූහු පුදුමයට පත්වූහ. "විස්මයජනකයි, සැබැවින්ම පුදුමයි, ගෝතම භික්ෂුවගේ බලය ඉතා ඉහළයි. උන්වහන්සේ තමන් වහන්සේගේම ඉගැන්වීම පසෙක තබාගෙන අනෙක් අයට ඔවුන්ගේ ධර්මය සාකච්ඡා කිරීමට ආරාධනය කරති!" (D.111,40) ජෛන ආගම අදහන උපාලි නමැති, නාලන්දාවේ ප්‍රමුඛ පෙළේ පදිංචිකරුවෙක්, තමාට ශ්‍රාවකයකු වීමට අවශ්‍ය බව කීවේය. ඔහු තමාගේ පෙර ඇදහිල්ල අත්හැරීමට ඉක්මන් වූයේයැයි සිතමින්, බුදුපියාණන් වහන්සේ ඔහුට අවවාද කළහ: "පළමුව හොඳින් විමර්ශනය කරන්න. ඔබ වැනි හොඳින් දන්නා පුද්ගලයකු පළමුව හොඳින් විමර්ශනය කිරීම සුදුසු වේ." මෙය උපාලිගේ සිතෙහි සෑහෙනදුරට කාවැදුණි. ඔහු මෙසේ සඳහන් කළේය: "වෙනත් ගුරුවරුන් මා ශ්‍රාවකයකු ලෙස ලබාගත්තේ නම්, 'ගෘහමූලික උපාලි අපගේ ශ්‍රාවකයකු බවට පත්වී ඇත' යනුවෙන් නාලන්දාව පුරා ධජයක් ප්‍රදර්ශනය කරනු ඇත." නමුත්, ඔබ වහන්සේ මට පළමුව විමර්ශනය කරන ලෙස ඉල්ලයි. මම වඩාත් ඒ පිළිබඳව සතුටු වෙමි." (M.I,378-379)

බුදුපියාණන් වහන්සේගේ මහාත්ම ගුණයන් අනෙක් ප්‍රදේශවලටත් පැතිර ගියේය. සමහර ගුරුවරු තමන්ගේ ශ්‍රාවකයන්ට හෝ අගය කරන්නන්ට අනෙක් ආගම්වල අයට සහාය නොදෙන ලෙස පවසති. බුදුපියාණන් වහන්සේ අනෙක් ධර්ම පිළිබඳව විවේචනය කළත්, උන්වහන්සේ තමන් වහන්සේ ගැන මෙසේ පවසතිඃ "මම කොන්දේසි විරහිතව කථා නොකරමි." (ඒකංසවාදෝ, M.11,1970) මෙයින් අදහස් කරන්නේ උන්වහන්සේ සාමාන්‍යයෙන් වෙනත් ආගම් සම්පූර්ණයෙන්ම විවේචනය නොකරන බවත්, නමුත් ඔවුන්ගේ ශක්තීන් සම්බන්ධව සතුටට පත්වෙමින් සහ අගයකරමින්, දුර්වලතා පෙන්වාදෙන බවත්ය. මේ ආකාරයට, වෙනත් ආගම් අදහන්නන් අවංකවම යහපත් බව සඳහා උත්සාහ කරන බවත්, ඒ නිසා උපකාර කිරීමට සහ උනන්දු කිරීමට සුදුසු බවත් යන්න පිළිගැනීමට උන්වහන්සේට හැකිවිය. ඉහත සඳහන් ලෙස උපාලි තුන්වන වරටත් බුදුපියාණන් වහනසේගේ ශ්‍රාවකයකු ලෙස තමා පිළිගන්නා ලෙස ඉල්ලූ විට, "බොහෝ කාලයක් ඔබේ පවුල ජෛනයන්ට උපකාර කර ඇත, ඒ නිසා ඒ අය ඔබගේ නිවසට පැමිණි විට ඔවුන්ට දන්දීමට ඔබ සැලකිලිමත් විය යුතුයි" යනුවෙන් බුදුපියාණන් වහන්සේ වදාළහ. (M.I.378-379) තවත් අවස්ථාවක එක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේයඃ "යහපත් ගෝතම, ඔබවහන්සේ ඔබට පමණක් දන්දිය යුතුයි, අනෙක් අයට නොදෙන ලෙසත්, අනෙක් ගුරුවරුන්ගේ ශ්‍රාවකයන්ටත් නොදෙන ලෙසත් ඔබේ ශ්‍රාවකයන්ට කියා ඇතැයි මම අසා ඇත්තෙමි. මෙසේ කියන අය ඔබේ අදහස ඉදිරිපත් කරන්නේ ද, එසේ නැත්නම් එය විකෘති කර ඇද්ද? ඔවුන් ඔබගේ ඉගැන්වීමට අනුව ද කථා කරන්නේ? සැබැවින්ම, යහපත් ගෝතම, ඔබ වරදවා නොපෙන්වන්නට මම තද කැමැත්තෙන් සිටිමි." බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හඃ "මේ අය කියන්නේ මගේ අදහස නොවේ, ඒ අය මා වරදවා පෙන්වමින් අසත්‍ය ප්‍රකාශ කරති. සැබැවින්ම, කෙනෙකුට දන්දීම කවරකු හෝ අධෛර්යය කරන්නේ ද, එසේ කරන්නා තුන් ආකාරයකට බාධා ඇතිකරයි. ඔහු දන් දෙන්නාට යහපත ලබා ගැනීමට බාධා ඇතිකරයි. ඔහු දානය ලබන්නාට බාධා ඇති කරයි. එසේම ඔහු ඒ වන විටත් පහත් ක්‍රියාවකින් තමාට විනාශය ඇති කරයි." (A.161) බුදුපියාණන් වහන්සේගේ අනෙක් විශ්වාස කෙරෙහි ඇති විවෘත භාවය සහ ගෞරවය පිළිබඳව මිනිසුන් සිතූ අයුරු සම්බන්ධයෙන් අනෙක් ආගමික විශ්වාස කෙරෙහි බුදුපියාණන් වහන්සේ දැක්වූ ගෞරවය හා විවෘත භාවය ගැන ජනයා සිතුවේ කුමක් ද යන්න පිළිබඳව තොරතුරු ත්‍රිපිටකයේ නැත; නමුත් ඔවුන්ගේ සිත් එයින් ආකර්ෂණය වන්නට ඉඩ ඇත.

මිනිසුන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව සැලකිල්ලට ගත් සහ අගය කළ තවත් දෙයක් නම් උන්වහන්සේගේ නිශ්ශබ්දතාවට තිබූ කැමැත්තයි. සාකච්ඡා පවත්වමින් සහ සංවාද සහ විවාදවලට සහභාගි වීම පිළිබඳව විවිධ තොරතුරු තිබියදීත්, බුදුපියාණන් වහන්සේ කෙසේ නමුත් හුදෙකලා විවේකවලට, සමහරවිට මාස තුනක් වැනි කාලපරිච්ඡේදයක් (S.V. 325-326) සහ බොහෝවිට, හුදෙක් නිශ්ශබ්දව අසුන්ගෙන, ඝන රාත්‍රියේ භාවනා මනසිකාරයෙන් සැහෙන වේලාවක් ගත කළහ. බුදුපියාණන් වහන්සේ ඈතින් වඩින විට, භික්ෂූහු පිරිසක් ශබ්ද නඟමින් කථාකරමින්, එකිනෙකා අතර වාද කරමින් සිටියහ. එක් අයෙක් අනෙක් අයට මෙසේ පැවසුවේයඃ "ශබ්ද නොකරන්න, ගෝතම භික්ෂුව පැමිණෙමින් සිටී. ඔහු නිශ්ශබ්දතාවට කැමතියි; නිශ්ශබ්දතාව අගය කරයි. අපේ කණ්ඩායම නිශ්ශබ්ද බව දුටුවහොත්, ඔහු අප වෙත එනු ඇත." (D.I.179)

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් නොවූ මිනිසුන්ට පවා උන්වහන්සේ දැක, සවන්දී උන්වහන්සේ කෙරෙහි ඇති ගෞරවය ප්‍රකාශ කිරීමට හැකිවිය. මෙයට හොඳම උදාහරණයක් ලෙස සෝණදණ්ඩ නැමැති ජ්‍යෙෂ්ඨ බ්‍රාහ්මණයාගේ අදහස දැක්විය හැකියි. "ගෝතම භික්ෂුවගේ උත්පත්තිය නිරවද්‍යයි, හත්වන පරම්පරාව තෙක්ම පිරිසිදු සහ අඛණ්ඩ පෙළපතකින් ආ පවුලේ දෙපාර්ශ්වයම වංශවත් අය වූහ. උන්වහන්සේ විශාල ඥාති කණ්ඩායමක් අත්හැර සැඟවුණ සහ විවෘත - විශාල රත්රන් සහ ධාන්‍ය ප්‍රමාණයක් අත්හැරියහ. උන්වහන්සේ තරුණ වියේදීම අභිනිෂ්ක්‍රමණය කළහ. උන්වහන්සේ සද්ගුණවත්, උන්වහන්සේගේ ගුණයහපත්කම පෘථුල සහ තවදුරටත් ව්‍යාප්ත වන්නක් විය. උන්වහන්සේ යහපත් ලෙස සහ ප්‍රසන්න අයරින් කථා කළහ, ආචාරශීලීයි, උච්චාරණය ආකර්ෂණීයයි, පැහැදිලි ය, කරුණට පමණක් අදාළයි. උන්වහන්සේ බොහෝ දෙනාගේ ගුරුවරයාය. උන්වහන්සේ ඉන්ද්‍රියයන් පිනවීම සහ පුහු ආටෝපය අත් හළහ. උන්වහන්සේ ක්‍රියාව සහ ක්‍රියාවේ ප්‍රතිඵල උගන්වයි. නිදොස් බ්‍රාහ්මණ සම්ප්‍රදායයන්වලට ගෞරව කළහ. ඉතාම ධනවත් සහ බූදලයක් හිමි ප්‍රධාන රණශූර කුලයේ පවුලකින් පැවත එන, ඉහළ උත්පත්තියක් හිමි උන්වහන්සේ ඔබමොබ යන භික්ෂුවකි. විදේශීය රාජධානි සහ රටවල්වලින් මිනිස්සු උන්වහන්සේගෙන් උපදෙස් ලැබීමට පැමිණෙති. එසේම දහස් ගණනින් දෙවිවරුන් උන්වහන්සේ සරණ ගොස් ඇත. බොහෝ දෙවිවරු සහ මිනිස්සු උන්වහන්සේට ඉතා ළැදිය. උන්වහන්සේ වැඩසිටින නගරවලට සහ ගම්වලට අනර්ථකාමී භූතයන්ගේ විපත් සිදුවන්නේ නැත. උන්වහන්සේට අනුගාමිකයන් විශාල පිරිසක් ඇත. උන්වහන්සේ ගුරුවරුන්ගේත් ගුරුවරයාය. එසේම විවිධ නිකායන්හි ප්‍රධානීහු උන්වහන්සේ සමඟ සාකච්ඡා කරති. වෙනත් භික්ෂූන් හෝ බ්‍රාහ්මණයන් මෙන්

නොව, ගෝතම භික්ෂුවගේ කීර්තිය, අද්විතීය දැනුම සහ කල්ක්‍රියාව මුඳුන්පමුණුවා ගැනීම මත රඳේ. මගධයේ බිම්බිසාර රජ පවා උන්වහන්සේගේ ශ්‍රාවකයෙකි. ඔහුගේ පුත්‍රයා සහ බිරිඳ, අනුගාමිකයෝ සහ ඇමතිවරු උන්වහන්සේගේ ශ්‍රාවකයෝ වෙති. කෝසලයේ පසේනදි රජ සහ බ්‍රාහ්මණ පොක්ඛරසාති පවා ශ්‍රාවකයෝ වෙති.” (සංක්ෂිප්ත කර ඇත. D.I. 119) සෝණදණ්ඩගේ මෙම ඇගයීම සිත් ඇදගන්නා සුළුයි, ඒ එය බුදුපියාණන් වහන්සේ සහ එකල බ්‍රාහ්මණ පැළැන්තිය සැලකිලිමත් වූ සහ උනන්දු වූ දේ සහ ඔවුන් ප්‍රශංසනීය ලෙස සැලකුවේ මොනවා ද යනාදිය අපට පවසන නිසායි.

# 20.නිර්වාණය අවබෝධයට ආහාර

බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට ප්‍රථම ආහාරයට ගත් භෝජනය සම්බන්ධයෙන් බොහෝ සාකච්ඡා තිබී ඇත. විශේෂයෙන්ම, මහාපරිනිර්වාණ සූත්‍රයේ සඳහන් වී තිබෙන්නේ, සූකරමද්දව නමැති ආහාර වර්ගය කම්මල්කරුවෙකු වන චුන්ද උන්වහන්සේට පූජා කළ බවත්, එය උන්වහන්සේ වැළඳූ අවසාන ආහාරය බවත්ය. සූකරමද්දව යන ආහාරයේ සංයෝගය වල් ඌරෙකුගේ මෘදුතාව හෝ ඌරාගේ මෘදු බව හෙවත් "මෙළෙක් ඌරු මස් " යනුවෙන් පරිවර්තනය කර ඇත. කෙසේ නමුත් මෙම අදහස පැහැදිලි නැත.

නිර්මාංස වීම සම්බන්ධයෙන් පක්ෂව කථා කරන්නෝ බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ මතයට පාක්ෂික පුද්ගලයෙකු බව කීමට උනන්දු වෙති. ඒ අය සූකරමද්දව, එළවළු ආහාරයක් බව ස්ථිරවම කියා සිටිති. (ඌරන් ලැග්ග මඩවළ ආශ්‍රිතව හටගන්නා හතු වර්ගයක්) බුදුපියාණන් වහන්සේගේ චරිතය ඝාතනයට සැලසුම් කරන්නට කැමති අය උන්වහන්සේ නිර්මාංස වීම ඉගැන්වූ බවට වරදවා විශ්වාස කරති, සූකරමද්දව ඌරුමස් ආහාරයක් බවට ස්ථිරවම කියා සිටිමින්, එය ආහාරයට ගනිමින් බුදුපියාණන් වහන්සේ ප්‍රෝඩාවක් කර ඇති බවත් ඔවුහු කියති.

තොරතුරු නොදන්නා මිනිසුන් විසින් ප්‍රසිද්ධියට පත්කර ඇති තවත් ප්‍රසිද්ධ මතයක් නම්, බුදුපියාණන් වහන්සේ නරක්වූ ඌරු මස් ආහාරයට ගෙන හෝ සිතාමතාම උන්වහන්සේට වසදී පරිනිර්වාණයට පත්කළ බවයි. දැනුවත්ව සහ වෙනස් ලෙසකින්, මේවා සහ වෙනත් මත බොහෝ දුරට කාලය විනාශ කිරීමකි. එයට හේතුව, සත්‍යය නම්, කිසිම කෙනෙකු සූකරමද්දව කියන්නේ කුමක් ද කියා නොදන්නා නිසාය. නූතන විවේචනාත්මක පාණ්ඩිත්‍ය අවුරුදු සියයකට වඩා මෙම විෂයය සම්බන්ධයෙන් අඩු අවධානයක් යොමුකර ඇත. නමුත් පුදුමය නම්, බුදුපියාණන් වහන්සේගේ අවසාන ආහාරයට මෙතරම් අවධානයක් යොමුකර තිබියදී උන්වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු ලැබූ ප්‍රථම ආහාරය සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම කිසිවෙකුත් අවධානය යොමු නොකිරීමයි. ඒ සම්බන්ධයෙන් යම් ස්ථිර දෙයක් කිව හැකිය.

බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීමට හරියටම මොහොතකට පෙර හෝ ලැබුණු වහාම ගත් ආහාර සම්බන්ධයෙන් තොරතුරු දෙකක් ඇත. පළමු වැන්නට අනුව සුජාතා නමැති තරුණ කාන්තාවක බෝධිය අබියස වැඩමව සිටි ගෝතම දුටු අතර, ඒ වෘක්ෂ දේවතාවක් හෝ වෙනත් වර්ගයේ දෙවියෙක් යැයි සිතා, ඈ වහ වහා නිවසට ගොස් උන්වහන්සේ වෙනුවෙන් ආහාරයක් පිළියෙල කළාය. සැම දෙනාම දන්නා පරිදි ඇය සූදානම් කළ

ආහාරය කිරිබතක්ය. බොහෝ සිංහලයන් සිතන්නේ පොල්කිරි යොදා පිළියෙල කරන කිරිබතක් වැනි ආහාරයක් සුජාතා බුදුපියාණන් වහන්සේට පූජා කළ බවයි. මෙය නිවැරදි නැත.

උතුරු ඉන්දියාවට පොල්ගස් හඳුන්වනු ලැබුණේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසුවයි. දැනටමත් එය එතරම් ප්‍රචලිත නොවේ. සුජාතා පිළියෙල කරන ලද ආහාරය බොහෝවිට හින්දි භාෂාවෙන් හඳුන්වන "කීර්" ම විය යුතුයි; එය සහල්, එළකිරි හෝ මී කිරිවලින් සාදන ආහාරයකි. එය තම්බන කාලයට අනුව, කිරිබතක් ඇලෙන සුලු හෝ ඝන ආහාරයකි. එහි ඝනත්වය කැඳ මෙන්ය. සුජාතා විසින් කරන ලද බවට කියන මෙම පූජාව සම්බන්ධයෙන් ත්‍රිපිටකයේ ඇතුළත්වී නැතැයි ඇසූ විට බොහෝ මිනිසුන් පුදුමයට පත්විය හැකිය. සුජාතා යන නාමය ත්‍රිපිටකයේ එක් වරක් පමණක් ඉතා කෙටියෙන් සඳහන්වී ඇති අතර, බුදුපියාණන් වහන්සේ පළමු ශ්‍රාවිකාව වශයෙන්, ඇයගේ නම සඳහන් කළ බව අංගුත්තර නිකායේ සඳහන් වී ඇත. සුජාතා විසින් කරන ලද මෙම පූජාව ජනප්‍රවාදයක් පමණක් යයි කීම මෙයින් අදහස් නොකළ යුතුයි. සැබැවින්ම එය ඇත්තක් වූවත්, ත්‍රිපිටකයේ මුල්කාලීන සම්පාදකයන්, එය සටහන් කිරීමට තරම් වැදගත් යයි නොසිතූ බව පැහැදිලි වේ. කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේගේ හතරවන සතියේ උරුවේල හෙවත් වර්තමාන බුද්ධගයාවේදී සිදුවූ සිද්ධියක් ලෙස උදානය සහ විනයේ සඳහන් වේ.

තපස්සු සහ බල්ලුක නමැති වෙළෙන්දෝ දෙදෙනා උරුවේල හරහා යන විට බුදුපියාණන් වහන්සේගේ තැන්පත් සහ ප්‍රභාවත් හැසිරීම දැක තදින්ම සිතේ කාවැදී, උන්වහන්සේ වෙත සමීපව බාර්ලි කැඳ භාජනයක් සහ මීපැණි ගුළි (මන්ථඤ්ච මධුපිණ්ඩික) ද පූජා කළහ. මෙම කැඳ පිළියෙල කර ඇත්තේ බාර්ලි ජලය හෝ කිරි සමඟ, සාපේක්ෂව ඝන පදමකට උණුකර, සමහර විට ලුනු ස්වල්පයක් එක්කර සෑදීමෙන්ය. බාර්ලි ආහාරය (සත්තු) විශේෂයෙන්ම සංචාරයකදී පහසුවෙන් සහ ඉක්මනින් මහමඟදී පිසගැනීමට හැකි නිසා රැගෙන යන බව ජාතක කථා සහ වෙනත් බෞද්ධ නොවන ලේඛනවලින් අපට දැනගන්නට ලැබුණි. තපස්සු සහ බල්ලුක සහල්වලින් සෑදූ ආහාරයක් වෙනුවට, බාර්ලි කැඳ බුදුපියාණන් වහන්සේට පූජා කළේ ඇයිද කියා මෙයින් පැහැදිලි වේ.

බාර්ලි කැඳ සමඟ ගෙනගිය මීපැණි ගුළි පිළිබඳව එතරම් නිසැක නැත. ඒවා රවුම් කරන ලද මීවද කුට්ටි හෝ සමහරවිට මීපැණි කැට විය හැකිය. කෙසේ නමුත්, ඊටත් වඩා ඒවා අද හින්දි භාෂාවෙන් හඳුන්වන ගුලාබ් ජමුන් වැනි දෙයක් විය හැකිය. ඉන්දියාවේ තවමත් ජනප්‍රිය මෙම රසකැවිල්ල, ඝන

"කිරි බෝල ඇතුළත් පිටි සමඟ මිශ්‍ර කර එළඟිතෙල්වලින් බැද මීපැණි හෝ සීනි සිරප් සමඟ මිශ්‍ර කළ රසකැවිල්ලකි. මධුපිණ්ඩික සූත්‍රයේ ආනන්ද ස්වාමීන්වහන්සේ මීපැණි බෝල මධුපිණ්ඩික, "පැණි රස සහ ප්‍රණීත රස" දෙයක් ලෙස විස්තර කර ඇත. මෙය නූතන ගුලාබ් ජමුන්වලට සමාන හොඳ විස්තරයකි. පිංගියානි බ්‍රාහ්මණයා විසින්ද මීපැණි බෝල පිළිබඳව කළ විස්තරද අප සතුව ඇත. අංගුත්තර නිකායේ ඔහු කළ විස්තරයක් මෙසේ සටහන්වී ඇතඃ "බඩගින්න සහ දුර්වල බව මැඩපවත්වා ගත් මිනිසෙකුට මීපැණි බෝලයක් දුන්විට, කුමන කොටස ඔහු රස වින්දත්, පැණිරසක් අත්විඳියි. අවුරුදු ගණනාවක් එලක් නැති අත්තකිලමථය පුරුදු කිරීමෙන් පසු, ආහාර රුචිය නැවත ලබාගැනීමට සහ ශක්තිය යළි ලබාගැනීමට, බුදුපියාණන් වහන්සේට පෝෂ්‍යදායක, රසවත් ආහාරයක් වූ බාර්ලි කැඳ සහ මීපැණි බෝල උපකාර වූයේ යැයි සිතන්නට සුළු සැකයක් ඇත.

# 21.ත්‍රිපිටකය පළමුව ලීවේ කවදා ද? කොහේදී ද?

2017 අප්‍රේල් මස 21 වන දින "ද අයිලන්ඩ්" පුවත්පතේ පළවූ මගේ ලිපිය තුළින් බොහෝ බෞද්ධයන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව හොඳින් දන්නා බොහෝ තොරතුරු පළවූ අතර, එම තොරතුරු ත්‍රිපිටකයේ සඳහන්වූ ඒවායි බොහෝ බෞද්ධයන් උපකල්පනය කරන නමුත්, සැබැවින්ම එහි එවැනි තොරතුරු සඳහන්වී නොමැත. මේ තොරතුරුවලින් සමහර ඒවා බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසුව නිර්මාණය වූ ඒවා ලෙසට මම ඇඟවූයෙමි.මෙම ලිපියට බොහෝ දෙනා ප්‍රතිචාර දැක්වූ අතර, කැනඩාවේ පදිංචි වෛද්‍ය චන්ද්‍රා ධර්මවර්ධන ද ප්‍රතිචාර දක්වා තිබුණි. ඔහුගේ ප්‍රතිචාරයෙන් සඳහන් කර තිබුණේ, ත්‍රිපිටකය පළමුවරට ලිවීමට කැපවූයේ, ක්‍රිස්තු පූර්ව පළමුවන ශතවර්ෂයේ ශ්‍රී ලංකාවේ අළුවිහාරයේදී බවයි. එසේ කියමින්, ධර්මවර්ධන මහතා, එය සාමාන්‍යයෙන් පිළිගත් සහ බොහෝවිට නැවත නැවතත් සඳහන් කරන "සත්‍යයක්" හා සම්පූර්ණයෙන්ම අනුකූල දෙයක් බව සඳහන් කරයි. කෙසේ නමුත්, එය නැවත සැලකිල්ලට ගතයුතු සත්‍යයක් යයි මම කියමි.

පළමුව, මෙම තොරතුරු පැමිණෙන්නේ කොහි සිට ද ? එය පැමිණෙන්නේ දීපවංශයෙන්ය. එය මහාවංශයේත් නැවත සඳහන්වී ඇතැයි මම සිතමි. මෙම අගනා වංශ කථා දෙකම ක්‍රි.ව. 3-4 ශතවර්ෂවල සහ 5 වන ශතවර්ෂයේදී අනුපිළිවෙළින් රචනාවී ඇත, එසේ නැත්නම්, අඩුම ගණනේ වර්ෂ 500කට ප්‍රථමව සිදුවූ සිද්ධියක් වාර්තා කර ඇත. මෙම තොරතුරු සැක කිරීමට මෙය හේතුවක් නොවේ, නමුත්, එය සිහියේ තබාගැනීම වටී. වසර 500ක් තුළදී බොහෝ සිද්ධීන් අමතක වීම හෝ "නිර්මාණය" වීම සිදුවිය හැකිය. නමුත් මෙයට වඩා වැදගත් වන්නේ, ශ්‍රී ලංකාවේ සිදුවූ සිද්ධියක් ගැන වාර්තා කිරීමට වඩා වැඩි දෙයක් වංශකථා සිදු නොකරන බවයි; ඒ සිද්ධිය වන්නේ ත්‍රිපිටකය ලිවීමයි. අපැහැදිලි හේතූන් මත පදනම් වී කොහේ හෝ මෙය සිදුවූ පළමු අවස්ථාව ලෙස බහුල ලෙස උපකල්පනය වී ඇත. නමුත්, එසේ සිදුවී ද ? මෙයට ප්‍රථමව එය ඉන්දියාවේ නොලියන්නට ඇද්ද? බොහෝ දුරට, සැබැවින්ම බොහෝ දුරට විය හැකිය!

මම නිශ්ශබ්දව මෙතැන තර්ක කරමි. නමුත් කෙසේ වෙතත්, බෞද්ධ ග්‍රන්ථ පළමුව ලිවීමට යෙදුණේ මෞර්යයන්ගේ කාලයේ, විශේෂයෙන්ම, අශෝක අධිරාජයාගේ (268-232) රාජ්‍ය කාලයේ ඉන්දියාවේ බවට

උපකල්පනය කිරීමට හොඳ හේතු ඇතැයි මම සිතමි. මෙය සලකා බලන්න. අශෝක බැතිමත් බෞද්ධයෙකු වූ අතර, ඉතාම පැහැදිලිව ධර්මය ඉතා පුළුල් ලෙස ප්‍රචලිත කිරීමට ඔහුට අවශ්‍ය විය. මේ සම්බන්ධයෙන් ඔහු ආගමික දූතපිරිස් ඉන්දියාව පුරාම, බටහිරට, ස්වර්ණභූමියට (සමහරවිට දකුණු බුරුමයට) සහ සැබැවින්ම  ශ්‍රී ලංකාවට පිටත්කර යැව්වේය. පුරාවිද්‍යාවට අනුකූල සම්ප්‍රදායකින් පිටුවහලක් ලැබ ඔහු ස්තූප බොහෝ ප්‍රමාණයක් බිහිකළ බවට පාරම්පරික විශ්වාස පළකර ඇත. පළමුවරට ඉන්දියානු ස්තූප බිහිවූයේ මෞර්යයන්ගේ පාලන කාලයේ බව දැනගන්නට ඇත. පාරම්පරික තොරතුරුවලට අනුව, අලහබාද් සහ සාරානාත් ආඥාවන්හි හඟවා ඇති අයුරින්, ඔහු සංඝ සංශෝධනයක් කිරීම පිණිස සංගායනාවක් කැඳවීමට උත්සාහ කළ බව ද පාරම්පරික විශ්වාසයයි. නමුත්, ඊටත් වඩා වැදගත් දෙය නම්, අශෝක ඉතා බහුල ලෙස තමාගේ පොදු ප්‍රතිපත්තීන් ලිවීමයි. සැබැවින්ම, ඔහුගේ නියෝගයෙන් ඉන්දියාවේ පැරණිතම රහස් සංකේතවලින් ලියවුණ රචනා ඇත. ලිවීම සම්බන්ධයෙන්, අශෝක නව ක්‍රම භාවිතයට ගෙන ආ පුද්ගලයෙකි. මීට අමතරව ක්‍රිස්තු පූර්ව 256 දී ඔහුගේ නියෝගවලින් ත්‍රිපිටකයේ, ඔහු නම්කළ ඇතැම් සූත්‍රවලට "සවන්දීමට සහ මතක තබාගැනීමට" ඔහු භික්ෂූන්ට ආයාචනය කළේය. සමහර සූත්‍ර වලට,"සවන්දීමට" භික්ෂූන් යොමු කරමින් ඔහු බලාපොරොත්තු වූයේ ඒවා සජ්ඣායනය කිරීමට විය හැකිය. නමුත් ඔහු අදහස් කළේ ඒවා තල්කොළ පොත්වලින් හඬනගා සජ්ඣායනය කිරීමට විය හැකිය. කෙටියෙන් කිවහොත්, ත්‍රිපිටකය ලියවුණේ අශෝක අධිරාජයාගේ රාජ්‍ය කාලයේදී යයි කියන්නට තරම් මෙය වැඩිදියුණු කළහැකි පියවරක් නොවේ.

නමුත්, තව බොහෝ දේ ඇත. මෑතදී ඇෆ්ගනිස්තානයේදී ත්‍රිපිටකයෙන් උපුටාගත් ඊනියා බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ලියවිලි ක්‍රිස්තු පූර්ව 100 දී සිට අද දක්වා පෙන්නුම් කරයි. මෙය ඒ වනවිට අඩුම ගණනේ සූත්‍රවල කොටස් හෝ ඉන්දියානු බෞද්ධයන් ඒ වනවිටත් ලියා ඇති බවට ඒත්තු ගන්වන සාක්ෂි වේ. එසේම, සැබැවින්ම මෙම කාර්යය ඊටත් ප්‍රථමයෙන් ආරම්භ වන්නට ඇත.

නමුත්, තවත් බොහෝ දේ ඇත. ත්‍රිපිටකය පළමුව ලියැවුණේ අජාසත්ත රජුගේ පුත් උදායිබද්දගේ රාජ්‍ය කාලයේදී ය යන විස්මයජනක අදහසක් මන්ජුශ්‍රීමූලකල්ප නමැති බෞද්ධ ග්‍රන්ථයේ සඳහන්වී ඇත. මෙය නිවැරදි නම්, ත්‍රිපිටකය ලිවීම සිදුවී ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 30ක් පමණක් ගෙවී ගිය පසුව යයි අදහස් වේ. මන්ජශ්‍රීමූලකල්පයේ කොටස් වඩා පැරණි ලේඛනවල තොරතුරු ලබාදෙන බවට සුළු ප්‍රමාණයේ

අනුමානයක් තිබුණත්, එය ලියන්නට ආරම්භ වී ඇත්තේ 8 වන ශතවර්ෂයේ සිටයි.

පැරණි ශ්‍රී ලාංකිකයන් සහ පැරණි ඉන්දියානුවන් අතර තිබෙන ලොකුම වෙනස නම්, ශ්‍රී ලාංකිකයන් සැහෙන හොඳ ලේඛන තබන්නන් වන අතර, ඉන්දියානුවන් එසේ නොවීමයි. ඊට අමතරව පැරණි ඉන්දියාව පිළිබඳව වරක් තිබූ විශාල ප්‍රමාණයේ තොරතුරු හුදෙක්ම නොනැසී ඉතිරිව නැත; තල් කොළවල ලියවුණු ලේඛන ඉතා ඉක්මනින් කාවන්, පුස් සහ තෙතමනය නිසා විනාශ වේ. සමහරවිට සමහර ඉන්දියානු භික්ෂූන් ත්‍රිපිටකය ලියා, කරුණු ලේඛනගත කරඇති නමුත්, එම ලේඛන තවදුරටත් නොනැසී පැවත නැත. දීපවංශය ආදිය පැවතුණ අතර, එහි ක්‍රිස්තු පූර්ව 1වන ශතවර්ෂයේදී ශ්‍රී ලංකාවේ සිදුවූ ඉතාම වැදගත් සිද්ධියක් සම්බන්ධයෙන් අපට කියයි. නමුත් ඉන්දියාවේ සිදුකළ හෝ සිදුවන්නට ඇති දේ සම්බන්ධයෙන් කිසිවක් එහි සඳහන්වී නැති තරම්ය. එය ශ්‍රී ලංකාවේ ඉතිහාසය සඳහන් කරමින් සිටිය ද, ඉන්දියාවේ ඉතිහාසය නොවේ; සමහර විට ස්වල්පයක් පමණක් දැනගෙන සිටින්නට ඉඩ තිබේ.

# 22.මරණ දඬුවම හා ප්‍රබුද්ධ පුද්ගලයා

ගණිකා වෘත්තිය පැරණිතම වෘත්තිය නම්, අලුගෝසුවාගේ කාර්යභාරය දෙවැනි පැරණිතම වෘත්තිය වේ. විවිධ අපරාධවලට, බොහෝවිට ඉතාම සුළු ඒවාට, මරණ දඬුවම ලබාදීම් පිළිබඳව ඉතාම පැරණිතම සමහර ලේඛන සහ සැබැවින්ම පැරණිතම නීතිය සම්බන්ධ ලේඛනවල සඳහන්වී ඇත. හම්මුරාබි ව්‍යස්ථාව Code of Hammurabi (ක්‍රි. පූ. 1754) නීති විරෝධී ක්‍රියාවන් 50කට පමණ මරණ දඬුවම් ලබාදෙයි. ශුද්ධ බයිබලයේ පරණ ගිවිසුමේ ද්විතීය කථාවට (Deuteronomy) අනුව (ක්‍රි. පූ. 7 වන ශතවර්ෂයේදී පමණ) හුදෙක් ඉරු දින රැකියාවක් කිරීම, කාන්තාවක තමා විවාහයට පෙර කන්‍යාවක බවට බොරු කීම සහ දරුවන් දෙමව්පියන්ට අකීකරු වීම මරණීය දඬුවම ලැබීමට හේතුවක් විය. වර්තමානයේ මරණ දඬුවම් ලබාදීම, ශීඝ්‍ර පහත වැටීමක් ලෙසත්, විද්‍යුත් කම්පනයක් හෝ වරදකරුවෙකුගේ ජීවිතය අවසන් කරන තියුණු කපා හෙළීමක් ලෙසත් අප සිතුවත්, අතීතයේදී එය එසේ නොවීය. එකල බොහෝවිට, බලවත් වේදනා විඳවන්නට සලස්වමින්, මරණය දික්ගස්සවමින් බිහිසුණු අත්දැකීමක අවසානය විය. පැරණි ඉන්දියානු නීතියේ, මරණීය දඬුවම ආකාර දෙකකට හඳුනාගන්නා ලදී; ක්ෂණික (සුද්ධාවධ) හෙවත් හිස ගසා දැමීම; සහ වේදනා සහිත (ක්ලෙසදණ්ඩ) හෙවත් මරණයට පෙර වධහිංසා පැමිණවීම ද ඇතුළත් විය. හිරකරුවන් මරණයට පත්කිරීමේ ක්‍රමයක් වශයෙන් 13 ආකාර බියකරු වධහිංසා පමුණුවා පහරදීම, බුදුපියාණන් වහන්සේ මජ්ඣිම නිකායේ දක්වා ඇත. කවරදා නමුත් බලයෙන් කළ බියජනක දඬුවම නම්, වරදකරුවා කඩුල්ලකට හෝ ලී ජනේලයකට තදින් ගැටගසා, එල්ලා මරණ තැනට අශ්වයකු ලවා තදින් ඇදගෙන යාමයි. මෙම දඬුවම ඊට පෙර ද යම් කාලයක් ක්‍රියාත්මක නොවුණ අතර, 1870 දී බ්‍රිතාන්‍ය අවසානයේදී එය අහෝසි කරන ලදී.

අලුගෝසුවා විසින් ශිෂ්ටාචාරයට අහිමි කරන ලද ශ්‍රේෂ්ඨ මිනිසුන්ගේ සහ ගැහැනුන්ගේ ලැයිස්තුවක් ඇත, නමුත් එය දීර්ඝය. සොක්‍රටීස්, ශ්‍රීමත් වෝල්ටර් රැලේ, නසරෙත්වල ජේසු, ඇන්ටියන් ලොවසියර්, ආර්ක්වල ජෝන්, ලුසිලෝ වනිනි, ජන් හුස්, ශ්‍රීමත් තෝමස් මෝර්, ශාන්ත පීටර්, රබී අකිවා, ගොයර්ඩානෝ බෘනෝ, විලියම් ටයන්ඩේල් සහ ෆෙඩරිකෝ ගාසියාලෝකා, ඒ අයගෙන් සුළු පිරිසකි.

මරණ දඬුවම් ලබාදීමට මූලික හේතුව මුලින්ම පලිගැනීමයි. ඒ සමාජයෙන් තරහකාරයන් ඉවත් කිරීම සහ අපරාධ කිරීම අධෛර්යවත් කිරීමයි. 1764 දී සීසර් බෙකාරියාගේ "අපරාධය සහ දඬුවම" යන කෘතියෙන් ඔහු විසින් මරණීය දඬුවම් ලබාදීම අපරාධ මර්ධනයට ක්‍රෑරතර සහ අසාර්ථක

පියවරක් බවට තර්ක කරමින් මරණීය දඬුවම අහෝසි කිරීමට කරන ලද යෝජනාව, නූතන කාලයේ ඇතිවූ පළමු පියවරයි. මෙයින් පෙලඹවීමක් ලැබූ ඉතාලියේ, ටස්කනියේ පීටර් ලෙපඩ් 1786 දී, මරණීය දඬුවම අහෝසි කළේය. මෙසේ කළ පළමු යුරෝපීය රාජ්‍ය එයයි. ටස්කනිය, සම්පූර්ණයෙන්ම නීතියක් නැතිව පහළට වැටේ යැයි කියමින්, පල්ලිය සහ වෙනත් ආයතන බියපත් විය. එය එසේ නොවීය.

නමුත්, බෞද්ධ ප්‍රතිපත්තීන් සමාජ පාලන ප්‍රදේශ තුළට යෙදවීමට නිතරම උත්සාහ කළ පාලකයන්, මීට බොහෝ කාලයකට පෙර සිටම එල්ලා මැරීම තහනම් කර තිබීම විශේෂත්වයකි. අශෝක අධිරාජයා ක්‍රි. පූ. 243 දී එය තහනම් කළ අතර, ඊට පසු බොහෝ ඉන්දියානු බෞද්ධ අධිරාජයෝ එසේ කළහ. 7 වන ශතවර්ෂයේදී ඉන්දියාවට පැමිණි චීන ජාතික වන්දනාකරු --- සුඇන්සැන්ග් මෙසේ සඳහන් කළේයඃ "ඉන්දියාවේ රජවරු බුදුපියාණන් වහන්සේගේ ධර්මය ඉතා ගැඹුරු ලෙස විශ්වාස කරති. එමනිසා ඔවුහු මිනිසුන් පාලනය කිරීමේදී මරණීය දඬුවම භාවිත නොකරති. බරපතළ වැරදිවලට වැරදිකරුවෝ පවා එල්ලා නොමරති. "ජපාන රජ කෙනෙකු වූ ෂොමූ නමැති තවත් භක්තිමත් බෞද්ධයකු ඔහුගේ රාජ්‍ය කාලය තුළදී (724-49) මරණීය දඬුවම අහෝසි කළ අතර, නැවතත් 810 දී තහනම් කරන ලදී. ඉදිරි වර්ෂ 350 දී බොහෝ විට එය භාවිත නොකරන ලදී. බොහෝ බෞද්ධ චින්තකයෝ ශතවර්ෂ ගණනාවක් පුරා මරණීය දඬුවම අහෝසි කිරීම පිණිස වාද විවාද කළහ. නාගර්ජුන (1 වන/2 වන ශතවර්ෂයේ) ගෝතමිපුත්‍ර රජතුමාට ලිපියක් ලියමින් මෙසේ පැවසුවේයඃ "පුතකු වටිනා පුද්ගලයකු කිරීම පිණිස ඔහුට දඬුවම් පමුණුවන ආකාරයටම, අනුකම්පාවෙන්, නමුත් වෛරය හෝ ලෝභය නොමැතිව දඬුවම් පැමිණවිය යුතුයි. ඔබ මිනීමරුවන් විනිශ්චය කිරීමෙන් අනතුරුව ඔවුන් නොමරමින්, පිටුවහල් කළ යුතුයි."නාගර්ජුන්ගේ වචන තුළ බලාපොරොත්තු වූ ප්‍රතිඵල තිබේදැයි අපි නොදනිමු.

එමනිසා "බුදුදහම ආරක්ෂා කරන" හෝ "බෞද්ධ රටක්" ලෙස කියාගන්නා රටක මරණීය දඬුවම තිබිය හැකි ද? අප පංචශීලය, ප්‍රධාන වශයෙන් පෞද්ගලික ශීලය ලෙස සිතුවත්, ඒවා සමාජීය සහ දේශපාලනමය පරිමාණයෙන්ද උචිත විය යුතුයි; සිදුවිය යුතුයි. තර්කානුකූලව බලන කල්හි, පුද්ගලයකු මැරීම වැරදි නම්, රටක් වැනි වස්තුවකට ද මිනීමැරීම වරදක් විය යුතුයි. විදේශික සංචාරකයන් ඡායාරූපයක් ගැනීම පිණිස නොසැලකිලිමත් ලෙස බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ සිටගැනීම හෝ පාරම්පරික බෞද්ධ සිරිත් වෙනත් ආකාරයකට සිදුකරමින්, වරදක් කිරීම ආදියට බුරුමය හෝ තායිලන්තය වැනි රටවල දඬුවම් දීම සම්බන්ධයෙන්, මා නිතරම සිතන්නේ පෙරකී ලෙස මේ රටවල් දෙකම, අඛණ්ඩව එල්ලා මැරීම කෙතරම් අසංතුලිත

ද කියායි. සැබැවින්ම, බෞද්ධ වටිනාකම්වලට අනුව, ආචාර සහ චාරිත්‍ර උල්ලංඝනය කිරීමට වඩා මිනිසකු මැරීම බොහෝ සෙයින්ම වරදකි.

බෞද්ධ රටක අධිකරණ මිනීමැරීම් සිදු නොකළ යුතු බව විවාද රහිත කරුණකි. බුදුපියාණන් වහන්සේ මරණීය දඬුවමට විරුද්ධ වූයේ, ප්‍රධාන වශයෙන් එයට කෲරත්වය සහ මැරීම අදාළ වන නිසාය. ඒ අනුව, පළමුවන ප්‍රතිපදාව උල්ලංඝනය වන නිසාය. කෲරතර දඬුවම් නියම කරන විනිශ්චයකරුවන්, වධ හිංසා පමුණුවන්නන් සහ අලුගෝසුවන්, පාප සහිත ක්‍රියාමාර්ගයක යෙදෙන බව උන්වහන්සේ කියා සිටියහ. මෙය ප්‍රායෝගිකව " කෲරතර" ජීවන උපායකි. (කුරුර කම්මන්ත) එසේම ඔවුන්ට සෘණාත්මක කර්මයක් බොහෝ සෙයින් ඇතිකරවන්නකි. (S. 11, 257-60) උන්වහන්සේගේ කාලය තුළ නීතිමය පද්ධතියේ දැඩි බව සම්බන්ධයෙන් උන්වහන්සේ මනාව දැනසිටි අතර, එක් සූත්‍රයකින් එක් විනිශ්චයකරුවකු එක් නඩු විභාගයක් අවසානයේදී භාවිත කළ භයානක වචන උන්වහන්සේ උපුටා දැක්වූහ: "ඔහුගේ අත්දෙක පිටිපස්සට ගෙන ශක්තිමත් කඹයකින් ගැටගසන්න, ඔහුගේ හිස මුඩු කරන්න, දරුණු බෙර ශබ්දයකට ඔහු මාර්ගය දිගේ ප්‍රදර්ශනය කරන්න, නගරයේ දකුණු ගේට්ටුවෙන් පිටතට ගෙන, ඔහුගේ හිස ගසා දමන්න." මරණීය දඬුවම දෙන ස්ථානවල ඇති අප්‍රසන්න සහ හදවතට වේදනා ගෙනදෙන දර්ශන උන්වහන්සේ පවා දකින්නට ඇත, සුලභ වන්නට ඇත, උන්වහන්සේගේ භික්ෂු/භික්ෂුණීන්ටත් එසේම වන්නට ඇත. එක් වරදකරුවෙකු "ඔහුගේ කනස්සල්ලෙන් ඉවතට දැමීම පිණිස" වහාම අවසන් කර දමන ලෙස එක් භික්ෂුවක වධකයාගෙන් ඉල්ලා සිටිය බවත් විනය පිටකයේ සටහන් වී ඇත.

එක් ධාර්මික රජෙකු (සැබැවින්ම බෝධිසත්ත්ව) "සිර මැදිරිය විවෘත කර අලුගෝසුවාගේ කුටිය කැඩීමක්" ඇතුළුව බොහෝ සංශෝධනවලට මුලපිරීම් කිරීම සම්බන්ධයෙන් ජනසන්ධ ජාතකයේ සටහන්වී ඇත. තවත් රජ කෙනකු (නැවතත් බෝධිසත්ත්වයෝ) මෙසේ පැවසූ බව "මම මිනිසුන්ට දඬුවම් කරන්නේ සාධාරණත්වය අනුවයි, නමුත් අනුකම්පාව ද ඇතිවයි" යනුවෙන් සුමංගල ජාතකයේ සටහන් වී ඇත. පෙරකී ලෙස, සැම ආකාරයටම මරණ දඬුවම් ඇතුළුව, කෲර සහ මිනීමැරීම්වලට බුදුපියාණන් වහන්සේගේ විරෝධතා තිබියදීත්, කාම්බෝජියාව සහ මොන්ගෝලියාව හැර, සියලු බෞද්ධ රටවල වර්තමානයේ මරණ දඬුවම ක්‍රියාත්මක වීම සහ සංඝයා වහන්සේලා, අධිකරණ වෘත්තිය හෝ එය අවලංගු කිරීමට මහජනයාගේ කිසිම බලපෑමක් නැතිවීම යම් ආකාරයක නොගැළපීමකි. අතිශය දියුණු ප්‍රජාවන් සහ බැබළෙන විහාරවලට බොහෝ උනන්දුවක් සහ අනුමැතියක් ලැබෙතත්, එයට ධර්මයට

අනුකූල සමාජීය කරුණු සම්බන්ධයෙන් උනන්දුව සහ අනුමැතිය ලැබෙන්නේ ඉතා සුළු වශයෙනි.

සෙසු බොහෝ රටවල, විශේෂයෙන්ම, දියුණු වූ රටවල නීත්‍යානුකූලව මරණයට පත්කිරීම පසුගිය වර්ෂ 70 තුළදී තහනම් කර ඇති අතර, ඇමරිකාව මෙයට පැහැදිලිවම විරුද්ධත්වය දැක්වූ එක් විශාල රටකි. නොදියුණු වූ ද, සමහරුන් පසුගාමී යැයි හඳුන්වන්නා වූ ද රටක් වන නේපාලය එය තහනම් කර ඇත. නමුත්, කනගාටුවට කරුණකි, සමහර රටවල දියුණුවක් තිබියදීත්, පසුබසිනසුලු පියවර ගැනීම් සම්බන්ධයෙන් උදාහරණ ඇත. ටිබෙට් රටේ 13 වන දළයි ලාමා 1913 දී මරණ දඬුවම තහනම් කළේය. නමුත් චීන ජාතිකයෝ 1959 දී රටේ පාලනය ගත් පසු එය නැවතත් නීතිගත කළහ. ඒ ප්‍රධානවම, දේශපාලනමය වරදවල් සම්බන්ධයෙන්ය. එතැන් සිට, ඉතාම විවෘතව භාවිත කෙරේ. ශ්‍රී ලංකාව පොදු ප්‍රතිපත්තීන් තුළට වඩාත් බෞද්ධ මූලධර්ම ඇතුළත් කිරීමේ එක් වැඩසටහනක් වශයෙන් 1956 දී මරණ දඬුවම අහෝසි කළේය. නමුත් බණ්ඩාරනායක ඝාතනයෙන් පසු 1959 දී එය නැවතත් පනවනු ලැබුණි. ඊට පසු 1976න් පසු එයින් වැළකුණු අතර, නැවත 2004 දී එය නැවත පනවනු ලැබුණි. එතැන් සිට, තාවකාලිකව තහනමක් ඇති විය. 1976 සිට අද වනතුරු මරණීය දඬුවම තිබී නැත. නමුත් මරණ දඬුවම නීතියේ ඇත. ගැඹුරු සහ කල්පවතින බෞද්ධ සම්ප්‍රදායයක් ඇති රටක අවසානයේ රජයෙන් මිනිසුන් මැරීමේ අනුග්‍රහය සඳහටම නැවැත්වීමට මේ කාලය නොවේ ද?

බුද්ධ ධර්මය සමඟ අනුකූල වනු පිණිස මරණ දඬුවම අහෝසි කිරීම කුහකකමක් යැයි යමෙකුට කිවහැකිය. ශ්‍රී ලංකාව මසුන් මැරීමේ කර්මාන්ත ප්‍රවර්ධනය කරන බවත්, එසේම ලංකාව මත්පැන් අලෙවියෙන් සහ සූදුවෙන් හොඳ ආදායමක් ලබන බවත් ඒ අයට කිව හැකිය. ඊටත් වඩා ශ්‍රී ලංකාව විශේෂයෙන්ම, අවශ්‍ය වූ විට භාවිතයට ප්‍රචණ්ඩත්වය පුහුණු කළ හමුදාවක් නඩත්තු කරයි. "විචාරකයන් පවසන පරිදි ඔබ ගැළපෙන අයුරින් කටයුතු කරන්නට යන්නේ නම් රජය මේ සියලු දේවල් ඉවත දැමිය යුතු ය." මිනීමරුවන් කුඩා පිරිසක් නිසා විශාල කලබලයක් කරන්නේ ඇයි? බෞද්ධ පාරිශුද්ධිය ඉතා විශාල ප්‍රමාණයෙන් කඩ කරන දේ සම්බන්ධයෙන් අවධානය යොමු නොකරන්නේ ඇයි? "රජයක් මේ සියලු දෙයින්ම නිදහස් විය යුතු" යැයි විවේචකයන්ට කියන්නට හැකිය. මසුන් මැරීම හා මිනිසුන් මැරීම අතර වෙනස් ප්‍රභේදයක් ඇත. මස් මැරීමේ කර්මාන්තයෙන් සමාජයකට බොහෝ යහපත ඇතිවන අතර, මිනිසුන් මැරීමෙන් මේ කිසිවක් ලැබෙන්නේ නැත යන්න එවැනි විරෝධයන්ට දියහැකි ප්‍රතිචාරයයි. බුදුපියාණන් වහන්සේ පවා සතුන් මැරීම සහ මිනිසුන් මැරීම අතර මූලික වෙනසක් දුටුවහ. මිනීමැරීමක් කළ භික්ෂුවක් හෝ භික්ෂුණියක් සංඝයා අතුරින් නෙරපා දමනු ලබයි; නැවත

ඇතුළුවිය නොහැකිය, සතෙකු මැරීම බරපතළ දෙයකි, නමුත් මිනීමැරීමට වඩා අඩු බරපතළ වරදක් වන අතර, සංසයා ඉදිරියේ පාපෝච්චාරණය කිරීම අවශ්‍ය වේ. මත්පැන් සහ සූදුව තහනම් කිරීමෙන් දූෂණය වැඩි කරයි, ජාවාරම් වැඩි කරයි. බොහෝ රටවල් මෙයට උත්සාහ කර ඇති නමුත් සාර්ථක වී නැත. යථාර්ථය නම් සමහර පුද්ගලයන් සැමවිටම මත්පැන් බොන බව සහ සූදුවේ යෙදෙන බව පිළිගෙන, ඔවුන්ගේ ස්වාභාවික මට්ටමින් ඔබ්බට ප්‍රවර්ධනය පිණිස කටයුතු නොකිරීමයි. හමුදාවක්? ධර්මයට අනුකූලව කටයුතු කිරීමට රජයකට බොහෝ දේ ඇත, නමුත් සියලුම දේ නොවේ. තම හමුදාවන් අහෝසි කළ රටවල් 22ක් තිබෙන බව මතක් කිරීම වටී, ඒ කොස්තා රිකා, මොරීෂස්, ඩොමිනිකා, ග්‍රෙනඩා, අයිස්ලන්තය සහ පැනමා යන රටවල්ය. ඒවායින් බොහොමයක් ශ්‍රී ලංකාව වැනි කුඩා දූපත්ය.

මරණීය දණ්ඩනය තහනම් කිරීමෙන් රටක වැසියන්ට, තමන්ගේ රජය වඩාත් මානුෂික සහ කරුණාවන්ත සමාජයක් බිහිකිරීමට කටයුතු කරන බවට දැනගැනීමට ඉඩ සලස්වයි. අඩු තරමින් මේ ආකාරයට අනුකූලව කටයුතු කරන ජාතීන් සමඟ රට එක්ව ගමන් කරන බව පෙන්නුම් කරයි. එසේම එවිට, වෙනත් ලෙසකින් මිනීමැරුම් හා සම්බන්ධ නොවී නිදහස්ව සිටීමට සියලු දෙනාටම අවස්ථාව සැලසේ. එසේම, මරණීය දඬුවම නියමකරන විනිශ්චයකරුවන්, සැබෑවටම එල්ලා මරණ අලුගෝසුවා සහ ඔහුගේ සහායකයන්, කඹ සපයන වෙළෙඳුන්, එල්ලා මැරීම සිදුකරන ස්ථානයට පැමිණෙන දොස්තරවරුන් යනාදී ඒ පිළිකුල් සහගත රාජකාරීවලින් ඒ සියලුදෙනාම නිදහස් කළ හැකිය. එසේම එය අපරාධකරුවන්ට හරි මගට එමින් නැවත සමාජයට බලාපොරොත්තු වන පරිදි එක්වීමට අවස්ථාව ලබාදෙයි. සැබැවින්ම, එය අප ජීවත්වන විටදී අගය කරන ගුණාත්මක බව රඳවා ගැනීමට වඩා ප්‍රයෝජනවත් වේ.

# 23.සංකස්සයේ ප්‍රාතිහාර්යය : යථාවක් හෝ ප්‍රබන්ධයක්ද?

විස්මය දනවන දේවල් සහ ප්‍රාතිහාර්යය පෑම සම්බන්ධයෙන් ලෝකයේ බොහෝ ප්‍රධාන ආගමික ප්‍රාරම්භකයන්ට කීර්ති ප්‍රශංසා ලැබී ඇත. ජේසුතුමා ජලය මත ගමන් කළේය. මහමද්තුමා තටු සහිත අශ්වයකු වැනි සත්ත්වයකු පිට නැඟී පියාසර කළේය. හින්දු දෙවිවරු බොහෝ ප්‍රාතිහාර්යය පෑහ. මේ සියල්ල මෙන් සුවිශේෂ වූ ද අනෙක් සියලු ප්‍රාතිහාර්යයන්, බුදුන් වහන්සේ විසින් පානා ලද සංකස්සපුරයේ ප්‍රාතිහාර්යය අසලින් තැබූ විට වටිනාකමින් හීන වී යයි.

ශ්‍රී ලංකාවේ පැරණිතම විශාල සිතුවම් අතරින්, එක් ඉතාම ශෝභන නොවන නමුත් පොළොන්නරුවේ අගනා තිවංක පිළිම ගෙයි පිටිපස දකුණු බිත්තිය අලංකාර කර ඇත. එය සංකස්සයේ ප්‍රාතිහාර්යය නිරූපණය කරයි. පාලි අටුවාවන්ට අනුව, මෙම පුදුමාකාර සිද්ධිය එළිදරව් කළ ආකාරය මෙයයි. තව්තිසා දෙව්ලොව වැඩසිටින තම මවට අභිධර්ම පිටකය දේශනා කිරීමෙන් අනතුරුව බුදුපියාණන් වහන්සේට පෘථිවිය මතට නැවත ඒමට කාලය උදාවිය. සංකස්ස නගරයට ඒමට අඩුම තරමින් කිලෝ මීටර් එකක්වත් දිග ඇතැයි යෝජනා කරමින්, දෙවිවරුන්ට අධිපති ශක්‍ර, දිව්‍යමය සෝපාන වළාකුළුවලට උඩින් උපද්දවිය. මැද සෝපානය මුතු මැණික් වලින්ද, වම්පස සෝපානය රිදී සහ දකුණු පස සෝපානය රත්රන්වලින් ද නිමවා තිබුණි. බුදුපියාණන් වහන්සේ මහේශාක්‍ය ලීලාවෙන් සහ විභූතියෙන් මැද තිබූ ඉණිමඟක් වැනි සෝපානයෙන් පොළොව මතට වැඩිය අතර, බ්‍රහ්මයන් වම්පස සෝපානයෙන් උන්වහන්සේට උඩින් කුඩයක් ඔසවමින් පැමිණි අතර, ඊට පහළ මට්ටමේ දෙවිවරු දකුණු පස ද සිටියහ.

මෙම ආකර්ෂවත් සිද්ධිය ඇසින් දැකීමට යෝජනා හෙවත් යොදුන් 30ක් අවට (යෝජනා යනු වේදයේ දුර ප්‍රමාණය මනින ක්‍රමයයි. 1 යොදුනක කිලෝ මීටර් 12-15 අතර) මිනිසුන් එක්රැස්වූ බව අටුවාවේ වැඩිදුරටත් සටහන් වන අතර, එය ඔබට හොඳින්ම විශ්වාස කළහැකිය. ඔවුන් පළමු වරට දුටු ඉතාම පුදුමාකාර සහ ආකර්ෂණීය දෙය මෙය වන්නට ඇත, එසේම ඔවුන් පුදුමයෙන් නිරුත්තර වන්නට ද ඇත. එතැන් සිට, මෙම ප්‍රාතිහාර්යය, මූර්ති කලාව, චිත්‍ර සහ පද්‍යවලින් උපහාර දක්වමින් පවතී. ඒ සම්බන්ධයෙන් ගණන් නොකළ හැකි තරම් ධර්ම දේශනා තුළින් හෙළිකර ඇත, විස්තර කර ඇත. සැබැවින්ම බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ සිද්ධීන් ගැන මුල්ම

නිරූපණයන් අතරින් බලවත් භාරුට් ස්තූපය (ක්‍රි. පූ. 150/100) මූර්තියක් පැතිකඩයෙන් බාගයක් පමණ සඳහන් වන්නේ මෙම ප්‍රාතිහාර්යය පිළිබඳවයි.

කෙසේ නමුත් එය කෙතරම් පුදුමාකාර වූවත්, සංකස්සයේ ප්‍රාතිහාර්යය සම්බන්ධයෙන් නිසැකවම කුතුහලය දනවන කරුණු ස්වල්පයක් ඇත. පළමුවෙන්ම, බුදුපියාණන් වහන්සේ සංකස්සය වැනි අප්‍රකට නගරයක පහළට බැසීමට තීරණය කිරීම තේරුම් ගැනීම අපහසුයි. සංකස්සය ඉතා අප්‍රකට ප්‍රදේශයකි. සැබැවින්ම, මුළු ත්‍රිපිටකයේම සංකස්සය සම්බන්ධයෙන් සටහන් වී ඇත්තේ දෙවරක් පමණි. බුදුපියාණන් වහන්සේ එහි වැඩියේ එක් අවස්ථාවකදී පමණි. ඒ යම්කිසි ස්ථානයකට වඩින විට ඒ හරහා යාමයි. එවැනි පුදුමය දනවන සිද්ධියක් සාවත්තිය, රජගහ හෝ කොසඹෑ වැනි විශාල නගරයක විශාල ජන පිරිසක් අතරදී සිදුවූයේ නම්, වටින බවට යම් කෙනෙකුට සිතෙන්නට පුළුවන. නැවතත් චෛතසික බල දියුණු කළ භික්ෂුවක ප්‍රසිද්ධියේ ඒවා ප්‍රදර්ශනය නොකළ යුතු බවට බුදුපියාණන් වහන්සේ විනය පිටකයෙන් නීති පනවා තිබේ. එම නෛතික කඩකිරීම පුදුමයට කරුණක් ලෙස පෙනේ.පින්ඩෝල භික්ෂුව තමන්ගේ සෘද්ධි ප්‍රාතිහාර්ය බලය විශාල පිරිසක් ඉදිරිපස ප්‍රදර්ශනය කළවිට, බුදුපියාණන් වහන්සේ ඉතාම දැඩි භාෂිතයෙන් ඔහුට දෝෂාරෝපණය කළහ: "නුඹ මුස්පේත්තු කාසියක් වෙනුවෙන් තමාගේ වස්ත්‍රය ඔසවන ගණිකාවක වගෙයි." (Vin.11, 110-111)

සමහර විට මෙය ඊටත් වඩා පුදුම සහගත විය හැකිය. ත්‍රිපිටකයේ සඳහන් සියලුම සූත්‍ර වගේම, බුදුපියාණන් වහන්සේ එම සූත්‍ර දේශනාව සිදුකළ ස්ථානය සඳහන් පෙරවදනක් ඇත. ඒ ආකාරයට උදාහරණයක් වශයෙන්, හොඳින් දන්නා මංගල සූත්‍රය ආරම්භ වන්නේ, "මෙසේ සඳහන් කළ පරිදි මම මෙසේ ඇසුවෙමි: වරක් බුදුපියාණන් වහන්සේ ජේතවනයේ අනාථපිණ්ඩික ආරාමයේ, සිටිනා විට, ... ආදී වශයෙනි." බුදුපියාණන් වහන්සේ සංකස්සයට බැසීමට පෙර තව්තිසා දිව්‍ය, ලෝකයට වැඩ අභිධර්මයේ ග්‍රන්ථ හතම උගන්වා, අනතුරුව උන්වහන්සේගේ සියලු දේශනා ආනන්ද ස්වාමීන් වහන්සේට පැහැදිලි කළ ආකාරයටම, සාරිපුත්ත මහරහතන් වහන්සේට සජ්ඣායනය කළ බව අපි අසා ඇත්තෙමු. නමුත් පුදුමයට කරුණ නම්, අභිධර්ම පිටකයේ කිසිම තැනක අපි මෙම වචන අසා නැත්තෙමු; "මා විසින් මෙසේ අසා ඇත්තෙමි. වරක් බුදුපියාණන් වහන්සේ තව්තිසා දෙව්ලොව සිට වැඩ, සංකස්සයේ සිට... ආදී වශයෙන්" පෙර කී පරිදි, අභිධර්මයේ ඇති වැදගත් බව අනුව, එය ඉගැන්වූ ස්ථානය සහ ඊට පසුව සිදුවූ පුදුමාකාර ආශ්චර්යය සම්බන්ධයෙන් සටහන් කිරීම ස්වාභාවිකයි. නමුත් මේ සියලු දේ අතරින් ඉතාම පුදුමය මෙයයි --- මුළු ත්‍රිපිටකයේම, වෙළුම් 50කින් යුක්ත ඉංග්‍රීසි පරිවර්තනයේ ද, සංකස්සයේ ආශ්චර්යය පිළිබඳව

කිසිවක් නැත. නිකාය හතරේම නැත, ඛුද්දක නිකායේ ග්‍රන්ථ 15හිම නැත, විනය පිටකයේ නැත, යම් කිසිවකු යම් සටහනක් හරියටම දකින්නට බලාපොරොත්තු වන අභිධර්ම පිටකයේ ද නැත. මෙය මෙසේ වන්නේ ඇයි?

මෙම සම්භාව්‍ය? පුදුමාකාර අත්හැරීම සිදුවීමට බොහෝ හේතු දැක්විය හැකිය. පළමුවැන්න, ආනන්ද ස්වාමීන් වහන්සේට එය අමතක වී පසුව පළමුවන සංගායනාවේදී එය සඳහන් නොකිරීමයි. මෙම මතය අපට නිසැකවම ඉවත්කර ගත හැකිය. එවැනි විස්මයජනක සිද්ධියක් ඇසින් දුටුවකුට එය අමතක වීම විශ්වාස කළ නොහැකි බව පෙනේ. එසේම ආනන්ද ස්වාමීන් වහන්සේට අමතක වූවත්, පළමුවෙනි ධර්ම සංඝායනාවට සහභාගි වූ රහතුන් වහන්සේලාගෙන් අඩුතරමේ යම් පිරිසක් ස්ථිරවම ඒ පිළිබඳව අසා තිබෙන්නට ඇත, සමහරවිට එය ඇසින් දුටු ආනන්ද ස්වාමීන් වහන්සේට මතක් කරන්නට ඇත. තවත් වියහැකි හේතුවක් නම් ආශ්චර්යවත් සිද්ධිය පිළිබඳව සඳහන් වී තිබී, නොසැලකිලිමත් බව නිසා අහම්බෙන් නැතිවීමක් විය හැකිය, නැවතත්, මෙය විය නොහැකි යයි පෙනී යයි. බොහෝ සූත්‍ර දෙවරක්, තුන්වරක් හෝ සමහරවිට ඊටත් වඩා නැවත නැවත සටහන්වී ඇත. මෙවැනි ආශ්චර්යවත්, ආකර්ෂණීය සිද්ධියක් බොහෝ වාරයක් විස්තරාත්මකව සඳහන් කිරීම පුද්ගලයෙක් බලාපොරොත්තු වෙයි. පෙරකී ලෙස, සෑම සියලු විස්තරයක්ම නැතිවී ගියේ යයි සිතන්නට අපහසුය. ඒ නිසා අපි ඉතාම අවධානය ගන්නාවූ පැහැදිලි කිරීම ලෙස පෙනෙන නිගමනයට එළඹෙමු --- ඒ සංකස්සයේ ප්‍රාතිහාර්යය කිසිදිනක සිදුනොවූ බවට ඒ අය පසුකාලීනව, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසුව නිර්මාණය කරන ලද පුරාවෘත්තයක්, මනෝදෘෂ්ටියක් බවයි. මෙම පැහැදිලි කිරීම පිළිගත නොහැකි පුද්ගලයන්ට ඉතා ප්‍රබල සහ විස්මයජනක හාස්කමක්, පූජනීය ග්‍රන්ථවල සඳහන් කිරීමට නොහැකි වීම පිළිබඳ ප්‍රශ්නය පැහැදිලි කිරීමට ඉඩ තබමු.

කෙසේ වුව ද මෙම නිගමනය නිවැරදි නම්, සංකස්සපුර ප්‍රාතිහාර්යය, ලෝකය විද්‍යාවෙන් තොර වූ කාලයේ, භක්තිය හා විස්මය ඇති කිරීමේ අදහසින්, සිසිල් බී. ද මිල් (සිනමාකරුවා) නිර්මාණය කළ වර්ගයේ පුරාවෘත්තයක් වන්නේ නම්, බාගවිට එය කෙදිනක හෝ සිදු වී යයි පැවසීම නතර කිරීමට මෙය සුදුසු කාලයයි. මෙය නරක දෙයක් නොවිය හැකිය. සන්සුන්ව බැබළෙන, නමුත්, ඇදහිය නොහැකි පුරාවෘත්ත ඉවතලීමෙන්, බුද්ධ ධර්මයේ හරය ඇසීමට වඩාත් ඉඩකඩ සැලසිය යුතුයි. වටිනා ලෝහ වර්ග සහ මැණික්වලින් සෑදුණ ඉණිමං තුනක්, වරක් අහසේ වලාකුළු තුළින් මතුවී බුදුපියාණන් වහන්සේ සහ දෙවිවරුන් දූසිම් ගණන් පොළොවට බැස උතුරු

ඉන්දියාවේ අප්‍රකට නගරයකට වැඩිය බවට හොඳින් උගත් තරුණ පිරිසකට ඒත්තු ගැන්වීමට උත්සාහ කිරීම ඉතා අපහසු පාවාදීමකි.

ඊටත් වඩා බුද්ධාගම විද්‍යාත්මක යැයි හුදෙක් කිය කියා සිටියහොත්, තවදුරටත් සංකස්සයේ ප්‍රාතිහාර්යය සත්‍යය සිද්ධියකට වඩා පුරාවෘත්තයක් යැයි සැලකීම බුද්ධාගම දුර්වල කිරීමක් නොවිය හැකි අතර සැබැවින්ම ධර්මය ශක්තිමත් විය හැකිය. විශේෂයෙන්ම, පාලි ත්‍රිපිටකයේ සත්‍යය බව තහවුරු කිරීමේ ප්‍රශ්නයට අදාළව, සැබැවින්ම පාරම්පරික බෞද්ධයන් විශ්වාස කරන්නේ සූත්‍ර, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ නිවැරදි විස්තර බවත්, පළමුවෙනි සංගායනාවේදී සජ්ඣායනය කර, අදවන තුරුත් අත්හැරීමක් හෝ වැරැද්දක් නැතිව, පෙරට යන බවයි. බුද්ධාගමේ කිසිම ඉන්දියානු ඉතිහාසය, සාහිත්‍ය , දර්ශන විද්‍යාව, සහ සංස්කෘතිය පිළිබඳ විශේෂඥයන් හෝ උගතකු අද මෙය පිළිගන්නේ නැත. නිකායයන්හි හරවත් තොරතුරු, බුදුරදුන්ගේ කාලයේ සිට උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් අවුරුදු 100ක් හෝ සමහරවිට 150ක් අදාළ කාලය වියහැකි බව ඉතා හොඳින් තේරුම් ඇති පුද්ගලයෝ පවසති. එසේම මුල්කාලීන තොරතුරු ද බුදුපියාණන් වහන්සේගේ අදහස් පිළිබිඹු කරයි, එසේ නැත්නම් අනිවාර්යයෙන්ම උන්වහන්සේගේ නිශ්චිතම වචන, කෙසේ නමුත් ඇතැම් උගතුන්, ප්‍රධාන වශයෙන්ම කැලිෆෝනියානු විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ග්‍රෙගරි ෂොපේන් වැනි ඇමරිකානු විද්වතුන් කියා සිටින්නේ පළමුවන ශතවර්ෂවල මාරුවීමත් සමඟම මතුවූ සංස්කෘත සූත්‍රවලට වඩා පාලි ත්‍රිපිටකය පැරණි ලෙස සැලකිය නොහැකි බවයි. ෂොපේන්, බුදුපියාණන් වහන්සේ පිළිබඳ අධ්‍යයනයේ අතිදක්ෂ සහ බොහෝ අතිශය ඵල දරන විශේෂඥයෙකි. එසේම ඔහුගේ පිරික්සුමට භාජනය වූ කරුණ පිළිබඳව ඉතාම හොඳින් තර්ක කරයි. නමුත් පාලි සාහිත්‍ය පිළිබඳව උගතුන් ඔහුගේ තත්ත්වය අන්තවාදී ලෙස සලකන අතර, ඔහු හා ඔහු වැනි අනෙක් අයට බෞද්ධ අධ්‍යයනයන් පිළිබඳව බටහිර රටවල සැලකිය යුතු තරම් බලපෑමක් ඇත.

සංකස්සයේ ප්‍රාතිහාර්යය සමඟ මෙම විද්වත් විවාදය කරන්නට ඇත්තේ කුමක් ද? හොඳයි, ඇත්තෙන්ම බොහෝ දේවල් ඇත. මෙම ප්‍රාතිහාර්යය පිළිබඳව බොහෝ මහායාන සූත්‍ර සහ මුල්කාලීන බෞද්ධ සංස්කෘත සාහිත්‍යයේ විස්තර දක්වා ඇත. සැබවින්ම ජාතක පොත් ඇතුළුව පාලි අටුවාවල එය සඳහන්වී ඇත. ඒ නිසා ථේරවාද සම්ප්‍රදාය එය පිළිගෙන ඇති බව අපි දනිමු. අඩුතරමින් ක්‍රිස්තු පූර්ව 150/100 වනවිට බුදුපියාණන් වහන්සේගේ චරිත කථාවේ කොටසක් ලෙස මෙම ප්‍රාතිහාර්යය පුළුල් ලෙස සැලකිල්ලට ගෙන තිබූ බව අපි දනිමු. එයට හේතුව සාංචි, භාරුත් සහ මාතුරා යන ප්‍රදේශවල බිතුසිතුවම්වල එය නිරූපණය වී තිබීමයි. මේවායින්

ඉතාම අවධානය ගන්නා දෙය නම් අශෝක අධිරාජයා විසින් සංකස්සයේ ඉදිකරන ලද යෝධ ගල් කුලුනුයි. ඒවායේ නටබුන්වල, ඇත් හිස සමග තවමත් දකින්නට ඇත. එම කුලුනු මත ශිලා ලේඛන නැත. ඒ නිසා අශෝක අධිරාජයා එය ඉදිකිරීමට මෙම ස්ථානය තෝරා ගත්තේ කුමන හේතුවක් නිසා ද කියා නොදනී. නමුත්, තර්කයක් නොමැතිව, එසේ කළේ ප්‍රාතිහාර්යය සිහිපත් කිරීමට බව පෙනේ. ඔහු එය ඉදිකළේ කවදා ද කියාත් අපි නිසැකවම නොදනිමු. නමුත් ක්‍රිස්තු පූර්ව 258 දී පමණ --- ඔහු බුදුදහම වැලඳගත් කාලයේ දී බව සිතන්නට පුළුවන. බුදුපියාණන් වහන්සේ පිරිනිවන් පෑ දිනය මත පිහිටා සහ එම දිනය ක්‍රිස්තු පූර්ව 483 ලෙස ගෙන, මෙම ප්‍රාතිහාර්යය උන්වහන්සේගේ පරිනිර්වාණය සිදුවී වර්ෂ 250ක් තුළ සිදු වී යයි පුළුල් ලෙස ප්‍රචලිත වීම නිසා, සමහරවිට මෙය පූර්ණ සත්‍යයක් ලෙස සැලකීමට ඉඩ ඇත. එසේනම් එය පාලි ත්‍රිපිටකයේ සඳහන් නොවුණේ ඇයි? ථේරවාදීන් ඔවුන්ගේ පූජනීය ග්‍රන්ථවල එයට තැනක් නොදුන්නේ ඇයි?

මෙම ප්‍රශ්නයට මගේ සිතට ඉතාම අවධානය ගන්නා වූ පිළිතුර නම් ත්‍රිපිටකය ඒ වනවිටත් අවසාන කර තිබෙන්නට ඇති බවය. ත්‍රිපිටකය ඉතා පූජනීය වස්තුවක් ලෙස අලුතෙන් දෙයක් එකතු කිරීමට කිසිවකුට ධෛර්යක් නොතිබීමයි. අවුරුදු 250ක් පමණ කාලයක් තුළ සමහරවිට, ඊටත් ප්‍රථමයෙන් සංකස්සයේ ප්‍රාතිහාර්ය පිළිබඳව අවස්ථා වසා තිබුණු අතර, ඉක්මනින්ම වෙනත් බොහෝ ජනප්‍රවාදයන් ක්‍රමයෙන් ඇතිවන්නට පටන් ගත්තේය. ඒවා මුල්කාලීන බෞද්ධ සංස්කෘත සාහිත්‍යයට, මහායාන සූත්‍ර සහ පාලි අටුවාවලට ඇතුළත් කරගත් අතර, ත්‍රිපිටකයට ඇතුළත් කරගෙන නොමැත. එමනිසා සංකස්සයේ ප්‍රාතිහාර්යය පසුකාලයේ ජනප්‍රවාදයක් ලෙස සම්මතයට විරුද්ධව වර්ග කරමින්, ඒ අතර යම්කිසිවකු පාලි ත්‍රිපිටකය ක්‍රිස්තු පූර්ව 258 ට පෙර දින නියම කළයුතු බවට ප්‍රකාශ කරයි. ඒ අනුව, ත්‍රිපිටකය බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේ ගේ ධර්මය පිළිබඳව අප සතු පැරණිතම ලේඛනයයි.

# 24.පාලි ත්‍රිපිටකයේ ශෘංගාරය

සැබැවින්ම පාලි ත්‍රිපිටකයේ ලිංගිකත්වය පිළිබඳව ඇති සෑම සඳහනක්ම තද අප්‍රසාදයට ලක් වෙයි. කෙසේ නමුත්, මෘදු ලෙස ශෘංගාරය අඩංගු උද්ධෘත දෙකක් තිබෙන බව සඳහන් වේ. මෙයින් පළමු වැන්න, දීඝ නිකායේ සක්කපඤ්ඤ්හ සූත්‍රයේ ලිංගික ආදරය ආධ්‍යයාත්මික මුඳුන් පමුණුවා ගැනීම් සමඟ සසඳන සුවිශේෂ පැදි ඇතුළත් වේ. බුදුපියාණන් වහන්සේගේ දීර්ඝ දේශනා The long Discourses of the Buddha නමැති වොල්ශ් ගේ පරිවර්තනයෙන්මම එය නැවත ඉදිරිපත් කරමි.

හිරුඑළිය වන් පැහැබර තැනැත්තිය

මම ඔබට ප්‍රණාමය පුදමි,

මගේ හදවතට සතුට ගෙන එන ඔබ වැනි පැහැපත්

කාන්තාවකට පියා වූයේ කව්ද?

දහඩිය දමන කෙනෙකුට සතුට දනවන මඳ පවන සේ,

නැතහොත් පිපාසය ඇති කෙනෙකුට

සිසිල් පානයක් සේ, ඔබගේ ප්‍රභාවත් රූපශ්‍රීය

අර්හතුන්ට ධර්මය මෙන් මට ප්‍රියමනාප වේ.

රෝගී වූවකුට ඖෂධ මෙන් හෝ තවමත් කුසගින්නේ

පෙළෙන අයෙකුට පෝෂණය මෙන්, කරුණාවන්ත,

ප්‍රසන්න ආර්යාවනි, දැවෙමින් විනාශ වන මට,

සිසිල් ජලයෙන් නිදහස දෙන්න!

ග්‍රීෂ්ම සෘතුවේ උෂ්ණෙන් පීඩා විඳින ඇතෙකු
නෙළුම් මලේ පෙති සහ රේණු පාවෙන නෙළුම්-පොකුණක්
සොයයි; මමත් එසේම ඔබගේ
සෞම්‍ය තුරුලට කිමිදෙමි

හෙණ්ඩුවෙන් දිරිගන්වන ඇතෙකු හෙල්ල සහ
තෝමරවලින් ඇතිවන ඇනීම් තකන්නේ නැත.
එසේම, ඔබගේ ලස්සන රූපයෙන් මත් වූ මම,
මා කරන්නේ මොනවාද යන්න නොතකමි.

ඔබ නිසා මගේ හදවත තදින්ම බැඳීම්වලින් සිරවී ඇත.
මගේ සියලු සිතුවිලි මුළුමනින්ම වෙනස්වී ඇත, එසේම මට
මගේ පෙර ප්‍රගමනය තවදුරටත් සොයාගත නොහැක;
මා  බිලී කොක්කකට හසු වූ මාළුවකු වැනිය.

එන්න, පැහැපත් කලවා ඇති තරුණිය, මා වැලඳ ගන්න,
ඔබගේ අතිශය අලංකාර ඇස්වලින් මා ග්‍රහණය කර ගන්න,
අල්ලා ගන්න, මා වැලඳ ගන්න, මම ඉල්ලන්නේ එය පමණි.
අහෝ, සැලෙන කෙස් ඇති තරුණිය!
මුලදී මගේ ආශාව ස්වල්ප විය.
එහෙත් එය වේගයෙන් වැඩිණ,
රහතුන්ට ලැබෙන තිළිණ වැඩෙන සේ.

අරහතුන්ට පුදන
තිළිණවලින් මට ලැබෙන,
කවර පිනක් වේ නම්,
එය හොඳින් වැඩුණු විට,
මගේ ආදරිය, එය ඔබගේ තිළිණය වේවා!

ශාක්‍ය පුත්‍රයාණන්
ධ්‍යානයෙහි ගැලී අපේක්ෂාවෙන් හා
සවිඤ්ඤාණයෙන් අමරණීය අරමුණ
සොයන්නා සේ මම,
අපේක්ෂාවෙන් යුතුව
නුඹගේ ආදරය සොයමි,
මගේ සූර්යවච්චසාවනි!

පරම ඤාණය ලදහොත්
ප්‍රමෝදයට පත්වන මුනිවරයා සේ,
ඔබත් සමඟ එක්වූ විට සතුටට පත්වෙමි.

තිස්තුන් කෝටියක් දෙවිවරුනට
අධිපති සක්දෙවිඳුන්
මට වරමක් දුනහොත්,
මම යදින්නේ ඔබ ලබා ගැනීමටයි,
ඔබට මගේ  ඇති ආදරය ඉතා ශක්තිමත්ය!

තරුණිය, ඔබගේ පියා ඉතා බුද්ධිමත්, මම ඔහුට
වන්දනා කරමි. පැවත එන්නන් වෙනුවෙන්
ඉතා ලස්සන සහ සිත්කලු
හොඳින් මල් පිපෙන ගසක් මෙන්ය. (D.11, 265-7)

ශෘංගාරය ඇතුළත් කවිවල පද දෙවැනි එකතුව ජාතකයෙහි ඇතුළත් එක් කථාවකින් සොයාගෙන තිබේ. මෙම කථාව ඉතා සරල එකකි. බෝධිසත්වයන් වහන්සේ හිමාලයේ වැඩවිසූ තවුසෙකි. ඔහු විශේෂ පොකුණකට මූත්‍ර පිටකිරීම සිදුකළ අතර, බ්‍රහ්මචාරී වූ ඔහුගේ ශුක්‍රාණු ධාතු සමහරවිට මූත්‍ර සමග බැහැර විය. එක් දිනක් එක් මුවදෙනක් පොකුණක් වෙත පැමිණ පිපාසය සංසිඳවා ගත්තාය. ශුක්‍ර ධාතුවක් උකහාගෙන ඈ ගැබ්බර වී අවසානයේ පුතෙකු ප්‍රසූත කළාය. බෝධිසත්වයෝ එම දරුවාට ඉසිසිංග යන නම තබා හදාවඩා ගත්හ. දරුවා වැඩිවියට පත්වූ පසු, භාවනාව ප්‍රගුණ කර, පසුව අහස දෙස බැලුවොත් වලාකුළු වියළෙන්නට විය. අනපේක්ෂිතව සහ ඔහු විසින් එය සිදුකළ බව නොදැන ඉතා දරුණු නියඟයක් ඇති විය. තමාගේ වියළෙන භූමිය බේරාගැනීමට සියල්ල පරදුවට තැබූ රජතුමා ඉසිසිංග එයට වගකිව යුතු බව දැන, මෙයට කුමක් කළ යුතු ද? කියා ඉන්ද්‍ර ගෙන් උපදෙස් පැතුවේය. ඉසිසිංගගේ සුචරිතය විනාශ කර ඊට පසු ඔහුගේ භාවනාමය බලය රජුගේ දුව නාලිනිකා මගින් තරුණ භික්ෂුව කාමයට පොලඹවා ගන්නා ලෙස ඉන්ද්‍ර නිර්දේශ කළේය. නාලිනිකා ද බෝධිසත්ව ආරාමයේ නොමැති වේලාවේ ඉසිසිංග වෙත පැමිණියාය. මීට පෙර කාන්තාවක නොදුටු සහ සම්පූර්ණයෙන්ම අහිංසක වූ ඉසිසිංග නාලිනිකා තරුණයෙක් යැයි සිතුවේය. 1895 දී පාලි ග්‍රන්ථ සමිතිය වෙත ජාතක කථා පරිවර්තනය කළ එච්.ටී.ෆ්‍රැන්සිස්, කථාවේ ඊළඟ කොටසේ සිට පැදි, ඉතා අසැබි ලෙස සලකා නොපැකිළිවම ඒවා අතහැර ඇත. ඒවා ඉංග්‍රීසි බසට පරිවර්තනය කළ පළමු කථාව මෙය යැයි සිතමි.

ඉසිසිංග - ඔබගේ කලවය අතර තිබෙන්නේ මොනවා ද? මම ඔබෙන් අසන්නේ, කරුණාකර මට කියන්න. ඔබගේ පුරුෂලිංගය තිබෙන්නේ ඔබගේ ශරීරය ඇතුළේ ද?

නලිනිකා - මම මුල් සහ පලතුරු සොයමින් කැලයට ගිය විට එක් දරුණු වලහෙකු මට පහරදී මා වෙත පැන මගේ පුරුෂලිංගය හපා කෑවා. දැන් තුවාලය කසනවා සහ වේදනාවට පත්වෙනවා. ඒ නිසා මට කිසි දිනෙක

කිසිම සහනයක් නැහැ. සමහරවිට ඔබට මගේ එක කැසීමට ඇති පෙලඹවීම සංසිඳුවන්නට පුළුවනි. කරුණාකර බ්‍රාහ්මණයන්ට කළ හැකි දේ කරන්න.

කථාකරුවා - ඇයගේ බොරු, ඇත්ත සේ විශ්වාස කළ ඔහු, "එය ඔබට සහනයක් සලසන්නේ නම් මම එය කරමි" යි තුවාලය දෙස පරිස්සමෙන් බලා මෙසේ පැවසුවේයඃ

ඉසිසිංග - ඔබගේ තුවාලය රත්පැහැ වී ඇත, එය දරුණු ලෙස පෙනේ. එය ආසාදනය වී නැත, නමුත් එහි ගන්ධයක් ඇත. මම ඔබට බෙහෙතක් සූදානම් කරන්නම්. එවිට එය සම්පූර්ණයෙන්ම සුව වේවි.

නලිනිකා - බ්‍රාහ්මණ ශාක්‍යන් මන්ත්‍ර සහ බෙහෙත් අත්හදා නොබැලිය යුතුයි. කැසීම නැවතීම සඳහා එම නිසා ඔබගේම මෘදු පුරුෂලිංගය භාවිත නොකරන්නේ ඇයි? එවිට එය සම්පූර්ණයෙන්ම සුව වෙයි. (Ja. V. 197-8)

සිදුවන්නට ඇති දේ සිදුවෙයි. තරුණ තවුසා ඔහුගේ බ්‍රහ්මචාරී බව නැතිකර ගත්තේය. ඒ සමඟම ඔහුගේ ආධ්‍යාත්මික බලය නැති විය. වැස්ස පටන්ගත් අතර නලිනිකා වහා එතැනින් පලා ගියාය. වහාම ඉසිසිංගට ඔහුගේ රූමත් " තරුණයා" පිළිබඳව ආශාවක් ඇතිවී ඔහුගේ යුතුකම් පැහැර හැර ඇති බව දැක බෝධිසත්වයන් වහන්සේ තමන් වහන්සේගේ පුතාගෙන් හේතුව විමසුවේය. ඊළඟ පැදි 16 දී ඉසිසිංග තමාට මුණගැසුනණු "තරුණයා" පිළිබඳව විස්තර කර, එසේ කරන අතර නාරිමය රූපශ්‍රීය සහ ආභරණ සහ කාන්තාවන් ඇඳපැලැඳි වස්ත්‍ර පිළිබඳ පැරණි ඉන්දියානු මත සම්බන්ධයෙන් විස්තරාත්මක සහ මනබඳිනා සටහනක් තබයි. ඊට පසු ඉසිසිංග මෙසේ පවසයිඃ ඔහු වලහෙකු තුවාල කර ඇති අතර, ඔහු 'කරුණාකර මාව සුව කරන්න යයි කීවේය.", එවිට මම එය කළ අතර මාද සුවපත් වූයේ" යි පැවසුවේය. (Ja.V.204)

බෝධිසත්වයන් වහන්සේට සිදුවී ඇත්තේ කුමක් ද කියා හරියටම දැනගැනීමට තරම් ලෝක අවබෝධයක් තිබුණි. උන්වහන්සේ මින් ඉදිරියට එවැනි " තරුණයන්" මඟහරින ලෙස තම පුත්‍රයාට අනතුරු ඇඟවීමක් කළේය.

බුද්ධාගම දරුවන්ට හඳුන්වා දීමට ජාතක ඉතා හොඳ මඟක් බව බොහෝවිට කියා ඇත. සැබැවින්ම සමහර ජාතක කථා එසේ වන අතර, සියල්ල එසේ නොවේ.

# 25.ජේසුතුමා සහ බුදුපියාණන් වහන්සේ ගති ස්වභාවයෙන් එක හා සමාන ද? නැතහොත් සම්පූර්ණයෙන්ම වෙනස් ද ?

ඉතිහාසයේ වඩාත්ම බලපෑම් ඇතිකළ ආගමික ශාස්තෘවරයන් දෙදෙනා වූයේ බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා විය හැකිය. උන්වහන්සේලාගේ උගැන්වීම් භාවිතයේ යොදාගත් සංස්කෘතීන් කෙරෙහි එම උගැන්වීම් ගැඹුරු හා ධනාත්මක බලපෑමක් ඇති කළේය. මෑතක් වනතුරුම, දෙදෙනාගේම අනුගාමිකයන් සාමාන්‍යයෙන් කියා සිටියේ තමන්ගේ ආගම අද්විතීය බවත්, අනෙක් සියලු අයගේ ආගම් සමගින් පොදු වන්නේ අල්ප වශයෙන් බවත්ය. කතෝලික විශ්වකෝෂයේ බුදුදහම සම්බන්ධයෙන් විවේචන පෙළක්ම එකින් එක සඳහන් කර ඇත. මෙය එකක් පමණි. ”බුදුදහමේ ඇති තවත් බරපතළ අඩුපාඩුවක් වන්නේ එහි පවතින සදොස්, සර්ව අශුභවාදයයි. ජීවිතය ජීවත් වන්නට තරම් නොවටිනා එකක් ය යන දූෂිත දෘෂ්ටියට එරෙහිව ශක්තිමත් සහ සෞඛ්‍ය සම්පන්න මනස කැරලි ගසයි. බලාපොරොත්තුව සහ සතුට ඉස්මතු වී පෙනෙන ස්වරය රැගත් සොබාදහමේ හඬ විසින් හෙළා දකිනු ලබන බුදුදහම එයට මුහුණ දෙයි. බුදුදහමේ ඇති ඉහළම අභිලාෂය සියලුම ජීවීන් නිර්වාණය නමැති අසිහි නින්දට ගෙනගොස් ඒ පරිපූර්ණත්වය විනාශ කිරීමයි. ඒ නිසා බුදුදහම ස්වභාවධර්මයට විරුද්ධ ප්‍රධාන අපරාධයට වැරදිකරුවෙකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිසුන්ට අසාධාරණයක් සිදු කරයි.” අද කාලයේ එවැනි භාෂාවෙන් පළ කෙරෙන තක්සේරු පිළිබඳව බොහෝ මිනිසුන් මත පළ කිරීමට නැඹුරු වන්නේ අසහනයෙන් ය. අද දවසේ ඇත්ත වශයෙන්ම ඇතැමුන් විසින් විරුද්ධ අන්තය ලෙස සලකනු ලබන දෙය වෙත, මේ අවධාරණය ගමන් කර ඇත එනම්ඃ ආගම් දෙක එකිනෙක සමඟ පූර්ණ වශයෙන් සුසංයෝගී වන අතර, කිතුදහමට සවන් දුන් කල්හි, බුදුන් වහන්සේ එයට එකඟතාව පළ කරමින් හිස සලන්නට ඇතැයි යන්න ද, බුද්ධ ධර්මයට සවන් දීමෙන් අනතුරුව යේසුස් වහන්සේ ද එයම සිදු කරන්නට ඇත යන්න ද වේ. වර්තමානයේ අඩු තරමින් ඇතැම් කණ්ඩායම් අතර ඇති අලුත් මතය නම්, ”සැම ආගමක්ම එකමය” යන්න ය. ශුද්ධ බයිබලය සහ බෞද්ධ මූලාශ්‍ර හොඳින් පිරික්සා, බුදුපියාණන් වහන්සේගේ සහ ජේසුතුමාගේ සමාන කියමන් පිරික්සීම, සාමාන්‍යයෙන් ශාස්තෘන් වහන්සේලා දෙදෙනාම එකම සත්‍යයට මඟ පෙන්වූ බව ඔප්පු

කිරීම හෝ සමහරවිට බුදුදහම සමග සම්බන්ධ වීමෙන් ක්‍රිස්තියානි ධර්මයට බලපෑමක් ඇතිවූ බව පෙන්වීම හෝ ලේඛකයන්ගේ විනෝදාංශයක් බවට පත් වී ඇත. මේ සඳහා ප්‍රකටව දන්නා උදාහරණය වන්නේ, මාර්කස් බෝර්ග් ගේ "ජේසුතුමා සහ බුදුන් වහන්සේ: සමාන කියමන්" (Jesus) Buddha( The Parallel Sayings) රෝයි අමොර් ගේ "ශාස්තෘන් දෙදෙනෙක් එක් පණිවිඩයක්" (Two Masters One Message), ජෙසිකා ඩර්හැම් - ගොන්ඩර් ගේ බෙහෙවින් සරල ලෙස ලියන ලද "ජේසුතුමා, බුදුන් වහන්සේ සහ ආදරය" (Jesus" Buddha and Love) යන කෘතීන් ය.

පෙරදී ක්‍රිස්තියානු භක්තිකයකු ලෙස ද, අනතුරුව අවුරුදු 42ක් බෞද්ධ භික්ෂුවක ලෙස ද මම මෙවැනි පොත්වල සඳහන් අවසන් නිගමනයන් පිළිබඳව ව්‍යාකුලත්වයට පැමිණ ඇත්තෙමි. බොහෝ ආකාරවලින් බලන විට, මේ දෙදෙනා එකිනෙකට වෙනස් ආකල්පවලින් කටයුතු අරඹන බව ද, විවිධ උපකල්පනයන් නිර්මාණය කරන බව ද, එකිනෙකට වෙනස් දිශාවන් ඔස්සේ කටයුතු කරගෙන යන බවද, මේ විශිෂ්ට ගුරුවරුන් දෙදෙනාගේ ඉගැන්වීම් පිළිබඳව කියැවීමෙන් පමණක් යම් කෙනෙකුට දැකගත හැකි බව මට පෙනී යයි, එසේ පවසන අතරවාරයේ ඒ දෙදෙනා එක හා සමාන යැයි කීම සැනසිලිදායක විය හැකි නමුත් එය සත්‍යය කරුණු සමග නොගැළපෙයි, බුදුදහම ක්‍රිස්තියානි ධර්මය හා සමාන ය යන්න අවසානයේ සොයාගැනීමට මිනිසුන්ට වර්ෂ 2000ක් ගතවීම කෙතරම් කුතුහලය දනවන දෙයක් ද? "සියලු ආගම් එකම ය" යන මතයේ මූලාරම්භය ඇතිවූයේ අතීතයේදී ය යන සැකය මට ඇති වේ. ශතවර්ෂ ගණනාවක් ආගමික නොඉවසීම සහ අනන්‍ය සාධාරණය පිළිබඳව කියාපෑම් බොහෝ අවාසනාවන්ත තත්ත්ව ඇති වීමට හේතු වූ අතර, මුළුමනින්ම අවබෝධයෙන් මිනිසුන් මෙයට විරුද්ධව අප්‍රසාදය පළකර ඇත. නමුත් ආගමික එකඟතා පෝෂණය කිරීමට හොඳම ක්‍රමය සැම ආගමක්ම එකම යයි තදින් කියා සිටීම නොව, විවිධ ඇදහීම් අතර මිත්‍රත්වය සහ අවබෝධය වර්ධනය කිරීමයි. සැම කෙනෙකුම මිනිස් සංහතියේ සාමූහික සිතුවිලි, ආචාර ධර්ම සහ ආධ්‍යාත්මිකතාව වෙනුවෙන් සැපයූ අද්විතීය, සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව, සියලු ආගම් එකම ය කීමෙන් වසා දැමේ. තවදුරටත්, අනෙක් විශ්වාසයන් ඒ අයගේ ආගම හා හරියටම සමාන යයි ඔවුන්ට ඒත්තු ගන්වමින් ඔවුන් කියන දේ ඉවසා සිටීම එකම මග වූවොත්, එවිට අපගේ ඉවසීම විශ්වාසය තැබිය නොහැකි අත්තිවාරමක ගොඩ නැඟී ඇත. අපේක්ෂා සහගතව, වෙනස්කම් දැකීමට අප පරිණත විය යුතුයි, ඔවුන්ට ගෞරව කළ යුතුයි. කෙසේ නමුත් අප කරන ආකාරය සහ සැමවිටම කරන්නට ඉඩඇති ආකාරයට අනුව සමහර මිනිසුන් වෙනස් ආකාරයට සිතන බව පිළිගත යුතුයි.

ඒ අනුව බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා ගති ස්වාභාවයෙන් එක හා සමාන ද? නැතහොත් සම්පූර්ණයෙන්ම වෙනස් ද? අපි සමහර සාක්ෂි පිරික්සා බලමු. එම පරීක්ෂණය ඇරඹීම සඳහා සුදුසු ස්ථානය වන්නේ මේ මිනිසුන් දෙදෙනාගේ ජීවිතයි. දෙදෙනාටම නිවෙස් අහිමි වෙයි, දෙදෙනාම ඔබමොබ යමින් සිටින ගුරුවරුයි, දෙදෙනාම තමන්ගේ අදහස් තේරුම් කර දීම සඳහා උපමා සහ කථාන්දර භාවිතයේ නිපුණ වූහ. බුදුවරුන්ගේ පරම්පරාවේ වඩාත් මෑතකදී බුද්ධත්වයට පත්වූ බුදුවරයා ලෙස බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේ දුටුවහ. එසේම ජේසුතුමා, තමා පැරණි උතුම් යුදෙව් ශාස්තෘවරයාගේ අනුප්‍රාප්තිකයා වශයෙන් විශ්වාස කළේය. දෙදෙනාම වෙන් වෙන් වශයෙන් තමන් වෙත ශ්‍රාවක සමූහයක් ආකර්ෂණය කරගනිමින් තමන් වහන්සේලාගේ ආගම් පැතිරවීමට ඉදිරියට යැවූහ. උන්වහන්සේලා දෙදෙනාටම විශේෂයෙන් ආදරය කළ ශ්‍රාවකයෝ වූහ. ජේසුතුමාට ආදරය කළ බව කියන නමක් නැති (ජෝන් 21:20) තරුණයෙකු සිටි අතර, බුදුපියාණන් වහන්සේට ද තමන් වහන්සේගේ ඥාති සහෝදර ආනන්ද සිටියේය. අවසාන රාත්‍රී භෝජනයේදී නමක් නැති ශ්‍රාවකයා ඔහුගේ හිස ජේසුතුමාගේ උකුළ මත තැබූ අතර, ආනන්ද හිමියෝ, බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වන බව අවබෝධ කරගෙන ඉකි බින්දේය. ආනන්දගේ ශෝකය දැක බුදුපියාණන් වහන්සේ ඔහුට කථා කර, මේ වචනවලින් ඔහු සැනසූ සේකඃ "ඔබ බොහෝ කාලයක් තථාගතයන් වහන්සේ සමඟ සිට, ආදරණීයව ක්‍රියා කළා, වචනයෙන් ක්‍රියා කළා. සිතින් ක්‍රියා කළා." මේ සම්බන්ධතා දෙකම අවධාරණය කරන්නේ නිතරම නොසලකා හරින කරුණක් වූ බුද්ධත්වය ලැබූවකු හෝ අභිෂේකය ලැබූවකු ඔවුන්ගේ චිත්තවේගී සමීපතා අත්හැර දැමීම අනවශ්‍යය බවයි.

සැලකිල්ලට ගත යුතුයි, බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා එකම සමාන ඉරණමකට තමන් වහන්සේලාගේ මරණින් පසු සමාන ඉරණමකට මුහුණ දුන් අතර අවසානයේ දෙදෙනාම, දේවත්වයට පත් කරනු ලැබූහ. එක් භික්ෂුවක උන්වහන්සේගේ කායික ස්වරූපය කෙරෙහි කුල්මත් වී සිටින බව අනාවරණය වීමෙන්, බුදුපියාණන් වහන්සේ ඔහුට අවවාද කළහ. "ඇයි ඔබට මගේ මේ කිලිටි ශරීරය දකින්නට අවශ්‍ය? ධර්මය දකින්න, එවිට ඔබට මා දැකිය හැකි ය." මෙසේ තිබියදීත්, තුන්වන ධර්ම සංගායනාවට සහභාගි වූ සමහර පුද්ගලයෝ, බුදුපියාණන් වහන්සේගේ මලපහ පවා සුවඳ බවත් කියමින් උන්වහන්සේගේ පරිපූර්ණ බව ප්‍රකාශ කළහ. බුදුපියාණන් වහන්සේ ලෝකය ආරම්භයේ සිටම ජීවත්ව සිටි බව මුල්ම මහායාන සද්ධර්මපුණ්ඩරික සූත්‍රයේ (පළමුවන ශතවර්ෂයේ දී පමණ) හඟවා ඇත. ජේසුතුමා ද එසේම ඔසවා තබා ඇත. "යම් කිසිවෙකු හොඳ ගුරුවරයා ලෙස ඔහුට ආමන්ත්‍රණය කළ විට, ජේසුතුමා වහාම ඔවුන් නිවැරදි කර ඇත. "ඇයි ඔබ මා හොඳයි

කියා අමතන්නේ? දෙවියන් වහන්සේ හැර කිසිම කෙනෙක් හොඳ නැත." (ලූක් 18, 19) එතුමා මෙසේ ද කීවේය: "පියතුමා මට වඩා ඉහළයි." (ජෝන් 14.28), ඔහු හා දෙවියන් වහන්සේ අතර පැහැදිලි වෙනසක් ඇත. එවැනි මත පළකර තිබුණ ද, ජේසුතුමාගේ මරණයෙන් අවුරුදු 20ක් තුළදී ශාන්ත පාවුළුතුමා ජීවන විටත්, ජේසුතුමා දෙවියන් වහන්සේ මනුෂ්‍යම වේශයෙන් පෙනී සිටීමක් බව කියා සිටියේය. ජේසුතුමා සැබැවින්ම මෙම කීම එතුමාට කියා තිබේ ද යන්න විවෘත ප්‍රශ්නයකි, අඩුම තරමින් ශාස්ත්‍රීය විද්වතුන් අතරින් පෙන්වා දෙන්නේ ජෝන්ගේ කිතුනු දහමේ පමණක්, තමා මිනිස් බව ඉක්මවූ කෙනෙකු බව විස්තර කර ඇති බවයි. පෙනෙන ආකාරයට තමාගේ දේවත්වය මැතිව්, මාක් සහ ලූක්ට විස්තර කිරීම අනවශ්‍ය යයි ඔහු සිතන්නට ඇත.

මෙම සමානකම්වලින් ඔබ්බට මේ දෙදෙනාගේ ජීවිතයේ අනෙක් කරුණු, මෙහෙවර සහ බලපෑම් වෙනස් වෙයි. බුදුපියාණන් වහන්සේ රදල පන්තියක පවුලකින් පැවත ආ අතර, ජේසුතුමා නිහතමානී පරිසරයක උපත ලැබූවෙකි. ජේසුතුමා කිසි දිනක විවාහ නොවීය. බුදුපියාණන් වහන්සේ සමහරවිට වසර 20 දී ස්වාමිපුරුෂයකු වූ සහ කෙටි කාලයකට නිවසේ පියෙකු වූ අතර, පසුකාලීනව බොහෝ කාලයක් ඔහුගේ පුතා සාමණේර භික්ෂුවක් විය. බුදුපියාණන් වහන්සේ බුද්ධිමතුන්ගේ පටන් මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට, ගොවීන්ට ආදී වශයෙන් සැම දෙනාටම ඉගැන්වූ සේක. ජේසුතුමා ප්‍රධාන වශයෙන් ඔහුගේ පණිවුඩය සරල පොදු ජනතාවට එල්ල කළ අතර, එතුමා "පොඩි දරුවන්" මෙන් වන්නට යයි ඔවුන්ට අවවාද කළේය. (මැතිව්ස් 18.3) බුදුපියාණන් වහන්සේ විශේෂ අවධානයක් තමන් වහන්සේගේ වංශයේ අයට නොදැක්වූ අතර, සියලු ගෝත්‍රවලට, කුලවලට සහ පන්තිවලට අවධානය යොමු කළහ. ජේසුතුමා තමා, දෙවියන් වහන්සේගේ තෝරා ගත් මිනිසුන් වෙත "ඊශ්‍රායලයේ නැති වූ බැටළුවා වෙත පමණක් යැවූ බව" විශ්වාස කළේය. (මැතිව්ස් 10,5-6; 15.24) ජේසුතුමාගේ ක්‍රිස්තු ධර්මය යුදෙව් පූජකයන්ගේ ධර්මය හා සසඳන විට අසාමාන්‍යයි. සැබැවින්ම, ඔහු ඔවුන් සමඟ පෞද්ගලික මට්ටමෙන් වුව ද අසාමාන්‍ය ලෙස සිටියේය. ඔහු ඔවුන්ට "නරක", "කුහක" සහ "පොළොං පැටව්" යනුවෙන් මුහුණට මුහුණලාම ඇමතුවේය. (මැතිව් 23-33) මිත්‍රත්වයක් ඇති කරන්නට එම වචන හරියටම සැලසුම් වී නැත. එසේම දේවස්ථානයෙන් පිටට මුදල් මාරු කරන්නන් පලවා හරින විට, සමහර වේලාවට ඔහුගේ තරහ, භක්තිය නැතිකම නිසා කායිකව විද්‍යමාන වූ බව ඔහු විශ්වාස කළේය. බුදුපියාණන් වහන්සේ බොහෝ විට උන්වහන්සේගේ ධර්මය බ්‍රාහ්මණයන්, හින්දු පූජකයන් හා සමඟ සසඳා බැලූ සේක. නමුත් උන්වහන්සේ ඔවුන් සමඟ මිත්‍රශීලී සාකච්ඡාවලට සම්බන්ධ කරගැනීමට සූදානම් වූ අතර, උන්වහන්සේගේ ඒ අය පිළිබඳ

විවේචන මැන බැලූ අතර, ඒවා මැඩපවත්වා ද ගත්හ. එකම වරක් උන්වහන්සේ දැඩි භාෂාවෙන් කථා කළේ දේවදත්ත සංඝයා පාලනය කරන්නට උත්සාහ කළ අවස්ථාවේදීය. උන්වහන්සේ දේවදත්තට මෙසේ පැවසූහ: "කෙළ මෙන් කහිමින් පිටකළ යුතු කාලකණ්ණියා (ඛේලපකස්ස)".

බුදුපියාණන් වහන්සේ සාපේක්ෂව, දේශපාලනයෙන් නිදහස් වූ මෙහෙයවීමක් පැවති සන්සුන් කාලයක ජීවත් වූහ. නමුත් ජේසුතුමාගේ මෙහෙවර සිදුවන කාලයේ ගැලවිය නොහැකි ලෙස ප්‍රචණ්ඩත්වයට නැඹුරු දේශපාලන වාතාවරණයක් පැවතුණි. ජේසුතුමා යුදෙව් ජාතිකයෙකු වූ අතර, ඔවුහු පලස්තීනය දෙවියන් විසින් ඔවුන්ට පොරොන්දු වූ පූජනීය භූමියක් ලෙස සැලකූහ. රෝමානු ජාතිකයන් මෙම භූමියේ පදිංචි වූ නිසා, ඔවුන් කෙරෙහි නොරිස්සුම සහ විරෝධය පෑම, ආගම සහ දේශපාලනය වෙන්කළ නොහැකි බවක් දැනෙන්නට විය. ඒ නිසාවෙන් අදහස් කර හෝ නොකර ජේසුතුමාගේ ඉගැන්වීම්, ආගමික සහ දේශපාලනමය බලය අතර ප්‍රකෝපය ඇති කළ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු පූජකයකු බවට පත්වී වසර 2ක් හෝ සමහර විට 3ක් අතර එල්ලා මරනු ලැබුණි. බුදුපියාණන් වහන්සේ ගේ ඉගැන්වීම් නිසැකවම පවතින තත්ත්වයට අභියෝගයක් වූ නමුත්, දැඩි ලෙස ක්‍රියා කිරීමට තරම් ප්‍රකෝපයක් ඇති නොවුණි. උන්වහන්සේ සන්සුන්ව වයස 80 දී පරිනිර්වාණයට පත් වූ සේක.

ජේසුතුමාගේ පෙනුම පිළිබඳව කිසිම ආකාරයක තොරතුරක් නැත. නිසැකයෙන්ම බටහිර ආකාරයට සාමාන්‍යයෙන් ඔහු නිරූපණය කර ඇත. අනික් අතට, ඔහු සැබැවින්ම සැමිටික් ජනවර්ගයකට අයත් වූ අතර, එම නිසා සමහරවිට ඔහුගේ සම අඳුරු පැහැති වර්ණයකින් යුක්ත විය. සැම විටම ඔහු නිරූපණය කර තිබුණේ දිගු කෙස් තිබෙන ආකාරයට වුව ද, ශුද්ධ බයිබලයේ සඳහන් කර ඇති පරිදි "ස්වාභාවධර්මය පවා කියන්නේ දිගු කෙස් ඇති මිනිසකු අපකීර්තියක් බවයි. (1 කොරින්තියන්ස් 11.14) ඔහුට සැබැවින්ම සහ සම්පූර්ණයෙන්ම කෙටි කෙස් තිබුණි. ඔහු ඇමතුවේ "පව් උසුලන්නා" ලෙසයි. (පීටර් 2:24) එසේම ඔහු "සන්තාපයේ මිනිසා" සමඟ සමකර ඇත. (වීර් ඩොලරම්, ඉසයිආ 53,3) පෙර කී ලෙස, ජේසුතුමා කිසි දිනක සිනා නොවූ බව බොහෝ මුල් කාලීන ක්‍රිස්තියානි මූලාශ්‍ර සටහන් කිරීම පුදුමයක් නොවේ.

ගාන්ධාර මූර්ති කලාවේ හැර (2-5 ශතවර්ෂවලදී) බුදුපියාණන් වහන්සේ නිරූපණය කර ඇත්තේ සාමාන්‍යයෙන් තාත්වික ස්වභාවයට වඩා ශෛලීගත ක්‍රමයටයි. අදටත් උන්වහන්සේගේ පරිනිර්වාණය නිරූපණය කර ඇත්තේ වයස 25 හෝ 30 උපරිම පෙනුමකින් වුවත්, උන්වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ වියපත් මිනිසකු ලෙස බව අපි දනිමු. නමුත් විශ්වාස පසෙක තබා,

බුදුපියාණන් වහන්සේගේ කායික පෙනුම පිළිබඳව බොහෝ වැදගත් තොරතුරු රාශියක් ත්‍රිපිටකයේ සඳහන් වේ. උන්වහන්සේ ආකර්ෂණීය ලෙස කඩවසම් වූ බාල සුළු-සහෝදර නන්දට වඩා සෙන්ටිමීටර් අටක් වැඩියෙන් උස බව විනය පිටකයේ සටහන් වේ. මිනිස්සු නන්ද දුරින් දකින විට ඔහු බොහෝ සෙයින් බුදුපියාණන් වහන්සේ යැයි වැරදි ලෙස හඳුනා ගත්හ. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේම විස්තරයකට අනුව, ගිහි ගෙය අත්හැරීමට පෙර තරුණ වියේදී, උන්වහන්සේට දිගු කළු කෙස් කලඹක් සහ රැවුළක් තිබී ඇත.

බුදුපියාණන් වහන්සේ ගේ පිළිම සැම විටම කෙස් සමඟ පෙනෙන්නට තිබුණත්, එය චිත්‍ර - රූප චාරිත්‍රයක් වන අතර, ඓතිහාසික වශයෙන් නිවැරදි නොවේ. උන්වහන්සේ ගේ අභිනිෂ්ක්‍රමණයෙන් පසු අනෙක් සියලු භික්ෂූන් මෙන්ම, උන්වහන්සේ "කෙස් රැවුල් කපා ඉවත්" කළ අතර, උන්වහන්සේගේ හිස් කබල සහ මුහුණ අනෙක් සියලු භික්ෂූන් කළ ආකාරයටම මුඩු කළ බවට සැකයක් තිබීමට හේතුවක් නැත. බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම හොඳ පෙනුමකින් හෙබි බවට සියලු මූලාශ්‍ර එකඟ වෙයි. සෝණදණ්ඩ උන්වහන්සේ පිළිබඳව මෙසේ විස්තර කළේය: "කඩවසම්, ශෝභන පෙනුම, දකින්නට ප්‍රිය, හොඳ සමේ වර්ණය සහ රූමත් රූපය සහ මුහුණේ පෙනුම". මෙම ස්වාභාවික ප්‍රසන්න පෙනුම උන්වහන්සේගේ ගැඹුරු, අභ්‍යන්තර සන්සුන් බවින් තවදුරටත් වැඩි විය. තවත් සාක්ෂි දරන්නකු වන, දෝන මෙසේ පැවසුවේය: "ඔහු සුන්දරත්වයෙන් යුක්ත, විශ්වාසය ඇති කරවනසුලු, සන්සුන්, තැන්පත්, ආත්ම ගෞරවයෙන් යුතු, හික්මවූ ඇතකුගේ අභිමානය සහ පෙනුම " ඇති කෙනෙකි. උන්වහන්සේ ගේ සමෙහි ප්‍රභාව සම්බන්ධයෙන් තවත් නිරීක්ෂකයෙක් අවධානයට ලක් කළේය: "යහපත් ගෝතමගේ පෙනුම චමත්කාරජනකයි, සැබැවින්ම විශිෂ්ටයි, කෙතරම් ශාන්ත ද? උන්වහන්සේගේ සමෙහි ස්වාභාවික වර්ණය කෙතරම් පැහැදිලි ද? ප්‍රභාවත් ද? සරත් කාලයේ රන්වන් ජුජුබේ පලතුරු වාගේම පැහැදිලි ය, ප්‍රභාවත් ය, ඒ වාගේමයි, යහපත් ගෝතමගේ සමෙහි ස්වාභාවික වර්ණය."

කෙසේ නමුත් අනික් අය වාගේම බුදුපියාණන් වහන්සේගේ පෙනුමත්, වයසත් සමඟ දුර්වල විය. ආනන්ද ස්වාමීන් වහන්සේ උන්වහන්සේගේ මහලු විය මෙසේ විස්තර කළහ: "බුදුපියාණන් වහන්සේගේ සම තවදුරටත් නිර්මල නැත. දීප්තිමත් නැත, උන්වහන්සේ ගේ අවයව දුබලයි, රැලි වැටී ඇත, ශරීරය පහතට නැමී ඇති අතර, උන්වහන්සේගේ ඉන්ද්‍රියයන් වෙනස් වී ඇත." ජීවිතයේ අවසාන මාසවලදී උන්වහන්සේ තමන් වහන්සේ පිළිබඳව මෙසේ පැවසූහ: "මම දැන් වයස්ගතව, විඩාපත්ව, ජීවන ගමන්මාර්ගයේ ගමන් කළ අයෙකුව සිටිමි. 80 වැනි වියෙහි පසු වන මම ජීවිතයේ අවසානයට

එළඹෙමින් සිටිමි. පරණ කරත්තයක් ඉදිරියට ගෙන යා හැක්කේ තාවකාලික පිරියම් කිරීමෙන් පමණක් මෙන්ම, මගේ ශරීරයත් ඉදිරියට ගෙන යා හැක්කේ තාවකාලික පිරියම් කිරීමෙන් පමණයි." (D.11,100)

ජේසුතුමාගේ සහ බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ක්‍රම, උන්වහන්සේලාගේ අදාළ පුද්ගල විශේෂතාවන් සහ පසුබිම්, අඩු තරමින් යම්තම් හෝ දැකීමක් ඇතිකර ගන්නට අපට උපකාරී වේ. ශුද්ධ බයිබලයෙහි නව තෙස්තමේන්තුවේ මුල් කොටස් තුනෙහි දැක්වෙන හතළිහක් පමණ වන උපමා කථා ජේසුස් වහන්සේ විසින් කියන ලදැයි සලකනු ලබන්නේ ඇතැම් විට උපදේශාත්මක ප්‍රකාශන යයි සලකන දෑ සැලකිල්ලට නොගෙන ය. ජෝන්ගේ හතරවන ශුභාරංචියේ උපමාකථා නැත, නැවතත් එහි දින පසුවීම හඟවා ඇත. ජේසුතුමාගේ උපමාකථා ප්‍රබෝධවත්ය, අතිශයෙන් නිර්මාණශීලී ය, අමතක නොවන සුලු සහ ඔහුගේ පණිවුඩවල ඉතාම ගෞරවනීය කොටස්ය. බුදුපියාණන් වහන්සේ භාවිත කළ උපමාකථා කිසිම කෙනෙකු කිසිම දිනක සැලකිල්ලට ගත් බවක් පැහැදිලි නොවේ; නමුත් නිසැකවම අඩුම තරමේ ඒවා සියගණන් ඇත. ජේසුතුමාගේ ඒවා මෙන්ම, ඒවා බොහොමයක්ම ස්වාභාවික, අදාළ සහ අමතක නොවන ඒවායි. නමුත් මේ දෙක අතර වැදගත් වෙනස්කම් ඇත. උදාහරණ වශයෙන්, ජේසුතුමාගේ උපමාකථා ඔහුගේ ඉගැන්වීම් මෙන්ම සම්පූර්ණයෙන්ම හාස්‍යයෙන් බැහැරව ඇත. ඊට ප්‍රතිවිරෝධීව, බුදුපියාණන් වහන්සේ ගේ උපමාකථා, විශේෂයෙන්ම සිනාවක් ඇති කිරීමට, එසේ නැත්නම් ස්වල්ප වශයෙන් මැඩගත් සිනාවක් ඇති කිරීමට අදහස් කර ඇත. උදාහරණ වශයෙන්, සම්මා සංකප්පය නොමැතිව රහත් ඵලය ලැබීමට උත්සාහ කිරීම, එළදෙනකගෙන් කිරි දෙවීමට ඇගේ අංවලින් ඇදීම හා සමාන යයි උන්වහන්සේ පැවසූහ. එකිනෙකට නොගැළපෙනනා වූ දේවල් වන නමුත්, සබඳකමක් ඇති කරුණු දෙකක් එක් කිරීම මඟින් හාස්‍යමය ප්‍රතිඵලයක් ඇති කරවීමේ ජනප්‍රිය ශිල්ප ක්‍රමය පිළිබඳව මෙය හොඳ උදාහරණයකි.

තවත් සිත්ගන්නා සුලු ප්‍රභේද ඇත. ජේසුතුමාගේ උපමාකථා බොහොමයක්ම අනාවරණය වන්නේ සරල ජන ජීවිතවලිනි. ගොවි, බේකරි, වල් නෙළීම, පලතුරු ගස් සහ අස්වැන්න, වඩු වැඩ, අවංක සේවකයන්, මිදි වගාකරුවන්, නැති වූ බැටළුවකු සොයන ගොපල්ලා, කිසිසේත් නොවටිනා කාසියක් ලබාගැනීමට උත්සාහ කරන දුප්පත් ගැහැනියක, මාළු දැල් අදින මස් මරන්නන් ආදියයි. එවැනි උපමාකථා ජේසුතුමාගේ නිහතමානී පසුබිම හඟවයි. එසේම ඔහු ආමන්ත්‍රණය කළ නිහතමානී මිනිසුන්ට විශේෂයෙන්ම වැදගත්ය. බුදුපියාණන් වහන්සේගේ උපමාකථා, සම්පූර්ණයෙන්ම ඉහළම සිට වඩාත් ලෞකික ජීවිතයේ සැම කරුණකටම පුළුල් දැනුමක් ප්‍රත්‍යාවේක්ෂණය

කරයි. රාජකීයත්වයට අයත් උදාර තේමාවක වන, රජකුමරකුගේ අධ්‍යාපනය, යුක්තිය පසිඳලීමේ කාර්යය, රාජකීය මුළුතැන්ගෙයි වැඩකටයුතු, රජතුමාගේ මංගල රථය, රාජකීය මංගල හස්තියා යනාදිය පිළිබඳ උපමාකථා උන්වහන්සේ නිතර භාවිත කළ බව ඉතා පහසුවෙන් දැකගත හැකි ය. බුදුපියාණන් වහන්සේගේ වංශාධිපති පසුබිම සහ අධ්‍යාපනය මෙයින් නිසැකවම පිළිබිඹු වෙයි. නමුත් බොහෝ උපමාකථා, සාමාන්‍ය ජනතාවගේ ජීවිත සහ ජීවත්වීම සඳහා ඔවුන් දරන දුෂ්කර ප්‍රයත්නයන් පිළිබඳ තියුණු නිරීක්ෂණයක් පෙන්නුම් කරයි. එක් දේශනාවකදී උන්වහන්සේ යපස්වලින් රත්රන් නිස්සාරණය කිරීමේ ක්‍රියාවලිය සමඟ මනස හික්මවීමේ සහ පිරිසිදු කිරීමේ ක්‍රියාවලිය සැසඳූහ; එය ගැරීම, වැලි සහ වැලි කැටවලින් වෙන් කිරීම, යපස් උණු කර ලෝහ ලබාගැනීම, ඊට පසු ලෝහය සෑදීම; බුදුපියාණන් වහන්සේ එවැනි වැඩ පිළිබඳව හොඳින් දන්නා බව, එම විස්තරවල නිරවද්‍යතාවෙන් පෙනේ. බුදුපියාණන් වහන්සේගේ වෙනත් උපමාකථා අතර, ස්වාභාව ධර්මයේ මූලද්‍රව්‍යය, පැළෑටි, සතුන් සහ ඔවුන්ගේ හැසිරීම් ආදිය ඇතුළත් වන අතර උන්වහන්සේ කැලෑවල හුදෙකලාවේ ගතකළ කාල ප්‍රමාණය කෙතරම් ද යන්න සැකයක් නැතිව පිළිබිඹු කරයි.

නමුත් උපමාකථාවල ඉතාම වැදගත් වෙනස නම් ඒවායේ අරමුණයි. ජේසුතුමා ඉගැන්වීම්වලදී උපමාකථා භාවිත කළේ ඇයිද කියා එතුමාගේ ශ්‍රාවකයන් ඇසූ විට ඔහු මෙසේ පිළිතුරු දුන්නේය: "ස්වර්ග රාජ්‍යයේ රහස් පිළිබඳව දැනුම මම ඔබට ලබාදී ඇත්තෙමි, නමුත් ඔවුන්ට නොවේ, තිබෙන ඕනෑම කෙනෙකුට තවත් දෙමි, එසේම ඔහුට බහුලව ලැබේවි, නැති ඕනෑම කෙනෙකුට ඔහුට තිබෙන දෙයිනුත් තවත් ගනීවි. මම ඔවුන්ට උපමාකථාවලින් අමතන්නේ ඒ නිසයි; පෙනෙන නමුත් ඔවුන් නොදකී; ඇසෙන නමුත් ඔවුන්ට ඇසෙන්නේ නැත හෝ අවබෝධ නොවේ" (මැතිව් 13,10-17). මෙයින් ජේසුතුමා අදහස් කළේ කුමක් ද කියා කොහෙත්ම පැහැදිලි නැත. නමුත් ඔහුගේ උපමාකථාවල අරමුණ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔවුන්ගෙන් සැඟවීමට හෝ අප්‍රකට කිරීමට බව කීමට යැයි හැඟේ. ඒ තෝරාගත් කණ්ඩායමක්, ඔහුගේ දූතයන් පමණක් එයට රහස්‍යවූ අය වෙති. බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසූ විට, පිළිතුරු දීමට පෙර බුදුපියාණන් වහන්සේ බොහෝ විට මෙසේ පවසන සේක: "මම ඔබට උපමාවක් කියන්නම්, එයට හේතුව, සමහර උද්‍යෝගිමත් මිනිස්සු උපමාවකින් කියූ විට වඩා හොඳට තේරුම් ගනිති." (S.11. 114) බුදුපියාණන් වහන්සේ තමන් වහන්සේගේ අදහස් වඩාත් පැහැදිලි සහ තේරුම් ගැන්වීම සඳහා පැහැදිලිව උපමාකථා භාවිත කළහ.

සදාචාරය පිළිබඳව බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා බොහෝ මත පළ කර ඇති අතර, නමුත් එකම දෙය විවිධ වචනවලින් කියා ඇත. උදාහරණ වශයෙන්, ධම්ම පදයේ 394 පදය මෙසේ කියයි;"ඔබ මෝඩයෙකි! ඔබගේ අවුල් වූ කෙස් සහ එළු සමෙන් නිම කළ ඇඳුමේ ඇති ඵලය කුමක් ද? අභ්‍යන්තරයේ අවුලක් තිබියදී ඔබ බාහිරය පිරිසිදු කරයි." මේ අතර ලූක් 11.39-40, මෙසේ කියයිඃ "ඔබ ව්‍යාජ භක්තිකයා, ඔබ කෝප්පයේ සහ භාජනයේ පිටත පිරිසිදු කරයි, නමුත් ඔබේ ඇතුළත ලෝභය සහ නපුරුකම පිරී ඇත. නුඹලා මෝඩ මිනිසුන්!" නැවත, සුත්ත නිපාතයේ 242 පදය මෙසේ කියයිඃ "රිදවීම, මැරීම, කැපීම සහ හිර කිරීම, සොරකම් කිරීම, බොරු කීම, වංචා කිරීම සහ කපටිකම් කිරීම, ධර්ම ග්‍රන්ථවල තේරුම් විකෘති කිරීම සහ පරදාර සේවනයේ යෙදීම ආදියෙන් මිස මස් මාංස අනුභවයෙන් පුද්ගලයෙක් අපිරිසුදු නොවේ", මේ අතර මැතිව් 15:19-20 මෙසේ කියයිඃ "මිනී මැරුම්, පරදාර සේවනය, ලිංගික අවකල් ක්‍රියාවෙන්, සොරකමින්, බොරු සාක්ෂි දීම සහ ද්වේෂ සහගතව අපහාස කිරීමෙන් හදවත නපුරු වේ. මිනිසකු අපිරිසිදු වන්නේ මේවායින්ය, අත නොසෝදා අනුභව කිරීමෙන් නොවේ." එසේම දෙදෙනාම සර්ව සම වචන එකම අදහස් ප්‍රකාශ කිරීම සඳහා භාවිත කළ අවස්ථා ද ඇත. උදාහරණ වශයෙන් ජේසුතුමා මෙසේ පැවසුවේයඃ "තමන්ගේ ජීවිතය මිතුරා වෙනුවෙන් දීම තරම් උතුම් ආදරයක් නැත."(ජෝන් 15ඃ 13), බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහඃ "ආදරණීය මිතුරෙක් (මිත්ත සුහද) තමාගේ මිතුරා වෙනුවෙන් තම ජීවිතය පවා දෙයි."(D. 111, 187)

ඇතැම් ක්‍රිස්තියානි අටුවාචාර්යවරුන් බුදුපියාණන් වහන්සේ ගේ ධර්මයේ එක්තරා පටු බවක් තමන් දකින බව පෙන්වාදී ඇත. උදාහරණ වශයෙන්, විශේෂයෙන්ම එය ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ ලෝකය අභිනිෂ්ක්‍රමණය කරන අයට බවත්, නිර්වාණයට එළඹීම ඉතා අපහසු බවත්ය. එය "ජීවිතය තමන්ගේ නොවන බව" කියන ඉගැන්වීමක් බවට සමහර අය නම්පට බැඳ ඇත. නමුත් ක්‍රිස්තියානි ධර්මය සම්පූර්ණයෙන්ම කියවූවොත් ජේසුතුමා සමහර විට බුදුපියාණන් වහන්සේට වඩා දැඩි භාෂාවක් භාවිත කර ඇති නමුත්, ඉතාම සමාන දේ උගන්වා ඇති බව පෙනේ. "මා වෙත පැමිණෙන ඕනෑම තැනැත්තෙක් පියාට, මවට, බිරිඳට සහ දරුවාට, සහෝදරියන්ට සහ සහෝදරයන්ට ද්වේෂ නොකරයි නම් - තමන්ගේම ජීවිතයටවත් ඔහු මගේ ශ්‍රාවකයෙක් නොවේ." (ලූක් 14,26) නැවත "නිවාස හැරගියවුන්, නැතහොත් සහෝදරයන් හෝ සහෝදරියන් නැතහොත් පියා හෝ මව නැතහොත් බිරිඳ හෝ දරුවන් නැතහොත් කුඹුරු මා වෙනුවෙන් හැර යයි ද, ඒ සියලු දෙනාට සියක් වාරයක් සදාකාලික ජීවිතයකට උරුමකම් ලැබෙයි." (මැතිව් 19,29) එසේම ජේසුතුමා පැවසූ සමහර දේවල් "බුදුපියාණන්

වහන්සේ වදාළ ඕනෑම දෙයක් මෙන්ම, ජීවිතය තමා ගේ නොවන බවට හැඳින්වීමට සැබැවින්ම සුදුසු වේ." උදාහරණ වශයෙන්:"තමාගේ ජීවිතයට ආදරය කරන ඕනෑම කෙනෙකුට එය අහිමි වන අතර, මෙලොවදී තමාගේ ජීවිතයට ද්වේෂ කරන්නා එය සදාකාලික ජීවිතයට තබා ගනී." (ජෝන් 12.25); ජේසුතුමාගේ ශ්‍රාවක ජෝන් එම අදහසම ඊටත් වඩා ප්‍රබල භාෂිතයෙන් ඉදිරිපත් කර ඇත. "ලෝකයට හෝ ලෝකයේ කිසිම දෙයකට ආදරය නොකරන්න. යමෙක් ලෝකයට ආදරය කරයි නම්, පියතුමාට ආදරයක් ඔවුන් තුළ නැත." (1 ජෝන් 2,15)

මෙම සමානකම් සහ වෙනත් ඒවා තිබියදීත්, බුද්ධ ධර්මය සහ ක්‍රිස්තියානි ධර්මය අතර අනපේක්ෂිත වෙනස්කම් තිබේ, මේ වෙනස්කම් අතර ලොකුම වෙනස නම් ඔවුන් පරමාර්ථය හෙවත් ඉහළම අරමුණ දකින ආකාරයයි. ජේසුතුමා දිව්‍යමය මැවුම්කරුවකු කෙරෙහි විශ්වාසය තැබූ අතර, බුදුපියාණන් වහන්සේ එසේ නොකළහ. දෙවියන් වහන්සේ අසාමාන්‍ය සහ මිනිසකු වැනි දෙවියකු ලෙස මිනිසුන්ගේ ජීවිතවලට මැදහත් වෙමින් ඔවුන්ගේ යාච්ඤාවලට ප්‍රතිචාර දක්වන බවට ජේසුතුමා විශ්වාස කළේය. ඔහු, සමහර විට දෙවියන් වහන්සේ "අබා හෙවත් "පියා" යනුවෙන් ආමන්ත්‍රණය කළ අතර, දෙවියන් වහන්සේ සමඟ කුලුපග සම්බන්ධයක් තිබෙන බවට හැඟවීය. බුදුපියාණන් වහන්සේට පරමාත්මය මනුෂ්‍යත්වාරෝපිත නොවන්නකි. "නොඉපදුණ, යොග්‍ය නොවන, නොසෑදූ, නිර්මාණය නොකරන ලද යනුවෙන් අදහස් කළහ." ඒ අනුව නිරත වෙමින් ජේසුතුමා බාහිරව තමාගේ ඉල්ලීම් දෙවියන් වහන්සේ වෙත සකස් කරමින් යාච්ඤා කළේය. මේ අතර බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ ගේ අවධානය ආධ්‍යාත්මිකව මනසට එල්ල කරමින් භාවනා කළහ. ජේසුතුමාට මිනිස් අභිප්‍රාය වූයේ දෙවියන් වහන්සේගේ තුරුලේ, ස්වර්ගයේ ඉපදීමයි. බුදුපියාණන් වහන්සේ දෙව්ලොව ඉපදීම නිර්වාණයට වඩා පහළ බව දුටුවහ. භික්ෂුවක් දෙව්ලොව ඉපදීම අරමුණු කරගෙන ධර්මය පුරුදු කරන්නේ නම්, ඔහු "පිළිකුල් කළ යුතුයි, වැළැක්විය යුතුයි සහ නතර කළ යුතුයි."(අත්තියෙයත්ථ, හරෙයෙයත්ථ, ජිගුච්ඡියෙයත්ථ) බව බුදුපියාණන් වහන්සේ වදාළහ. සියලුම ජීවත්වන තත්ත්වයන්, දිව්‍යලෝක පවා අභිභවා යන්නේ නිර්වාණය බව බුදුපියාණන් වහන්සේ වදාළහ.

සමහර විට (ඊශ්වර) යන නමින් හඳුන්වන, බ්‍රහ්මගේ පැවැත්ම නිහඬව පිළිගනිමින්, ඔහුගේ සෑම ගුණාංගයක්ම පාහේ ප්‍රතික්ෂේප කරමින්, ආධ්‍යාත්මික වසම තුළ ඔහුගේ සිටීමෙන් තේරුමක් නැති බව බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළහ. බුදුපියාණන් වහන්සේට අනුව, විමුක්තියට මඟ පෙන්වන්නේ විශ්වාසය නොව, මානසික ගුණ සහ අවබෝධයයි. කෙසේ

නමුත් බ්‍රහ්ම ප්‍රාථමිකව ආදරය සහ අනුකම්පාව, මුදිතාව සහ උපේක්ෂාවෙන් පිරුණු කාරුණික පුද්ගලයෙකු බව බුදුපියාණන් වහන්සේ පිළිගැනීමට සූදානම් වූහ. ජේසුතුමා ද මේ සම්බන්ධයෙන් එකඟ වන්නට ඇත. නමුත් මේ දෙදෙනාගේ අවබෝධය වෙනස් විය. ජේසුතුමාගේ දෙවියන් වහන්සේට බියගන්වන සුලු අංශයක් තිබෙන්නට ඇත. ඔහු පිළිබඳව ජේසුතුමා මෙම පැහැදිලි අනතුරු හැඟවීම ප්‍රකාශ කළේය:"ශරීරය මරණයට පත් කරන නමුත් ආත්මය මරණයට පත් කරන්න බැරි අය පිළිබඳව බිය නොවන්න; නමුත් ඊට වඩා ශරීරය සහ ආත්මය නිරයේදී විනාශ කරන ඔහු පිළිබඳව බිය වන්න. "(මැතිව් 10,28)

දෙවියන් වහන්සේගේ ස්වභාවයේ අනෙක් පැත්ත හඳුනා ගැනීම, පුද්ගලයෙකුගේ මරණින් මතු ජීවිතය කෙබඳු දැයි දැකගැනීමට ජේසුතුමාට බලපෑමක් ඇති කළේය. ඔහුට ස්වර්ගය තේජවන්ත වූ අතර, දෙවියන් වහන්සේට සමීප වීමකි, නමුත් අපාය සදාකාලික දඬුවම් ලැබීමට තැනකි, "වේදනා සහ දත්මිටි කෑම් තිබෙන ගිනි ගන්නා ළිපකි." (මැතිව් 13:42) බුදුපියාණන් වහන්සේ අපායේ යථාර්ථය ද තහවුරු කර ඇත. නමුත් ජේසුතුමා අනුමාන කළ දේට වඩා බොහෝ වැදගත් වෙනස්කම් ඇත. බාහිර අයෙකු විසින් සිදුකරන ලද විනිශ්චයකට අනුව මිනිසකු නිරයේදී දඬුවම්වලට නියම කිරීමක් නැත. ඊට වඩා පුද්ගලයන් ඒ අය සිතන, කථා කරන සහ ක්‍රියා කරන ආකාරයට ඒ අයම ඉතා අප්‍රසන්න ඉරණමක් නිර්මාණය කර ගනිති. ජේසුතුමාට අනුව කිතුනු දහමින් ප්‍රතික්ෂේප වීම විමුක්තිය සහතික කරන සදාතනයට ශාපයකි. බුදුපියාණන් වහන්සේට අනුව දෙවි කෙනෙකු කෙරෙහි ඇතිකර ගන්නා නොසැලෙන විශ්වාසය සහ නොබෙදුණු අවනත භාවය නොව, අපාය නිර්මාණය වන්නේ සදාචාරය පලුදු වූ හැසිරීම් නිසාය. ආගම කුමක් වුවත්, සියලු යහපත් මිනිසුන්ට වාසනාවන්ත නැවත ඉපදීමක් ලබාගත හැකිය. එසේම අපාය ද සදාකාලික නැත, නිර්මාණය වූ අකුසල්, එය ගෙවී යන තුරු පමණක් පවතියි.

ධර්ම ග්‍රන්ථවල බොහෝ ස්ථානයන්හි, නමුත් විශේෂයෙන්ම, අංගුත්තර නිකායේ 22 වන දේශනාවේ "කරුණු තුනක් සම්බන්ධ ග්‍රන්ථයෙන්", පුද්ගලයකු උන්වහන්සේ කිසි දිනක නුදුටුවත් හෝ උන්වහන්සේ ගේ ධර්මය කිසි දිනක අසා නොමැති වුවත්, නිර්වාණය අවබෝධය සඳහා "නිසැක මාර්ගය" ට (ඔක්කමතී නියාමං) පත්විය හැකි බව බුදුපියාණන් වහන්සේ සහතික කළ සේක. මෙම අවබෝධය, බුද්ධ ධර්මයට සෑම මිනිසකුම අවසානයේ බේරාගත හැකිය යන මතය ලබාදී ඇති අතර, එය සාමාන්‍යයෙන් බෞද්ධයන් අනෙක් ආගම් කෙරෙහි ගෙන ඇති ආකල්පවලට ධනාත්මක බලපෑමක් ඇති කර තිබේ. බුදුපියාණන් වහන්සේට අපාය සදාකාලික

නොවන බව වැදගත් කරුණක් වේ. සිදුවීම් දෙකක් අතර දිගු කාලපරාසයක් වන අතර ස්වයංව ඇතිකර ගත් මෙම කාලපරාසය අප්‍රසන්න එකක් වේ.

සියලු ආගම් එකම හා සමාන ය, නැතහොත් වෙනස් නම්වලින් හැඳින්වුව ද ඒවා සමාන අරමුණක් කරා යොමුවන්නේ ය යන ප්‍රකාශයට අදාළව ජේසුතුමාට හා බුදුපියාණන් වහන්සේට පවසන්නට තිබුණේ කවර දෙයක් ද? විමුක්තිය සඳහා ඇත්තේ එකම ක්‍රමයක් යන්න ජේසුතුමා විශ්වාස කළ බවට වාදයක් නැත, ඒ ඔහු ඉගැන්වූ ක්‍රමයයි. "මම මාර්ගය ද, සත්‍යය ද ජීවිතය ද වන්නෙමි", කිසිම කෙනෙකුට දෙවියන් වහන්සේ කරා යාහැකි නම්, ඒ මා හරහායි." (ජෝන් 14,6) එක් පුද්ගලයෙක් වරක් ඇත්තෙන්ම, බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසුවේයː "සියලු භික්ෂූන් සහ බ්‍රාහ්මණයන් එකම ධර්මය උගන්වන්නේ නම්, එකම විනය පුරුදු කරන්නේ නම්, එකම දෙය අවශ්‍ය වන්නේ නම්, සහ එකම අරමුණක් සොයන්නේ නම්?" එවිට බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේකː "නැත, ඔවුන් එසේ කරන්නේ නැත. ලෝකය සෑදී තියෙන්නේ බොහෝ විවිධාකාර මූල ද්‍රව්‍යන්ගෙන් වන අතර, මිනිස්සු මෙම විවිධ දේවල්වලින් එකකට හෝ දෙකකට එල්බ සිටිති. ඔවුන් එල්බ ගන්නා කුමක් වුවත්, ඔවුන් එය තදින් ග්‍රහණය කර ගන්නා අතර, ඊට පසු අයිතිය තහවුරු කර ගන්නවා. මෙයම සත්‍යයක් වන අතර, අනික් සියලු දේ අසත්‍යයයි. එම නිසා ඔවුන් එකම ධර්මය උගන්වන්නේ නැත, ඔවුහු එකම විනය පුරුදු නොකරති, එකම දෙය අවශ්‍ය වන්නේ නැත, එකම අරමුණ සොයන්නේ නැත."(D.11,282)

ඒ අනුව මෙම උතුම් ගුරුවරුන් දෙදෙනා වන බුදුපියාණන් වහන්සේ සහ ජේසුතුමා ගැඹුරු ලෙස නිරීක්ෂණය කළ විට, කුතුහලය දනවන සමානකම් සහ පැහැදිලි වෙනස්කම් ද පොදුවේ ගත් ලක්ෂණ සහ ප්‍රභේද අනාවරණය වේ. අපට අවංකවම ඔවුන් සහ ඔවුන්ගේ ඉගැන්වීම්, ඔවුන් ගොඩනැගූ ආගම් තේරුම් ගැනීමට අවශ්‍ය නම් අප ඔවුන් පිළිගත යුතුයි.

නමුත් ධර්මයට සම්බන්ධ සමානකම් සහ වෙනස්කම්වලට ඔබ්බෙන්, බෞද්ධයන්ට ද, ක්‍රිස්තියානීන්ට ද කවර ආගමකට අයත් යහ සිතැති ජනයාට ද එකඟ විය හැකි දෙයක් තිබේ ද? මම හිතනවා පුළුවනි කියා. ද්වේෂය, බෙදීම, එකිනෙකාට පෙරළා දෝෂාරෝපණය කිරීම සහ අන්‍යෝන්‍ය සැකය, අදාළ සැම දෙනාටම නරක යයි සමහර විට අපි සියලු දෙනාටම එකඟ විය හැකිය. අනුකම්පාව, කරුණාව, සමාව දීම සහ යහපත් අසල්වාසී සමීපත්වය අදාළ සියලු දෙනාටම ප්‍රයෝජනවත් වේ යයි මම සිතමි. එසේම ක්‍රිස්තියානි ධර්මයේ සහ බුද්ධ ධර්මයේ ද පළමුවැන්න මඟහැර දෙවැන්න වැලඳ ගැනීමට බොහෝ උපදෙස් ඇතුළත් ය. අපි සියලු දෙනාටම මෙම වචන සමඟ එකඟ

විය නොහැකි ද? ”නොමනාපය සහ ද්වේෂය අත්හැර, කෙනෙකු සියලු සත්ත්වයන්ට දයා කරුණා සහිත මනසකින් වාසය කරමින්, ඒ නොමනාපය සහ ද්වේෂයෙන් යුතු මනස පිරිසිදු කරගත යුතුයි. ජීවිත නැති කිරීම අත්හැර, කෝටුව සහ කඩුව පසෙක තබා, කෙනෙකු සියලු සත්ත්වයන්ට සත්කාරය, කරුණාව සහ අනුකම්පාව දක්වමින් වාසය කළ යුතුයි.(D.1,63) ”දෙවියන්ට ආදරය කරන බව කියමින් සහෝදරයා හෝ සහෝදරියට ද්වේෂ කරන කවරෙකු වුවත් බොරුකාරයෙකි. තමාගේ සහෝදරයා සහ සහෝදරියට ආදරය නොකරන කවුරුන් වුවත් ඒ අය දකින, සහ නොදකින අයට දෙවියන් වහන්සේට ආදරය කළ නොහැකිය (1 ජෝන් 4:20)

# 26.බුදුපියාණන් වහන්සේ කාන්තාවන් සම්බන්ධයෙන් කුමක් වදාළේ ද?

සැහෙන මෑතක් වනතුරු සියලු සමාජ කාන්තාවෝ පුරුෂයන්ට වඩා පහත් ලෙස සැලකිල්ලට ගත්හ. සමහරු තවමත් එසේ කරති. මෙම පහත් තත්ත්වය බොහෝ ආගම්වල ඉගැන්වීම් තුළිනුත් පිළිබිඹු විය. මානව වර්ගය පහළ වැටීමට කාන්තාවන් වගකිව යුතු ය යන මතය ශුද්ධ බයිබලයේ සඳහන් වේ. ( 1තිමති 2, 11-15) එසේම දරු ප්‍රසූතියේදී ඇතිවන වේදනාව මෙම වරදට දෙවියන්ගෙන් ලැබෙන දඬුවමක් ලෙස ද දකී. (ප්‍රභවය 3, 16) කොන්ෆියුෂියානි ධර්මයේ ඉගැන්වීම්වලදී කාන්තාවන් "තුන් ආකාරයකින් පහත් කොට සැලකීම" යටතේ ජීවත් විය යුතුය. ඒ, විවාහයට පෙර තමන්ගේ පියාගේ යටතේ සිටීම, විවාහයට පසු පුරුෂයා යටතේ සිටීම සහ වැන්දඹු වූ විට වැඩිමහල් පුත්‍රයා යටතේ සිටීම ආදී වශයෙනි. භාර්යාව මියගිය පුරුෂයන්ට නැවත විවාහ වීමට උනන්දු කළ නමුත්, වැන්දඹු කාන්තාවන්ට එය තහනම් විය. කාන්තාවක රහත් ඵලයට පත්වීමට නම් පිරිමියෙකු ලෙස නැවත උත්පත්තිය ලැබිය යුතු බව ජෛන ආගමේ ශාඛා දෙකෙන් එකක් වූ දිගම්බර නිකායේ අය විශ්වාස කරති. පෙනෙන ආකාරයට, මෙම මතය පසුකාලීනව ඇතිවූවක් වන අතර, සමහර විට ජෛන ආගමේ ආරම්භක මහාවීර ඉගැන්වූවක් නොවන්නට පුළුවන. හින්දු ආගමේ මනුස්මෘතියට අනුව, කාන්තාවන්ට ගරු කළ යුතු ය. නමුත් සැම අතින්ම යටහත්ව සිටිය යුතු ය. වේදය නමැති පූජනීය ග්‍රන්ථ කියවීමට ඔවුන්ට ඉඩ නොදුන්හ. මනුස්මෘතියේ බලාධිකාරය විශ්වයම පිළිගත්තක් නොවූ අතර, එය පිළිගත් අය ද අවශ්‍යයෙන්ම ඒවායේ චෝදනාත්මක විවේචන අනුගමනය කළේ ද නැත. කාන්තාවන් කෙරෙහි ඉන්දියානු ආකල්පය කෙරෙහි එහි බලපෑම ගම්භීර විය. බහායි (බාබි ආගමික මතවාදීන් අනුගමනය කරන්නන්) ආරම්භයේ සිටම පුරුෂයන් හා කාන්තාවන් සම ලෙස සැලකූ ආගම් ස්වල්පයෙන් එකකි, පෙර කී ලෙස, එහි ආරම්භය 19 වන ශතවර්ෂයේදී පර්සියාවේදී සිදුවූ අතර, එය විශේෂයෙන්ම වැදගත් ය.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී ඉන්දියානු කාන්තාවන්ට පසුකාලීන ශතවර්ෂවලදීට වඩා සැලකිය යුතු තරම් බොහෝ නිදහස තිබුණි. එසේම, මුස්ලිම් කාන්තාවන්ගේ මොට්ටැක්කිලිය, වැන්දඹු කාන්තාවන් පිළිස්සීම, ගැහැනු බිළිඳු ඝාතන හෝ දරුවන් අතර විවාහ, පසුකාලීන ශතවර්ෂවලදී සිදු වූ ආකාරයෙන් ම පැතිරී ගිය බවට සාක්ෂි ඇත්තේ අල්ප වශයෙනි. වැන්දඹු කාන්තාවන්ට නැවත විවාහ වියහැකි වුව ද, ජාතක කථාවල පැදි එකතුවකට අනුව, ඒ අය දෙස පිළිකුල් සහගතව බැලීමට පටන් ගත් බව පෙන්වයි.(Ja. V1,

508) පසුකාලීනව මෙම ආකල්පය වැන්දඹු තත්ත්වය පිළිපැදීමට බලකර තිබුණි. බෞද්ධයන් ස්ථිර නොකළ බවට හඟවමින් වැන්දඹුවන්ගේ අසීරු තත්ත්වය කෙරෙහි විශාල අනුකම්පාවක් එම පැදිවලින් ප්‍රකාශ කර තිබුණි.

කාන්තාවන් කෙරෙහි බුදුපියාණන් වහන්සේගේ ආකල්ප සම්බන්ධයෙන් ඇතිවූ ප්‍රධාන විවේචනය උන්වහන්සේට ආරෝපණය කරන ලද්දේ පහත සඳහන් අදහස් සම්බන්ධයෙනි. කාන්තාවකට බුද්ධත්වයට පැමිණිය නොහැකි බව (M.111, 65) සහ භික්ෂුණීන් භික්ෂූන්ට වඩා පහත් තත්ත්වයට පත්කරන විශේෂ (අට්ට ගරුධම්ම) නීති 8ක් සමඟ වාසය කළ යුතුයි. (Vin. 11, 254) මෙම පළමු අදහස සම්බන්ධයෙන්, බුදු කෙනෙකු පහළවීම ඉතා දුර්ලභ අවස්ථාවකි. කුමන ලිංගයට අයත් වුවත් බුද්ධත්වයට පත් වීමේ අවස්ථාව අතිශයින් විරල, කල්ප ගණනාවකින් ඇතිවන අවස්ථාවකි. මෙම තත්ත්වය යටතේ, නොකමැත්තක් පළ කිරීමේ අවස්ථාව සැක සහිතය.

භික්ෂුණීන්ට වගකීමක් සේ පැවරෙන මෙම විශේෂ නීති අට, භික්ෂූන්ට වඩා දෙවන ස්ථානයක් භික්ෂුණීන්ට ලබා දෙයි. එසේම කාරණා බොහොමයක් ඔවුන්ට භික්ෂූන් මත යැපීමට සිදුවෙන ඒවායි. වර්තමානයේ පවතින සමාන ලිංගික වර්ගීකරණ අදහස් සමඟ එකඟ නොවූවත්, බුදුපියාණන් වහන්සේ ගේ කාලයේදී මෙය මතභේදයට තුඩු නොදෙන්නට ඇත. අද බොහෝ විනය නීති නොසලකා තිබෙන අතර, එයට හේතුව අදාළ නොවන හෝ නූතන මත සමඟ විකාර ස්වරූපයක් ගන්නා අතර, විශේෂ නීති අට මෙයට උදාහරණයක් ද වේ, ඒ නිසා ඒවා පිළිපැදිය යුතුයි. කාන්තාවන් කෙරෙහි බෞද්ධ ආකල්ප පිළිබඳව කථා කරන විට, සැම විටම සඳහන් කරන සහ සාකච්ඡා කරන අනෙක් ග්‍රන්ථය කුණාල ජාතකයයි. මෙම කථාව කුහක ලෙස ගැහැනු නොරිස්සීමක් බව කීම අතිශෝක්තියක් නොවේ. එය පුළුල් පරාසයකින් දුරාචාරය සම්බන්ධයෙන් කාන්තාවන්ට චෝදනා කරයි. නමුත් එසේ කරද්දී එය ප්‍රකෝපකාරී බවින් ටිකක් වැඩිය, පෙර කී පරිදි අනෙක් ජාතක කථාවලින් පුරුෂයෝ මිනී මැරීම, සොරකම් කිරීම, රහස් කුමන්ත්‍රණ, වංචා, විශ්වාසය කඩ කිරීම්, කළගුණ නොදත්කම, දැඩි කෑදරය, මෝඩකම සහ අපට කියන්නට වචන නැති තවත් මඳ වශයෙන් දුරාචාරවල යෙදීම පිළිබඳව වැරදිකරුවන් ලෙස විස්තර කරනු ලබති. එකම අස්වැසිල්ල නම්, ජාතක කථා බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ ඒවා නොව, පැහැදිලිවම ශතවර්ෂ ගණනාවකට පසු සූත්‍රවල නියම දිනට පසු සටහන් වූ ඒවායි.

බුදුපියාණන් වහන්සේ සමහර විට කාන්තාවන් වර්ණනා කරමින් සහ තවත් අවස්ථාවල හෙළා දකිමින් කථා කිරීම, උන්වහන්සේට ඔවුන් කෙරෙහි ඇති ආකල්පයේ නොපැහැදිලි බවක් තිබෙන්නට ඇතැයි හැඟීමක් ඇති වේ.

කෙසේ නමුත්, ධර්මයේ මූලික කරුණු සම්බන්ධයෙන් පිරිමින් සහ ගැහැනුන් අතර වැදගත් වෙනස්කම් නැති බව උන්වහන්සේ ස්ථිර කර ඇත. උන්වහන්සේ මෙසේ වදාළහ: " මේ ධර්මය තුළ නිවෙස අතහැර, නිවෙස නැති තත්ත්වයට ගමන් කොට, ධර්මය හා තථාගතයන් වහන්සේගේගේ පුහුණු කරන ලද ඉගැන්වීම් තුළ කාන්තාවන්ට රහත් ඵලය අවබෝධවන තෙක්ම පියවරින් පියවරට යාහැකි බව කිව හැකිය." (Vin. 11, 254). නැවතත්:"ගැහැනියක් හෝ පුරුෂයෙක් කුමන කෙනෙක් ධර්මය නමැති රථයේ ගමන් කරන්නේද, නිර්වාණය සමීපයට යා හැකිය." (S.I. 33) සෝමා නමැති භික්ෂුණිය එම කාරණයම සමහරවිට වඩාත් අවධාරණයෙන් කීවාය. මනස නිශ්චල සහ ශක්තිමත් නම් ගැහැනියකුගේ ස්වභාවය නොවැදගත් ය, දැනුම දින දින වැඩෙන විට ඇයට ධර්මයේ සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව ඇත. "මම ගැහැනියක්මි නැතහොත් මම මිනිහෙක්මි, නැතහොත් මම යනුවෙන් හඳුන්වන වෙනත් ඕනෑම කෙනෙකුට ඇමතීමේ හැකියාව මාරයාට ඇත." (S.I. 129)

භික්ෂුණීන් සහ ගිහි කාන්තාවන් ඇතුළුව, තමන් වහන්සේගේ සියලු ශ්‍රාවකයන්, විශාරදත්වයෙන් යුතු, හොඳින් පුහුණුව ලද, උගත් හා පාණ්ඩිත්‍යයෙන් හෙබි ධර්මය දන්නා අය විය යුතු යයි ද, ධර්මය අනුව ජීවත් වෙමින්, ධර්ම මාර්ගයේ ගමන් කරමින්, තමන්ගේ ආචාර්යවරයාගෙන් ලැබුණු දේ අන් අයට ලබා දෙමින්, එය උගන්වමින්, ප්‍රකාශයට පත් කරමින්, ස්ථාවර කරමින්, පැහැදිලි කරමින්, ප්‍රවර්ධනය කරමින් වඩා නිර්මල කරමින්, ව්‍යාජ ඉගැන්වීම් පරාජය කරවමින් සිටිනු ඇතැයි ද බුදුපියාණන් වහන්සේ අපේක්ෂා කළහ. (D.11,105). ධර්ම ග්‍රන්ථවල සඳහන් සමහර භික්ෂුණීහු උගත් (බහුසුත), සූත්‍ර සජ්ඣායනය කළ හැකි, (භානික) විශ්වසනීයත්වයෙන් යුත් (විශාරද) ධර්මය ඉගැන්වීමේ සුවිශේෂ හැකියාව ඇති අය ලෙස විස්තර කරනු ලබති. (පත්ත ධම්මිං කථං කාතුං,Vin. 1V, 290).

අභිධම්ම පිටකයේ ධම්මසංගනියේ සඳහන් වන්නේ, ගැහැනු පිරිමි බව භෞතික ද්‍රව්‍යයක (රූප) ගතිලක්ෂණයක් බවත්, විඥ්ඥාණයක් නොවන බවත් ය. (Citta Dhs, 633-4). මෙහි සැබැවින්ම අර්ථයක් ඇත. ඒ අනුව, මේ ජීවිතයේදී කාන්තා සිරුරක් තිබූ කෙනෙකුගේ විඥ්ඥාණය ඊළඟ භවයේදී පුරුෂ ශරීරයක් ලැබූවත්, විඥ්ඥාණය එකම වේ.

# 27.මිතුරන් සහ මිතුරුදම පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ අදහස්

ග්‍රීක ජාතිකයන් ෆිලියා යනුවෙන් නම් කළ දෙයම බුදුපියාණන් වහන්සේ මිත්තත යනුවෙන් නම් කළහ. එම වචන දෙකේම අර්ථය ආදරවන්ත මිතුදම හෝ සහෝදර ආදරය වේ. මෑතක් වනතුරුම අද බලාපොරොත්තු වන ආකාරයට වඩා බොහෝ සෙයින් බටහිර සමාජවල පවා මිතුරුදම් බොහෝ සමීප සහ ගැඹුරු විය. අචිල්ස් සහ පැට්‍රෝක්ලස් අතර මිතුරුදම සහ ශුද්ධ බයිබලයේ සඳහන් සෝල් සහ ජොනතන් සහ රූත් සහ නයෝමි මිතුරුදම බටහිර ඉතා ප්‍රසිද්ධ ඒවායි. ඉන්දියාවේ මහාභාරතයෙන් අර්ජුන සහ ක්‍රිෂ්ණගෙ අන්‍යොන්‍ය දැඩි ඇල්ම නිරූපණය කළ අතර, එය පරමාදර්ශී මිතුරුදම් වශයෙන් බොහෝ කාලයක් උපහාරයට ලක්වී ඇත. අර්ජුන පිළිබඳව ක්‍රිෂ්ණ මෙසේ පැවසුවේයඃ "මගේ භාර්යාවන්, මගේ ඥාතීන් සහ මගේ සබඳතා ඇති අය අතරින් අර්ජුන තරම් මට ආදරය කළ කෙනෙක් නැත. අර්ජුනගෙන් තොරව එක් තත්පරයක් වත් මේ පොළොව මත මගේ ඇස් දෙක පහත හෙළන්න බැහැ. අර්ජුන මගේ ශරීරයෙන් කොටසක් බව දැනගන්න." සමාන ලිංගයකට අයත් පුද්ගලයෙකු පිළිබඳව නූතන බටහිර අවධානයට ඇසෙන්නට මෙසේ පැවසීම සමහර විට නුසුදුසු යයි දැනෙන්නට පුළුවනි. නමුත් 20 වන ශතවර්ෂයේ ආරම්භය වන තුරු ඒ හා සමාන මත ප්‍රකාශ කිරීම අපේ සංස්කෘතියේ සාමාන්‍ය දෙයක් විය.

ශ්‍රී ලංකාවේ වීර කාව්‍යයක් වූ චූලවංශයේ, එවැනි මිතුරුදමක් බෞද්ධ සංස්කෘතියේ දකින්නට ඇත. තරුණ මානවම්ම කුමාරයාට මාළිගාවේ ඇතිවුණු කුමන්ත්‍රණ නිසා දකුණු ඉන්දියාවට පලායෑමට සිදුවූ අතර, නරසීහ රජුගේ රාජසභා අංගණයේ රැකියාවක් ලැබුණි. මිනිසුන් දෙදෙනා අතර මිත්‍රත්වයක් ඇතිවූ අතර, එය ක්‍රමයෙන් ආදරයක් බවට පත් විය. රාජධානිය අසල්වැසියෙකු විසින් ආක්‍රමණය කළ විට, නරසීහගේ පළමු සිතුවිල්ල වූයේ ඔහුගේ මිතුරා පිළිබඳවයි. මානවම්ම යුද්ධයට එකතුවී මරණයට පත්වූවොත්, "අප දෙදෙනා එකට සැලසුම් කළ සියලු දේවලින් ප්‍රතිඵල නැති වේවි," ඒ නිසා ඔහු යුද්ධයට ගොස් මානවම්මට නගරයේ සිටින ලෙස අණ කළේය. නමුත් මානවම්ම මෙසේ සිතුවේයඃ "මම ජීවත්ව සිටිද්දී රජු මළොත් මගේ ජීවිතයෙන් වැඩක් නැත. මම එසේ කළහොත් ඔහු මා කෙරෙහි තබා ඇති විශ්වාසය කඩ වෙයි. ඔහු මා ඔහුට සමාන තත්ත්වයට ගෙන ඇත. එමනිසා ඔහු හා යුද්ධ පිටියට මා යාම වටිනවා. ඔහු සමඟ ජීවත් වන්න හෝ මැරෙන්න ලැබීම මට ඇති ලොකුම සතුටයි." මානවම්ම, නරසීහට එකතුවීම

පිණිස පිටත්වූ අතර දෙදෙනා ජයග්‍රහණය වෙනුවෙන් තමන්ගේ හමුදා මෙහෙයවූහ. ජයග්‍රහණයෙන් පසු රජු මානවම්ම ආදරයෙන් වැලඳ ගත්තේය. ඔහු මෙසේ කීවේයඃ "ඔබයි මට ජයග්‍රහණය ලබා දුන්නේ." ඔහුගේ කැපවීම පිළිබඳ කෘතඥතාපූර්වකව, නරසීහ ශ්‍රී ලංකාව ආක්‍රමණය කර ඔහුටම කිරුළ හිමිකර ගන්නට උත්සාහ කිරීම පිණිස තමාගේ හමුදාවක් ලබා දුන්නේය. එම මෙහෙයුම අසාර්ථක වූ අතර, මානවම්ම නරසීහගේ ආලිංගනයේ ඔහුගේ මිත්‍රයාට සේවය කරමින් හොඳ අවස්ථාවක් එනතුරු රැඳී සිටියේය. අවසානයේ නරසීහ මෙසේ සිතුවේයඃ "නොබිඳුණ අභිමානය සහ ගෞරවය ඔහුගේ වත්කම ලෙස සලකමින්, මගේ මිතුරා රාජකීය අභිමානය වෙනුවෙන් මට සේවය කරයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔහු වියපත් වෙයි, කෙස් රැවුල් සුදු පැහැ වෙයි. මෙය දකින මා සතුටින් රාජ්‍ය පාලනය කරන්නේ කෙසේ ද? ඔහුගේ රාජධානිය ආපසු ඉල්ලා සිටීමට ඔහු යවන්නට බැරි නම් මගේ ජීවිතය මට කුමකට ද? ඒ නිසා තවත් හමුදාවක් රැස්කර නරසීහ ඔහුගේම ආරක්ෂක ආවරණ මානවම්මට දුන් අතර, ඔහු ලංකාව ආක්‍රමණය කර රජකම ලබා ගත්තේය.(චූලවංශ XL. V111. 1-60)

මෙතරම්ම උද්‍යෝගිමත් එකක් නොවූවත්, සැබැවින්ම, ආනන්ද හිමියන් සහ බුදුපියාණන් වහන්සේ අතර වඩා ආධ්‍යාත්මික ස්වාභාවයේ මිතුදමක් තිබුණි. ආනන්ද බුදුපියාණන් වහන්සේගේ ඥාති සහෝදරයෙකි, ඔහු එක්තරා ප්‍රමාණයකට, උන්වහන්සේට වඩා වයසින් අඩු විය; සැබැවින්ම අවුරුදු 25ක් පමණ බුදුපියාණන් වහන්සේගේ පෞද්ගලික ලේකම් ලෙස කටයුතු කළේය. ඔහු මුළුමනින්ම මෘදු, ආදරණීය, සැම දෙනාටම සහනය සලසන, සැමගේ ප්‍රසාදයට ලක්වූ පුද්ගලයෙකි. ඔහු ඉතා ප්‍රායෝගික විය, බුදුපියාණන් වහන්සේ වෙනුවෙන් සියලු දේ සකසා දීමට සූදානම් සහ කැමති වූ අතර, උන්වහන්සේට විවේකයක් අවශ්‍යවූ විට මිනිසුන් ඈත් කර තැබීමට හා උන්වහන්සේගේ ආශ්‍රමය මනාව තබා ගැනීමට ද වගබලා ගත්තේය, උන්වහන්සේගේ පෞද්ගලික අවශ්‍යතා සැපයීම සිදු කළේය. බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් කෙරෙහි පූර්ණ විශ්වාසය තැබූහ. උන්වහන්සේ සැම දෙයක්ම ආනන්ද හිමියන්ට පැවරීමට සතුටු වූහ. දෙදෙනා අතර, එකිනෙකා කෙරෙහි ඉතා ගැඹුරු සහ සෙනෙහෙබර වර්ණනා කිරීම් තිබූ බවට ධර්ම ග්‍රන්ථවලින් පැහැදිලි වේ. "ජේසුතුමාට ආදරය කළ ශ්‍රාවකයා", අවසාන භෝජන රාත්‍රියේදී "ජේසුතුමාගේ තුරුලේ ඇලවූ" පුද්ගලයාට, ආනන්ද හිමියන් සමාන ලෙස සිතන්නට පුළුවනි. පැරණි අටුවාවට අනුව කෝප වූ ඇතකු බුදුපියාණන් වහන්සේ වෙත කඩා වදින විට, උන්වහන්සේ ආරක්ෂා කිරීම පිණිස ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේ ඉදිරිපිටට දිව ගියහ. (Ja. V. 335-6)

බුදුපියාණන් වහන්සේ ගේ පරිනිර්වාණයට පෙර මාසවලදී උන්වහන්සේ ගේ පරිනිර්වාණය ඉක්මන් කළ රෝගය මුලින්ම ඇතිවූ අවස්ථාවේදී ආනන්ද හිමියන්ට එය ඉතාම තදින් බලපෑවේය. "මම කම්පනයට පත් වූයෙමි, මගේ ඉවසීම දරාගත නොහැකි විය, බුදුපියාණන් වහන්සේ ගේ අසනීපය නිසා සියලු දේ මට අපැහැදිලි විය." (D.11,99). ආදරය කරන පුද්ගලයකුගේ රෝගයේ සමහර රෝග ලක්ෂණ තමා වෙත ආරෝපණය කරගෙන සංවේදනාත්මක ශෝකය නමැති ලක්ෂණය ඔහු තුළින් පෙන්වන්නට ඇත. පසුව, බුදුපියාණන් වහන්සේ ගේ අවසාන පැය ගණන සමීප වන බව පැහැදිලි වන විට, ආනන්ද හිමියන් "දොර කණුවට හේත්තු වී ඉකිබිඳ හඬන්නට" විය. "අහෝ!, මම තවමත් ඉගෙන ගන්නා අයෙකි. මට තව බොහෝ දේ කරන්නට තිබේ. ගුරුතුමා පිරිනිවන් මංචකයේ පසු වෙයි. උන්වහන්සේ මට ඉතා අනුකම්පා කළහ." ආනන්ද හිමියන් තමන් වහන්සේ අසල නැති බව දුටු බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ට කථා කළහ: ඔහු අසහනයෙන් සිටිනු දැක, උන්වහන්සේ ආනන්ද හිමියන් අස්වසා, ඔහු අනුන් ගැන සිතමින් බොහෝ කාලයක් කටයුතු කිරීම පිළිබඳව ස්තුති කළහ. "ආනන්ද, ඔබ බොහෝ කාලයක් මා ළඟ සිටීමත්, ක්‍රියාවෙන් වචනයෙන්, මනසින් ආදරය පෙන්වමින්, උපකාර කරමින්, සතුටින්, මුළු හදවතින්ම සහ අපරිමේය සේවයක් මට සිදු කළා. ඔබ බොහෝ යහපත් කටයුතු කර ඇත, ආනන්ද, උත්සාහ කරන්න, ඉතා කෙටි කලකින් ඔබ සියලු කෙලෙස්වලින් නිදහස් වෙයි." (D.11, 143-4)

ශෘංගාර ආදරය බොහෝ විට රඳා පවත්නේ කායික පෙනුම මතය. පෙනුම වැදගත්ය, එසේම ලිංගික තෘප්තිය නොමැති නම්, ශෘංගාර ආදරය ඉක්මනින්ම නැති වී යයි. විවාහය හා සම්බන්ධ ආදරයක් අඩුම තරමින් විවාහවී මුල් අවුරුදුවලදී එසේමයි, ආදරණීය මිතුදමකදී කායික පෙනුම හේතුවන්නේ කලාතුරකිනි. එසේම සතුට සහ ප්‍රීතිය ලිංගිකත්වයේදීට වඩා හැඟීම්වලට බලපායි, සමහරවිට එය බොහෝ සෙයින් ප්‍රේම සබඳතා සහ සමහර විවාහවලට පවා වඩා කල් පැවැත්මට එක් හේතුවකි.

වෙනත් කිසිම මිනිස් සම්බන්ධතාවකට වඩා වැඩියෙන් මිත්‍රත්වය පිළිබඳව බුදුපියාණන් වහන්සේ වදාළහ. එසේම උන්වහන්සේ මිත්‍රවයන් වර්ග රාශියක්, ඒ ඒ කාණ්ඩවල සම්බන්ධකම්වල මට්ටම් හෝ තීව්‍රතාවන් ද හඳුනාගත්හ. ඉතාම පොදුවේ උන්වහන්සේ සාමාන්‍ය මිත්‍රයන් පිළිබඳව, මිතුරා (සඛා) හෝ සගයා (සම්භත්ත) යනුවෙන් හඳුන්වන අය පිළිබඳව ද කථා කළහ. ඒ අප කැමති මිනිසුන්, අප හොඳින් ආශ්‍රය කරන, සමාජශීලීව හැසිරෙන, නමුත් අපගේ ආශ්‍රය ගැඹුරු නොවන, ආදී වශයෙන් වර්ග කළහ. බොහෝ සාමාන්‍ය මිත්‍රත්වවලට පාදක වන්නේ අන්‍යෝන්‍ය මිත්‍රශීලීත්වය සහ

බෙදාගන්නා රුචි-අරුචි කම් සහ ප්‍රයෝජනයි. ඊළඟට බුදුපියාණන් වහන්සේ හඳුන්වන සුහද මිතුරන් (මිත්ත සහද), ඉතා කුලුපග මිතුරන් (අමච්ච) හෝ සමහරවිට සැබෑ මිතුරන් (සහාය හෝ සංදිට්ඨ) වැනි ආදරණීය මිතුරන් ඇත. මේ අය සැබෑවටම ආදරණීය යැයි අපට කිව හැකිය. සැබෑ මිතුරකු පිළිබඳ අදහස් දක්වමින් බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "තම පියාගේ තුරුලේ විවේක ගන්නා පුතකු මෙන්" (S.N.255) සංකේතවත් කිරීමට, අපට එවැනි මිතුරන් ඇත්තේ දෙදෙනෙකු හෝ තිදෙනෙකු වශයෙනි, ඔවුන් සාමාන්‍යයෙන් එකම ලිංගයට අයත් වන අතර, පොදුවේ එවැනි අය සමඟ අපගේ සම්බන්ධය ජීවිත කාලයක් පවතී. එවැනි මිතුරන් අපට අවුරුදු ගණනාවකට නොදැක ඉන්නට පුළුවනි, ඊට පසු නැවත සමුවී අපගේ සම්බන්ධය යළි පටන්ගන්නේ අප මුල් වරට හමුවූයේ පසුගිය සතියේ මෙන්ය. අනුරුද්ධ තමා සහ තම මිතුරන් අතර ඇති ආදරණීය සුමිතුරු බව "ශරීරයෙන් වෙනස් නමුත්, එක සිතක්" (කාය එකං ච පන මන්නි චිතතං, M. 111, 156)" බව බුදුපියාණන් වහන්සේ සමඟ පැවසුවේය. මෙයට සමාන්තර සිත්ගන්නාසුලු දෙයක් වන්නේ, ඇරිස්ටෝටල් ආදරණීය මිත්‍රත්වය "ශරීර දෙකක් තුළ ඇති එක් ආත්මයක්", වශයෙන් කරන විවරණයයි.

ආදරණීය මිත්‍රයකු ගේ ගතිගුණ ලෙස තමන් වහන්සේ සැලකිල්ලට ගන්නේ කුමක් ද කියා බුදුපියාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේ විස්තර කර ඇත. ඔබ ඔවුන්ගෙන් ඉල්ලා සිටින දේවලින් බොහෝ දෙයක් ඔබට ලබාදීම, ඔබ බියට පත්වූ විට බිය සැක දුරු කිරීම, ඕනෑම තත්ත්වයක් යටතේ මොන අමාරුකම් තිබුණත් වෙනස් නොවීම, ඔබේ ජයග්‍රහණයේදී සතුටු වීම, ඔබට ආරක්ෂාව නැති වේලේදී ඔබ ගැන සොයා බැලීම, ඔබ වැරදි කරන විටදී ඔබ එයින් වැළැක්වීම සහ යහපත් දේ කිරීමට ඔබ දිරිමත් කිරීම, ඔබ විශ්වාස කිරීම සහ ඔබගේ විශ්වාස කටයුතු දේ රැකීම මෙයට ඇතුළත් වේ. අවස්ථාවක් එළඹුණොත් ඔබ වෙනුවෙන් ජීවිතය පරදුවට තැබීම ආදරණීය මිතුරකු විසින් කරනු ඇත. (D.111, 187) ජාතකවල මෙසේ සටහන් වේ: "සාමාන්‍ය මිතුරෙකු ඔබ වෙනුවෙන් පියවර 6ක් යන අතර, ආදරණීය මිතුරෙක් පියවර 12 ක් යයි. ඔහු සති දෙකක් හෝ මාසයක් එසේ කරන්නේ නම්, ඔහු පවුලකි; ඊට වඩා වැඩි නම්, ඔහු ඔබගේ දෙවන ආත්මයයි." (J.I. 365) මෙම ගුණධර්ම, කරුණාව, කැමැත්තෙන්ම ත්‍යාගශීලි බව, පක්ෂපාතී බව, අනුකම්පා සහිත ප්‍රීතිය සහ පූර්ණ විවෘත බව සහ විශ්වාසය යනාදිය මෙයින් අදහස් වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ වදාළහ: "එවැනි මිතුරකු තමාගේ දරුවා තුරුලට ගෙන ඇල්මෙන් රැකබලා ගන්නා සහ පෝෂණය කරන මවක" මෙන්ය. (D. 111, 188)

සමහරවිට බෙදාහදා ගත් රාගය මිත්‍රත්වයක් අවුළුවයි; සමහරවිට එය තීරණාත්මක මොහොතක උපකාර කිරීමට බලාපොරොත්තු නැති ඉදිරිපත් වීමක් විය හැකිය. තවත් අවස්ථාවක දුෂ්කරතා හෝ උවදුරකින් අවදිව ඒවාට එකවිට මුහුණ පෑමක් විය හැකිය. එවැනි දේ සාමාන්‍ය මිත්‍රත්වයක් ශක්තිමත් කිරීමට හෝ ප්‍රබල කිරීමට මූලාරම්භයක් වේ. නමුත් එක් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට ආකර්ෂණය වන්නේ කුමක් ද කියා හඳුනාගැනීම දුෂ්කරය. ඒ නිසා ඒ අය ආදරණීය මිතුරෝ වෙති. අඩු තරමින් සමහර අවස්ථාවලදී පෙර ජීවිතයක සම්බන්ධතාවන් නිසා එවැනි නැවත අවිදිවීමක් හෙවත්, අදාළ පුද්ගලයන් පෙර ජීවිතයක හෝ පෙර ජීවිතවලදී ඉතා සමීපව සිට, දෙදෙනා අතර එම බැඳීම වර්තමාන ජීවිතයේදී නැවත එකට ආකර්ෂණය වන බවක් බෞද්ධයකු කියන්නට පුළුවනි. ජාතක කථාවල දෙදෙනෙකු බොහෝ ජීවිතවලදී ඔවුන්ගේ සම්බන්ධතා නැවත ඇතිකරගෙන ඇති බවත් එක අවස්ථාවක ජීවිත 7ක් පුරා සිදුවූ බවත් සඳහන් වේ. (J. 11,30) බුදුපියාණන් වහන්සේ සහ ආනන්ද ස්වාමීන් වහන්සේ අනුපිළිවෙළින් සසරේ මිත්‍රයන් වූ බව පැරණි ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ.

දෙදෙනෙකුගේ ආදරණීය මිත්‍රත්වයට වැදගත් ආධ්‍යාත්මික මූලයක් ඇතුළත් වූ විට බුදුපියාණන් වහන්සේ සඳහන් කරන ආකාරයට එය කල්‍යාණ මිත්ත ලෙස හඳුන්වන අතර, එම සම්බන්ධය කල්‍යාණ මිත්තත නම් වේ. කල්‍යාණ මිත්තත පරමාදර්ශී මිත්‍රයකු හෝ ආධ්‍යාත්මික මිතුරකු, සහ කල්‍යාණ මිත්තත වන අතර, එය උත්තරීතර මානව සම්බන්ධතාවකි.

කල්‍යාණ යන්නෙහි පද ගත අර්ථය "ලස්සන" හෝ "අතිශය ලක්ෂණ වූ" යන්නයි. මෙයින් කායික ආකර්ෂණය බුදුපියාණන් වහන්සේ අදහස් නොකළහ, අභ්‍යන්තර ලක්ෂණ, අවංකත්වයේ ලක්ෂණ, කරුණාවන්ත හදවතක් ඇතිවීම, සුචරිතය සහ ධර්මය කෙරෙහි ඇති ආදරය අදහස් කෙරෙයි. "යමෙක් ඊර්ෂ්‍යාවෙන් පෙළේනම් හෝ ආර්ථමාර්ථකාමී හෝ වංක නම්, ඒ අයට කුමන හෝ වාග් චාතුර්යයක් හෝ හොඳ පෙනුමක් තිබුණත්, ඒ අය ආකර්ෂණයක් නැති පුද්ගලයෝය. නමුත් එවැනි දේවල් පිරිසිදු කරනවා නම්, එයින් නිදහස් වෙනවා නම්, සැබෑවටම, ලස්සන එවැනි අයයි."(Dhp. 262-3).

ආධ්‍යාත්මික මිතුරෙක් "ආදරණීය තේරුම් ගන්නා සුලු, ගෞරවය කරන සහ අගය කරන නිරවුල්ව අදහස් පළ කරන්නේ නම්, ප්‍රශ්නවලදී ඉවසන්නේ නම්, විචක්ෂණශීලීව කථා කරන්නේ නම්, සහ නිවැරදි මාර්ගයට යොමුකරන්නේ නම්" ඔහු ආධ්‍යාත්මික මිතුරෙකු බව බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. (A.1V. 32) ගමක හෝ නගරයක ජීවත් වුවත්, ආශ්‍රය කරන්නේ

සම්බන්ධකම් පවත්වන්නේ සහ මිනිසුන් සමඟ කථා කරන්නේ, තරුණ හෝ වියපත්, විශ්වාසය සහ සුචරිතය, ත්‍යාගශීලී බව සහ ප්‍රඥාවෙන් පිරුණු අය සමඟ නම් "මෙය ආධ්‍යාත්මික මිත්‍රත්වය යනුවෙන් හැඳින්වේ." (A. IV. 282).

ධර්මය "බුද්ධිමතුන් විසින් තමන්ම අවබෝධ කරගත යුතු" බව බුදුපියාණන් වහන්සේ අවධාරණය කරන අතර, මෙය අනෙක් අයගෙන් හුදෙකලාව කරගත නොහැකි බව ද අවධාරණය කළහ. ආත්ම විශ්වාසයෙන් යුතුව ස්වාධීන වීම වැදගත් වේ. නමුත් මිත්‍රත්වයේ චිත්තවේගී පෝෂණය සමඟින් උසස්වීම සහ පෝෂණය වීම අවශ්‍යයි. "ආනන්ද හිමි බුදුපියාණන් වහන්සේට මෙසේ කීවේයඃ "ආධ්‍යාත්මික මිත්‍රත්වය, ඉතා සමීප බව සහ සුමිතුරු බව පවිත්‍ර ජීවිතයේ හරි අඩකි." බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හඃ "නැත ආනන්ද! එහෙම නොවේ, ආධ්‍යාත්මික මිත්‍රත්වය, ඉතා සමීප බව, සහ සුමිතුරු බව යන සියල්ල සම්පූර්ණ පවිත්‍ර ජීවිතයයි. යමෙක් ආධ්‍යාත්මික මිතුරකු, ආධ්‍යාත්මික සමීප මිතුරෙකු, ආධ්‍යාත්මික සුමිතුරකු සකස් කරගෙන, ගුණ වගාකර ගත් මාර්ගය වර්ධනය කර, වැඩිදියුණු කර ගත්තේ නම් ඔහු ආර්ය අෂ්ටාංගික මාර්ගය දියුණු කර සහ වර්ධනය කර ගන්නේ යැයි බලාපොරොත්තු විය හැකිය." (S.V.2)

ආධ්‍යාත්මික මිතුරකු වශයෙන් තෝරා ගතහැකි හොඳම පුද්ගලයා අර්හත් ඵලයට පැමිණි අයෙක්ය. අවාසනාවට, එවැනි ඵලයකට පැමිණි හෝ නොපැමිණි පුද්ගලයකු දැනගැනීම පහසු නොවේ. එසේම ඉගෙන ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගුරුවරයා තෝරාගැනීම රඳා පවතින්නේ බොහෝ දුරට ශිෂ්‍යා මත බව අවබෝධ කරගැනීම වැදගත්ය. බුදුපියාණන් වහන්සේගේ ධර්මය පැහැදිලි කිරීම ලක්ෂ ගණන් මිනිසුන් අසා සිටියත්, සියලු දෙනාම රහත් ඵලය නොලැබූහ. දහස් ගණන් භික්ෂූන් සහ භික්ෂුණීන් උන්වහන්සේ ගෙන් පුහුණුව ලැබුවත්, ඒ සියලු දෙනාම රහත් ඵලයට පත්වූයේ නැත. සමහර අය ස්වල්ප දෙනකු වත් දියුණු වූයේ නැත. ඉතා ප්‍රඥාවන්ත, වඩාත් බහුශ්‍රැත සහ නිපුණ ආධ්‍යාත්මික මිත්‍රයා වඩාත් හොඳයි, නමුත් අප ප්‍රමාණවත්ව, යමක් ග්‍රහණය කරගත හැකි අය නම්, අපට වඩා තරමක් වඩා පැසුණු බුද්ධියක් ඇති හෝ බුද්ධි ගෝචර ඕනෑම පුද්ගලයකුගෙන් ඉගෙන ගතහැකිය. "එවැනි ආධ්‍යාත්මික මිත්‍රයකු සිටීම "ප්‍රත්‍යාභිඥාන" හෝ "අවබෝධ කරගත්" ගුරුවරයකු සිටීම හා සමානවම ඵලදායී වේ.

ඉන්දියානු ආගමික සම්ප්‍රදායට අනුව, සාමාන්‍යයෙන් යෝගික බලයක් ඇති ගුරුවරයෙක් (ගුරු) ශිෂ්‍යා සම්පූර්ණයෙන්ම ස්වයං පරිවර්තනයකට ලක් කිරීම පිණිස සුදුසු ද කියා සොයා බලයි. තමන්ගේ ශ්‍රාවකයන් "පිරික්සීම" සඳහා ඔවුන් වෙත අසාධාරණ ඉල්ලීම් කරමින්, අනාචාරවත් ලෙස පෙනෙන

ආකාරයට හැසිරීමෙන් හෝ අසම්මත උපදෙස් දීම සහ නොපැකිළිව අවනත වන ශ්‍රාවකයන් ඇගයීම වැනි දේ කරන ගුරුවරුන් පිළිබඳව බොහෝ කථා ඇත. සම්පූර්ණයෙන්ම ප්‍රශ්න නොකරමින් ගුරුවරයාට දක්වන කැපවීම ආධ්‍යාත්මික වර්ධනයට ඇති ප්‍රධාන ඉක්මන් මාර්ගය ලෙස ඔවුහු දකිති.

කවරකු හෝ ධර්මය උගන්වන පුද්ගලයාට ගෞරව කිරීම සුදුසු බව බුදුපියාණන් වහන්සේ සිතූ අතර, ප්‍රශ්න නොඇසීම සහ අවිචාරවත්ව ඒ අයට ස්වයං යටත්වීම අනුමත නොකළහ. එයින් එපිටට, උන්වහන්සේ ගුරුවරයාගේ විභවය මිනිසුන් කියන ආකාරයට සහ කියා සිටින හෝ උපකල්පනය කරන ආකාරයට සැබැවින්ම බුද්ධිමත් ද කියා තක්සේරු කිරීමට, කාලයක් තුළ සියුම් අයුරින් පිරික්සන ලෙසට දිරිමත් කළහ. ගුරුවරයකු පිළිගත් පසු ගුරුවරයාගේ ක්‍රියාවන් වචන සමඟ සමානුයෝගී ද, එසේ නැත්නම් ඔහුගේ ප්‍රසිද්ධ පුද්ගල භාවය සහ පෞද්ගලික ජීවිතය අතර වෙනස්කම් ඇද්ද යන්න පිළිබඳව නිරන්තරව සෝදිසියෙන් සිටින ලෙස ද ශ්‍රාවකයාට බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. සංකේතමය නියමානුකූල අන්තර්ඥානයෙන් උන්වහන්සේ පෙන්වා දුන්නේ, "මානසික අපිරිසිදු බව ඇතිවන්නේ පුද්ගලයෙකු ප්‍රසිද්ධිය සහ දැනුම් තේරුම් ඇති තත්ත්වයට පත්වීමෙන් පසුව බව" යි. (M.I.317-20) වෙනත් පුද්ගලයෙකු මෙන්ම, ගුරුවරයකු ද ගෞරව සැලකිලි සහ සාර්ථකත්වය ලැබීම නිසා නරක තත්ත්වයන්ට පත්විය හැකි බව අත්දැක්වීම්වලින් පෙනී යයි. මෙම තත්ත්වය අනුව, පෙරදී වටිනාකම්වලින් යුතු ගුරුවරයකු තවදුරටත් එසේ නොවිය හැකිය. එසේම බුද්ධිමත් පුද්ගලයකු මෙම සම්භාවිතා පිළිබඳව දැනසිටිය යුතුය.

එක් අවස්ථාවකදී පිරිසක් පැමිණ තමන්ට වෙනස් ආගමික කියමන් පිළිගන්නට ඇරයුම් කළ විට, ඒවා තෝරාගත යුත්තේ කෙසේ ද කියා බුදුපියාණන් වහන්සේ ගෙන් විමසූහ. "උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: "විශ්වාස තුළින් තීරණවලට නොආයුතුයි. මෙම භික්ෂුව අපගේ ගුරුවරයාය." (මා සමානෝ නො ගරු, A.I.189).ඊට පසු උන්වහන්සේ වැඩිදුරටත් මෙසේ පැවසූහ: "නමුත්, ඇතැම් දේ යහපත්ය, ප්‍රශංසනීයයි, බුද්ධිමතුන් විසින් අගය කළ, පිළිගත් සහ අනුගමනය කළ දේ බව ඔබම දන්නා විට, එය ඔබගේ සුභසිද්ධියට සහ සතුටට හේතු වේ. එවිට ඔබ ඒ අනුව ජීවත් විය යුතුයි." සිතූ පරිදිම, නොවරදින, ගුරුවරුන් ගේ උපදෙස්වලට වඩා තමන්ගේම තීරණ, විචක්ෂණය සහ නිරවුල් ප්‍රායෝගික බුද්ධිය මත වඩා විශ්වාසය රඳවන ලෙස බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. ටිබෙට් ජාතික බෞද්ධයන් අතර පවතින, ඔහු හෝ ඇය (ගුරුවරයා හෝ ගුරුවරිය) බුදුවරයකු සේ සැලකීමේ අදහස බුදුපියාණන් වහන්සේගේ මේ ප්‍රඥාවන්ත උපදේශය දිරිමත් කරවන්නට පිහිටක් නොවේ.

බුදුපියාණන් වහන්සේ සිතන ආකාරයට එක් පාර්ශ්වයක් උසස් සහ අනෙකා අප්‍රධාන හෙවත් එක් අයකු සියල්ල දන්නා සහ අනෙකා සියල්ල පිළිගන්නා තත්ත්වයක් ආධ්‍යාත්මික සම්බන්ධතාවයෙන් අදහස් නොකෙරේ. ඊට වඩා එය අන්‍යෝන්‍ය ගෞරවය සහ ආදරය, ප්‍රශ්න කිරීම, සාකච්ඡා, සමහර විට උදයෝගිමත් නොගැළපීම් තිබිය හැකි, ඉගෙනීම සහ ඉගැන්වීම සිදුවන පරිසරයක් ඇති සම්බන්ධතාවකි. වැදගත් ආධ්‍යාත්මික මිත්‍රයෙක් ආදරණීයයි. (පිය). එසේම, සිසුවා ගුරුවරයාට ආදරණීය සෙනෙහසකින් සැලකිය යුතුයි. (මනාප Vin 1, 45) එසේම, ධර්මය අනෙක් අය සමඟ බෙදාගන්නා අය, ඒ අය "ගුරුවරයකු" වුවත්, නොවුවත්, විධිමත් හෝ මිත්‍රශීලී පසුබිමක සිටියත්, එසේ කළ යුත්තේ යමක් ලැබීමට කැමැත්තක් නැතිව සහ ආදරණීය සිතකින් යුතුවයි. (මෙත්තාචිත්ත, A 111, 184).

# 28.බුදුපියාණන් වහන්සේ සහ
# ආහාර පිළිබඳ දර්ශනය

රසවත් හෝ රස නැති, බොහෝ හෝ ස්වල්ප, ආදරයෙන් සෑදූ ඕනෑම දෙයක් පුද්ගලයෙකුට අනුභව කළ හැකිය. සැබැවින්ම ආදරය ඉහළම රසයයි. (Ja. 111, 145)

පැවැත්මට එක් ආකරයකට හෝ තවත් ආකාරයකට ආහාර සම්බන්ධ බව, වෙනත් පැරණි ඉන්දියානු චින්තකයන් මෙන්ම බුදුපියාණන් වහන්සේ ද දුටුවහ. ආහාරවල මූලික වැදගත්කම බුදුපියාණන් වහන්සේ මෙසේ අවධාරණය කළහ: "සියලු ජීවිත ආහාර මත රඳා පවතී." (D.111, 211) ආහාර ජීවිතය පෝෂණය කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදෙන නිසා ආහාර සෙවීම සියලුම මිනිස් ක්‍රියාකාරකම් සඳහා පදනම වී ඇත. ඒ අනුව, ආහාර සඳහා පාලි වචනය, ආහාර, පැවත ඇත්තේ සංස්කෘතියේ ආ-හර වලින් වන අතර, එය ගෙන ඒම, සමීපයට ගෙන ඒම හෝ කෙනෙකු වෙත ගෙනයාම අදහස් කෙරෙයි. බුදුපියාණන් වහන්සේ ආහාර හෝ පෝෂණ වර්ග හතරක් පිළිබඳව කථාකර ඇත; ආහාර 4 කබලිංකාහාර, මනො සංචෙතනාහාර, ඵස්සාහාර, විඤ්ඤාණාහාර යි, මෙයින් පළමුවැන්න ශරීරය පවත්වා ගෙන යයි, එය රළු (ඕලාරික) හෝ සියුම් (සුඛුම) විය හැකිය. අනික් තුනම මනස පවත්වාගෙන යයි. නැවත ඉපදීමට හේතු වන ගැම්ම ඇති කරන එක් සාධකයකි දැඩි ආශාව, සත්‍යය වූ ආහාර වලට අන්තර්ගත වන්නේ භෝජන සහ බීම වර්ග, කෙටි ආහාර සහ භෝජන සංග්‍රහ, යුෂ වර්ග සහ සිරප් වර්ග (අන්න, පානඛජ්ජ, භොජ්ජ, ලෙයිය, A.1V. 394) සහ මේවා කෑමෙහිදී ද, බීමෙහිදී ද, සැපීමෙහිදී ද, රසවිඳීමෙහිදී ද භාවිත කළ හැකිය. (අසිතෙ, පීතෙ, ඛායිතෙ, සායිතෙ, M.I. 422)

ආහාරවල වැදගත්ම ගුණය නම් රසයයි. බුදුපියාණන් වහන්සේ හය ආකාර විවිධ වර්ග හඳුනා ගත්හ. ඒ පැණි රස (මධුර), ඇඹුල් (අම්බිල), ලුනු ගතිය (ලවණ), තිත්ත ගතිය (තිත්තක) සැර රසයක් (කටුක) සහ දැවිල්ල හෝ යවකාර ලුනු රසය (කසාය) යනාදියයි. මෙම වර්ග හයට පසුකාලීනව අටුවාචාර්යවරුන් උණුසුම් ගතිය (උණ්හ) සහ සිසිල් ගතිය (ශීත) එක් කළහ. මෙම රසයන්ට ප්‍රතිග්‍රාහකයන් වූයේ මුඛයේ සහ උගුරේ කොටස්වල පිහිටා

ඇති රසංකුර 1,700 කි. (රසහරණී) (A.111.250) මුල්කාලීන බෞද්ධ ග්‍රන්ථවල ද කුලුබඩු තුන් වර්ගය ද, හතර ආකාර පැණි රස ද, පස් ආකාර පස්ගෝරස ද, පස් ආකාර රසවත් මස් වර්ග ද, 18 ආකාර ඝන ආහාර ද්‍රව්‍ය ද සඳහන් වේ. (VvA. 186); Ja. I. 236; V.I. 324; V. 472; I. 186). සමහර ලැයිස්තු අනුව, කුලුබඩු වර්ග තුනේ සූදුරු ඇට, පෙරුම්කායම් සහ සුදුලූනුවල සංයෝගයක් අඩංගු වේ. පැණි රස හතර වර්ගය, මී පැණි, එළගිතෙල්, බටර් සහ සීනි වන අතර, තුන් වැන්න කිරි, බටර් යොදය සහිත එළගිතෙල් සහ යොදය ඉවත් කළ එළගිතෙල් අඩංගුය. නමුත් වෙනත් දේවලින් සැදූ දේ පිළිබඳව සඳහන්වී නැත. පසුකාලීනව ජීවිත ස්වරූපය තමන් ආහාරයට ගත් දේවල සියුම් බව අනුව, වර්ග කිරීමට බෞද්ධයෝ උත්සාහ කළහ. මෙම සැලැසුම්වල කිඹුලන් පහත්ම තත්ත්වයේ තිබුණේ සමහර විට උන් සමහර අවස්ථාවල ආහාරයට බොරලු කැට ගත් නිසා විය හැකිය. තවමත් ඉහළ මට්ටමේ තිබෙන්නේ නයින් සහ ගෝනුස්සන් ආහාරයට ගන්නා මොනරුන්ය. ඊට පසු අං සහ ඇට දිරවන්නට හැකි වෘකයකු හා සමාන හයනා නමැති සත්ත්වයා පැමිණි අතර, ඊට පසු ඇතුන්, මුවන්, ගවයන්, හාවුන් සහ ක්‍රමයෙන් තවත් සතුන් වැඩි වන පිළිවෙළට දැකගත හැකි විය. මීටත් වඩා වැඩිවූයේ, ගැමියන් ඊට පසු නගරවාසීන් සහ ඊටත් පසු රජවරු සහ ඔවුන්ගේ දූතයන් සහ ඉහළම තලයේ දිව්‍ය භෝජන ආහාරයට ගන්නා දෙවිවරු ද සිටියහ. (අත්ථසාලනී 331)

එකල ක්‍රමයෙන් ඇතිවෙමින් තිබූ වෛද්‍ය න්‍යායයයන්වලින් සමහර විට ආහාරවලට බලපාන්නට ඉඩ තිබුණ ද ආහාර වර්ග ජීවිතයට පිහිටවූ ආකාරය පිළිබඳව බුදුපියාණන් වහන්සේට අදහස් තිබුණි. එසේ වුවද එම අදහස්වලට සමකාලීනව උදරයේ (තපෝ හෝ උදරාග්ගි) යම් ආකාරයක ගින්දරක් හෝ උණුසුම් මූලද්‍රව්‍යක් තිබෙන බව ඔව්හූ පිළිගත්හ. මෙම උණුසුම ආහාර දිරවීමට සහ ජීවියාට අවශෝෂණය සඳහා ඉඩ සලසයි. (A 111 346) එසේම ජීවීන්ගේ ස්වාභාවික උණුසුම් ගතිලක්ෂණ ඇති කරන්නේ ද මෙම ගින්නයි. (M.I. 296). ආහාරයක අඩංගු ද්‍රව්‍ය දෙකක් ඇති බවට හඳුනාගෙන ඇත; ප්‍රමාණය (රූප) සහ පෝෂණමය සාරය (ඕජා), සමහර වර්ගවලට අනෙක් වර්ගයට වඩා එක වර්ගයක් වැඩියෙන් තිබේ. ධාන්‍ය වැනි ප්‍රමාණයෙන් වැඩි ආහාර කුසගින්නේ වේදනාව සංසිඳවයි. නමුත් කෙටියෙන් බටර් හෝ එළගිතෙල් වැනි පෝෂණයමය සාරයෙන් වැඩි ආහාර වැඩි කාලයක් සංසිඳවයි. ගවයන් සහ මුවන් වැනි ශාක භක්ෂක සතුන්ගේ මස් - කොටියන්, කිඹුලන් වැනි මාංස භක්ෂක සතුන්ගේ මස්වලට වඩා වැඩි පෝෂණයක් තිබෙන බව විශ්වාස කරයි. ආහාරවල පෝෂණමය සාරය කායික පෙනුම ඇතිකරන සාධක හතරින් එකක් බව හඳුනාගෙන ඇත. ජීවිතය පවත්වාගෙන යාම සඳහා ආහාර අත්‍යවශ්‍ය වන අතර, එකම වර්ගයේ ආහාර

ඕනෑවට වඩා ගැනීම උදරයේ උෂ්ණත්වය අඩු හෝ අයහපත් දිරවීමක් යමෙකුට ඇත්නම්, අනතුරුදායක වියහැකි බව විශ්වාස කරයි. එවැනි අවස්ථාවන්වලදී සමහර විට කොලරාව නමින් හඳුන්වන, විසුචිකා නම් රෝගයෙන් මිය යා හැකිය. (Mil. 153)

බුදුපියාණන් වහන්සේ ගේ කාලයේ තිබූ ප්‍රමුඛ ආගමක් වූ බ්‍රාහ්මණ ආගම, ආහාර සම්බන්ධයෙන් අඩුම තරමින් ඉහළ කුලවල අයටවත් සංකීර්ණ නීති කට්ටලයක් පනවා තිබුණි. සමහර බොහෝ අපිරිසිදු ආහාර ලෙසට ඇතුළත් වූයේ ඔටුවන්ගේ, බැටළුවන්ගේ, බොහෝ වල් ඌරන්ගේ කිරි ඇතුළුව, සූරමින් හෝ හොටෙන් කොටමින් ආහාර ගන්නා හෝ ඇඟිලි දැලකින් වැසුනු පාද ඇති, කුරුල්ලන්ගේ මස්, බොහෝ මාළු වර්ග, නමුත් සමහර බැහැර කිරීම් සමග සහ ඒ හා සමාන වූ මස් මඩුවකින් මස් ලබාගැනීම, තනි කුරය ඇති සතුන්, පැටවා නැතිවූ එළදෙන, හුදෙකලා සතුන්, ගම්බද ඌරන් හෝ කුකුළන් ද අපිරිසිදු ලෙස සලකනු ලැබුණි. පිරිසිදු ආහාර පවා, ඒවා ඇඳුමක වාටියේ ගැටී ඇත්නම්, හෝ රාජකීය දූතයකු, මුඩු හිස් ඇත්තකු, වඳ මිනිසකු, මුදල් ණයට දෙන්නකු, දොස්තර කෙනෙකු, ආයුධ රැගත් මිනිසෙකු සහ විශේෂයෙන්ම අඩු කුලයේ හෝ හරිජනයන් පිළිගත නොහැකි විය. බෝට්ටුවක ගමන් කරන විට, කන්දක් මුඳුනක සෑදූ නිවාස පෙළකදී ඉඳගෙන ඉන්නා විට හෝ රැහැනෙන් පැන්නූ අයෙකු, ඌරෙකු, කුකුළෙකු, බල්ලෙකු, ඔසප් වන ගැහැනියක හෝ නපුංසකයෙකු බලා සිටීමේදී (මනුස්මෘති 3,239) ආහාර නොගත යුතුයි. සියලු ආහාර අතරින් වඩාත් අපිරිසිදු සහ දූෂ්යම වී ඇත්තේ ඉතිරි වූ (ආහාර) (උච්චිත්ථ) වන අතර කිසිවෙකු ඒවා ඇල්ලුව ද ඒ අය අපිරිසිදු වේ.

බ්‍රාහ්මණයන් ඒ අය ආහාරයට ගත් දේ කොහෙන් ද සහ කාගෙන් ද ඒවා පිළිගත්තේ සහ අපවිත්‍ර බව සහ පිරිසිදු බව සම්බන්ධයෙන් ඔවුන්ගේ මත පිළිබඳව සිතේ ග්‍රහණය කර තබාගත් දේ පිළිබඳවත්, මුල්කාලීන බෞද්ධයන් ඉතා ඉක්මනින් පෙන්වා දුන් අතර, ඔවුන් දුටු දේ උසුළු විසුළුවලටද ලක් කළහ. සතධම්ම ජාතකය මෙයට උදාහරණයකි. මෙම කථාවට අනුව පෙර ආත්මයක හීන කුලයට උපන් බුදුපියාණන් වහන්සේට  තවත් "ප්‍රකට උතුරු ඉන්දියානු පවුලක තරුණ බ්‍රාහ්මණයෙක්" මහමඟදී හමුවිය. හීන කුලයේ පුද්ගලයකු  සමඟ ආශ්‍රයට නොකැමති වූවත්, බ්‍රාහ්මණ තරුණයා  ආරක්ෂාව පිණිස ඔහු සමඟ ගමන් ඇරඹීමට තීරණය කළේය. දෙදෙනා උදය ආහාරය සඳහා නැවතුණ විට, ඒ අසල ගඟකින් හීන කුලයේ තරුණයා  අත සෝදාගෙන ඔහුගේ බත් පාර්සලය දිගහැර, එය ආහාරයට ගැනීමට පෙර, කෑමට කිසිවක් නොතිබූ බ්‍රාහ්මණ තරුණයාට  කොටසක් ගැනීමට ආරාධනය කළේය. බ්‍රාහ්මණ තරුණයා  අපහාසාත්මක අයුරින්, එය ප්‍රතික්ෂේප කළේය.

අනෙකා එයට කම් නැතැයි හඟවන්නා සේ දෙවුර සලා, ආහාරය අනුභව කළේය. සවස් යාමයේ දෙදෙනා ගමන නතර කළ විට, බ්‍රාහ්මණ තරුණයා බොහෝ වෙහෙසට සහ කුසගින්නට පත්වී සිටියේය. කිසිවක් නොකියා හීන කුලයේ තරුණයා බත් ආහාරයට ගත් අතර, බ්‍රාහ්මණ තරුණයා සිටගෙන ඒ දෙස බලා සිටියේය. අවසානයේ තවදුරටත් කුසගින්න දරාගත නොහැකිවූ තරුණ බ්‍රාහ්මණයා තමාගේ සගයා ඉතිරි කළ ආහාර භුක්ති විඳින්නට තීරණය කළේය. ඔහු එය අවසාන වූ වහාම තමා කළ දේ පිළිබඳ සිතුවිල්ල පිළිකුලෙන් යටපත් කර ගත්තේය. තමාට එය දරා ගැනීමට නොහැකිව හෝ ඔහුගේ පවුලට හෝ ඥාතීන්ට නැවත කිසි දිනෙක මුහුණ දීමට නොහැකිව, වනයට දුව ගොස්, ඔහුගේ ජීවිතයේ ඉතිරි කාලය සම්පූර්ණ හුදෙකලාවේ ගත කළේය. (Ja. 111, 82-84)

දූෂණය වූ ආහාර මුල්කාලීන බෞද්ධයන් ප්‍රතික්ෂේප කිරීම ඕනෑකමින්ම අවධාරණය කරන කථා පුවතක් මහාජනක ජාතකය කියයි. නැවතත්, බුදුපියාණන් වහන්සේ අතීත භවයකදී කූරක් මත ගසා මස් පුළුස්සන ලදී. කෑමට ගැනීමට පෙර, සිසිල් වීම සඳහා පසෙකින් තබන ලදී. ඒ පිළිබඳව සිත යොමු නොකළ එක ක්ෂණයකින් බල්ලෙක් එය ඩැහැගෙන දුවන්නට විය. කෙසේ නමුත්, බල්ලා ඉතා අගය කළ දේ ආහාරයට ගන්නට පෙර, ජනයා එක්රොක් වී සිටිනු දුටු බල්ලා තිගැස්සී මස් කැබැල්ල බිම දමා දුවන්නට විය. මෙය දුටු බෝධිසත්ත්වයෝ ඔහුගේ මස් කැබැල්ල ආපසු ලබාගෙන බල්ලාගේ ස්පර්ශය ලැබූ කොටස කපා දමා තවදුරටත් කරදර නොවී එය ආහාරයට ගත්හ. මීට වඩා පිළිකුල් සහගත සහ අපිරිසිදු දෙයක් බ්‍රාහ්මණ වාදයේ තිබේ දැයි සිතා ගැනීමට අපහසුය. මෙම කථාව මෙසේ නිමා වෙයි. "දැහැමි ලෙස උපයාගත් වස්තුවෙන් මිල දී ගත් ඕනෑම ආහාරයක් පිරිසිදු වේ." (Ja. V1. 62-4)

සිතන පරිදි, පිරිසිදු හෝ අපිරිසිදු ආහාරවලට වඩා බුදුපියාණන් වහන්සේට බොහෝ වාරයක්, සුචරිතය වැදගත් වේ. ආමගන්ධ සූත්‍රයේ මෙසේ සඳහන් වේ: "යමෙක් රළු, අනුකම්පාවක් නැති, කේළාම් කියන, පීඩාකාරී, අහංකාර, ලෝභ, අනෙක් අය සමග කිසිවක් බෙදා නොගන්නා අයෙක් නම්, ඒ පුද්ගලයා අපිරිසිදු වේ, අපිරිසිදු වන්නේ මස් අනුභවයෙන් නොවේ. තරහ, අහංකාර බව සහ මුරණ්ඩු බව, ද්වේෂය, මෝහය, ඊර්ෂ්‍යාව, මානය, උඩඟු බව සහ නරක පුද්ගලයන් සමග ආශ්‍රය යන මේවා පුද්ගලයෙක් අපිරිසිදු කරවයි, මස් අනුභවයෙන් නොවේ. දුරාචාරය, ගත් ණය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම, කෙනෙකු ගැන ගතු කීම, ව්‍යාපාර ගනුදෙනුවලදී වංචා කිරීම, මිනිසුන් අතර භේද භින්න ඇති කිරීම යනාදිය පුද්ගලයෙකු අපිරිසිදු කරයි, මස් අනුභව කිරීමෙන් නොවේ." (S.N. 244-46)

බ්‍රාහ්මණ ආගමේ ආහාර පිළිබඳ නියෝග බුදුපියාණන් වහන්සේ නොසැලකූ අතර, උන්වහන්සේට තමන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන්, සුදුලූනු සහ ඇතැම් වර්ගවල වල්සතුන්ගේ මස් යන ආහාර වර්ග දෙකින් වැළකී සිටීම අවශ්‍ය විය. මුල්ම කාලයේ සිටම, සුදුලූනු සහ ලූනු නොහික්මුණු ආශාවන් සඳහා පොලඹවන බවට ඉන්දියානුවන් අතර විශ්වාසයක් තිබුණි. වඩාත් විශ්වාසය තැබිය හැකි මනුස්මෘති නමැති හින්දු නීති ග්‍රන්ථය බ්‍රාහ්මණයකු සුදුලූනු අනුභව කළහොත්, ඔහුගේ කුලය නැතිවන බව කියන්නට දුරදිග ගොස් ඇත. මෙම ජනප්‍රිය තහනම බුදුපියාණන් වහන්සේ අගය කර, සුදුලූනු ආහාරයට ගැනීම භික්ෂු භික්ෂුණීන්ට තහනම් කළා වන්නට පුළුවන, නමුත් තහනම් කිරීමට විචාරශීලී හේතුවක් දක්වා ඇත. විනය පිටකයට අනුව, පැවිදි අයට තිබූ නීති, තහනමට හේතු වූයේ, සුදුලූනු ආහාරයට ගත් භික්ෂුවක බුදුපියාණන් වහන්සේගේ දේශනයකට සහභාගි වී එහි රැස්ව සිටින පිරිසට ඔහුගේ ප්‍රශ්වාසයෙන් වරදක් සිදුවීම නිසාය. මෙය බුදුපියාණන් වහන්සේට දන්වා සිටි විට, උන්වහන්සේ අනුන් ගැන සිතමින් සුදුලූනු භාවිතය මඟ හරින ලෙස භික්ෂූන්ට උපදෙස් දුන්හ. විශේෂයෙන් සෞඛ්‍ය හේතු මත පමණක් භික්ෂූන්ට සුදුලූනු භාවිතයට අවසර දුන්හ.(Vin. 11,140)

එසේම, සමහර මස් තහනම් කිරීම පිළිබඳව විචාරශීලී හේතු දක්වන ලදී. උදාහරණ වශයෙන් ඇතුන්ගේ සහ අශ්වයන්ගේ මස් අනුභවය, එවැනි සතුන් රාජකීය සංකේත ලෙස අධිරාජයන් සැලකූ නිසා ඔවුන්ගේ ප්‍රසාදයක් නැති වේ යැයි යන හේතුව නිසාය. බල්ලන් සහ නාගයන් ඉතා පුළුල් ලෙස පිළිකුලට ලක් කළ අතර, උන් ආහාරයට ගැනීමෙන් සමාජ අප්‍රසාදය ඇති වේ යැයි සිතන ලදී. සිංහයන්, හයනාස් යන වෘකයකු වැනි සතුන්ගේ සහ වෙනත් විශාල මාංස භක්ෂක සතුන්ට ඔවුන්ගේ වර්ගයාගේ මස් ආඝ්‍රාණයෙන් සොයා ගන්නට හැකි බව විශ්වාස කරන නිසා ඒ මස් අනුභව කළ අයෙකුට පහර දීමට ඉඩ ඇත. මෙම අවසානයට දැක්වූ හේතුවට සාක්ෂි ඇත, යම් දඩයක්කාරයන් පිරිසක් වනයේ ජීවත්වන භික්ෂුවකට සිංහමස් පූජා කිරීමෙන් අනතුරුව එය වැළඳූ එම හිමියන්ට, පසුව සිංහයෙක් විසින්, හිංසා කර ඇත. එවැනිම, දෙයක් කොටි, දිවි සහ වලස් මස් වැළඳූ භික්ෂූන්ට ද සිදුවී ඇත. (Vin. I. 219-20)

එකල සිටි වෙනත් බොහෝ තවුසන් මෙන්ම බෞද්ධ භික්ෂූන් බ්‍රහ්මචාරී සංක්‍රාමී සහ දානයෙන් පමණක් යැපුණ අතර, වෙනත් තවුසන් මෙන්ම, ඔවුන්ට තිබූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ ආහාර ලබා ගැනීමයි. තමන්වහන්සේගේ භික්ෂූන්ට බුදුපියාණන් වහන්සේ ආහාර සම්බන්ධයෙන් පැනවූ නීති ඔවුන්ගේ ශරීර දමනය කිරීමට නොව, ඔවුන්ගේ ජීවිත සරල කිරීමටයි. පිළිගැනීම සහ

තෘප්තිමත් වීමට සහයෝගය දැක්වීමට සහ අනුබල දීමට පහසුවක් ඔවුන්ට ලබාදීමටයි. භික්ෂු භික්ෂුනීන්ට භික්ඛු සහ භික්ඛුණී යන සංස්කෘත වදන්වල මුල් තේරුම "සිඟනවා" යන්නයි. කෙසේ නමුත් වචනයේ සාමාන්‍ය අරුත කුමක් වූවත්, බෞද්ධ භික්ෂූන් සැබැවින්ම සිඟාකන්නේ නැත. "සිඟනවා" යනු දානය ඉල්ලීමට හෝ ආයාචනයට වුව ද, බෞද්ධ භික්ෂු භික්ෂුණීහු අයදින්නෝ නොවෙති. ඔවුහු හැකියාවක් ඇති පරිත්‍යාග කරන්නෙකුගේ නිවසක් ඉදිරිපිටට ගොස් ස්වල්ප මොහොතක් නිශ්ශබ්දව සිට, යමක් ලැබීමෙන් අනතුරුව, ඉවත් වෙති, කිසිවක් නොලැබුණත්, කෙසේ නමුත් එතැනින් ඉවත් වෙති.

භික්ෂූන්ට ආහාර සපයා දෙන ගිහි පුද්ගලයන්ට බරක් හෝ හිරිහැරයක් නොවිය යුතු බවට සැලකිලිමත් වෙමින්, බුදුපියාණන් වහන්සේ මෙසේ උපදෙස් දුන්හ: "මීමැස්සෙකු මල්වල පැණි ලබාගෙන මලේ වර්ණයට හෝ සුවඳට හානි නොකරමින් යන්නා සේ භික්ෂූන්ද ගම හරහා දානය ලබා ගැනීමට යා යුතුය." (Dhp. 49) අදටත් බුරුමය, කාම්බෝජියාව සහ තායිලන්තයේ භික්ෂූහු මේ ආකාරයට දානය ලබා ගනිති. භික්ෂූන්ට ආහාර පිසීම හෝ ආහාර රැයකට තබා ගැනීමට අවසර ලැබුණේ නැත, ඒ ඔවුන්ට දර එකතු කිරීම, හැළි වළං අවශ්‍යතා සහ ගබඩා කිරීමේ පහසුකම් යනාදියෙන් නිදහසක් ලබා දීමටයි. සීනි, මී පැණි, ලුනු, ගිතෙල් ආදී මූලික ආහාර දින හතක් තබා ගැනීමට විශේෂ අවසරයක් ලැබුණි.(Vin. 1V. 87)මෙයින් අදහස් කරන්නේ, බෞද්ධ භික්ෂූන් ගිහි සමාජයෙන් ආහාර ලබා ගැනීම සම්පූර්ණයෙන්ම රඳා පැවතිය යුතු බවයි. එම නිසා ඔවුන් සමඟ අන්‍යෝන්‍යව ක්‍රියා කළ යුතුයි. භික්ෂූන් හුදකලාව කාලය ගත කරනවා විය හැකිය, නමුත් ඔවුන්ට දුරස්ථ වනාන්තරවල තවුසන් විය නොහැකිය.

පිළිගැනීම සහ කෘතඥතාව පළ කිරීමක් වශයෙන් පාත්තරයට දමන ඕනෑම දෙයක් අනුභව කිරීම ද භික්ෂුවකගෙන් බලාපොරොත්තු වේ. මෙම ආකල්ප ශක්තිමත් කිරීම පිණිස නොමැකෙන සේ සිතේ රඳවා ගත් සහ අපිස් මහා කාශ්‍යප භික්ෂුව පිළිබඳ විශේෂ කථාවක් ඇත. එක් වතාවක් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේට එක් ලාදුරු රෝගියෙකු ආහාර පිළිගැන්වූ අතර, ඒ අසරණ මිනිසාගේ ඇඟිල්ලක් පාත්තරයට වැටුණේය. බෙහෙවින් අරුචි උපදවනසුලු මේ අහර පිඬුව උන්වහන්සේ වැළඳූහ.(Th.1054-6). බ්‍රාහ්මණ සහ වෙනත් නිකායන්වලට අයත් තවුසන්ට වඩා වෙනස්ව ඕනෑම කෙනෙකු කැමැත්තෙන් පිළිගන්වන දානයක් පිළිගැනීම බෞද්ධ භික්ෂූන්ගෙන් අපේක්ෂා කෙරිණ. මෙම අවශ්‍යතාවයට එක් විශේෂ බැහැර කිරීමක් කර ඇත. යම්කිසි පුද්ගලයෙකු භික්ෂු සමාජයට උවමනාවෙන්ම හානියක් කර ඇත්නම් හෝ අයුක්ති සහගත ලෙස ඔවුන් පිළිබඳව වැරදි චෝදනා කර ඇත්නම්, භික්ෂූන්ට

"පාත්තරය අනෙක් පැත්තට හරවා" තමන්ගේ ප්‍රතික්ෂේපය පළ කිරීමට අවසර ලබාදී ඇත. (පත්තං නික්කුජ්ජෙය්‍යය), එම පුද්ගලයාගේ දානය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ හැකි ය. (Vin. 11, 125)

භික්ෂු භික්ෂුණීන්ට මධ්‍යාහ්නයෙන් පසුව ආහාරයක් ගැනීම පැහැදිලිවම සෞඛ්‍ය හේතූන් මත තහනම් වේ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: "මම හවස් යාමයේ ආහාර නොගනිමි. ඒ නිසා මම රෝග සහ පීඩාවලින් නිදහස්ව යහපත් සෞඛ්‍යය, ශක්තිය සහ සැනසිල්ල විඳිමි. ඔබටද එසේ කිරීමෙන් රෝගාබාධවලින් මිදී යහපත් සෞඛ්‍ය ශක්තිය හා සුව පහසුව විඳ ගැනීමට හැකි වනු ඇත." (M.I. 473) කෙසේ නමුත්, මිනිසුන් ආහාර භුක්ති විඳින විට ඉතුරු වෙන ආහාර වඩ වඩාත් වැඩිවිය හැකි ය යන්න මෙම නීතිය සැලකිල්ලට ගන්නට ඉඩ තිබිය හැකිය. ආහාර ගැනීම ආරම්භ කිරීමට පෙර, භික්ෂු භික්ෂුණීන්ට පහත සඳහන් වචන නිශ්ශබ්දව කියන ලෙස උන්වහන්සේ අවවාද කළහ: "අපි මධ්‍යස්ථව ආහාර ගනිමු. බුද්ධිමත්ව සිතමින්, අපි විනෝදයට, හාස්‍යම හෝ කායික ආකර්ෂණයට හෝ ආහාර නොගනිමු. නමුත්, මෙම ශරීරය පැවැත්මට, ගෙනයාමට, කුසගින්න සංසිඳවීමට, මෙම පූජනීය ජීවිතය ජීවත් කරවීමට උපකාර කිරීමට සහ, මම පැරණි ආශාවන් නවතා සහ අලුත් ආශාවන් නොඋපදවා, ඒ අනුව සෞඛ්‍යවත්, චෝදනා නොලබන සහ සැනසිල්ලේ ජීවත් වෙමි යන සිතුවිල්ල ද ඇතිකර ගන්න." යහපත් ආශ්‍රමවල අදටත් ආහාර ලබාගැනීමට පෙර මෙම වචන සජ්ඣායනය කෙරේ. (M.I. 273)

වරක් බුදුපියාණන් වහන්සේට ප්‍රශංසා මුඛයෙන් කථාකරන තැනැත්තෙක් උන්වහන්සේ අමතා තමා මධ්‍යස්ථව ආහාර ගන්නා නිසාත්, තමාට ලැබෙන ඕනෑම ආහාරයකින් සතුටට පත්වන නිසාත්, බොහෝ සෙයින්ම තමාගේ ශ්‍රාවකයින් තමාට ගෞරවය පුදන බව පැවසුවේය. බුදුපියාණන් වහන්සේ එම නිරීක්ෂණයට දුන් පිළිතුරෙන්, උන්වහන්සේගේ ආහාර පිළිබඳව ද, ආකල්පය සහ ආහාර ගැනීමේ පුරුදු පිළිබඳව ද සියුම් දැක්මක් ලබා දෙයි. උන්වහන්සේ මෙසේ පැවසූහ: " මම ආහාර ස්වල්පයක් ගැනීමත්, අල්ප ආහාර ගැනීම මා ප්‍රශංසාවට ලක්කරන නිසාත්, මා මට ලැබෙන ඕනෑම ආහාරයක් පිළිගෙන තෘප්තියට පත්වන නිසාත් එයට මගේ ශ්‍රාවකයෝ ගුරුවරයකු ලෙස මට ගරු බුහුමන් දක්වති. ඔවුහූ මගේ උපදෙස් පිළිගන්නවා යයි ද සිතමු. නමුත් මගේ සමහර ශ්‍රාවකයන් කෝප්පයක් හෝ කෝප්ප බාගයක බෙලි පලතුරු ගෙඩියකින් අඩක් ගන්නා විට, මා සමහර විට මුළු පාත්තරයම පුරවා ආහාර ගන්නවා නම්, හෝ ඊටත් වඩා මට ඕනෑම දානයකින් ලැබෙන ආහාරවලින් මා තෘප්තිමත් වන නිසා, මගේ ශ්‍රාවකයෙක් මට ගෞරව කර මගේ දේශනා පිළිගන්නවා යයි උපකල්පනය කරමු. නමුත්

මගේ සමහර ශ්‍රාවකයන් පිණ්ඩපාතයෙන් පමණක් යැපෙන, ආහාරවලට කිසිම ආරාධනයක් නොපිළිගන්නා, එක නිවසක්වත් මඟ නොහැර, පිණ්ඩපාතය සඳහා වඩින්නේ නම්, සහ ලැබෙන ඕනෑම දෙයක් වළඳිනවා යැයි සිතමු. අනෙක් අතට, මා දානවලට සමහර විට ආරාධනා පිළිගෙන, ඉස්තරම් බත්, සෝස් වර්ග සහ ව්‍යංජන වළඳිනවා යයි සිතමු. ඉතින් මගේ ශ්‍රාවකයන් මට බුහුමන් දක්වන්නේ හෝ ගෞරව කරන්නේ ඒ කිසිවක් නිසා නොවේ. ඊට වඩා වැදගත් දේ තිබේ." (M. 11,6-8) ශ්‍රාවකයන්ගෙන් ගෞරව බුහුමන් ලැබීමට හේතු ලැයිස්තුවක් උන්වහන්සේ ඉදිරිපත් කළහ. ඒ උන්වහන්සේගේ සදාචාරාත්මක ඍජු බව, අභ්‍යන්තර සන්සුන් බව සහ ආධ්‍යාත්මික ප්‍රතිලාභ මුදුන්පමුණුවා ගැනීම්ය.

පිණ්ඩපාතයට වඩිනවාට වඩා බැතිමතෙකුගේ නිවසට දානය සඳහා ආරාධනයක් පිළිගැනීම අව්‍යාජ භික්ෂුවකට නොවටිනා දෙයක් බව සමහර දුෂ්කර ප්‍රතිපත්ති පුරන තවුසන් ගේ හැඟීම විය. සමහර විට මෙසේ කිරීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ විවේචනයට ද ලක් වූහ. එක් අවස්ථාවකදී උන්වහන්සේ ගේ ඉක්මන් වෙනස්වීම් පිළිබඳව ගැඹුරු ලෙස අකමැති සහ බලයට කැමති උන්වහන්සේගේ උග්‍ර සම්ප්‍රදායවාදී හා අභිලාෂවත් ඥාති සොහොයුරු දේවදත්ත සංඝ ප්‍රජාව අතර අර්බුදයක් ඇති කළේය. ඒ භික්ෂූන් ආහාර සඳහා කිසි විටකවත් ආරාධනා නොලැබිය යුතු බවත්, දානයෙන්ම පමණක් යැපිය යුතු බවත් කියමින්ය. (Vin. 11, 197) මෙය එකල සාමාන්‍ය භික්ෂු සම්මතය සමඟ එකඟ වුනත්, බුදුපියාණන් වහන්සේ මෙම ඉල්ලීම අනිවාර්ය කිරීම ප්‍රතික්ෂේප කළහ. උන්වහන්සේ ගේ අදහසට අනුව, සදාචාරාත්මක බව සහ ස්වයං ප්‍රතික්ෂේපය යමෙකුගේ යහපත සඳහා හෝ චාම් බව සඳහා බල කිරීමක් හෝ ප්‍රබුද්ධත්වයට මාර්ගය නොවේ. සත්‍යය ගැඹුරු අවබෝධයෙන්ම අවබෝධ කළ යුතු දෙයකි. යමෙකු ප්‍රබුද්ධත්වය අවබෝධ කරගෙන ඇත්නම්, සුඛෝපභෝගී ආහාර ලැබීම, ඔහුට හෝ ඇයට බල නොපායි;"එවැනි සුචරිතයකින්, එවැනි ඒකාග්‍රතාවෙන් හෝ එවැනි නුවණින් සිටී නම්, හොඳම බත්, විවිධ සෝස් සහ එළවළු අනුභව කළත්, එය ඔහුට බාධාවක් නොවේ." (M.I.38)

බුදුදහමට පළමුව පිළිගැනීම ලැබ, ඊට පසු ජනප්‍රියත්වය ලැබූ නිසා, සරල සහ මධ්‍යස්ථ බවින් යුතු ජීවන රටාවක් පවත්වා ගැනීම අභියෝගයක් විය, විශේෂයෙන්ම ආහාරවලට සම්බන්ධ කරුණු වලදී, මිනිසුන් කැමති වූයේ භික්ෂූන්ට ආහාර සැපයීම සඳහා පමණය, හුදෙක් ප්‍රමාණවත් ආහාර සැපයීමට නොව, ඔවුන්ට දැරිය හැකි හොඳම වර්ගයෙන් සහ සෑහෙන ප්‍රමාණයකින් සැපයීමටයි. "ඔවුන් මෘදු හෝ ඝන ආහාර හෝ බීම තෝරා ගත්තේ තමන්ට නොව, ඔවුහූ ඒවා තමන්ගේ දෙමව්පියන්ට, බිරිඳට හෝ පුරුෂයාට හෝ

දරුවන්ට, තමන්ගේ වහලුන්ට, සේවකයන්ට හෝ මිතුරන්ට සහ තමන් සමඟ වැඩකරන්නන්ට හෝ ඥාතීන්ට නොදුන්හ, ඔවුන් ඒවා දුන්නේ භික්ෂූන්ටය. එහි ප්‍රතිඵලයක් වශයෙන් භික්ෂූහු කඩවසම් වූහ, ස්ථුල වූහ. ඔවුන්ගේ සමේ වර්ණය දීප්තිමත් විය, පැහැපත් විය." (Vin. 111,88) අවංක භික්ෂූන් පවා පහසුවෙන් ආහාර නිසා මානසික වික්ෂිප්ත භාවය ඇතිවී නොදැනුවත්ම කෑදර කමට පත්විය හැකි බව බුදුපියාණන් වහන්සේ ඉතා තදින්ම දැන සිටියහ. ආහාර නිසා මානසික වික්ෂිප්ත භාවයට පත්වීමට විරුද්ධව උන්වහන්සේ ගේ දේශනා තුළින් අනතුරු ඇඟවීම් කළ අතර, ඒවා දෝෂාරෝපණ වලින් යුක්ත විය. "බුද්ධි ගෝචර ආකල්පයක් ආහාර කෙරෙහි" පවත්වාගෙන යන ලෙස උන්වහන්සේ අවවාද කළහ." හිස් බඩකින් යුක්තව ආහාර සම්බන්ධයෙන් මධ්‍යස්ථ වන්න, ස්වල්ප ඕනෑකමක් ඇතිකර ගන්න." (Dhp. 92. Sn. 707)

බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන්ගේ ආහාර කෙරෙහි, කෑදරකම් ඇතිවීමේ අනතුරු නැති කිරීමේ බලාපොරොත්තුවෙන් උන්වහන්සේ වඩාත් පිළිකුල දනවන කථාවකින් නිදර්ශනයක් ඉදිරිපත් කළහ. "සිතින් මවා ගන්න, ස්වාමි පුරුෂයෙකු, බිරිඳක සහ ඔවුන්ගේ ආදරණීය එකම පුත්‍රයා, ප්‍රමාණවත් නොවන කෑම බීම රැගෙන ජනශූන්‍ය ප්‍රදේශයක් මධ්‍යයේදී, තවත් බොහෝ දුර යාමට තිබියදී, ඔවුන්ගේ කෑම බීම අවසාන විය. "අපගේ සියලු කෑම බීම අවසන් වී ඇත. අපි ඉතා ආදරය කරන නමුත්, අපි අපගේ පුතා මරා ඔහුගේ මස් අනුභවයට ගනිමු, ඊට පසු වියළා සහ රසගැන්වූ මස් පිළියෙල කර ගනිමු. අපි තිදෙනාටම මැරෙන්න බැහැ." ඔවුහු මෙසේ සිතූහ. මෙසේ කළ ඔවුහු ජනශූන්‍ය ප්‍රදේශයෙන් පිටතට පැමිණියහ. නමුත් තමන්ගේ පුතාගේ මස් අනුභව කරන විට ඔවුන් පපුවට ගසමින් විලාප දෙන්නට ඇත, "ඔබ කොහි ද අපේ පුතේ?, ඔබ කොහි ද?" මහණෙනි, ඔබලා කුමක් සිතන්නහු ද? එම දෙමාපියෝ විනෝදයට, කායික රූපය සහ ආකර්ෂණය වැඩීමට එසේ කරත්ද? "නැත ස්වාමීනී.""ඔවුහූ එම ජනශූන්‍ය ප්‍රදේශය හරහා යන අරමුණ නිසාම පමණක් නොවේ නම්, ඒ මස් අනුභව කරත්ද?""එසේය ස්වාමීනී" (S.11.98-9).ආහාර, ශරීරය පවත්වා ගැනීමට අවශ්‍ය දෙයක් මිස, නමුත් සෙල්ලම් බඩුවක් නොවන බවට සලකන ලෙස උන්වහන්සේ භික්ෂූන්ට පැවසූහ.

අඛණ්ඩව ආහාර ලැබීමට සහ සමහර විට රසවත් ආහාර ලැබීමට සංඝයා තුළ අඩු අපේක්ෂාවක් තිබීම බෞද්ධ භික්ෂූන් අතර අඩුවෙන් ප්‍රශ්න ඇතිකිරීම බලාපොරොත්තු වීමට හේතු විය. ඇතැම් පුද්ගලයෝ තමන්ගේ සාමාන්‍ය ජීවිතයේ තිබෙන අරගල සහ වෙහෙසකාරී වැඩවලින් මිදීමට

ආකර්ෂණීය විකල්පයක් වශයෙන් භික්ෂූන් හමුවීමට පැමිණියහ. භික්ෂුවකගේ සැබෑ අරමුණට සම්පූර්ණයෙන්ම සබඳතාවක් නැති, නොමිලයේ ආහාර ලබා ගැනීම ඇතුළු හේතුවලට ද පැවිදි වූ අය පිළිබඳව තොරතුරු ස්වල්පයක් පැවිදි නීතිවල සඳහන් වේ. මෙවැනි තොරතුරක් එක් වංශවත් පවුලක, පසුව දුෂ්කර කාලයකට පත්වූ පුතෙකු "හොඳ ආහාර ලැබෙන, සුළඟෙන් ආරක්ෂා වූ ඇඳන්වල නිදාගන්නට පහසුකම් ලබන" භික්ෂූන් දැක, පැවිදි වීමට සිතක් පහළ වීම විස්තර කරයි. ඔහු ඉන්පසු ඒ ප්‍රයෝජන ලබාගැනීම පිණිස භික්ෂුවක වීමට තීරණය කරයි. (Vin. 1,86). තවත් අවස්ථාවක එක් මිනිසෙක් කුඹුරුවල වෙහෙසවී උදය ගතකර නිවසට යන අතරතුර, පළාතේ පන්සළක් ළඟ නැවතුණේය. එක් භික්ෂුවක් ඔහුට "ආහාර කොටසක්, රසවත් අවුළුපත්" තමගේම පාත්තරයෙන් දුන්නේය. මීට පෙර කිසි දිනෙක තම ජීවිතයේදී නොලැබූ ආහාර ලැබ, ඔහු ගොවියෙකුගේ ජීවිතයේදී නොලබන නිශ්චිත වාසි භික්ෂුවකගේ ජීවිතයේ තිබෙන බව තීරණය කරමින් භික්ෂුවක බවට පත් විය. (Ja. 1.311). එවැනි අවස්ථාවන්හිදී භික්ෂූන් වීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ "ඔබගේ බඩ සඳහා" කියා පරිහව කර ඇත." (Vin. 1, 58)

ආහාරයට ඉතා ආශා කළේ භික්ෂූන් පමණක් නොව, ත්‍රිපිටකයේ සඳහන් වූ එක් සිද්ධියකට අනුව, කෝසලයේ පසේනදී රජු, බුදුපියාණන් වහන්සේ හමුවීමට පැමිණි අතර, ඔහු සිටියේ පිම්බෙමින් සහ ඉතා දුෂ්කර ලෙස හුස්ම ගනිමින් ය. ඒ තවත් යෝධ ආහාරයක් භුක්ති විඳීමෙන් අනතුරුවයි. මෙය දුටු බුදුපියාණන් වහන්සේ මෙසේ සඳහන් කළහ: "යමෙක් සිහි ඇතිව සිටී නම්, මධ්‍යස්ථව ආහාර ගැනීම දනී, ඔහුගේ රෝග හීන වේ, ඔහු වියපත් වන්නේ ක්‍රමිකවයි. එසේම ඔහුගේ ජීවිතය උසස් වෙයි." රජු ඉඟිය භාරගෙන තමා ආහාර ගන්නා සෑම අවස්ථාවකම බුදුපියාණන් වහන්සේගේ අවවාද නැවත මතක් කරන ලෙස තම ඥාති පුත්‍රයාට දැනුම් දුන්නේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රමයෙන් රජුගේ ආහාර ගැනීම අඩු විය, බර අඩු විය, නැවත ඔහුගේ සිහින් සිරුර ලබා ගත්තේය. (S.I. 81-2)

සිහි කල්පනාවෙන් ආහාර ගන්නා ලෙස බුදුපියාණන් වහන්සේ පසේනදී රජුට, බර අඩු කිරීමට දුන් උපදෙස්, විශේෂඥයන් හඳුනා ගන්නට පටන් ගෙන ඇත්තේ අද කාලයේ වීම සිත් ඇදගන්නා දෙයකි. එය ඇබ්බැහි වූ පුරුද්දක්, සිහි කල්පනාවෙන් යුතු එකක් බවට හැරවීමට උපකාර වන අතර, තෝරා ගැනීමේ හැකියාව වැඩි කරයි. එය යමෙකුට කරන්නට යන්නේ කුමක් ද සහ ඇයි ද යන්න මොහොතකට නවතින්නට, සිතන්නට සහ කරන්නට ඉඩ සලසයි. බොහෝ විට මෙය හැසිරීමේ වෙනසක් ඇති කරන්නට ප්‍රමාණවත් වේ. සෘණාත්මක පණිවුඩයක් වෙනුවට ධනාත්මක පණිවුඩයකින් පසේනදී

රජතුමා පෙලඹවීමට බුදුපියාණන් වහන්සේ තෝරා ගැනීම ද වැදගත් දෙයකි. ස්ථුල බවින් ඇතිවන ප්‍රශ්න පිළිබඳ හේතු දක්වා රජු පිනවීම වෙනුවට, බර අඩුවීමෙන් ඇතිවන වාසි, ශාරීරික රෝග අඩුවීම, (තනු තස්ස භාවන්ති වේදනා), වියපත් වීමේ ක්‍රියාවලියේ වේගය අඩුවීමට (සනිකං ජිරාති) සහ ජීවිතයේ සාමාන්‍ය වර්ධනයට (ආයුපලයාං) බුදුපියාණන් වහන්සේ හේතු දැක්වූහ.

බෞද්ධ ආචාර ධර්ම ශක්තිමත් කිරීම යනු, තමාට සහ අනෙක් අයට කරුණාව සහ අනුකම්පාව දැක්වීමයි. බුදුපියාණන් වහන්සේ මෙසේ දැක්වූහ;"තමාගේ සහ අනුන්ගේ ශුභසිද්ධිය පිළිබඳව සැලකිලිමත් පුද්ගලයා උත්තරීතරයි, ඉහළයි, ඉතාම ඉහළයි සහ විශිෂ්ටයි." (A.11. 95) ආහාරයේ තිබෙන යම් දෙයක් සහ බෞද්ධ ආචාර ධර්ම හා එකඟ වන, පරිත්‍යාගය (දාන) සහ බෙදාහැරීම (චාග), ආගමේ ප්‍රධාන ගුණයහපත්කම් වේ. පුද්ගලයෙකු වස්තුව කෙරෙහි නොඇලීම දියුණු කිරීමට සහ අනෙක් අයට යහපත සැලසීම සඳහා මඟක් ලෙස, පරිත්‍යාගය, බුදුපියාණන් වහන්සේ ඇගයූ සේක. උන්වහන්සේ මෙසේ පැවසූහ: "දානයේ ප්‍රතිඵල මා දන්නා අයුරින් අනෙක් අය දනිත් නම්, ඔවුහු අනෙක් අය සමඟ බෙදා නොගෙන තමන්ගේ පරිභෝජනයෙන් සතුටු නොවෙති, ලෝභකමේ කැළල හදවතෙහි දැඩි ලෙස රැඳී නොපවතිනු ඇත. එය ඔවුන්ගේ අන්තිම සහ අවසාන ආහාර පිඩුව වූවත් එය ලැබීමට එතැන කෙනෙක් සිටියා නම් ඔහු සමඟ බෙදා හදා නොගෙන භුක්ති නොවිඳුනු ඇත." (I.T. 18) ආහාරයේ ද්‍රව්‍යමය අන්තර්ගතයෙන් ඔබ්බට එයින් දන්වා සිටින දෙය සැලකිල්ලට ගන්නා ලෙස උන්වහන්සේ තම ශ්‍රාවකයන් උනන්දු කළහ. ආහාර, ජීවිතයේ ප්‍රධාන ආධාරකය ලෙස රූපය සහ සතුට, ශක්තිය සහ බුද්ධිය වඩන නිසා, ආහාර අනෙක් අයට ලබාදීමෙන්, වක්‍රව, මෙම ගුණාංග ලබාදෙයි. තවදුරටත් අනෙක් අයට ජීවිතය, රූපය, සතුට, ශක්තිය සහ බුද්ධිය ලබාදීම එවැනි ආශිර්වාදවලට තමන් සහභාගි වීමක් බව බුදුපියාණන් වහන්සේ තවදුරටත් සඳහන් කළහ. (A. 111. 42)

ත්‍යාගීශීලි බව සහ ආහාරවලට සම්බන්ධ තවත් ගුණ යහපත්කමක් ලෙස ආගන්තුක සත්කාරය (සක්කාර) බුදුපියාණන් වහන්සේ ඉගැන්වූහ. ආගන්තුකයන්ට සහ අමුත්තන්ට සත්කාර කිරීම බ්‍රාහ්මණ ආගමේ මේ වන විටත් හොඳින් ස්ථාපනය වූ චාරිත්‍රයයි, එනමුත් කුල ගෝත්‍රවල බාධක නිසා එය සීමා විය. කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේට අනුව ඒ ඒ අයගේ කුල, ආගමික සම්බන්ධකම් හෝ සමාජීය තත්ත්ව සැලකිල්ලට නොගෙන ආගන්තුක සත්කාර පැතිර විය යුතුයි. ජෛන ආගම අදහන්නකු වූ ද,

වේසාලියේ ප්‍රධාන වැසියෙකු වූද, සිහ, බුද්ධාගම වැලඳගත් විට, ඔහුගෙන් දානය ලැබීමට නිවසට ඕනෑම ජෛන භික්ෂුවක පැමිණෙන විට ආගන්තුක සත්කාර ලබාදීම නොනැනවතී කරගෙන යන ලෙස බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ. (A.1V. 185). සියලු බෞද්ධයන්ට පැවරුණු පස් ආකාර පරිත්‍යාග අතරින් පළමුවෙනි දෙක වන්නේ ඥාතීන්ට, ආගන්තුකයන්ට සහ අමුත්තන්ට සත්කාර කිරීමයි. (A. 11. 68) බොහෝ දේවල් අදහස් වන නමුත්, හුදෙක් ආහාර සහ ජලය ලබාදීම වඩාත් සාමාන්‍ය සත්කාරය ලෙස අදහස් වේ. පා ගමනින් යන භික්ෂුවක ආශ්‍රමයකට පැමිණි විට, එහි පදිංචි භික්ෂූන් පිටතට පැමිණ ඔහු හමුවී, ආසනයක් පනවා, පාද දෝවනයට ජලය රැගෙන විත්, නවාතැන් සලසා දිය යුතුයි. එසේම උන්වහන්සේ පිළිගැනීමට අවශ්‍ය, වෙනත් දේ සිදු කළ යුතුයි. (Vin. 11. 207-11) ඔහු ආහාර ගෙන නැත්නම්, ආහාර සැපයීම ද ඇතුළත් වේ. ආහාර ලබාදීමට තිබෙන හොඳම වේලාවන් බොහෝ තිබෙන අතර, එයින් දෙකක් පිළිබඳව බුදුපියාණන් වහන්සේ වදාළහ. ආගන්තුකයෙකු හෝ අමුත්තෙකු පැමිණි විටම, සහ පිටත් වීමට සුළු මොහොතකට පෙර, පළමු වැන්න, ඔවුන්ගේ කුසගින්න සංසිඳවීම සහ දෙවැන්න ඔවුන් යන්නට නියමිත ගමනේදී ආහාරයට ගැනීමට යමක් දීමයි. (A. 111. 41)

ආගන්තුක සත්කාරයට ප්‍රතිචාර දැක්වීමට අසමත් වීම ඉතා අයහපත් ස්වරූපයක් ලෙස සලකයි. බුදුපියාණන් වහන්සේ මෙසේ සඳහන් කළහ: "කවරෙකු හෝ වෙනත් කෙනෙකුගේ නිවසට ගිය විට සංග්‍රහ කරයි ද, නමුත් ඔහුගේ නිවසට ඔවුන් පැමිණි විට සංග්‍රහ නොකරයි ද, ඔහු සමාජයෙන් පිටමං කළ අයෙකු ලෙස සැලකිය යුතුයි. (S.N. 128). සියලු ආහාර පරිභෝජනයෙන් පසුව පුද්ගලයෙකුගේ නිවසට අමුත්තෙක් පැමිණියේ නම්, ඔහුගේ කුසගින්න සංසිඳවීම පිණිස නැවත බත් පිසිය යුතු බව මිලින්දපඤ්ඤ කෘතියෙහි සඳහන් වේ. (Mil. 107) ආගන්තුක සත්කාරය ලබන්නාගෙන් ද යම්කිසි හැසිරීමක් බලාපොරොත්තු වේ. ජාතකයේ මෙසේ සඳහන් වේ: "යමෙක් තවත් පුද්ගලයෙකුගේ නිවසේ එක් රාත්‍රියක් හෝ නැවතී ආහාර පාන ලබයි ද, එසේ කිරීමට නරක සිතිවිල්ලක් ඇති නොකර ගන්න, එසේ කළහොත්, දික්කළ අතක් පුළුස්සා සැබෑ මිත්‍රයෙකුට ද්‍රෝහි වීමකි. " (Ja.V1.310)

## කෙටි හැඳින්වීම්

| | |
|---|---|
| A. | අංගුත්තර නිකාය |
| D | දීඝ නිකාය |
| Dhp | ධම්මපදය |
| It | ඉත්වුත්තක |
| Ja | ජාතක |
| M | මජ්ඣිම නිකාය |
| Mil | මිලින්දපඤ්ඤහ |
| Mv | මහාවස්තු |
| Pv | පේතවත්තු |
| S | සංයුත්ත නිකාය |
| Sn | සුත්ත නිපාත |
| Th | ථේර ගාථා |
| Thi | ථේරී ගාථා |
| Ud | උදාන |
| Vin | විනය |



# බුදුදහම පිළිබඳ බටහිර මතය

මෙම ග්‍රන්ථයෙන් බුදුදහමට අදාළ, එහෙත් ලැබිය යුතු අවධානය අඩුවෙන් යොමු කළ විෂයයන් සහ කරුණු පෙළක් ම පරීක්ෂාවට ලක් කර ඇත. පැරණි බෞද්ධ ග්‍රන්ථය පිළිබඳව පරිපූර්ණ අවබෝධයක් සහ අසාමාන්‍ය දේ පිළිබඳව අරමුණක් ඇති කතුවරයා, බුදුපියාණන් වහන්සේ ගේ ඖෂධීය ප්‍රතිකාරයක් වන දැහැටි කූර, උන්වහන්සේගේ සංචාර, ආහාර සහ මිත්‍රසබඳතා, උන්වහන්සේ පැවසූ දේ සහ දුම් ඉරීම සහ මරණීය දණ්ඩනය ඇතුළු කාලෝචිත කරුණු පිළිබඳව නිරීක්ෂණය කරයි. මෙම රචනා බුදුදහමේ විෂය පථය සහ ගැඹුරු ජීවිතයට දර්ශනයක් ලෙස නාභිගත කරයි.

ධම්මික ස්වාමීන් වහන්සේ ඕස්ට්‍රේලියාවේ උපත ලැබූ අතර, අවුරුදු **18** දී බුදුදහම වැළඳ ගත්හ. **1976** දී ඔහු පූජ්‍ය මැටිවල සංඝරතන ස්වාමීන් වහන්සේ යටතේ ඉන්දියාවේ දී පැවිදි වූහ. එතැන් සිට උන්වහන්සේ ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ ජීවත් වූහ. ධම්මික ස්වාමීන් වහන්සේ ශ්‍රී ලංකාවේ කැලණිය විශ්ව විද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යයනය පිළිබඳව පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යාපනය ලැබූ අතර, නිලඹේ භාවනා මධ්‍යස්ථානයේ සහාය-ප්‍රාරම්භකයෙක් ද වූහ. උන්වහන්සේ **2000** වසරේ දී බර්ලිනයේ පැවති යුරෝපීය බෞද්ධ සංගමයේ, සහස්‍ර වර්ෂ සම්මේලනයේ ථේරවාදය නියෝජනය කළහ. ප්‍රසිද්ධ දේශකයකු සහ ලේඛකයකු වන උන්වහන්සේ බුදුදහමේ විවිධ කරුණු පිළිබඳව ග්‍රන්ථ රාශියක් ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒවා භාෂා **30** කට වඩා පරිවර්තනය කසර ඇත.


ප්‍රකාශනය
සීමාසහිත සාසන සේවක සමිතියේ
ප්‍රකාශන කමිටුව
සිරි වජිරඥාණ ධර්මායතනය,
සිරි වජිරඥාණ මාවත, මහරගම.

ISBN 978-955-7915-28-9

මිල රු. 500/-

මුද්‍රණය : රුවන් පහරුව, මහරගම